

# අපගේ උරුමය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ කෙටි ඉතිහාසයක්

# අපගේ උරුමය

*යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල*
*ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ කෙටි ඉතිහාසයක්*

අපගේ උරුමය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල
ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ කෙටි ඉතිහාසයක්
ප්‍රකාශනය

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසිනි
පිටුව 50: *ජෝසෆ් ස්මිත් ලිබර්ටි සිරගෙදර*, ග්‍රෙග් ඔල්සන් විසිනි. © ග්‍රෙග් ඔල්සන්
පිටුව 68: *පාර්ලි මාවතේ අවසානය*, ග්ලෙන් හොප්කින්සන් විසිනි. © ග්ලෙන් හොප්කින්සන්

© 2008 Intellectual Reserve, Inc විසිනි.
සියලු හිමිකම් ඇවිරිණි.
අමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී.

ඉංග්‍රීසි අනුමැතිය: 11/96.
පරිවර්තන අනුමැතිය: 11/96.
*Our Heritage: A Brief History of The Church of Jesus Christ of Latter-day Saints*. පරිවර්තනයයි.
Sinhala

# අදහස්


හැඳින්වීම v

1වෙනි පරිච්ඡේදයඃ පළවෙනි දර්ශනය 1

2වෙනි පරිච්ඡේදයඃ සභාවේ පදනම් පිහිටුවීම 7

3වෙනි පරිච්ඡේදයඃ කර්ට්ලන්ඩ්, ඔහියෝ නගරයේ රාජධානිය ගොඩනැගීම 23

4වෙනි පරිච්ඡේදයඃ මිසූරි නගරයේ සයෝනය පිහිටුවීම 41

5වෙනි පරිච්ඡේදයඃ නාවූ නගරය තුල පරිත්‍යාග සහ ආශිර්වාද 59

6වෙනි පරිච්ඡේදයඃ සෑම පියවරක් තුලම ඇදහිල්ල 75

7වෙනි පරිච්ඡේදයඃ ජාතියට කොඩියක් පිහිටුවීම 88

8වෙනි පරිච්ඡේදයඃ පරීක්ෂාවන් සහ පරීක්ෂාකිරීමේ කාලයක් 101


9වෙනි පරිච්ඡේදයඃ ව්‍යාප්තවන සභාව 114

10වෙනි පරිච්ඡේදයඃ ලෝක ව්‍යාප්ත සභාව 131

11වෙනි පරිච්ඡේදයඃ වර්තමාන කාලයේ සභාව 143

අවසානය 157

අංක සටහන් 159



මෙම කාලපරිච්ඡේදයේ සෑම අනාගතවක්තෘවරයෙක්ම ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය දූතමෙහෙය ගැන සාක්ෂි දරා ඇත.

# හැඳින්වීම

මෙම පොතේ ප්‍රධාන පණිවුඩය වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන් ගෙන් යුත් සභාව ආරම්භයේ සිටම ප්‍රකාශකල පණිවුඩයයි ජෝසෆ් ස්මිත් මෙම කාල පරිච්ඡේදයේ පළවෙනි අනාගතවක්තෘවරයා, මෙසේ ඉගැන්වීය:

"අපගේ ආගමේ ප්‍රධාන මූලධර්ම නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සම්බන්ධව ප්‍රේරිතවරුන් සහ අනාගතවක්තෘවරුන්ගේ සාක්ෂියයි, එනම් උන්වහන්සේ මියගිය බවත්, තැන්පත්කළ බවත්, තුන්වෙනි දවසේ නැවත නැගිට ස්වර්ගයට නැගුන බවත්ය; එසේම අපගේ ආගමට අදාළවන වෙනත් කාරණා එහි උපාංග පමණි."[1]

ජෝසෆ් ස්මිත්ගේ අනුප්‍රාප්තික සෑම අනාගතවක්තෘවරයෙක්ම ගැලවුම්කරුවාණන්ගේ දිව්‍යමය දූතමෙහෙය ගැන සාක්ෂිය එකතුකර ඇත. පළවෙනි සභාපතිත්වය මෙසේ ස්ථිරකර ඇත:


"යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන මුළු ලෝකයටම සාක්ෂි දැරීමට කැඳවා පත්කර සිටින අය වශයෙන්, අපි මෙසේ සාක්ෂිදරමු, උන්වහන්සේ වසර දෙදෙහසකට පමණ පෙර පාස්කු උදෑසනක මළවුන්ගෙන් නැවත නැගිටුනසේක, තවද අද උන්වහන්සේ ජීවත්වනසේක. උන්වහන්සේට මහිමාන්විත, මස් සහ කටු සහිත අමරණීය ශරීරයක් ඇත. උන්වහන්සේ ගැලවුම්කරුවාණන්ය, ලෝකයේ ආලෝකය සහ ජීවනයද වනසේක."[2]

කෝටි සංඛ්‍යාත ඇදහිලිමත් ශුද්ධවන්තයන්ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍යමය භාවය ගැන සාක්ෂි ලබා ඇත. මෙම අවබෝධය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයනන්ගෙන් යුත් සභාව, පොළොව මත දේව රාජ්‍යය ගොඩනැගීමට අවශ්‍ය පරිත්‍යාග කිරීමට ඔවුන්ව පොළඹවා ඇත. සභාව පිහිටුවීමේ කථාව ඇදහිල්ල, කැපකිරීම සහ සතුට පිළිබඳ එක් කථාවකි. එය නූතන ලෝකයට දේව සත්‍යයන් ඉගැන්වූ ජීවමාන අනාගතවක්තෘවරුන්ගේ කථාවකි. එය විවිධ සමාජ


පසුබිමක් සහිත, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියේ පූර්ණත්වය සොයමින්, එය සොයාගැනීමේදී, ගැලවුම්කරුවාණන්ගේ ගෝලයන් වීමට ඕනෑම මිලක් ගෙවීමට කැමති මිනිසුන් සහ කාන්තාවන්ගේ කථාවකි. ශක්ති සම්පන්න ශුද්ධවන්තයෝ අසීරුකම් තුලින් දිගටම ඉදිරියට යමින්, ඔවුන්ගේ දැඩි වේදනාත්මක කාලයේදී පවා, දෙවියන්වහන්සේගේ යහපත්කම සහ උන්වහන්සේගේ ප්‍රේමයේ සතුට ගැන සාක්ෂි දරති. ඔවුහු ඇදහිල්ල, ධෛර්‍යය, කීකරුකම සහ පරිත්‍යාගවල උරුමයක් තබා ගොස් ඇත.

ඇදහිල්ලේ උරුමය අද දක්වා පවතියි. ලෝකය මුළුල්ලේ සිටින පසු-දවස්වල ශුද්ධවන්තයෝ ඔවුන්ගේ උපන් දේශවල පුරෝගාමීන් වන අතර, අළුත් අභියෝග සහ අවස්ථාවන් වලින් පිරුණ කාලයක ඇදහිල්ලෙන් සහ ධෛර්‍යයෙන් යුතුව ජීවත්වෙති. තවදුරටත් ලිවීමට තිබෙන ඇදහිල්ලේ කථාන්තර ඇත. ඉදිරි පරම්පරා සඳහා උරුමයක් තබා යාමේ අප එකිනෙකාට තිබෙන අවස්ථාව මගින්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය අනුව ජීවත්වෙමින් එය බෙදාගැනීමේ සතුට ඔවුන්ටද තේරුම්-ගැනීමට උපකාරවත්වේ.

අපට කලින් මියගිය අයගේ ඇදහිල්ල ගැන අප වඩාත් දැනගන්නා විට, ඔවුන් ගැන අපට හොඳින් තේරුම්ගැනීමට හැකිවී, ඔවුන්ගේ අත් අල්ලාගෙන, ගැලවුම්කරුවාණන් ගැන සාක්ෂි දරමින්, හා එතුමාගේ රාජ්‍යය පිහිටුවීමට උපකාර කළ හැකිය. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්-සේගේ ඇදහිලිමත් ගෝලයන් ලෙස වඩාත් ධර්මිෂ්ඨව ජීවත්වීමට අධිෂ්ඨානකරගැනීමට අපට හැකිය.




අමෙරිකා එක්සත් ජනපදය 1847දී. සභාවේ මුල්කාලීන ඉතිහාසයට වැදගත්වන ස්ථාන සහ ගමන් මාර්ග මෙම සිතියමෙන් පෙන්වයි.



*ශුද්ධ ලියවිලි කියවීමෙන්, කුමන සභාව හරිදැයි ස්වාමීන්වහන්සේගෙන් විමසාබැලීමට තරුණ ජෝසප් ස්මිත්ට මගපෙන්වා ඇත.*

# පළවෙනි දර්ශනය

## නැවත පිහිටුවීමක ඇති අවශ්‍යතාවය

යේසුස්වහන්සේගේ ප්‍රේරිතවරුන්ගේ මරණයෙන් පසුව, පූජකවරයේ බලය සහ සුභාරංචියේ සත්‍යයන් බොහොමයක් පොළොවෙන් ඉවත් කොට, මහා ඇදහිල්ලෙන් වැටීම වශයෙන් හැඳින්වෙන ආත්මික අන්ධකාරයේ දීර්ඝ කාල පරිච්ඡේදය ආරම්භවිය. අනාගතවක්තෘ ආමොස් මෙම වැටීම අනාවැකි දර්ශනයකින් කලින් දැක ඒ කාලයේදී, "බලව, හානියක්, එනම් කෑම හානියක් වත්, වතුර පිපාසයක්වත් නොව ස්වාමීන්වහන්සේගේ වචන ඇසීමේ හානියක්. එන බව" (ආමොස් 8:11) ප්‍රකාශ කළේය. ඇදහිල්ලෙන් වැටීමේ දීර්ඝ ශතවර්ෂවලදී, බොහෝ මිනිසුන් සහ කාන්තාවන් සුභාරංචියේ පූර්ණත්වය සෙවූ නමුත්, එය සොයාගැනීමට නොහැකිවිය. බොහෝ ආගම්වල පූජකවරු විවිධ පණිවුඩ දේශනාකරමින් ඔවුන් හා සම්බන්ධවීමට මිනිසුන්ට සහ කාන්තාවන්ට කීහ. බොහෝ අය ඔවුන්ගේ අභිප්‍රායන් අවංක වුවද, සත්‍යයේ පූර්ණත්වය හෝ දෙවියන්වහන්සේගේ අධිකාරී බලය ඔවුන් කිසිවෙකුට නොතිබින.

කෙසේවුවද, දයාවන්ත ස්වාමීන්වහන්සේ පොරොන්දුවක් දෙමින්, උන්වහන්සේගේ සුභාරංචිය සහ පූජකවරයේ බලය යම් දිනෙක පොළොවේ නැවත පිහිටුවන බවත්, එය නැවතත් කිසිදිනෙක ඉවත්කර නොගන්නා බවත් කීසේක. දහනම වෙනි ශතවර්ෂය ආරම්භයේදී, උන්වහන්සේගේ පොරොන්දුව ඉටුකිරීමේ කාලය ළඟාවීමෙන් ඇදහිල්ලෙන් වැටීමේ දීර්ඝ රාත්‍රියද නිම වීම ළඟාවිය.

## තරුණ ජෝසෆ් ස්මිත්ගේ ධෛර්‍යය

1800 ගණන්වල මුල් භාගයේදී, ජෝසෆ් සහ ලූසී මැක් ස්මිත්ගේ පවුල ජීවත්වූයේ අමෙරිකා එක්සත් ජනපදයේ, නිව් හැම්ස්සයර්, ලෙබනනයේය. ඔවුහු නිහතමානී, අප්‍රසිද්ධ මිනිසුන්වූ අතර, වෙහෙසවී වැඩකරමින් අසීරු දිවියක් ගත කළහ. ඔවුන්ගේ පස්වෙනි දරුවා, ජෝසෆ් කණි.,

වයස හතේදී නිව් ඉංග්ලන්ඩ් ප්‍රදේශයේ 3,000කට මරු කැඳවූ උනසන්නි-පාත වසංගතය රෝගයට ගොදුරුවී ඉන් සුවවෙමින් සිටියදී, ඔහුගේ වම් පාදයේ ඇට මිදුලුවල බරපතල රෝග බීජයක් වර්ධනය වීමෙන් ඉවසාගත නොහැකි වේදනාවක් සති තුනකට වඩා කාලයක් පැවතින.

ප්‍රාදේශීය වෛද්‍යවරයාගේ නිගමනය වූයේ කකුල කපා ඉවත්කිරීමට වුවද, ජෝසෆ්ගේ මවගේ අකමැත්ත නිසා, වෙනත් වෛද්‍යවරයෙක් ඔහු වෙත එවන ලදී. නාදන් ස්මිත්, අසල ඩාර්ට්මවුත් විද්‍යාලයේ චිකිත්සක වෛද්‍යවරයා, පාදය බේරාගැනීමට ඔහු උස්සාහකරන බවත්, නමුත් කටුවේ කොටසක් ඉවත්කිරීම සඳහා අධික වේදනාකාරී ක්‍රමයක් අනුග-මනය කිරීමට සිදුවන බවත් කීවේය. වෛද්‍යවරයා ජෝසෆ්ව බැඳ දැමීම සඳහා ලණු ගෙන ආ නමුත්, ඊට විරුද්ධවූ ජෝසෆ් ඒවා නොමැතිව ශල්‍යකර්මය විඳදරාගැනීමට ඔහුට හැකි බව කීවේය. ඔහුට තිබූ එකම නිර්වින්දනයවූ බ්‍රැන්ඩිද ප්‍රතික්ෂේප කළ ඔහු, ශල්‍යකර්ම කාලය තුලදී ඔහුගේ පියාට ඔහුව තුරුළුකර ගැනීමට කීවේය.

ජෝසෆ් දැඩි ධෛර්‍යයකින් ශල්‍යකර්මය ඉවසා දරා සිටි අතර, ස්මිත් වෛද්‍යවරයාට, එරට සිටි හොඳම බුද්ධිමත් චිකිස්සකයාට, ජෝසෆ්ගේ පාදය නොකපා ගලවාගැනීමට හැකිවිය. තුවාලය සුවවී හොඳින් ඇවිදීමට හැකිවන තුරු ජෝසෆ් දීර්ඝ කාලයක් වේදනා වින්දේය. ජෝසෆ්ගේ ශල්‍ය කර්මයෙන් පසුව, ස්මිත් පවුල වර්මොන්ට්, නෝවික් නගරයට පදිංචියට පැමිණ, එහිදී වසර තුනක් දිගටම වගා හානියෙන් කරදරයට පත්වී, ඉන් පසුව ඔවුහු නිව් යෝර්ක් පැල්මයිරා නගරයේ පදිංචියට ගියහ.

### පළවෙනි දර්ශනය

තරුණ කාලයේදී, ජෝසෆ් ස්මිත් වත්ත ශුද්ධ කිරීමේදී, කළු ගල් ඇද-ගෙන යමින් සහ වෙනත් බොහෝ වැඩ කරමින් පවුලට උදව් කළේය. පිරිමි ළමයා ජෝසෆ් යම් දේවල් ගැන දැඩි අවධානයකින් පසුවෙමින්, ඔහුගේ අමරණීය ආත්මයේ ශුභසිද්ධිය ගැන නිතරම කල්පනා කළ බවත්, ඔහුගේ මවවූ, ලුසී සඳහන් කළාය. ඔහු විශේෂයෙන්ම සැලකිලිමත්වූයේ පැල්මයිරා ප්‍රදේශයේ ආගමට හරවාගැනීමේ සභාවලින් නිවැරදි සභාව කුමක්ද කියාය. ඔහුගේම වචන වලින් ඔහු මෙසේ පැහැදිළි කරයි:

"මෙම මහත් කලබල සමයේ මගේ මනස ගැඹුරු කල්පනාවටත් මහත් අපහසුතාවයකටත් පත්විය; එහෙත් මගේ හැඟීම් ගැඹුරුව සහ බොහෝ විට තියුණු ලෙස තිබුනද, අවස්ථාවක් ලැබෙන පරිදි ඔවුන්ගේ රැස්වීම් කිහිපයකට සහභාගි වුවද, තවදුරටත් මම මේ සියලු පක්ෂවලින්

ඇත්ව සිටියෙමි. කල්යාමේදී මගේ මනස මෙතෝදිස්ත නිකායට යම් පක්ෂපාතිබවකට පත්වූ අතර, ඔවුන් සමග එකතුවීමට මම කිසියම් ආශාවකින්ද පෙළුනෙමි. එහෙත් විවිධ නිකායන් අතර ඇතිව තිබූ ව්‍යාකූලතාව සහ අරගලය එතරම් විශාල වූයෙන්, මිනිසුන් සහ කාරණා ගැන එතරම් නොහඳුනන මා වැනි තරුණයෙකුට කවරෙක් හරිද, කවරෙක් නිවැරදිද කියා කිසියම් නිගමනයකට ඒමට අපහසු විය.

"මම මේ ආගමිකයන්ගේ පක්ෂවල තරඟ මගින් ඇතිකරන ලද අතිශය දුස්කරතාවයන්ට භාජනව ආයාසගන්නා අතර, එක් දිනක් යාකොබ්ගේ සන්දේශයේ පළවෙනි පරිච්ඡේදයේ, පස්වෙනි පදය මම කියවමින් සිටියෙමි. එහි මෙසේ කියවෙයි: *නුඹලාගෙන් යමෙකුට ප්‍රඥාව අඩුනම්, වරද නොතබන්නාවූ, බොහෝ කොට සියල්ලන්ට දෙන්නාවූ, දෙවියන්වහන්සේගෙන් ඔහු ඉල්ලාවා; එවිට ඔහුට එය දෙනු ලැබේ.*

"ශුද්ධ ලියවිලිවල කිසිම කොටසක්, මෙවර මාගේ හදවතට පැමිණියාට වඩා වැඩි බලයකින් කිසිදු මිනිසෙකුට පැමිණ නැත. එය මහත් බලයකින් යුතුව මගේ හදවතේ සෑම හැඟීමකටම ඇතුළුවූ බවක් පෙනින. යම් පුද්ගලයෙකුට දෙවියන්වහන්සේගේ ප්‍රඥාව අවශ්‍යනම්, මට එය අවශ්‍යබව, දැනගෙන මම ඒ ගැන නැවත නැවත සිතුවෙමි; මන්ද මට එවකට තිබුනාට වඩා ප්‍රඥාවක් ලබා නොගෙන, එය කෙසේ කරන්නේදැයි මම දැන සිටියේ නැත, මට දැනගැනීමට ලැබෙන්නේද නැත; මන්ද විවිධ ආගමික නිකායවල ගුරුවරු එකම ශුද්ධ ලියවිලි කොටස විවිධාකාර ලෙස තේරුම්ගෙන තිබීම නිසා බයිබලයට අදාළව ප්‍රශ්නය විසඳාගැනීම ගැන තිබූ සියලු විශ්වාසයන් විනාශකර තිබුනි.

"අවසානයේදී මම තීරණයකට එළඹුනෙමි, එනම් මම ව්‍යාකූලව සහ අඳුරෙහි සිටිය යුතුය, නැතිනම් යාකොබ්ගේ මගපෙන්වීම අනුව ක්‍රියා කළ යුතුය, එනම්, දෙවියන්වහන්සේගෙන් ඇසිය යුතුය" (බලන්න ජෝසෆ් ස්මිත් ඉතිහාසය— 1:8, 11–13).

1820 වසන්තයේ එක් අලංකාර උදෑසනක, ඔහුගේ නිවස අසල වනවදුලක හුදකලාව. ජෝසෆ් ස්මිත් දණගසා ඔහුගේ සිතේ තිබූ ආශාවන් දෙවියන්වහන්සේට ඉදිරිපත්කරමින්, මගපෙන්වීම් ඉල්ලීය. ඉන්පසු සිදුවූ දෙය ඔහු මෙසේ විස්තර කළේය:

"ක්ෂණයකින් යම් බලයකින් මා අල්ලාගත් අතර, එමගින් මා මුළුමනින්ම යටපත්වී, එහි තිබූ පුදුමාකාර බලපෑමකින් මා යටපත්වී මාගේ දිව බැඳ තැබීම නිසා මට කථාකිරීමට නොහැකිවිය. ඝන අඳුරක්

මා වටා පැතිරුන අතර, ක්ෂණික විනාශයකට මා තීරණයවූ බවක් පෙනින" (බලන්න ජෝස්—ඉ 1:15).

ජෝසෆ් ස්මිත්ට ශ්‍රේෂ්ඨ කටයුත්තක් කිරීමට ඇති බව දැන සිටි සියලු ධර්මිෂ්ඨතාවයන්ගේ සතුරා ඔහුව විනාශකිරීමට උත්සාහකළ නමුත්, ඔහුගේ සියලු ශක්තීන් යොදවා, දෙවියන්වහන්සේට කථාකළ බැවින්, ක්ෂණයකින් ඔහු නිදහස්විය.

මෙම විශාල අනතුරුදායක මොහොතේ, හිරුගේ දීප්තිය අභිබවා යන, ආලෝක කදම්බයක්, හරියටම මගේ හිසට ඉහළින් මා දුටු අතර, එය ක්‍රමයෙන් මා මත පතිතවන තුරු පහළට ආවේය.

"මා බැඳ තබාගෙන සිටි සතුරාගෙන් මා නිදහස් වූ බව මට විගස-කින්ම අවබෝධ විය. ආලෝකය මා මත පතිතවූ විට මම විශිෂ්ඨ පුද්ගලයන් දෙදෙනකු දුටු අතර, මට ඉහළින් අහසේ සිටගෙන සිටින ඔවුන්ගේ දීප්තිය සහ මහිමය වර්ණනා විෂය ඉක්මවීය. එයින් එක් අයෙක් මා අමතා, මගේ නමින් කථාකර, අනෙක් තැනැත්තා පෙන්වා මෙසේ කීවේය—*මේ මාගේ ආදරණීය පුත්‍රයාය, ඔහුට සවන්දෙන්න!*" (ජෝස්—ඉ 1:16–17).

ජෝසෆ් ස්මිත් තම පියවි සිහිය ලබාගත් විගසම, සියලු ආගමික නිකායන්වලින් කුමන එක හරිද, ඔහු කුමන එකට සම්බන්ධවිය යුතුදැයි ස්වාමීන්වහන්සේගෙන් ඇසුවේය. ස්වාමීන්වහන්සේ පිළිතුරු දෙමින්, "ඒ සියල්ල වැරදි නිසා ඒ කිසිවකට සම්බන්ධ නොවිය යුතු බව" සහ "ඔවුන්ගේ සියලු ඇදහිලි උන්වහන්සේ ඉදිරියේ පිළිකුලක්" බව ඔහුට කීසේක. ඔවුන්ට "දිව්‍යමය ස්වරූපයක් තිබුනද," ඔවුහු "එහි ඇති බලය ප්‍රතික්ෂේප කරති" එතුමා කීහ (බලන්න ජෝස්—ඉ 1:19).

දර්ශනය නිමවීමෙන් පසුව, තමා තවමත් අහස දෙස බලාගෙන, හිඳගෙන සිටින බව ජෝසෆ් ස්මිත්ට පෙනුනි. ක්‍රමයෙන් තම ශක්තිය ලැබුනු පසු ඔහු නිවසට ගියේය.

1820 එම උදෑසන හිරු නැගෙන විට, එම උදෑසනත් සමග පැමි-ණෙන දෙය ගැන ජෝසෆ් ස්මිත්ට යාන්තමවත් සිතාගත නොහැකිවිය. අනාගතවක්තෘවරයෙක් තවත් වරක් පොළොවට පැමිණ ඇත. අප්‍රසිද්ධ පිරිමි ළමයෙක්වූ, බටහිර අමෙරිකාවේ ජීවත්වන ඔහු, ආශ්චර්‍යමත් සහ පුදුමාකර වැඩක් වන, සුභාරංචිය සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව පොළොව මත පිහිටුවීමට දෙවියන්වහන්සේ විසින් තෝරාගෙන ඇත. ඔහු දිව්‍යමය පුද්ගලයන් දෙදෙනෙක් දැක තිබෙන අතර, දැන් දෙව්වූ පියා-ණන් සහ එතුමාගේ පුත්‍ර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ ස්වරූපය

ගැන සාක්ෂි දැරීමට අද්වීතීය හැකියාවක් ලබා ඇත. එම උදෑසන සැබවින්ම දීප්තිමත් දිනයක් විය— ගස් සහිත වන වදුල ආලෝකයෙන් පිරීගොස් තිබුන අතර, දෙව්වූ පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ 14-හැවිරිදි පිරිමි ලමයෙක් උන්වහන්සේලාගේ අනාගතවක්තෘවරයා ලෙස තෝරාගෙන ඇත.



*කුමෝරා කන්දේදී, ජෝසෆ් ස්මිත් මොරෝනායි දේවදූතයාගෙන් රන් තහඩු ලබාගත් අතර, පරිවර්තන කටයුතු ආරම්භකිරීමට කියන ලදී.*

# සභාවේ පදනම පිහිටුවීම

### මෝර්මන්ගේ පොත එළි දැක්වීම

*මොරෝනායි දේවදූතයාගේ බැහැදැකීම්*

පළවෙනි දර්ශනය ලැබී වසර තුනකට පසුව, 1823 සැප්තැම්බර් 21වෙනි දින සවස් යාමයේ, ජෝසෆ් ස්මිත් ස්වාමීන්වහන්සේට යාච්ඤා-කරමින්, ඔහුගේ තරුණ කාලයේ මෝඩකම් වලට කමාව ඉල්ලමින්, තවදුරටත් මගපෙන්වන ලෙස ඉල්ලීය. ස්වාමීන්වහන්සේ ඊට පිළිතුරු දෙමින් ඔහුට උපදෙස් දීමට ස්වර්ගයෙන් පණිවුඩකරුවෙක් එවූසේක.

"ඔහු මගේ නමින් මා අමතා, ඔහු දේව සම්මුඛයෙන් මා වෙත එවන ලද පණිවුඩකරුවෙක් බවද, ඔහුගේ නම මොරෝනායි බවද; දෙවියන්වහන්සේට මා ලවා කරවාගැනීමට වැඩක් ඇති බවද; මගේ නම සියලු ජාතීන්, වංශයන් සහ භාෂාවන් අතර යහපත සහ නපුරට යොදා ගැනෙන බවද, නැතහොත් සියලු ජනයා අතර යහපත සහ නපුර යන දෙයාකාරයෙන්ම කියවෙන බවද මට කීවේය.

"මෙම මහාද්වීපයේ පෙර විසූවන්ගේ විස්තර සහ ඔවුන් පැවත එන ප්‍රභවයන්ද ඇතුළත්, රන් තහඩු මත ලියැවුන පොතක් තැන්පත්කර ඇති බවත් ඔහු කීවේය. ගැලවුම්කරුවාණන් විසින් පැරණි වැසියන්ට බාරදුන් පරිදිම, සදාකාලික සුභාරංචියේ පූර්ණත්වය එහි ඇතුළත්ව ඇති බවත් ඔහු කීවේය." (බලන්න ජෝස්—ඉ 1:33–34).

මෙම පැරණි වාර්තාවේ ලියූ අවසාන අනාගතවක්තෘවරයා මෝරෝනායි වූ අතර, ස්වාමීන්වහන්සේගේ මගපෙන්වීම අනුව ඔහු එය කුමෝරා කන්-දේ වළදමා ඇත. පැරණි කාලයේ අනාගතවක්තෘවරුන් පාවිච්චිකළ උරිම් සහ තුම්මිද ඔහු වළදැමූ අතර, වාර්තාව පරිවර්තනය කිරීමේදී ජෝසෆ් එය පාවිච්චි කළ යුතු විය.

අසල තිබූ කන්දක් වෙතට ජෝසෆ්ට මග පෙන්වූ දේවදූතයා, පසු-දවස්වලදී ස්වාමීන්වහන්සේගේ කටයුතු ගැන බොහෝ වැදගත් දේවල්ද

ඔහුට කීවේය. ඔහු ජෝසෆ් අමතා, ඔහු තහඩු ලබාගන්නා විට, ස්වාමීන්වහන්සේ ඔහුට අණකරන තුරු, ඒවා කිසි පුද්ගලයෙකුට නොපෙන්විය යුතු බවත් කීවේය. මොරෝනි එම රාත්‍රියේදී තවත් දෙවරක් ජෝසෆ් වෙත නැවත පැමිණි අතර, ඊළඟ දවසේද නැවතත් ආවේය. හැම වතාවේදීම ඔහුගේ වැදගත් පණිවුඩය නැවතත් කියමින්, ඔහු අමතර තොරතුරුද ලබාදුන්නේය.

දේවදූතයාගේ බැහැදැකීමෙන් පසු දින, උපදෙස් දුන් පරිදි ජෝසෆ් කුමෝරා කන්දට ගියේය. මෙම අත්දැකීම ගැන ඔහු මෙසේ කීවේය:

"කන්දේ බටහිර දෙසට වන්නට, මුදුනට මඳක් සමීපව, සාමාන්‍ය ප්‍රමානයේ ගලක් යට, ගල් පෙට්ටියක තහඩු තැන්පත්කර තිබින. මෙම ගල, ගනකමින් යුතුවූ අතර, මැදින් උඩු අතට වටකුරුවී, එහි කොන් තුනීයට තිබූ නිසා, එහි මැද කොටස පොළොවෙන් ඉහළට දර්ශනය විය. නමුත් ගලේ කොන වටේට පස් වලින් වැසී තිබින.

"පස් ඉවත්කිරීමෙන් පසුව, ලිවරයක් ගත් මම, එය ගලේ කොනකට තබා, මඳක් බලය යොදා එය ඉහළට එසවූවෙමි. මම එහි අතුළත බැලූ විට, එහි ඇත්තවශයෙන්ම පණිවුඩකරු විසින් සඳහන්කළ, තහඩුද, උරිම් සහ තුම්මි සහ කවචයද මම දැක්කෙමි." (බලන්න ජෝස්—ඉ. 1:51–52).

මොරෝනායි දේවදූතයා ජෝසෆ්ට ප්‍රකාශවී, තවත් වසරකින් එම වෙලාවටම කන්දට පැමිණ ඔහුව හමුවීමටත්, තහඩු ලබාගැනීමේ කාලය පැමිණෙන තුරු වසරක් පාසා දිගටම එන ලෙසත් ඔහුට කීවේය. හැම බැහැදැකීමකදීම මොරෝනායි වැඩිදුරටත් උපදෙස් දෙමින්, ස්වාමීන්වහන්සේ කිරීමට යන දේවල් ගැනත් උන්වහන්සේගේ රාජ්‍යය මෙහෙයවන අන්දම ගැනත් කීවේය. (බලන්න ජෝස්—ඉ. 1:27–54).

### *පරිවර්තන වැඩකටයුතු*

1827 සැප්තැම්බර් 22වෙනිදා, වසර හතරක සූදානම්වීමෙන් පසුව, අනාගතවක්තෘ ජෝසෆ්ට රන් තහඩු දුන් මොරෝනි, පරිවර්තන කටයුතු ආරම්භකිරීමට කීවේය. කලින් එම වසරේම ජෝසෆ් විවාහවී සිටි, එමා හේල්, එම අවස්ථාවේ ඔහු සමග ගොස්, ඇයගේ ස්වාමිපුරුෂයා තහඩු සමග නැවත එන තුරු කුමෝරා කන්ද පාමුලට වී බලා සිටියාය. ඇය අනාගතවක්තෘවරයාට වැදගත් උපකාරයක්වී, මෝර්මන්ගේ පොතේ එක් ලියන්නෙකු ලෙස කෙටි කාලයක් කටයුතු කළාය.

රන් තහඩු හොරකම්කිරීම සඳහා ප්‍රදේශයේ මැර කණ්ඩායමක් නිරන්තරයෙන්ම බලවත් උත්සාහයක් දැරූ නිසා, ජෝසෆ් සහ එමාට නිව්

යෝර්ක්, මැන්චෙස්ටර් ඔවුන් සිටි නිවසින් පිටවී යාමට බල කෙරිනි. මැන්චෙස්ටර් සිට සැතපුම් 120ක් පමණ දකුණු දිගින් එපිට, හාමනි, පෙනිසිල්වේනියාවේ පිහිටි එමාගේ පියාවූ, අයිසෙක් හේල්ගේ නිවසේ ආරක්ෂාව පැතීමට ඔවුන්ට සිදුවිය. එහිදී ජෝසෆ් තහඩු පරිවර්තනය කිරීම ඇරඹීය. පොහොසත් ගොවියෙකුවූ, ඔහුගේ මිතුරු, මාටින් හැරිස් සමග ඔහු ඉක්මණින්ම එකතුවූ අතර, ඔහුගේ ලියන්නා බවට ඔහු පත්විය.

මාටින් ජෝසෆ් අමතා, පරිවර්තනය කළ කොළ 116ක් රැගෙන ගොස් ඔහුගේ පවුලේ අයට පෙන්වා ඔවුන් කරන වැඩ කටයුතු වල ප්‍රබල තාවය ගැන ඔවුන්ට ඔප්පුකර පෙන්වීමට හැකිදැයි ඇසීය. අවසර පතා ජෝසෆ් ස්වාමීන්වහන්සේගෙන් ඇසීය, නමුත් පිළිතුර වූයේ එපා කියාය. නැවතත් අසන ලෙස මාටින් ජෝසෆ්ට ආයාචනා කළේය, ජෝසෆ් පසුබට වෙමින් දෙවරක්ම ඇසීමේදී, අවසානයේදී අවසර ලැබින. අත් පිටපත් යම් පුද්ගලයන්ට පමණක් පෙන්වීමට මාටින් පොරොන්දු වුවද, ඔහු එම පොරොන්දුව කඩ කළේය, අත් පිටපතේ පිටු සොරකම් කෙරින. මෙම නැතිවීම ජෝසෆ්ට අසහනකාරී දුකක් ගෙන දුන්නෙන්, ස්වාමීන්ව-හන්සේට සේවයකිරීමට ඔහු ගත් සියලු උත්සාහයන් අපතේ ගිය බව ඔහු සිතුවේය. ඔහු හැඬුවේය, "මා කළ යුත්තේ කුමක්ද? මා පව්කර ඇත—දෙවියන්වහන්සේගේ කෝපය ඇවිස්සුවේ මාය. ස්වාමීන්වහන්සේගෙන් මට ලැබුන පළමු පිළිතුරෙන් මා තෘප්තිමත් විය යුතුව තිබින."[1]

ජෝසෆ් අවංකව පසුතැවුනේය, තවද තහඩු සහ උරිම් සහ තුම්මිම් ඉවත්කරගෙන තිබූ කෙටි කාලයකට පසුව, ස්වාමීන්වහන්සේ ඔහුට කමාව දුන් අතර, ඔහු නැවතත් පරිවර්තනය කිරීම ඇරඹීය. නැතිවූ පිටු පරිවර්-තනය නොකරන ලෙස ස්වාමීන්වහන්සේ ඔහුට උපදෙස් දුන්සේක. එහි ඇතුළත්ව තිබුනේ ලෞකික ඉතිහාසයයි. ඒ වෙනුවට අනාගතවක්තෘ නිෆායි පිළියෙල කර තිබූ, එම කාල සීමාවටම අයත් වන නමුත්, ක්‍රිස්-තුස්වහන්සේගේ වඩාත් ශ්‍රේෂ්ඨ අනාවැකි සහ වෙනත් පූජනීය ලියවිලි ඇතුළත් අනෙක් තහඩු ජෝසෆ් පරිවර්තනය කළ යුතු විය. පිටු 116ක නැතිවීම ගැන ස්වාමීන්වහන්සේ කලින් දැක තිබූ අතර, දෙවන ඉති-හාසය සකස්කිරීමට නිෆායි පෙළඹවූසේක. (බලන්න 1 නිෆායි 9; ඩීසහගී 10:38–45; තවද බලන්න ඩීසහගී 3 සහ 10, ඒවා ලැබුනේ මෙම කාලය තුළදීය).

මේ කාලයේදී, ඔලිවර් කව්ඩරිගේ උපකාරය ලැබීමට ජෝසෆ් ආශිර්වා-දිත විය, තරුණ පාසල් ගුරුවරයෙකුවූ ඔහුව, ස්වාමීන්වහන්සේ විසින් අනාගතවක්තෘවරායගේ නිවසට මග පෙන්වනු ලැබීය. ඔලිවර් ලිවීමට

පටන්ගත්තේ 1829 අප්‍රේල් 7වෙනිදාය. එම බාරදුර කාලය ගැන ඔහු මෙසේ කීවේය, "මේවා කිසිදා අමතක නොකළ යුතු දවස්ය—මෙම පපුවෙන් එන අති මහත් කෘතඥතාවයෙන් පිබිදීමක් ලබමින්, ස්වර්ගයේ ආනුභාවයෙන් කියවෙන හඬක් යට හිඳගෙන සිටියෙමි!" (බලන්න ජෝස්—ඉ. 1:71, පාදසටහන්).

ඔලිවර් කව්ඩරි තව දුරටත් මෙසේ ප්‍රකාශ කළේය. "එම පොත සත්‍යයකි.... අනාගතවක්තෘවරයාගේ තොල්වලින් වැටෙන පරිදි එය මා විසින්ම ලියන ලදී. එහි සදාකාලික සුභාරංචිය ඇතුලත්වන අතර, යොහාන්ගේ එළිදරව් ඉටුවීමක් ලෙස එන්නේය, එහි කියවෙන්නේ දේවදූතයෙක් සදාකාලික සුභාරංචිය ඇතිව සෑම ජාතියකටම, භාෂාවකටම සහ ජනතාවකටම දේශනාකිරීමට එන බවකි. එහි ගැලවීමේ මූලධර්ම ඇතුලත්වේ. ඔබ එහි ආලෝකයෙන් ජීවත්වී, එහි ශික්ෂාවන්ට කීකරු වන්නේ නම්, දෙවියන්වහන්සේගේ සදාකාලික රාජ්‍යයේ ඔබ ගැලවීම ලබාගන්නේය."[2]

ඔවුන් වැඩ කටයුතු කරන අතර, වාර්තාව පරිවර්තනය කිරීම සඳහා ඔවුන්ගේ කැපවීම නිසා ඔවුන්ට ආහාර හෝ මුදල් හෝ නැතිවී ගියබව ජෝසෆ්ට සහ ඔලිවර්ට පෙනින; ඔවුන්ට ලිවීමට කඩදාසි පවා හිඟව තිබින. ඔවුන්ගේ අසරණකම දැන ගත්, ජෝසෆ් නයිට් ජ්‍යෙ., අනාගතවක්තෘවරයාගේ කලින් සිටි සේවකයෙක් සහ මිතුරෙක්, ඔවුන්ට සහයෝගය දීමට අධිෂ්ඨාන කළේය. මෙම කාලෝචිත ආධාරයේ ස්වභාවය ගැන ඔහු මෙසේ විස්තර කළේය:

"මම මැකරල් මාළු බැරල් එකක් සහ ඉරි ගැසූ ලියන කඩදාසි ටිකකුත් මිළදී ගතිමි....මම කඩල බුසල් නමයක් හෝ දහයක් සහ අල [අර්තාපල්] පහක් හෝ හයක් පමණද මිළදී ගතිමි." ඔහු ඉන්පසුව හාමනිවල විසූ මිනිසුන් දෙදෙනා බැහැදැකීම ගැන මෙසේ සිහිපත් කරයි, "ජෝසෆ් සහ ඔලිවර් ආහාර සඳහා වැඩකිරීමට හැකි තැනක් සොයා බැලීමට ගොස් තිබින නමුත් ස්ථානයක් සොයාගැනීමට නොලැබින. ඔවුන් නැවත නිවසට එන විට බඩුත් සමග සිටි මා හමුවිය. ආහාර කිසිවක් නොතිබුන නිසා ඔවුහු සතුටට පත්වූහ....ඉන්පසු ඔවුහු වැඩ කටයුතු කිරීමට ගිය අතර, පරිවර්තන කටයුතු නිමවන තුරු ප්‍රමාණවත් ආහාර ඔවුන්ට තිබින."[3]

අනාගතවක්තෘ ජෝසෆ් මෙම මිනිසා ගැන මෙසේ ප්‍රකාශකිරීමේ යම් පුදුමයක් තිබේද: "සයෝනයේ පුත්‍රයන් මගින්, ඔවුන්ගෙන් එක් කෙනෙකු හෝ ඉතිරිව සිටීනම්, මෙම මිනිසා ඉශ්‍රායලයේ ධර්මිෂ්ඨ මිනිසෙක් යයි

ඔහු ගැන කියවෙන්නේය; එමනිසා ඔහුගේ නාමය කිසිදා අමතක නොවිය යුත්තේය."[4]

වැඩිවන හිරිහැර නිසා, ජෝසෆ් සහ ඔලිවර් හාමනිවලින් පිටවී 1829 ජූනි කාලය තුලදී නිව්යෝර්ක්, ෆෙයට්වල පිහිටි පීටර් විට්මර්ගේ ගොවි-පළේදී පරිවර්තන වැඩ නිම කළහ. එවන් හිරිහැර තත්වයන් මධ්‍යයයේ මෙම වැඩ කටයුතු සම්පූර්ණකිරීම සත්‍ය ලෙසම නූතන-කාලයේ ආශ්චර්යයකි. මඳ මූලික අධ්‍යාපනයක් සහිතව, ජෝසෆ් ස්මිත් මාස දෙ-කකට මඳක් වැඩි පූර්ණ වැඩකරන කාලයක් තුලදී පරිවර්තන කටයුතු ලියාගැනීමේදී, වැරදි තිබුන් බොහෝ සුළු ප්‍රමාණයකි. එදා ඔහු පරිවර්-තනය කළ පරිදිම අදද පොත අත්‍යාවශ්‍යව පවතින අතර, එය ලෝකය මුළුල්ලේම කෝටි සංඛ්‍යාත ජනතාවක් සඳහා සාක්ෂියේ මූලාශ්‍රයක්වී ඇත. ජෝසෆ් ස්මිත් ස්වාමීන්වහන්සේගේ හස්තවල මෙවලමක්වී, පසු-දවස්වල ශුද්ධවන්තයන්ට ආශිර්වාදයක් ලබාදීමට පැරණි අනාගතවක්තෘවරුන්ගේ වචන ඉදිරියට ගෙන ආවේය.

*මෝර්මන්ගේ පොතේ සාක්ෂිකරුවෝ*

අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් ෆෙයට්වල සිටියදී, ඔලිවර් කව්ඩරි, ඩේවිඩ් විට්මර් සහ මාටින් හැරිස් විශේෂ සාක්ෂි කරුවන් ලෙස රන් තහඩු බැලීමට ඔවුන්ට අවසර දිය යුතු බව ස්වාමීන්වහන්සේ එලිදරව් කළසේක (බලන්න 2 නිෆායි 27:12; ඊතර් 5:2–4; බලන්න ධීසහගී 17). ඔවුහු, ජෝසෆ් ස්මිත් සමග මෙම පැරණි වාර්තාවේ මූලාරම්භය සහ සත්‍යය ගැන සාක්ෂි දැරීමට හැකියාව ලබා ගත්හ.

ඩේවිඩ් විට්මර් මෙසේ පැහැදීළි කළේය, "අපි අසල තිබූ, කැලයකට ගොස්, කොටයක් මත වාඩිවී මඳ වෙලාවක් කථා කරමින් සිටියෙමු. ඉන්-පසු අපි දණ ගසා යාච්ඤා කළෙමු. ජෝසෆ් යාච්ඤා කළේය. ඉන්පසු අපි නැගිට කොටස මත වාඩිවී කථාකරමින් සිටින විට, එක් වරටම අපට ඉහළින් ආලෝකයක් පැමිණ අප වටා මඳ දුරකින් කැරකුනේය; තවද දේවදූතයෙක් අප ඉදිරියේ සිටගත්තේය," මෙම දේවදූතයා මොරෝනායි විය. ඩේවිඩ් කී ලෙස ඔහු "සුදු ඇඳුමෙන් සැරසී සිටියේය, ඔහු මගේ නමින් මා අමතා කථා කර, 'පණිත් තබන්නා ආශිර්වාද ලද්දෙකි' යයි කීවේය. අප ඉදිරියේ මේසයක් තිබූ අතර ඒ මත වාර්තා තබා තිබුනි. මෝර්මන්ගේ පොත පරිවර්තනය කළ, නිෆායිගේ වාර්තා, පිත්තල තහඩු, මග පෙන්වන බෝලය, ලාබන්ගේ කඩුව සහ අනෙක් තහඩුය."[5] මිනිසුන් මේ දේවල් බලමින් සිටින අතර, කථා කරන හඬක් ඔවුන්ට ඇසිනි.

"මෙම තහඩු දෙවියන්වහන්සේ විසින් එළිදරව් කළ ඒවා වන අතර, දෙවියන්වහන්සේගේ බලයෙන් ඒවා පරිවර්තනය කර ඇත. ඔබ දැක ඇති ඒවායෙහි පරිවර්තනය නිවැරදිය, ඔබ දැන් දකින සහ අසන දේවලට සාක්ෂි දැරීමට මම ඔබට අණකරමි."[6]

මෙම සිදුවීමෙන් පසුව ඉක්මණින්ම, අමතර සාක්ෂිකරුවන් අට දෙනාට ජෝසෆ් ස්මිත් තහඩු පෙන්වීය. ඔවුහු නිව් යෝර්ක් මැන්චෙස්ටර්හි ස්මිත් පවුලේ නිවස අසල හුදකලා ස්ථානයකදී ඒවා අතගා බැලූහ. මෙම කණ්ඩායම් දෙකේම සාක්ෂි මෝර්මන්ගේ පොතේ මුල් පිටුවල වාර්තාකර ඇත.

*මෝර්මන්ගේ පොතෙන් දේශනාකිරීම*

පරිවර්තන කටයුතු සම්පූර්ණවූ විට, මෝර්මන්ගේ පොත මුද්‍රණයකිරීමට අනාගතවක්තෘවරයා පැල්මයිරාවල එග්බර්ට බී. ග්‍රැන්ඩින් සමග කටයුතු පිළියෙල කළේය. මාටින් හැරිස් ග්‍රැන්ඩින් මහතා සමග පොතේ පිටපත් 5,000ක් මුද්‍රණයකිරීමට අවශ්‍යවූ ඩොලර් 3,000 සඳහා උකස් එකඟතාවයකට ඇතුල්විය.

මෝර්මන්ගේ පොතේ ප්‍රථම පිටපත් 1830 මාර්තු 26වෙනි දින ග්‍රැන්ඩින් පොත් සාප්පුවේදී මහජනතාවට ලබාගත හැකිවිය. අළුත මුද්‍රණයවූ පිටපත් පාවිච්චි කළ මුල් කාලීන ධර්මදූතයන් අතර සැමුවෙල් ස්මිත්ද විය. 1830 අප්‍රේල් මාසයේදී, ඔහු නිව් යෝර්ක් නගරයේ, මෙන්ඩන් නියම් ගමේ ටොම්ලින්සන් නම් භෝජනාගාරයට ගියේය. එහිදී ඔහු ෆිනිහාස් යන්ග් නම් තරුණ මිනිසෙක්වූ, බ්‍රිගම් යන්ගේ සොහොයුරාට පිටපතක් විකුණුවේය.

ජූනි මාසයේදී ඔහු නැවතත් යමින්, මෙවර මෝර්මන්ගේ පොතේ පිටපතක් නිව් යෝර්ක්, බුලූම්ෆීල්ඩ් ජෝන් පී. ග්‍රීන්ගේ නිවසේ තැබීය. ජෝන් විවාහවී සිටියේ රෝඩා යන්ග් නම්, බ්‍රිගම් යන්ගේ සොහොයුරිය සමගය. ජෝන් යන්ග්, බ්‍රිගම්ගේ පියා, ඊළඟට පොත ගැන දැනගෙන, එය නිවසට ගෙන ගොස්, එය සම්පූර්ණයෙන්ම කියවීය. "එය ශ්‍රේෂ්ඨතම පොතක් බවත්, ඔහු දැක තිබෙන, බයිබලයේ පිළි නොගැනෙන, වැරදි වලින් තොර එකක් බවත් කීවේය."[7]

1830 වසන්ත කාලයේ සිට පවුලේ සාමාජිකයන් සහ ධර්මදූතයන් විසින් පොතේ කරුණුවලට බ්‍රිගම් යන්ග් යොමු කළ නමුත්, එය සම්පූර්ණයෙන්ම සොයාබැලීමට ඔහුට අවශ්‍යවිය. ඔහු මෙසේ සඳහන් කළේයඃ "පොත පිළිගැනීමට මගේ සිත හදාගැනීමට පෙර වසර දෙකක කාලයක්


එම කාරණය මම අධ්‍යනය කරමින් පරීක්ෂා කළෙමි. එය සත්‍ය බව මම දැනගතිමි, එසේම මගේ ඇස්වලින් මට දැක ගැනීමටත්, නැතහොත් මගේ ඇඟිලිවලින් අතගා බැලීමටත්, හෝ මගේ ශරීරයට යමක් තිබෙන බව හැඟීමටත් මට හැකිවිය. මෙසේ සිදු නොවුනි නම්, අද දක්වා මම එය වැළඳ නොගැනීමට ඉඩ තිබින....සියලු දේවල් මටම ඔප්පුකිරීමට එම කාලය ප්‍රමාණවත් බව මම සිතමි."[8]

බ්‍රිගම් යන්ග් 1832 අප්‍රේල් 14වෙනි දින බව්තීස්ම විය. ඔහුගේ බව්තීස්මය සහ ස්ථිරවීමෙන් පසුව, ඔහු මෙසේ මතක් කළේය, "ගැලවුම්කරුවාණන්ගේ වචන වලට අනුව, මට නිහතමානී, ළමයෙක් වැනි ආකල්පයක් හැඟී, මගේ පව්වලට කමාව දුන් බවට සාක්ෂියක් මට ලැබින."[9] පසුව ඔහු ප්‍රේරිතවරයෙකු බවටත්, අවසානයේදී සභාවේ දෙවෙනි සභාපතිවරයා බවටත් පත්විය.

## ආරෝනික සහ මෙල්කිසදෙක් පූජකවරය නැවත පිහිටුවීම

මොරෝනායි දේවදූතයා 1823දී කුමෝරා කන්ද උඩදී පළමු වරට ජෝසෆ් ස්මිත්ව හමුවූ විට, පූජකවරයේ අධිකාරී බලය පොළොවේ නැවත පිහිටුවීම ගැන වැදගත් උපදෙස් දෙමින්, පහත සඳහන් ප්‍රකාශයද ඊට ඇතුළත් කළේයඃ "[රන් තහඩු] පරිවර්තනය කළ විට *ස්වාමීන්වහන්සේ ශුද්ධවූ පූජකවරය කිහිප දෙනෙකුට දෙනසේක.* ඔවුන් මෙම සුභාරංචිය ප්‍රකාශකරමින්, වතුරෙන් බව්තීස්මකරීම ආරම්භකරනු ලබන්නේය. ඉන්පසුව ඔවුන්ගේ අත් තැබීම මගින් ශුද්ධාත්මයාණන් වහන්සේ ලබාදීමට ඔවුන්ට බලය ලැබෙන්නේය."[10]

1829 වසන්ත කාලයේදී, දේවදූතයාගේ වචනවලින් කොටසක් ඉටුවීමකට ජෝසෆ් සහභාගිවිය. ඔහු සහ ඔලිවර් කව්ඩරි මෝර්මන්ගේ පොත පරිවර්තනය කිරීමේදී, පව් කමාව සඳහා බව්තීස්මය ගැන සඳහන්කර තිබීම ඔවුන්ට හමුවිය. මැයි 15වෙනිදා ඔවුහු මෙම මාතෘකාව ගැන යාච්ඤාව තුලින් ස්වාමීන් වහන්සේගෙන් තවදුරටත් දැනගැනීම සෙවූහ. සස්කුහෙන්නා ගංගා ඉවුර මතදී ඔවුන්ගේ ආයාචනය පුදකරන විට, ස්වර්ගික පණිවුඩකරුවෙක් මිනිසුන් දෙදෙනාට ප්‍රකාශවිය. ඔහු තමාව හඳුන්වා දුන්නේ අලුත් ගිවිසුමේ යොහාන් බව්තීස්ත ලෙසිනි. ඔහු තම හස්තයන් ජෝසෆ් සහ ඔලිවර් මත තබමින් මෙසේ කීවේය, "මගේ සහෝදර සේවකයන්වූ නුඹලා මත, මෙසියස්වහන්සේගේ නාමයෙන් මම ආරෝනික පූජකවරය දානය කරමි, එය දේවදූතයන් මෙහෙකිරීමේද, පසුතැවීමේ



පේත්‍රුස්, යාකොබ් සහ යොහාන් ජෝසෆ් ස්මිත්ට සහ ඔලිවර් කව්ඩරිට
ප්‍රකාශවී ඔවුන් මත මෙල්කිසදෙක් පූජකවරය දානය කළහ.

සුභාරංචියේ සහ පව් කමාව සඳහා ගිල්වීමේ බව්තීස්මයේද යතුරු උසුලන්නේය" (බලන්න ධීසහසී 13:1).

මෙම දානයකිරීමෙන් පසුව, ජෝසෆ් සහ ඔලිවර් කව්ඩරි යොහාන් බව්තීස්ත විසින් අණකළ පරිදි එකිනෙකා බව්තීස්ම කර එකිනෙකාව ආරෝනික පූජකවරයට පත්කරන ලදී. යොහාන් ඔවුන් අමතා, "මෙම ආරෝනික පූජකවරයට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාව සඳහා අත් තැබීමේ බලය නොමැති නමුත්, මෙයින් පසුව මෙය අප මත දානය කළ යුතු බවත් කීවේය." තවද ඔහු මෙසේද කීවේය, එනම් "පේත්‍රුස්, යාකොබ් සහ යොහාන්ගේ මග පෙන්වීම අනුව ඔහු ක්‍රියාකල බවත්, ඔවුන් මෙල්කිසදෙක් පූජකවරයේ යතුරු උසුලන බවත්, එම පූජකවරය යථා කාලයේදී අප මත දානය කරන බවත් ඔහු කීවේය." (බලන්න ජෝස්—ඉ: 1:70, 72; තවද බලන්න 1:68–72).

මෙම අත්දැකීම ගැන අනාගතවක්තෘවරයා මෙසේ කීවේය: "අප බව්තීස්මවීමෙන් පසුව වතුරෙන් අප උඩට ආ විගසම, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගෙන් අපි ශ්‍රේෂ්ඨ සහ මහිමාන්විත ආශිර්වාද අත්දුටු- වෙමු. මා ඔලිවර් කව්ඩරි බව්තීස්ම කිරීමෙන් විගසම වාගේ, ශුද්ධාත්මයා- ණන්වහන්සේ ඔහු මත වැටීමට අමතරව, ඔහු කෙළින් සිටගෙන ලඟදීම සිදුවීමට යන බොහෝ දේවල් ගැන අනාවැකි කීවේය. තවද නැවතත්,, ඔහු විසින් මාව බව්තීස්ම කිරීමෙන් විගසම වාගේ, මටද අනාවැකි ආත්මය ලැබින. කෙළින් සිටගත් පසුව, මෙම සභාවේ නැගීම සම්බන්ධව සහ සභාවට සම්බන්ධ වෙනත් බොහෝ දේවල් සහ මෙම පරම්පරාවේ ලමයින් සහ මිනිසුන් ගැනද අනාවැකි කීවෙමි. අපි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී සිටි අතර, අපගේ ගැලවීමේ දෙවියන්වහන්සේ තුල ප්‍රීති වුනෙමු." (බලන්න ජෝස්—ඉ. 1:73).

පසුව, පේත්‍රුස්, යාකොබ් සහ යොහාන් ජෝසෆ් ස්මිත් සහ ඔලිවර් කව්ඩරිට ප්‍රකාශවී, ඔවුන් මත මෙල්කිසදෙක් පූජකවරය දානය කළහ. ඔවුහු රාජ්‍යයේ යතුරුද ඔවුන් මත දානය කළහ (බලන්න ධීසහසී 27:12–13; 128:20). මෙල්කිසදෙක් පූජකවරය යනු පොළොව මත මිනි- සුන්ට දී තිබෙන ඉහළම අධිකාරී බලයයි. මෙම අධිකාරී බලය සහිතව, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ට මෙම කාල පරිච්ඡේදයේදී යේසුස් ක්‍රිස්- තුස්වහන්සේගේ සභාව සංවිධානය කිරීමට සහ අද දවසේ සභාව දන්නා විවිධ පූජකවරයේ ගණපූර්ණද පිහිටුවීමට හැකිවිය.

**සභාව සංවිධානය කිරීම**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව මෙම කාල පරිච්ඡේදයේදී සංවිධානය කිරීමේ දවස 1830 අප්‍රේල් 6වෙනිදා බව ස්වාමීන්වහන්සේ ජෝසෆ් ස්මිත්ට එළිදරව් කළසේක (බලන්න ධීසහගී 20:1). ඇදහිලිමතුන්ට සහ මිතුරන්ට දැන්වීම් යැවූ අතර මිනිසුන් සහ කාන්තාවන් 56 දෙනෙක් පමණ නිව්යෝර්ක්, ෆෙයට්වල පීටර් විට්මර් කණි. දැව නිවසට එක් රැස්වූහ. සංවිධානයට සහායවීම සඳහා අනාගතවක්තෘවරයා විසින් මිනිසුන් හය දෙනෙක්, තෝරාගන්නා ලදී. එය "අපගේ රටේ නීතිවලට එකඟව සහ දෙවියන්වහන්සේගේ කැමැත්ත සහ පණත්වලට අනුව සිදුවිය" (ධීසහගී 20:1).

අනාගතවක්තෘවරයා මෙසේ වාර්තාකර තැබීය: "අපගේ ස්වර්ගික පියාණන්වහන්සේට ගරුගම්භීර යාච්ඤාවක් මගින් රැස්වීම ආරම්භ කරමින්, කලින් දුන් පණතට අනුව අපි ඉදිරියට ගියෙමු, එනම් අපගේ සහෝදර සහෝදරියන්ට කථා කර, දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුල කරුණු වලදී ගුරුවරුන් ලෙස ඔවුන් අපව පිළිගන්නේද, අපට ලැබුනු කලින් කී පණතට අනුව අපි ඉදිරියට යමින් සභාව සංවිධානය කිරීම ගැන ඔවුන් තෘප්තිමත් වන්නේද කියා ඇසුවෙමු. මෙම යෝජනා කිහි-පයට ඔවුහු ඒකමතිකව කැමැත්ත දුන්හ."[11]

පැමිණ සිටි අයගේ කැමැත්ත මත. ස්වාමීන්වහන්සේ විසින් ඔවුන්ට මග පෙන්වූ ලෙස, ජෝසෆ් ඔලිවර්ව සභාවේ වැඩිමහල්ලෙකු ලෙස පත්කළ අතර, ඔලිවර් අනාගතවක්තෘවරයාව වැඩිමහල්ලෙකු ලෙස පත් කළේය. පැමිණ සිටි සාමාජිකයන්ට සක්‍රමේන්තුව ආශිර්වාද කොට බෙදා දෙන ලදී. බව්තීස්මවූ අය ස්ථිර කොට ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාදෙන ලදී. අනාගතවක්තෘවරයා මෙසේ කීවේය, "ශුද්ධාත්මයාණන්ව-හන්සේ විශාල ප්‍රමාණයකින් අප මත වැගිරින—අප සියල්ලෝ ස්වාමීන්ව-හන්සේට ප්‍රශංසා කරමින් අධික ලෙස සතුටුවූ අතර, සමහරු අනාවැකි කීවෝය."[12] මෙම රැස්වීම අතරතුර, ජෝසෆ්ට එළිදරව්වක් ලැබුන අතර, එහි සඳහන්වූ උපදෙස් අනුව අනාගතවක්තෘවරයාගේ වචන, ස්වාමීන්ව-හන්සේ වෙතින්ම එන ලෙස සලකා සභාව ඒවාට ඇහුම්කන් දිය යුතු-බවය (බලන්න ධීසහගී 21:4–6).

1830දී එම රැස්වීමේදී තිබුනු මූලික කරුණු අද සභාව තුලද දිගටම පැවැත්වේ: පොදු කැමැත්තේ නීතිය ක්‍රියාත්මක කිරීම, ගායනා කිරීම, යාච්ඤා කිරීම, සක්‍රමේන්තුව භුක්තිවිඳීම, පුද්ගලික සාක්ෂි බෙදාගැනීම,

අත් තැබීම මගින් ශුද්ධාත්මයාණන් වහන්සේ දානය කිරීම, නියම කිරීම්, පුද්ගලික එළිදරව්, සහ පුජක නිළධාරීන් තුලින් එන එළිදරව් යනාදියයි.

ජෝසෆ් ස්මිත් ජ්‍යෙ., අනාගතවක්තෘවරයාගේ පියා, බව්තීස්මවන දිනයේ සිදුවුන එක් සංවේදී සිද්ධියක් ජෝසෆ්ගේ මව, ලුසී මැක් ස්මිත්, වාර්තාකළාය: "ස්මිත් මහතා වතුරෙන් පිටතට එන විට ඉවුර මත සිට-ගෙන සිටි ජෝසෆ්, තම පියාගේ අතින් අල්ලාගෙන, සතුටු කඳුලින් යුතුව මෙසේ ප්‍රකාශ කළේය, 'මගේ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා! මා ජීවත්ව සිටියදීම මගේම පියා යේසුස් ක්‍රිතුස්වහන්සේගේ සත්‍ය සභාවට බව්තීස්මවීම දැකීමට මට හැකිවුනා!'"[13] ජෝසෆ් නයිට් ජ්‍යෙ., එම මොහොත ගැන මෙසේ කීවේය: "[අනාගතවක්තෘවරයා] අති මහත් ලෙස ආත්මයාණන්ගෙන් පිරී ගොස් සිටියේය....ඔහු මහත් සතුටින් සිටි බව පෙනීමට තිබුනි. ඔහු ආරම්භකළ ශ්‍රේෂ්ඨ වැඩ කටයුතු දුටු ඔහු ඒවා ඉදිරියට ගෙන යාමට ඔහු ආශාවෙන් සිටි බව මම සිතමි."[14]

පියා සහ පුතා අතර ශක්තිමත් බැඳීමක් තිබ්න. තම පියාට ප්‍රශං-සාත්මකව පසු අවස්ථාවකදී අනාගතවක්තෘවරයා මෙසේ කීවේය, "මගේ පියාට සහ ඔහුගේ මතකයට මම ප්‍රේම කරමි; ඔහුගේ උදාර ක්‍රියාවල මතකය මගේ සිතේ නිතරම ඇති අතර, දෙමාපියෙක් ලෙස ඔහු මට පැවසූ බොහෝ කාරුණික වචන මගේ හදවතේ ලියවී ඇත."[15]

අනාගතවක්තෘවරයා සහ ඔහුගේ පියා අතර තිබූ ප්‍රේමය ජෝසෆ් ස්මිත් ජ්‍යෙ., විසින් ඔහුගේ පියාවූ, අසේල් ස්මිත්ට ප්‍රකාශ විය. 1830 අගෝස්තු මාසයේදී, ජෝසෆ් ස්මිත් ජ්‍යෙ.,මෝර්මන්ගේ පොතේ පිටපත් කිහිපයක් රැගෙන නිව් යොර්ක් ඊශාන දිග ශාන්ත ලෝරන්ස් ප්‍රාන්තයේ සිටි ඔහුගේ පියා සහ මව සහ සොහොයුරු සොහොයුරියන්ට දීමට ගියේය. අසේල් ස්මිත් 1830 ඔක්තෝබර් ඔහු මියයාමට පෙර, මුළු පොතම කියවා, ඔහුගේ පවුලට පැමිණෙන බව බොහෝ කාලයකට පෙර සිටම ඔහු දැන සිටි එම අනාගතවක්තෘවරයා ඔහුගේ මුනුපුරා, ජෝසෆ් ස්මිත් කණි., බව කීවේය."[16] අසේල්ගේ තවත් පුතුන් තුන් දෙනෙක්—සිලාස්, ජෝන් සහ අසේල් කණි., අවසානයේදී සභාවට බැඳුනෝය. තම ඥාති පවුලේ සියල්ලෝම සහ ඔහුගේ පියාගේ පවුලේ බොහෝ දෙනෙක්ද බව්තීස්ම ජලයේ ගිලෙනු දැකීමට අනාගතවක්තෘවරයාට වරප්‍රසාදයක් ලැබුනි.

සිඩ්නි රිග්ඩන්, පසුව පළවෙනි සභාපතිත්වයේ සමාජිකයෙක් බවට පත්වූ ඔහු, සභාවේ නිහතමානී ආරම්භය සහ අනාගතය ගැන සංවිධාය-කයන්ට ඒකාලයේම තිබූ විශිෂ්ඨ දර්ශනයද ගැන කථාකළේය: "මම ක්‍රිස්-තුස්වහන්සේගේ සභාවේ සියලු දෙනාම නි.යෝ. වෝටර්ලූ අසල අඩි 20ක

පමණ ප්‍රමාණයේ පැරණි කුඩා දැව ගෘහයක් තුලදී හමුවීමි. එහිදී අපි දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන කථාකිරීමට පටන් ගත්තේ, ලෝකය අපගේ අණසකට යටත්ව තිබූ පරිදිය; අපට බොහෝ ජනතාවක් නොසිටියද,...අපි දැඩි විශ්වාසයක් ඇතිව කථා කළෙමු;...දෙවියන්වහන්සේගේ සභාව දහස් වාරයක් විශාලව තිබෙනු දර්ශන තුලින් අපි දුටුවෙමු;...අනාගතවක්තෘවරුන්ගේ සාක්ෂිය ගැන ලෝකයා සම්පූර්ණ අවිද්‍යාවක සිටි අතර, දෙවියන්වහන්සේ කිරීමට යන දෙය ගැන අවබෝධයක්ද නොමැතිව සිටියහ."[17]

1830 අප්‍රේල් 6වෙනිදා බටහිර නිව්යෝර්ක්හි එළිදරව්වූ සිද්ධීන් වලින් කෝටි ගණන් ජනතාවකගේ ජීවිත වෙනස්කර ඇත. කුඩා දැව නිවසක සිටි අතලොස්සක්වූ හැරී ආ අයගෙන්, සුභාරංචිය ලෝකය මුළුල්ලේම විහිදී ගොස් ඇත. දැන් සභාව බොහෝ දේශවල පිහිටුවා ඇත. බොහෝ විට ඒවාද ෆෙයට්වල තිබූ මූලික සංවිධානය මෙන් නිහතමානී වටපිටාවකින් යුතුවය. ලොව වටා සිටින ශුද්ධවන්තයෝ ගැලවුම්කරුවාණන්ගේ පොරොන්දුව නිසා සතුටින් සහ සැනසිල්ලෙන් සිටිති." මාගේ නාමයෙන් දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් යම් ස්ථානයක එකතුව සිටීද,...බලව, එතැන මාද ඔවුන් මධ්‍යයේ සිටිමි" (බලන්න ධීසහගී 6:32).

## "ඔහියෝ නගරයට යන්න": පසු-දවස්වල ඉශ්‍රායෙල් එකතුකිරීම

### *කෝල්ස්විලීවල හිරිහැර*

සභාව සංවිධානය කළ මාසය තුලදීම, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් ඔහුගේ මිතුරන්ට ඉගැන්වීමට දූතමෙහෙයකට ගියේය. ජෝසෆ් නයිට්ගේ ජ්‍යෙ., පවුල, පදිංචිව සිටියේ කෝල්ස්විලී, නිව්යෝර්ක් නගරයේය. ජූනි 28වෙනිදා නයිට් පවුලේ සාමාජිකයන් සහ මිතුරන් කිහිප දෙනෙක් බව්තීස්ම ගිවිසුම් තැබීමට සූදානමින් සිටියහ.

කෝල්ස්විලීහිදී සුභාරංචිය දේශනාකිරීම ගැන තදබල විරුද්ධත්වයක් තිබූන අතර, ජලය නවතාගැනීම සඳහා සොහොයුරන් ගොඩනගා තිබූන වේල්ල කඩා දමා බව්තීස්ම නතරකිරීමට දාමරික කණ්ඩායමක් උත්සාහ දැරීය. කෙසේ වෙතත් මෙය අළුත්වැඩියා කෙරින. ආගමට විරුද්ධ අය කළ දේවල් ගැන ජෝසෆ් නයිට් ජ්‍යෙ., විස්තර කළේය: "අපි [බව්තීස්මවී] යන විට, අපගේ අසල්වැසියන් බොහෝ දෙනෙක් අපට හමුවී, අප දෙසට ඇඟිල්ල දිගු කොට අපි බැටළුවන් නැව්වේදැයි ඇසුහ....එදින රාත්‍රී අපගේ කරත්ත අනෙක් පැත්ත හරවා ඒවා උඩ දර පටවා තිබූන අතර, සමහර ඒවා වතුරේ ගිල්වා තිබින. දර කොටන් අපගේ දොරවල්වල

ගොඩ ගසා තිබින. යකඩ දම්වැල් ඇලවල් වල දමා, වැරදි වැඩ බොහොමයක් කර තිබින."[18]

මෙම කාලයේදීම වාගේ, විරුද්ධව සිටි අය අනාගතවක්තෘවරයාව සිරගත කොට සාමය කඩකිරීම ගැන චෝදනාවකට හසුකර ඔහුගේ සිත වෙනතකට යොමුකිරීම සඳහා උත්සාහ කළහ. කෙසේ වෙතත්, ජෝසෆ් නයිට් ජ්‍යෙ., නීතිඥයන් යෙදවීමෙන්, ඔවුහු ඉක්මණින්ම ජෝසෆ්ව සියලුම චෝදනාවලින් නිදහස්කර ගත්හ.

සභාව විසින් වැදගත් පියවරවල් ගන්නා හැම විටකම, දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය නැවැත්වීමට සතුරෝ තදබල උත්සාහයන් ගත්හ. නමුත් දෙවියන්වහන්සේගේ භක්තිමත් ශුද්ධවන්තයෝ ප්‍රශ්න ජයගෙන ශක්තිමත්ව වැඩී, කෝල්ස්විලී ශුද්ධවන්තයන් කලාක් මෙන්, ඔවුන්ද ශක්තිමත් එක්සත් ශාඛාවක් මෙන් එකට බැඳී සිටියහ.

### *ඉන්දියානුවන් වෙත ධර්මදූතයන්*

1830 සැප්තැම්බර් සහ ඔක්තෝබර් වලදී, තරුණ මිනිසුන් හතරදෙනෙක් එළිදරව් මගින් කැඳවා, සුභාරංචිය සහ මෝර්මන්ගේ පොතේ පණිවුඩය, මෝර්මන්ගේ පොතේ ජනාවගෙන් පැවතෙන්නන් වන ඉන්දියානුවන් වෙත ගෙනයාමට කටයුතු කළහ. ධර්මදූතයන් වූයේ, ඔලිවර් කව්ඩරි, පීටර් විට්මර් කණි., සහ පාර්ලි පී ප්‍රැට් සහ සීබා පීටර්සන්ය (බලන්න ධීසහගී 28:8; 30:5–6; 32). ඔවුහු සැතපුම් සිය ගණන් ඉතා අපහසුකරී තත්වයන් යටතේ ගමන්කර, නිව් යෝර්ක්, බෆලෝ නගරය අසල කැටරෝගස් ඔහියෝවල වයින්ඩොස්, සහ අවසන් ලෙස මිසූරි ප්‍රාන්තයේ බටහිර ජීවත්වූ ඩෙලවෙයාර් ජනතාවට දේශනාකිරීමට සමත්වූහ. නමුත් ඔවුන්ට විශාල සාර්ථකත්වයක් ලැබුනේ කර්ට්ලන්ඩ් ඔහයියෝ සහ ඒ අසල ජනපද වාසීන්ගෙන් වන අතර, එහිදී ඔවුහු මිනිසුන් 127දෙනෙක් හරවා ගත්හ. ධර්මදූතයන් පිටව ගිය පසු, ඔහයියෝවල සිටි ශුද්ධවන්තයන් කිහිප දෙනෙක් එම සාමජිකයන් හරවාගැනීම තුලින් මග හැරුනු තවත් සිය ගණනක් වෙතට ලඟාවූහ.

### *ඔහයියෝ නගරයේ එකතුවීමට කැඳවීම*

කලින් සිටි දේශකයෙක්වූ සහ කර්ට්ලන්ඩ් ප්‍රදේශයේ සාමාජිකයෙක්වූ සිඩ්නි රිග්ඩන්, සහ සාමාජික නොවන මිතුරෙක් වන එඩ්වඩ් පාට්රිජ්ද අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් හමුවී සභාවේ ඉගැන්වීම් ගැන වැඩිදුර දැනගැනීමට උත්සුක වූහ. 1830 දෙසැම්බරයේදී ඔවුහු සැතපුම් 250කටත්

වඩා දුරක්, ජෝසෆ් ස්මිත් හමුවීමට ෆෙයටි, නිව් යෝර්ක්, දක්වා ගමන් කළහ. ඔවුන් ගැනත් කර්ට්ලන්ඩ් ශුද්ධවන්තයන් ගැනත් ස්වාමීන්වහන්සේගේ කැමැත්ත සොයන ලෙස ඔවුහු ඔහුට කීහ. ස්වාමින් වහන්සේ ප්‍රතිචාර දක්වමින්, නිව්යෝර්ක් ශුද්ධවන්තයන් ඔහයියෝ නගරයේදී එකට එකතුවිය යුතුබව එළිදරව් කළහ (බලන්න ධ්‍යසහසී 37:3). නිව්යෝක් නගරයේ තුන්වෙනි සහ අවසාන සභා සම්මන්ත්‍රනය, 1831 ජනවාරි 2වෙනිදා විට්මර්ගේ ගොවිපළේ පැවැත්වූ අතර, එහිදී ස්වාමීන්වහන්සේ එතුමාගේ මෙම උපදෙස් සාමාජිකයන්ට නැවතත් දුන්සේකඃ

තවද දැන් ඔවුන්ට සතුරු බලයෙන් ගැලවී, ධර්මිෂ්ඨවූ ජනතාවක් ලෙස කැළැල් රහිතව සහ චෝදනා නොමැතිව එතුමා වෙතට එකතුවීම සඳහා ඔහියෝ බලා යා යුතු බවට එතුමා ඔවුන්ට නියෝගයක් දී ඇතිසේක. එහිදී උන්වහන්සේ ඔවුන්ට එතුමාගේ නීතිය දෙන අතර, ඔවුන්ව ඉහළින් එන බලයකින් එන්ඩව්කරනු ඇත (බලන්න ධ්‍යසගසී 38:31–32). ශුද්ධවන්තයන්ට එකට එකතුවීම සඳහා මේ කාල පරිච්ඡේදයේදී ලැබුනු පළවෙනි කැඳවීම මෙයවේ.

සාමජිකයන් කිහිපදෙනෙක් ඔවුන්ගේ දේපළ අත්හැර දමා නිව් යෝර්ක් සිට ඔහයියෝ දක්වා දීර්ඝ ගමන නොයාම තෝරාගත් අතර, ශුද්ධවන්තයන්ගෙන් වැඩි පිරිස ඉශ්‍රයෙල් එකතුකිරීමේ එඬේරාගේ හඬ ඇසූහ. ගෝලයන් නියෝජනයකරන්නෙක් වූ නිවෙල් නයිට් පූජක නායකයන් අනුගමනය කරමින් කැඳවීමට මෙසේ පිළිතුරු දුන්නේයඃ

"සම්මන්ත්‍රනයෙන් පසුව නිවසට නැවත පැමිණ, අපට ලබාදුන් නියෝගයට කීකරුව, මම, කෝල්ස්විලී ශාඛාව සමග එක්ව, ඔහයියෝ බලා යාමට අවශ්‍ය සූදානම්වීම් කළෙමි….අපේක්ෂා කළ පරිදිම, අපගේ දේපළ විශාල ලෙස පරිත්‍යාගකිරීමට අපි අවනතවුනෙමු. මගේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් ගතවුනේ සොහොයුරු සොහොයුරියන් බැහැදකිමින්, ඔවුන්ගේ කටයුතු සකස්කිරීමට උදව් කරමින්ය. එනිසා අපට එක කණ්ඩායමක් ලෙස ගමන් කළ හැකිය."[19]

ජෝසෆ් නයිට් ජ්‍යෙ., ඔහියෝවලදී අනාගතවක්තෘවරයා සමග සම්බන්ධවීම සඳහා සිය දේපළ විකිණීමට කැමැත්තෙන්ම පරිත්‍යාග කළ අයගේ එක් ආදර්ශයකි. බෘෘමි පුවත්පතෙහි ඔහු පළ කල සරල දැන්වීම සුභාරංචියට තිබූ ඔහුගේ කැපවීම විශාල ලෙස ප්‍රකාශකිරීමකිඃ "දැනට ජෝසෆ් නයිට්ට අයත් මෙම ගොවිපළ පිහිටා තිබෙන්නේ කෝල්ස්විලී නගරයේ, කෝල්ස්විලී පාලම අසලය—එක් පැත්තක් සස්කුහෙන්නා ගඟට මායිම්වන අතර, ප්‍රමාණය අක්කර එකසිය හතලිස් දෙකකි. එම ගොවි පළේ පදිංචි

විය හැකි ගෙවල් දෙකක්ද, හොඳ අටුවක් සහ ලක්ෂණ ගෙවත්තක්ද ඇත. විකිණීමේ කොන්දේසි මිළදී ගන්නාට *වාසි දායකය.*"[20] කෝල්ස්විලි නගරයේ 68 දෙනෙකු පමණ සාමජික පිරිසක් 1831 අප්‍රේල් වලදී ඔහියෝ බලා ගමන් ඇරඹූහ.

ස්වාමීන්වහන්සේගේ නියෝගයට එක සමානවම කීකරුවූ අය අතර, ෆෙයට් ශාඛාවේ ශුද්ධවන්තයන් 88ක්ද, මැන්චෙස්ටර් ශාඛාවෙන් 50ක්ද සිටි අතර, ඔවුහු 1831 මැයි මුල් භාගයේදී සිය නිවෙස්වලින් පිටවූහ. ෆෙයට්වල සාමාජිකයන්ගේ නික්මයාමේ ප්‍රධානත්වය ගැනීම අනාගත-වක්තෘවරයාගේ මවවූ, ලූසී මැක් ස්මිත්ට පැවරුනි. ඔවුන් නිව්යෝර්ක්, බෆලෝ වෙත ලඟාවූ විට, ඊරී ගංගාවේ වරාය අයිස් වලින් අවහිරවී, ෆෙයට් ශුද්ධවන්තයන් රැගත් දුම් බෝට්ටුවට වරායෙන් පිටවීමට නොහැකි බව ඔවුන්ට පෙනින. මෙම අසීරු තත්වය තුල, ඇය සාමාජි-කයන් අමතා ඔවුන්ගේ ඇදහිල්ල ක්‍රියාත්මක කරන ලෙස කීවාය: "දැන්, සොයුරු සොයුරියනි, ඔබ සියලු දෙනාම ස්වර්ගයට යාච්ඤාකරන්නේ නම්, අයිස් කන්ද කැඞී ගිය හැකිය. අපට නිදහසේ යා හැකිය, ස්වා-මීන්වහන්සේ ජීවමාන බව සැබෑ සේම, එයද ඉටුවනු ඇත." එම අවස්-ථාවේදීම ශබ්දයක් ඇසින, "එය පුපුරන ගෙරවීමක් වැනිය." අයිස් වෙන්වී ගොස්, පටු මාර්ගයක් ඇතිවූ අතර, එතුලින් බෝට්ටුවක ඉදිරියට යාමට හැකිවිය. ඔවුන් පිටවූ විගසම වාගේ මාර්ගය නැවතත් වැසී ගිය නමුත්, ඔවුන් ඉදිරියේ අයිස් නොතිබීම නිසා, ඔවුන්ගේ ගමන යාමට හැකිවිය. මෙම ආශ්චර්යමත් ගැලවීමෙන් පසුව, කණ්ඩායම එකට රැස්වී යාච්ඤා මෙහෙයක් පවත්වා ඔවුන් වෙනුවෙන් දෙවියන්වහන්සේ දැක්වූ කරුණාව වෙනුවෙන් ඔවුන්ගේ ස්තුතිය පුදකළහ.[21]

මැයි මාසයේ මද භාගය වන විට, නිව් යෝර්ක්හි සියලුම සභා ශාඛා සාමාජිකයන්ට ඊරී ගංගාව හරහා ඔහයියෝ, ෆෙයාර්පෝට් වරාය දක්වා නැව් මගින් ගමන්කිරීමට හැකිවිය. එහිදී සහෝදර ශුද්ධවන්තයන් විසින් ඔවුන්ව කර්ට්ලන්ඩ් සහ තොම්ප්සන් ගම්වල ස්ථාන වෙත රැගෙනයන ලදී. පසු-දවස්වල ඉශ්‍රායෙල්ගේ ශ්‍රේෂ්ඨ එකතුවීම ආරම්භවිය. ශුද්ධවන්-තයෝ දැන් ස්වාමීන්වහන්සේගේ තෝරාගත් සේවකයන් ලෙස, එතුමාගේ ව්‍යවස්ථාවන් ගැන උපදෙස් දීමට සහ ශුද්ධවූ දේවමාළිගා ගොඩනැගීම-ටත් ඉගැන්වීමට හැකි තත්වයක සිටියහ.



කර්ට්ලන්ඩ් දේවමාළිගාව

# කර්ට්ලන්ඩ් ඔහියෝ නගරයේ රාජධානිය ගොඩනැගීම

## අනාගතවක්තෘවරයා ඔහයියෝවලට පැමිණීම

1831 පෙබරවාරියේ ශීත දවසක, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් සහ ඔහුගේ බිරිඳ, එකල මාස හයක නිඹුල්ලුන් සහිත දරු ගැබක් ඇතිව සිටි එමා, නිව් යෝර්ක් සිට කර්ට්ලන්ඩ්, ඔහයියෝ දක්වා සැතපුම් 250ක ගමනක් සම්පූර්ණ කළහ. ඔවුහු හිම කරත්තයකින් ගිල්බට් සහ විට්නි වෙළඳ සැලට ලඟාවූහ. නිවෙල් කේ. විට්නි සමග අනාගතවක්තෘවරයා හමුවීම පහත දැක්වෙන වචන වාර්තාවෙන් උපුටා ගැනිනඃ

"[හිම කරත්තයේ සිටි], එක් මිනිසෙක්, තරුණ ශක්තිමත් පුද්ගලයෙක්, එයින් බැස, පඩිපෙළ උඩට නගිමින්, වෙළඳ සැලට ගමන්කල අතර, එහි කණිෂ්ඨ කොටස්කරුවා සිටගෙන සිටියේය.

"'නිවෙල් කේ. විට්නි! එම මිනිසා ඔබය!' කියමින් ඔහුගේ අත සුහදව දිගුකලේ, පැරණි සහ ප්‍රියතම හඳුනන්නෙකු ලෙසය.

"'ඔබට මාගෙන් ප්‍රයෝජනයක් ඇත,' එහි සිටි පුද්ගලයා පිළිතුරු දුන්නේ., යන්ත්‍රානුසාරයෙන් මෙන් දිගුකල අත ගනිමින...—'ඔබ මාගේ නමින් මා ඇමතු ලෙස, ඔබගේ නමින් ඇමතීමට මට නොහැකිවිය.'

"'මම ජෝසෆ් නම් අනාගතවක්තෘවරයා වෙමි,' අමුත්තා සිනහසෙමින් කීවේය, 'මගේ මෙහි පැමිණීම සඳහා ඔබ යාඥාකර ඇත; දැන් ඔබ මගෙන් අපේක්ෂාකරන්නේ මොනවාද?'"[1]

මඳ කලකට පෙර, නිවෙල් සහ ඔහුගේ බිරිඳ එළිසබෙත්, උපදෙස් පතා උනන්දුවෙන් යාච්ඤාකර ඇත. පිළිතුර තුලින්, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන් මත බැස, ඔවුන්ගේ නිවස වළාකුලකින් වැසී ගියේය. වළාකුල තුලින් යම් හඬක් මෙසේ ප්‍රකාශ කළේය, "ස්වාමීන්වහන්සේගේ වචනය ලබාගැනීමට සූදානම්වෙන්න, මන්ද එය පැමිණෙයි!"[2] එයින් පසු ඉතා ඉක්මණින්ම, ඉන්දියානුවන්ට ඉගැන්වීම සඳහා කැඳවා සිටි ධර්මදූතයෝ කර්ට්ලන්ඩ් පැමිණ සිටි අතර, දැන් අනාගතවක්තෘවරයාද පැමිණ ඇත.

ඔර්සන් එෆ්. විට්නි, නිවෙල්ගේ මුනුපුරෙක්, මෙම සිද්ධිය ගැන පසු කාලයකදී මෙසේ කීවේයඃ "මෙම විශ්ෂ්ඨ මිනිසා, ජෝසෆ් ස්මිත්, කලින් මාංශාකාරයෙන් දැක නොතිබූ යමෙක් හඳුනාගත්තේ කුමන බලයකින්ද? නිවෙල් කේ. විට්නිට ඔහුව හඳුනාගැනීමට නොහැකිවූයේ මන්ද? එයට හේතුව ජෝසෆ් ස්මිත් දර්ශනකාරයෙක්, තෝරාගත් දර්ශනකාරයෙක්වීම නිසාය; නිවෙල් විට්නි තම දණින් වැටී, කර්ට්ලන්ඩ් නගරයට ඔහුගේ පැමිණීම පතා යාච්ඤා කිරීම, සැතපුම් සිය ගණන් ඈතක සිටි ඔහු ඇත්තවශයෙන්ම දැක ඇත. පුදුමයි—ඒත් ඇත්තයි!"[3]

අනාගතවක්තෘවරයාගේ පැමිණීම කර්ට්ලන්ඩ් නගරයට ස්වාමින්වහන්සේගේ වචනය ගෙන ආ අතර, එහිදී සභාවේ බොහෝ මූලික කාරණා නිසි පරිදි සකස් කෙරින. සභා පරිපාලනයේ මූලික සංවිධාන කටයුතු එළිදරව් කෙරින. ධර්මදූතයන් පිට රටවලට යැවින. ප්‍රථම දේවමාළිගාව ගොඩ නැගින. වැදගත් එළිදරව් කිහිපයක්ම ලැබුනි. ශුද්ධවන්තයන් බරපතල ලෙස හිරිහැරයට පත්ව, ඔවුන්ගේ ඇදහිල්ල, ධෛර්‍යයය, සහ ස්වාමීන්වහන්සේ ආලේපකළ අනාගතවක්තෘවරයා අනුගමනයකිරීමට ඇති ඔවුන්ගේ කැමැත්ත පරීක්ෂා කෙරින.

### සභා ක්‍රියාකාරකම් සඳහා මධ්‍යස්ථාන දෙකක්

ඔහියෝවලදී එකතුවීමට ශුද්ධවන්තයන්ව කැඳවූ එම කාලයේම, ඔවුන්ට සයෝනය ගොඩනැගීමට හැකි කාලය එනතුරු ඔවුහු බලා සිටියහ. 1831 ජූනි මාසයේදී, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ට ලැබුන එළිදරව්වකට අනුව, ඔහු සහ සිඩ්නි රිග්ඩන් සහ තවත් වැඩිහිටියන් 28 දෙනෙක් මිසූරි නගරයට හරවාගැනීමේ දූතමෙහෙයකට යාමට සහ එහිදී සභාවේ ඊළඟ සම්මන්ත්‍රනය පැවැත්වීමටත් මගපෙන්වීම් ලැබින (බලන්න ධීසහසී 52). මිසූරි පිහිටා තිබුනේ එකල අමෙරිකා එක්සත් ජනපදයේ බටහිර මායිමේ වන අතර, කර්ට්ලන්ඩ් නගරයේ සිට සැතපුම් 1,000ට බටහිර පැත්තටය. ජැක්සන් ප්‍රාන්තයේ, මිසූරි නගරය, ශුද්ධවන්තයන්ගේ වාසස්ථානයවී, එහි සයෝනය ගොඩනගන බව ස්වාමීන් වහන්සේ ජෝසෆ් ස්මිත්ට එළිදරව් කළසේක.

ජෝසෆ්, තවත් ධර්මදූතයන්ද, එයින් ටික කලකට පසුව කෝල්ස්විලී, නිව් යෝර්ක්හි සිටි ශුද්ධවන්තයන් සම්පූර්ණ කණ්ඩායමද, 1831 ග්‍රීෂ්ම ඍතුවේදී ජැක්සන් ප්‍රාන්තයට ගමන්කර වාසභූමියක් පිහිටුවීම ආරම්භ කළහ. අනාගතවක්තෘවරයා සහ අනෙක් නායකයන් කර්ට්ලන්ඩ් නගරයට නැවත පැමිණි අතර, සභාවේ බොහෝ සාමාජිකයෝ මිසූරිවල පදිංචිවූහ.

1831 සහ 1833 අතර, ජනගහන මධ්‍යස්ථාන දෙකක් සභාවට තිබින. ජෝසෆ් ස්මිත්, දොළොස් දෙනාගේ උපදේශක මණ්ඩලය, සහ ශුද්ධවන්තයන් විශාල ගණනක් කර්ට්ලන්ඩ්, ඔහියෝ, ප්‍රදේශයේ ජීවත්වූ අතර, සභාවේ වෙනත් සාමාජිකයන් බොහෝ දෙනෙක් ඔවුන් වෙනුවෙන් පත් කළ පූජක නායකන්ගේ මූලිකත්වයෙන් මිසූරියේ ජීවත්වූහ. ස්ථාන දෙකේදීම එකම අවස්ථාවකදී වැදගත් සිදුවීම් සිදුවුන අතර, සභාවේ නිළධාරීහු එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කළහ. මෙම වසර-හතක-කාලයේදී කර්ට්ලන්ඩ්වල සිදුවූ සිද්ධීන් මුලින් සාකච්ඡා කර, ඉන්පසුව එම කාලයේම මිසූරිවල සිදුවීම් ගැනද සාකච්ඡා කරනු ලැබේ.

## ඔහයියෝ නගරයට එකතුවීමේදී ශුද්ධවන්තයන් කල පරිත්‍යාග

ඔහයියෝ නගරයට පැමිණි බොහෝ ශුද්ධවන්තයෝ විශාල පරිත්‍යාග කළහ. සමහරුන්ට ඔවුන්ගේ පවුල් නැතිවිය; අන් අයට ඔවුන්ගේ කලින් සිටි මිතුරන් අහිමිවිය. එකතුවීමට අනාගතවක්තෘවරයාග් කැඳවීමට බ්‍රිගම් යන්ග් ප්‍රතිචාර දැක්වූ අන්දම ගැන ඔහු විස්තර කරයිඃ

"අපි කර්ට්ලන්ඩ්වලට [සැප්තැම්බර් 1833] දී ලඟාවූ විට, ශුද්ධවන්තයන් සමග එකතුවූ මට වඩා දුප්පත්වූ කිසි මිනිසෙක් සිටියේ නම්—එයට හේතුව ඔහුට කිසිවක් නොතිබූ නිසාය....මට රැක ගැනීමට දරුවන් දෙදෙනෙක් සිටියහ—තිබුනේ එපමණකි. මා කනවැන්දුම් පුරුෂයෙක්විය. 'බ්‍රිගම් සොහොයුර, ඔබට සපත්තු කිසිවක් තිබුනාද?' නැහැ; ඉල්ලාගත් සපත්තු ජෝඩුවක් හැර, මගේ පයට සපත්තුවක් නොතිබින. වසර තුනක හෝ හතරක සිට මට තිබුන අතින් මැසූ කබායක් හැර, ශීත ඍතුවට ඇඳුම් කිසිවක් මට නොතිබිනි. 'කලිසම් කිසිවක්?' නැත. 'ඔබ කරන්ට යන්නේ මොනවාද? ඔබට ඇඳීමට කලිසම් කිසිවක් නැතිද?' නැහැ, වෙනත් එකක් මට ලැබෙන තුරු, ඇඳීමට මම එකක් ඉල්ලා ගත්තෙමි. මම සංචාරය කරමින් සහ දේශනාකරමින් මගේ දේපළවල හැම ඩොලරයක්ම වියදම්කර ඇත්තෙමි. මා දේශනාකිරීම පටන්ගත් විට, මම කුඩා දේපලකට සුදුසුව සිටියෙමි....මා සමග ගෙනයාමට කිසිවක් නැතිවන තුරු මම සංචාරය කරමින් දේශනා කළෙමි; නමුත් ජෝසෆ් මෙසේ කීවේයඃ 'මෙහෙට එන්න;' මට හැකි පමණ හොඳින් මම ඉහළට ගියෙමි."[4]

තවත් බොහෝ ශුද්ධවන්තයෝ කර්ට්ලන්වලට පැමිණියහ. ඒවන විට එහි සිටි සමාජිකයෝ ඔවුන්ව පිළිගෙන ඔවුන්ට තිබුනු ස්වල්ප දෙය කැමැත්තෙන්ම බෙදාගත්හ. එවන් ධෛර්‍යමත් ජනතාව සභාවේ විෂ්මය ජනක වර්ධනය සහ දියුණුව සඳහා පදනම සකස් කළහ.

## කර්ට්ලන්ඩ් ප්‍රදේශය තුළදී ලැබුන එළිදරව්

අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් කර්ට්ලන්ඩ් ප්‍රදේශයේ ජීවත්ව සිටියදී, ඔහුට එළිදරව් ගණනාවක්ම ලැබුනි, ඒවායින් 65ක් දහම සහ ගිවිසුමේ වාර්තාකර ඇත. එළිදරව්වලින් ඉගැන්වූයේ සුභසාධනය, ලකුණු සෙවීම, සදාචාර හැසිරීම, අහාරවල මූලධර්ම, දසයෙන් කොටස, පූජකවරයේ අධිකාරී බලය, අනාගතවක්තෘවරයාගේ කාර්‍යභාරය, මහිමයේ අංශ තුන, ධර්මදූත කටයුතු, දෙවන පැමිණීම, කැපකිරීමේ නීතිය, සහ වෙනත් මාතෘකා පිළිබඳ ස්වාමීන් වහන්සේගේ කැමැත්තය.

### *ජෝසෆ් ස්මිත් බයිබලය පරිවර්තනය කිරීම*

1830 ජූනි මාසයේදී ජෝසෆ් ස්මිත් ඔහුට ලැබුන දිව්‍යමය අණ අනුව බයිබලයේ ජේම්ස් රජතුමාගේ (ඉංග්‍රීසි) අනුවාදයේ අනුභාසම්පන්න නිවැරදි කිරීමේ වැඩ ආරම්භ කළේය. මෙම වැඩ කටයුතු ජෝසෆ් ස්මිත් බයිබල් පරිවර්තනය නමින් හැඳින්වේ. 1830 ජූනි සිට 1833 ජූලි අතර කාලය තුළදී, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් බයිබලයේ මෙම පාඨවලට වෙනස්කම් ගණනාවක්ම කළේය. ඊට බයිබලයේ වචනවල වෙනස්කම්, දහමේ පැහැදිළි කිරීම්, සහ ඓතිහාසික සහ දහම් කරුණු නැවත ස්ථාපනය කිරීම්ද ඇතුළත් කෙරින.

මෙම කටයුතු කරන කාලය තුළදී ජෝසෆ් නිතරම ශුද්ධ ලියවිලි කොටස් ගැන සිතාබලන විට පැනනැගුන ප්‍රශ්නවලට ප්‍රතිචාර ලෙස ඔහුට බොහෝ එළිදරව් ලැබුනි. එවැනි එක් එළිදරව්වක් 1832 පෙබරවාරි 16වෙනිදා ලැබුනේ ජොසෆ් සහ සිඩ්නි රිග්ඩන් යොහාන් 5:29 පරිවර්තනය කළ විටදීය. ඔවුහු මෙම කොටස ගැන කල්පනාකරන විටදී ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ අවබෝධය එළිදැක්වූ අතර, ස්වාමීන්වහන්සේගේ මහිමය ඔවුන් වටා බැබලින (බලන්න ධීසහසී 76:19). සියල්ලටම වඩා ඔවුන්ට ලැබුන ශ්‍රේෂ්ඨ දර්ශනය දැන් දහම සහ ගිවිසුමේ 76වෙනි කොටසේ වාර්තාකර ඇත. ඔවුහු පියාණන් සහ පුත්‍රයාණන්ව දැක, දෙවියන්වහන්සේගේ දරුවන්ගේ දිව්‍යමය ගමනාන්තය ගැන දැනගෙන, මහිමයේ රාජ්‍ය තුන ලබාගන්නා අය පිළිබඳ සදාකාලික සත්‍යයන්ද ලබාගත්හ.

### *එළිදරව් ප්‍රසිද්ධියට පත්කිරීම*

1831 නොවැම්බරයේදී හයිරම්, ඔහයියෝහි පැවැත්වූ විශේෂ සම්මන්ත්‍රනයකදී, අනාගතවක්තෘවරයාට දුන් එළිදරම් 70ක් පමණ ඇතුලත් පණත් පොත, ප්‍රසිද්ධියට පත්කිරීමට සාමාජිකයෝ කැමැත්ත දුන්හ. සම්මන්ත්‍රනය

කාලය තුලදී, ස්වාමීන්වහන්සේ ජෝසෆ් ස්මිත්ට පණිත් පොතේ සංශෝධනය සහ උප ග්‍රන්ථය සඳහා එළිදරව් දුන්සේක. (පසුව මේවා දහම සහ ගිවිසුමේ 1 සිට 133 දක්වා කොටස් බවට පත්විය.)

පොත මුද්‍රණය කිරීමේ පැවරුම දුන්නේ විලියම් ඩබ්ලිව්. ෆෙල්ප්ස්ටය, ඔහුට ජැක්සන් ප්‍රාන්තයේ, මිසූරිවල මුද්‍රණ ආයතනයක් තිබින. (පණිත් පොත ගැන වැඩිදුර තොරතුරු සඳහා බලන්න පි. 41.) පණිත් පොතේ එළිදරව්, අනෙක් එළිදරව්ද සමග, පසුව දහම සහ ගිවිසුම යන මාතෘකාව යටතේ පොතක් ලෙස මුද්‍රණයවූ අතර, එය ප්‍රසිද්ධියට පත් කලේ 1835 කර්ට්ලන්ඩ්හිදීය. මෝර්මන්ගේ පොතේ දෙවන සංස්කරණයද, අනාගතවක්තෘ ජෝසෆ් විසින් කළ සුළු නිවැරදි කිරීම් සහිතව කර්ට්ලන්ඩ්හිදී මුද්‍රණය කෙරින.

සභාව සංවිධානය කර මාස කිහිපයකට පසුව, සභාව තුල සංගීතයට ඇති වැදගත්කම ගැන අවධාරණය කළ ස්වාමීන්වහන්සේ අනාගතවක්තෘවරයාගේ බිරිඳවූ, එමාට, පූජනීය ගීතිකා කිහිපයක් තෝරාගෙන සකස්කිරීමට අණ කළසේක (බලන්න ධීසහසී 25:11). ඇය සකස්කළ ගීතිකා සංග්‍රහය කර්ට්ලන්ඩ්හිදී ප්‍රසිද්ධකර, ස්වාමීන්වහන්සේගේ පොරොන්දු ආශිර්වාද ලබාගැනීමට ශුද්ධවන්තයන්ට මාර්ගය විවෘතකර දුන්නාය. මන්ද හදවතෙන් එන ගීතයෙන් උන්වහන්සේගේ ආත්මය අතිශයින් සතුටට පත්වේ. එසේය, ධර්මිෂ්ඨයන්ගේ ගීතය උන්වහන්සේට යාච්ඤා කිරීමක් වන අතර, එයට ඔවුන්ගේ හිස් මතට ආශිර්වාදයක් සමගින් පිළිතුරු ලැබෙන්නේයයි ස්වාමීන්වහන්සේ කියනසේක (බලන්න ධීසහසී 25:12).

### *අනාගතවක්තෘවරුන්ගේ පාසල*

1832 දෙසැම්බර් සහ 1833 ජනවාරි මාසවලදී, අනාගතවක්තෘ ජෝසෆ්ට ලැබුන එළිදරව්වක් දහම සහ ගිවිසුමේ 88වෙනි කොටස බවට පත්විය. වෙනත් දේවල් අතර, මෙම එළිදරව්ව මග පෙන්වන්නේ, අනාගතවක්තෘවරුන්ගේ පාසල (බලන්න ධීසහසී 88:127) ගොඩ නගා සොහොයුරන්ට සුභාරංචි දහම සහ මූලධර්ම, සභාවේ කටයුතු සහ වෙනත් කාරණා ගැන ඉගැන්වීමටය.

1833 ශීත ඍතුවේදී අනාගතවක්තෘවරුන්ගේ පාසල තුල නිතර හමුවීම් සිදුවූ අතර, ජෝසෆ් සහ එමා ස්මිත් දෙදෙනාගේම සැලකිල්ල යොමුවුනේ, සොහොයුරන් සිරිතක් ලෙස දුම් කොළ පාවිච්චිය ගැන සහ විශේෂයෙන්ම රැස්වීම් තුල දුම් වළාකුල් ලෙස ඇතිවීමත්, දුම්

කොළ සැපීමෙන් සිදුවන අපිරිසිදුකම ගැනත්ය. ජෝසෆ් ස්මිත් මෙම කාරණාව ගැන ස්වාමීන්වහන්සේගෙන් විමසීමෙන්, ලැබුන එළිදරව්ව ප්‍රඥාවේ වචනය ලෙස හැඳින්වේ. මෙම එළිදරව්ව තුලින් ස්වාමීන්වහන්සේ පණතක් දෙමින් ප්‍රකාශ කලේ, ශරීරය සහ ආත්මය ගැන සැලකිලිමත්වීමටය, තවද මෙයට කීකරුවන අයට ආත්මික ආශිර්වාදයක් ලෙස ප්‍රඥාව සහ විශාල වස්තුවක් ලෙස ඥානය නම්, සැඟව තිබෙන වස්තු පවා ලැබෙන බවට පොරොන්දුවූසේක (බලන්න ධීසහගී 89:19). ප්‍රඥාවේ වචනය තුල ඇතුළත් වන සෞඛ්‍යය ගැන තොරතුරු ඒ කාලයේ වෛද්‍ය හෝ විද්‍යා අංශය නොදැන සිටියද, දුම් කොල හෝ මත්පැන් පාවිච්චි නොකිරීමට දුන් උපදේශය විශාල ප්‍රයෝජනවත් දෙයක් බව එතැන් පටන් ඔප්පුවී ඇත.

*කැපකිරීමේ නීතිය*

වර්ෂ 1831දී කැපකිරීමේ නීතියේ කරුණු එළිදරව් කිරීම ආරම්භ කළසේක. එය ආත්මික ලෞකික ක්‍රියා පිළිවෙලක්වූ අතර, ධර්මිෂ්ඨව අනුගමනය කළහොත්, පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ ජීවිතවල දියුණුවට ආශිර්වාද ලැබෙනු ඇත. මෙම නීතිය යටතේ, සභා සාමාජිකයන් ඔවුන්ගේ සියලුම දේපළ හෝ ඔප්පුව සභාවේ සභානායකවරයාට කැපකිරීමට ඔවුන්ගෙන් ඉල්ලා ඇත. ඔහු ඉන්පසු උරුමයක් හෝ භාරකාරත්වයක් සමාජිකයන්ට නැවත දෙනු ලැබේ. පවුල් ඔවුන්ගේ භාරකාරත්වය ඔවුන්ට හැකි පමණ හොඳින් පාලනය කරනු ලැබේ. වසර අවසානයේදී ඔවුන්ට වැඩි පුර ලාභයක් තිබේ නම්, එය අවශ්‍යතා ඇති අයට උදව්කිරීම සඳහා සභානායකවරයාට දෙනු ලැබේ. එඩ්වඩ් පාට්රිජ් සභාවේ පළවෙනි සභානායකවරයා වශයෙන් සේවය කිරීමට ස්වාමීන්වහන්සේ විසින් කැඳවන ලදී.

කැපකිරීමේ නීතියේ ඇතුලත්ව තිබෙන මූලධර්ම සහ ප්‍රතිපත්ති සාමාජිකයන්ව ආත්මිකව ශක්තිමත්කර, ආර්ථිකය සම තත්වයකට ගෙන එමින්, තණ්හාව සහ දුප්පත්කම දුරු කරයි. සමහර ශුද්ධවන්තයන් ඒ අනුව හොඳින් ජීවත්වී තමන්ට සහ අන් අයටද ආශිර්වාදයක්වූ නමුත්, අනෙක් ශුද්ධවන්තයන්ට ආත්මාර්ථකාමී ආශාවන්, අභිබවා යාමට නොහැකිවීම නිසා, අවසානයේදී එම නීතිය සභාවෙන් ඉවත්කර ගැනීමට සිදුවිය. 1838දී ස්වාමීන්වහන්සේ දසයෙන් කොටස නීතිය එළිදරව් කල අතර (බලන්න ධීසහගී 119), එය අද දක්වාම සභාවේ මූල්‍යමය නීතිය ලෙස පවතියි.

## පූජකවරය ශක්තිමත්කිරීම

*පූජකවරයේ නිළයන් එළිදරව්වෙයි*

සභාව සාමාජිකත්වයෙන් වැඩිවන විට, පූජකවරයේ නිළයන් ගැන අනාගතවක්තෘවරයාට දිගටම එළිදරව් ලැබින. ස්වාමීන්වහන්සේ විසින් මග පෙන්වූ පරිදි, ඔහු පළවෙනි සභාපතිත්වය සංවිධානය කරමින්, ඔහුව සභාපති වශයෙන්ද, සිඩ්නි රිග්ඩන් සහ ෆ්‍රෙඩ්රික් ජී. විලියම්ස් උපදේශකයන් ලෙසද පත් කළේය. ඔහු ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය සහ හැත්තෑවරුන්ගේ පළවෙනි ගණපූර්ණයද සංවිධානය කළේය. ඔහු සභානායකවරුන් සහ ඔවුන්ගේ උපදේශකයන්ද, උත්තම පූජකවරුන්, ආදි පීතෘවරුන්, උත්තම උපදේශක මණ්ඩලය, හැත්තෑවරුන්, සහ වැඩිමහල්ලන් කැඳවමින් පත් කළේය. ඔහු සභාවේ පළවෙනි ස්ටේකයද සංවිධානය කළේය.

අත්දැකීම් නැති, අළුත බව්තීස්මවූ සාමාජිකයන්ට සේවය සඳහා කැඳවීම නිතරම යටපත්වීමක් විය. උදාහරණයක් ලෙස, නිවෙල් කේ. විට්නි සභාවේ දෙවෙනි සභානායකවරයා ලෙස කර්ට්ලන්ඩ්හි සේවයකිරීමට 1831 දෙසැම්බර් මස කැඳවූ අතර, එඩ්වඩ් පාට්‍රිජ් මිසූරි ශුද්ධවන්තයන්ගේ සභානායකවරයා බවට පත්විය. නිවෙල්ව ස්වාමීන්වහන්සේ විසින් එළිදරව්වක් මගින් කැඳවූ බව අනාගතවක්තෘවරයා ඔහුට පැවසුවද, ඔහුට එම නිළයේ අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීමට හැකිවේයයි හැඟීමක් ඔහුට නොතිබින. එනිසා අනාගතවක්තෘවරයා ඔහුට මෙසේ කීවේය, "ගොස් පියාණන්වහන්සේගෙන් ඔබම අසන්න" නිවෙල් ගොස් දණගසා නිහතමානීව යාච්ඤාකිරීමේදී ඔහුට ඇසුන ස්වර්ගික හඬකින් මෙසේ කීවේය, "නුඹගේ ශක්තිය මා තුලය"[5] කැඳවීම බාරගත් ඔහු වසර 18ක් සභානායකවරයෙක් ලෙස සේවය කළේය.

*සයෝන කඳවුරේදී නායකයන් පුහුණුකිරීම*

සබාවට පූජක නායකයන්ගේ දැඩි අවශතාවයක් තිබින. ඔවුන්ව පරීක්ෂාකර, අත්දැකීම් ලබාදීමෙන් සහ ඇදහිල්ල ඔප්පුකිරීමෙන්, ඔවුන් ස්වාමීන්වහන්සේට සහ අනාගතවක්තෘවරයාට ඕනෑම තත්වයක් යටතේ අවංකව සිටිනු ඇත. අසීරු තත්වයන් යටතේ කීකරුකම ඔප්පුකිරීමට අවස්ථාවක් සහ සයෝන කඳවුරේ පෙළපාලි යාම මගින් පුහුණුවීමක්ද අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් විසින් පුද්ගලිකවම ලබාදුනි.

සයෝන කඳවුර සංවිධානය කලේ මිසූරි ශුද්ධවන්තයට උපකාරවත් වීමටය. ඔවුන්ගේ ධර්මිෂ්ඨ ආගමික විශ්වාසයන් නිසා ඔවුන්ට දරුණුලෙස හිංසා කෙරින. බොහෝ දෙනෙක්ව ඔවුන්ගේ නිවාස වලින් පළවා හැරින. (වැඩිදුර තොරතුරු සඳහා බලන්න පිටු 39–45.) 1834 පෙබරවාරි 24වෙනි-දා, ස්වාමීන්වහන්සේ ජෝසෆ් ස්මිත්ට එළිදරව්වක් දෙමින්, ඔහු මිනිසුන් කණ්ඩායමක් සංවිධානයකර කර්ට්ලන්ඩ් සිට මිසූරි දක්වා ඔවුන්ට ගමන්-කිරීමට සලස්වා ශුද්ධවන්තයන්ව ඔවුන්ගේ ඉඩම්වල නැවත පදිංචිකල යුතු බව කීසේක (බලන්න ධීසහසී 103). ස්වාමීන්වහන්සේ පොරොන්දුවක් දෙමින් උන්වහන්සේ ඔවුන් සමග සිටින බවත් සියලු ජයග්‍රහන සහ මහි-මයන් ඔවුන්ගේ උනන්දුව, ඇදහිලිමත්බව, සහ ඇදහිලිමත් යාච්ඤා තුලින් සිදුවීමට සලස්වන බවත් කීසේක (බලන්න ධීසහසී 103:36). ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ සියලුම මුල් සාමාජිකයෝ සහ හැත්තෑවරුන්ගේ ගණපූර්ණය මෙම අත්දැකීම මගින් ඔවුන්ගේ අනාගත වගකීම් සඳහා සූදානම්වූහ.

සයෝන කඳවුර නිළ වශයෙන් නිව් පෝර්ටේජ්, ඔහියෝවල 1834 මැයි 2වෙනිදා සංවිධානය කෙරින. අවසානයේදී එහි මිනිසුන් 207ක්ද, කාන්තාවන් 11ක් සහ ළමයින් 11ක්ද ඇතුළත්වූහ. ඔවුන්ව අනාගතවක්-තෘවරයා දසදෙනා සහ පනස්දෙනා වශයෙන් කණ්ඩායම්වලට බෙදා එක් එක් කණ්ඩායමකට ප්‍රධානියෙකු පත්කරගැනීමට උපදෙස් දුන්නේය. "ඉශ්‍රායෙල් පැරණි නියමයට අනුව"[6] කඳවුර සංවිධානයකළ බව එක් අළුත් භටයෙකුවූ, ජෝසෆ් හොල්බෲක් වාර්තා කළේය. මන්ද දින 45ක් ඔවුන් එක්ව ක්ලේ ප්‍රාන්තය, මිසූරි දක්වා සැතපුම් 1,000ක් පෙළපාලි ගියහ. ඔවුහු කර්කශ තත්වයන් යටතේ හැකි පමණ ඉක්මණින් ගමන් කළහ. ප්‍රමාණවත් ආහාර ලබාගැනීම ඉතා අසීරු විය. නිතරම රළු පාන්, පිළිනුවූ බටර්, බිම් හතු, සනවූ මීපැණි, අමු ඌරුමස්, නරක්වූ හැම්, පණුවන් ගැසූ නරක්වූ බේකන් සහ චීස් කෑමට මිනිසුන්ට සිදුවිය. පසු කාලයකදී ප්‍රේරිතවරයෙකු බවට පත්වූ, ජෝන් ඒ. ස්මිත්, ඔහු නිතර කුසගින්නේ සිටි බව ලීවේයඃ "මම ඉතා වෙහෙසට පත්ව, කුසගිනිව සහ නිදිමතින් පාර දිගේ ගමන්කරමින් සිටින විට දුටු සිහිනයකින්, අලංකාර දිය ඇල්ලක් අසල ප්‍රශන්න හෙවනකින් යුතු ගසක් යට කදිම පාන් ගෙඩියක් සහ කිරි බෝතලයක් රෙදි කෑල්ලක් මත දිය ඇල්ල පැත්තක තිබෙනවා දිටිමි"[7]

කඳවුරේ ආත්මික බවට සහ පණත්වලට කීකරුවීම ගැන දැඩි වැදගත්කමක් ලබාදී තිබුනි. ඉරුදින වලදී ඔවුහු රැස්වීම් පවත්වා

සක්‍රමේන්තුව භුක්ති වින්දෝය. අනාගතවක්තෘවරයා නිතරම රාජ්‍යයේ දහම ඉගැන්වීය. ඔහු මෙසේ කීවේයඃ "දෙවියන්වහන්සේ අප සමග වූ අතර, උන්වහන්සේගේ දේවදූතයෝ අප ඉදිරියෙන් සිටියහ. අපගේ කුඩා කණ්ඩායමේ ඇදහිල්ල නොසැලෙන සුළුය. දේවදූතයන් අපගේ සහායක-යන් බව අපි දනිමු. මන්ද අපි ඒ අයව දුටුවෙමු."[8]

කෙසේවුවද, කඳවුරේ තිබූ අසීරුකම් සහභාගිවන්නන්ගේ අඩුවීමට හේතුවිය. මෙම පිරිසිදුකිරීමේ ක්‍රියාවලිය මැසිවිලි කියන්නන්ව එළිදරව් කෙරින ඔවුන්ට කීකරුකමේ ආත්මය නොතිබුන අතර, නිතරම ඔවුන්ගේ කරදර වලට ජෝසෆ්ට චෝදනා කෙරින. මැයි 17වෙනිදා කැරලිකාර ආත්-මයක් තිබූ අයට අවවාදකරමින් "ඔවුන් දඬුවම් නොලැබීම පිණිස ඔවුන්ව ස්වාමීන්වහන්සේ ඉදිරියේ යටහත් කොට, එක්සත්විය යුතු බව කීවේය."[9]

ජූනි 18වෙනිදා වන විට කඳවුර මිසූරි, ක්ලේ ප්‍රාන්තයට ළඟාවූහ. කෙසේහෝ මිසූරියේ ආණ්ඩුකාරවරයාවූ, ඩැනියෙල් ඩන්ක්ලින් පොරොන්-දුවූ ලෙස, නිවාස වලින් පළවාහරින ලද සහා සාමාජිකයන්ව නැවත පදිංචි කිරීමට ශුද්ධවන්තයන්ගේ හමුදාවට උපකාරකිරීමට ඔහු අකමැ-තිවිය. කඳවුරේ සිටි කිහිපදෙනෙකුට, මෙම හමුදා අරමුණ අසමත්වීම ඔවුන්ගේ ඇදහිල්ල අවසාන ලෙස පරීක්ෂාකිරීමක් විය. බලාපොරොත්තු කඩවීම සහ අමනාපය නිසා සමහරෙක් විවෘතවම කැරලි ගැසූහ. එහි ප්‍රතිපලයක් ලෙස, අනාගතවක්තෘවරයා ඔවුන්ට අවවාදකරමින් ඔවුන්ව වනසාදමන දඬුවමක් ස්වාමීන්වහන්සේ ඔවුන් මත එවිය හැකි බව කීවේය. ඉක්මණින්ම කොළරා වසංගතය මුළු කඳවුර පුරාම පැතිර ගියේය. එය අවසන්වීමට පෙර, ජෝසෆ් ස්මිත්ද ඇතුළුව, කඳවුරෙන් තුනෙන් දෙකකට එය වැළඳී තිබින. තවද ඉන්පසුව කඳවුරේ 14 දෙ-නෙක් මියගියහ. ජූලි 2වෙනිදා, ජෝසෆ් නැවතත් කඳවුරේ අයට අනතුරු අඟවමින් ඔවුන් ස්වාමීන්වහන්සේ ඉදිරියේ නිහතමානීව, උන්වහන්සේගේ පනත් තැබීමට ගිවිසුම්කරන ලෙසත්, ඔවුන් එසේ කරන්නේ නම්, එම පැයේ සිට වසංගතය නවතින බවත් කීවේය. අත් එසවීමෙන් ගිවිසුම තබන ලද නිසා, වසංගතය අවසන්විය.

ජූලි මාසයේ මුලදී, කඳවුරේ සාමාජිකයන්ව අනාගතවක්තෘවරයා විසින් ගෞරවනීයව මුදා හැරින. එම ගමනින් ස්වාමීන්වහන්සේගේ පැත්තේ සිටින්නේ කවුද, නායකත්වයේ තනතුරුවල සේවයකිරීමට සුදුසු කවුදැයි එළිදරව් විය. පෙළපාලියේ ප්‍රතිඵල ගැන අනාගතවක්තෘවරයා පසුව මෙසේ පැහැදිලි කළේයඃ "ඔබ සටන්කිරීම දෙවියන්වහන්සේට අවශ්‍ය නැත. පොළොව මත ජාතීන්ට සුභාරංචියේ දොර විවෘතකිරීමට මිනිසුන්

දොළොස් දෙනෙක් සහිතව සහ ඔවුන්ගේ මග පෙන්වීම මත ඔවුන්ගේ මාර්ගය අනුගමනයකිරීමට හැත්තෑවරුන් සිටියද, තම ජීවිත පුදකිරීමට කැමති මිනිසුන් සහ ආබ්‍රහම් කලාක් මෙන් විශාල පරිත්‍යාග කල අය නැතිව උන්වහන්සේට තම රාජ්‍යය සංවිධානය කළ නොහැකිය."[10]

කඳවුරේ සාමාජිකයෙක්ව සිට පසුව සභාවේ හතරවෙනි සභාපතිවරයාවූ, විල්ෆෝඩ් වුඩ්රෆ්, මෙසේ කීවේය: "අප ලබාගත් අත්දැකීම වෙනත් කිසිම මාර්ගයකින් අපට කිසිදා ලබාගත නොහැකිය. අනාගතවක්තෘවරයාගේ මුහුණ දැකීමට අපට වරප්‍රසාදයක් ඇති අතර, ඔහු සමග සැතපුම් දහස් ගණන් සංචාරය කරමින්, දෙවියන්වහන්සේගේ ආත්මය ඔහු තුල ක්‍රියාත්මකවීම සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් ඔහුට ලැබීම සහ එම එළිදරව් ඉටුවීම දැකීමටද අපට වරප්‍රසාදයක් තිබින."[11]

1835 පෙබරවාරි මාසයේදී, කඳවුර අස්කිරීමෙන් මාස පහකට පසුව, ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය සහ හැත්තෑවරුන්ගේ පළවෙනි ගණපූර්ණය සංවිධානය කෙරින. ගණපූර්ණ දෙකේ තනතුරු අසූදෙකෙන් හැත්තෑනමයක් පුරවන ලද්දේ සයෝන කඳවුරේ පෙළපාලිවලදී සුදුසුකම් ඔප්පුකළ මිනිසුන්ගෙන්ය.

කර්ට්ලන්හිදී, ජෝසෆ් ස්මිත් අනාගත නායකයන් පුහුණුකිරීම කරගෙන ගියේය. සභාවේ අනාගත සභාපතිවරුන්වූ—බ්‍රිගම් යන්ග්, ජෝන් ටේලර්, විල්ෆෝඩ් වුඩ්රෆ්, සහ ලොරෙන්සෝ ස්නෝ—බව්තීස්මවූයේ කර්ට්ලන්ඩ්වල සිටි කාලයේදී වන අතර පසුව ඔවුහු 1901 දක්වා අනුපිළිවෙලින් සභාව මෙහෙයවූහ. ඊට අමතරව, ඊළඟ සභාපතිවරුන්වූ—ජෝසෆ් එෆ්. ස්මිත්, හීබර් ජේ. ග්‍රාන්ට්, සහ ජෝර්ජ් ඇල්බට් ස්මිත්ගේ පරිපාලනය 1951 දක්වා පැවතුනි. ඔවුහු කර්ට්ලන්ඩ් ධෛර්‍යමත් පුරෝගාමීන්ගෙන් කෙලින්ම පැවතුන අයවූහ.

## ධර්මදූත කටයුතු ඉදිරියට යයි

ශුද්ධවන්තයන් කර්ට්ලන්ඩ්වල ජීවත්වන විටදී, ධර්මදූතයන් බොහෝ දෙනෙක්ව ඔවුන්ගේ නිවෙස්වලින් ඈත ප්‍රදේශවල සුභාරංචිය දේශනාකිරීම සඳහා කැඳවන ලදී. ඔවුන් බොහෝ දෙනෙක් විශාල පුද්ගලික පරිත්‍යාග කළහ. ධර්මදූතයන්ව අමෙරිකාවේ ප්‍රාන්ත ගණනාවකටද, කැනඩාවේ කොටස්වලට සහ අත්ලාන්තික් සාගරය හරහා එංගලන්තයටද යවන ලදී. මෙම ධර්මදූත උත්සාහයන් තුළින්, බොහෝ දෙනෙක් සුභාරංචියේ සත්‍යය ගැන සාක්ෂි ලබාගත්හ. ඔවුහු නිර්භීත සමාජිකයන්වී අළුත් සභාවට විශාල ශක්තියක් ගෙන දුන්හ.

කර්ට්ලන්ට්වලදී වාර්තගතවී තිබෙන බොහෝ එළිදරව්වල සුභාරංචිය ලෝකයාට දේශනාකිරීමට සාමාජිකයන්ට දුන් පණිත්ද ඇතුලත්ය. ස්වාමීන්වහන්සේ ප්‍රකාශ කල පරිදි අප දෙදෙනා බැගින් උන්වහන්සේගේ ආත්මික බලයෙන් ඉදිරියට යමින්, උන්වහන්සේගේ නාමයෙන්, උන්වහන්සේගේ සුභාරංචිය දේශනාකරමින්, නළාවක ශබ්දය මෙන්, අපගේ හඬ ඔසවමින්, දෙවියන් වහන්සේගේ දේවදූතයන් මෙන් උන්වහන්සේගේ වචනය ප්‍රකාශ කළ යුතුය (බලන්න ධීසහසී 42:9). ඊළඟ වසරේදී ස්වාමීන්වහන්සේ පණිතක් දෙමින්, අනතුරු අඟවන ලද සෑම මිනිසාම ඔහුගේ අසල්වැසියාටද අනතුරු අඟවන්නේ යයි කීසේක (බලන්න ධීසහසී 88:81).

*මුල් කාලීන ඔහයියෝ හැරී ආ අයගේ දූතමෙහෙය*

ඔහයියෝ සිට හැරී ආ අයෙක්වූ සේරා පල්සිෆර්, නැවත පිහිටුවීමේ පණිවුඩය ඉතා උනන්දුවෙන් බෙදාගත් අය අතර එක් ආදර්ශයකි. ඔහු 1832 ජනවාරි මසදී සභාවට බැඳී මඳ කලකින් "වැඩිහිටි නිළයට පත්වී තම රටේ සහ පිට රටද සැලකිය යුතු සාර්ථකත්වයකින් දේශනාකරමින් ගියේය"[12] යයි. වාර්තාකර ඇත. ඔහු සහ තවත් ධර්මදූතයෙක්වූ, එලිජා චෙනී, කුඩා නගරයක්වූ රිච්ලන්ඩ්, නිව්යෝර්ක් දක්වා ගමන්කර, එහි ප්‍රාදේශීය පාසලක සිට දේශනාකිරීම ආරම්භ කළහ. රිච්ලන්ඩ් නගරයේදී වැඩිහිටි පල්සිෆර් හරවාගත් පළමු තැනැත්තා වූයේ තරුණ ගොවියෙකුවූ විල්ෆෝඩ් වුඩ්රෆ්ය. ඔහු යම් දිනෙක සභා ඉතිහාසයේ වඩාත්ම සාර්ථක ධර්මදූතයෙක් බවට සහ සභාවේ හතරවෙනි සභාපතිවරයා පත්වීමට සිටි අයෙකි. මාසයක කාලයක් තුලදී, ධර්ම දූතයන් දෙදෙනා මිනිසුන් ගණනාවක් බව්තීස්ම කර සභාවේ ශාඛාවක් රිච්ලන්ඩ්හි සංවිධානය කළහ.

තම අසල්වැසියාට අනතුරු අඟවන ලෙස කළ කැඳවීමට පිළිතුරු වශයෙන් විවිධ තරාතිරම්වල ධර්මදූතයෝ පැමිණියහ. ඔවුන් බොහෝ දෙනෙක් විවාහවී සිටි අතර ඔවුන්ට පවුල් වගකීම් තිබින. ඔවුන් පිටත්ව ගියේ, අස්වැන්න නෙළීමට ආසන්නව තිබියදීය, එම ශීත ඉතා අධික කාලය, ආර්ථික අවපාතයට මැදිවී සිට, පුද්ගලික සමෘද්ධිය ලබාගැනීමට තිබෙන කාලයකි. ඔවුන් දූත මෙහෙය ක්ෂේත්‍රයට ඇතුළුවූ විට, වැඩිහිටියන් ගණනාවක්ම අසරණ තත්වයක සිටියෝය. 1831 සිට 1838 දක්වා අනාගතවක්තෘවරයා විසින්ම කැනඩාවේ නොයෙක් ප්‍රාන්තවල සැතපුම් 15,000ක් සංචාරය කරමින්, කෙටි කාලීන දූතමෙහෙයන් 14ක සේවය කළේය.

අනාගතවක්තෘවරයාගේ ඥාති සහෝදරයෙක්වූ, ජෝර්ජ් ඒ. ස්මිත්ට නැගෙනහිර අමෙරිකා එක්සත් ජනපදයේ සේවය සඳහා කැඳවීමක් ලැබුනි. ඔහු කෙතරම් දුප්පත්ව සිටියෙ-ද යත්, ඇඳුම් සහ ඔහුට අවශ්‍ය පොත් පත් නොතිබූ අතර, මිළදී ගැනීමට මුදල්ද නොතිබින. ඒ හේතුව නිසා අනාගත වක්තෘවරයා සහ ඔහුගේ සොහොයුරු හයිරම් ඔහුට අළුපාට රෙදි දුන් අතර, එලිසා බ්‍රවුන් ඔහුට කබායක්, බැනියමක් සහ කලිසම් සකස්කර දුන්නාය. බ්‍රිගම් යන්ග් ඔහුට පාවහන් ජෝඩුවක් දුන්නේය. ඔහුගේ පියා ඔහුට කුඩා බයිබලයක් දුන්නේය. අනාගතවක්තෘවරයා මෝර්මන්ගේ පොතේ පිටපතක් ලබා දුන්නේය.

වැඩිහිටියන් වන ඉරස්ටස් ස්නෝ සහ ජෝන් ඊ. පේජ්ද 1836 වසන්තයේදී දූතමෙහෙය ක්ෂේත්‍රයට යන විට දුප්පත්ව සිටියහ. බටහිර පෙනිසිල්වේනියාවේ දූතමෙහෙයකට පිටත්ව යන කාලයේදී තමා සිටි තත්වය ගැන විස්තරකරමින් වැඩිහිටි ස්නෝ මෙසේ ලීවේයඃ "මම කර්ට්ලන්ඩ් නගරයෙන් පයින්ම පිටවීයන විට, කුඩා සුට්කේසයක සහා පොත් පත් කිහිපයක් සහ මේස් ජෝඩුවක් තිබූ අතර, මට තිබුන එකම ලෞකික වස්තුවවූ ශත පහක්ද සාක්කුවේ තිබින." වැඩිහිටි පේජ් අනාගතවක්තෘවරයා අමතා ඔහු ඇඳුම් නැතිව අසරණව සිටින බැවින් ඔහුට දේශනාකිරීමේ කැඳවීම පිළිගැනීමට නොහැකි බව කීවේය. ඔහුට ඇඳීමට කබායක්වත් නොතිබින. අනාගතවක්තෘවරයා තම කබාය ගලවා ඔහුට දෙමින් වැඩිහිටි පේජ්ට ප්‍රතිචාර දැක්වීය. ඔහු වැඩිහිටි පේජ්ට ඔහුගේ දූතමෙහෙයට යන ලෙසත්, ස්වාමීන්වහන්සේ ඔහුට විශාල ලෙස ආශිර්වාදකරන බවත් කීවේය.[13] මෙම දූතමෙහෙයේදී සිය ගණන් ජනයාට සුභාරංචිය බෙදාගැනීමට වැඩිහිටි පේජ් ආශිර්වාදිතවීමෙන්, ඔවුහු සභාවට සම්බන්ධ වූහ.

*ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ දූතමෙහෙය*

1835 දී ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්නයට අමෙරිකා එක්සත් ජනදයේ නැගෙනහිර පළාතේ සහ කැනඩාවේද දූතමෙහෙයකට කැඳවීම් ලැබින. ගණපූර්ණයේ සාමාජිකයන් 12 දෙනාම එකම වරකදී දූතමෙහෙයක් බාරගත් සහා ඉතිහාසයේ එකම අවස්ථාව මෙය විය. ඔවුන් නැවත පැමිණිවිට, හීබර් සී. කිම්බල් සාක්ෂිදරමින් ඔවුන්ට දෙවියන්වහන්සේගේ බලය හැගුන නිසා රෝගීන් සුවකිරීමට සහ යක්ෂයන් පළවාහැරීමටද හැකිවූ බව කීවේය.



*ඉතා අසීරු තත්වයන් යටතේ අමෙරිකානු ඉන්දියානුවන්ට සුභාරංචිය රැගෙනයාමට කැඳවා තිබූ මෙම ධර්මදූතයන් හතරදෙනා, මුල් කාලීන සභා ඉතිහාසය මුළුල්ලේම ඇදහිලිමත් ධර්මදූතයන් කල පරිත්‍යාගවල ආදර්ශයකි.*

*එංගලන්තයට ගිය දූතමෙහෙය*

කර්ට්ලන්ඩ් නගරයේ අවසාන කාලයේදී, සභාව ඇතුලින්ම අර්බුද මතුවිය. යම් නායකයන්ද ඇතුළු, සමහර සාමාජිකයෝ, පරීක්ෂාවන් සහ හිරිහැර දරාගැනීමට බැරි නිසා, සහ ඔවුහු අනාගත වක්තෘවරයා සහ වෙනත් සභා නායකයන්ට වැරදි තැබීමට පටන් ගත් නිසාත්, ඇදහිල්ලෙන් වැටුනාහ. ස්වාමීන්වහන්සේ ජෝසෆ් ස්මිත්ට එළිදරව්වක් තුළින් උන්වහන්සේගේ සභාව බේරාගැනීමට යමක් කළ යුතු බව කීසේක. එම දෙය නම්, එංගලන්තයේ සිටින හැරී ආ අයගේ යහ ගුණ සභාවට මිශ්‍ර කිරීමය. 1837 ජූනි 4වෙනි ඉරිදා, කර්ට්ලන්ඩ් දේවමාළිගාව තුලදී හීබර් සී. කිම්බල් හමුවූ අනාගතවක්තෘවරයා, "හීබර් සොයුර, ස්වාමීන්වහන්සේගේ ආත්මයාණන් මට කොඳුරමින්: 'මගේ සේවක හීබර් එංගලන්තයට ගොස් මාගේ සුභාරංචිය දේශනාකරමින්, එම ජනතාවට ගැලවීමේ දොරටුව විවෘතකරත්වා'"[14] යයි කී බව කීවේය.

හීබර් සී. කිම්බල් ඔහුගේ දූතමෙහෙය සඳහා වෙන්කරන විට, වැඩිහිටි හයිඩ් කාමරයට පැමිණියෙන් සිදුවන දෙය කුමක්දැයි ඔහුට ඇසී, ඔහුට පසුතැවීමේ සිතක් පහළවුනේ, අනගතවක්තෘවරයාට දොස් කී අය සමග ඔහුද සම්බන්ධව සිටි නිසාය. ධර්මදූතයෙකු ලෙස සේවයකිරීමට ඔහුද ඉදිරිපත්වූ නිසා එංගලන්තයට යාමට ඔහුවද වෙන් කරන ලදී.

පිට රට භූමියක සුභාරංචිය දේශනාකිරීමට හිබර් සී. කිම්බල් කෙතරම් ආශාවෙන් සිටියේද යත් බෝට්ටුව එංගලන්තයේ ලිවර්පූල් වරායට පැමිණි විගසම, එය නැංගුරම් දැමීමටත් පෙර බෝට්ටුවෙන් වේදිකාවට පැනගත් ඔහු, නැවත පිහිටුවීමේ පණිවිඩය සමග විදේශික භූමියකට ප්‍රථමයෙන්ම පැමිණි පුද්ගලයා ඔහු යයි ප්‍රකාශ කළේය. ජූලි 23වෙනිදා වන විට, ධර්මදූතයන් සෙනගින් පිරී ගිය සභාවක දේශනාකළ අතර, ප්‍රථම බව්තීස්ම කිහිපයක්ම ජූලි 30 වෙනිදාට යොදාගත්හ. ජෝර්ජ් ඩී. වොට් ප්‍රෙස්ටන් නගරයේ රිබල් ගංගාව දක්වා පා තරඟයක් ජයග්‍රහනය කළ බැවින්, බ්‍රිතාන්‍යයේදී ප්‍රථමයෙන් බව්තීස්මවීමේ ගෞරවය එමගින් නිශ්චය වූවේය.

මාස අටක් තුලදී, සිය ගණන් හැරී ආ අය සභාවට බැඳීම නිසා ශාඛා කිහිපයක්ම සංවිධානය කෙරින. මෙම විශාල ආත්ම අස්වැන්න ගැන සිහිපත් කළ හීබර්, අනාගතවක්තෘවරයා සහ ඔහුගේ උපදේශකයන් "ඔවුන්ගේ අත් මා මත තබා...දෙවියන්වහන්සේ වෙතට ආත්ම දිනාගැනීමට එම ජනතාව අතර උන්වහන්සේ මා බලවත් කරනබවත්ඃ දේවදූතයන් මා සමග සිටිමින්, මා දරාගැනීම නිසා, මා අසමත් නොවන බවත්; මා බලවත් ලෙස ආශිර්වාදිතවී, දහස්ගණනකට ගැලවීමේ මාර්ගය ඔප්පුකරනු ඇති බවත් කීවෝය."[15]

මුල් කාලීන බොහෝ ධර්මදූතයෝ පරිත්‍යාග ගැන නොසලකා දූතමෙහෙය කැඳවීම් කීකරුව පිළිගත් නිසා, දහස් ගණන් හැරී ආ බ්‍රිතාන්‍ය ජනයා නැවත පිහිටුවන ලද සුභාරංචියේ ආශිර්වාද භුක්ති වින්දෝය. ඔවුහු සයෝනයට එකතුවී ඉදිරියේ එන තීරක කාලය සඳහා සභාව විශාල ලෙස ශක්තිමත් කළහ.

## කර්ට්ලන්ඩ් දේවමාළිගාව

### *ශුද්ධවන්තයන්ගේ පරිත්‍යාග*

1832 දෙසැම්බර් 27වෙනිදා, දේවමාළිගාවක් ගොඩනැගීමට ස්වාමීන්වහන්සේ දුන් නියෝගය ගැන පළමුවරට දැනගත්හ (බලන්න ඩීසගසී 88:119). දේවමාළිගාව ගොඩනැගීම සඳහා 1833 සිට 1836 දක්වා කාලය අතර කර්ට්ලන්ඩ්හි සභාව මගින් ප්‍රධාන ප්‍රමුඛත්වයක් දුන්නේය. අවශ්‍ය සේවකයන් සහ මුදල් නොමැතිකමින් ශුද්ධවන්තයන්ට මෙය විශාල අභියෝග රාශියක් ගෙන දුන්නේය. එලිසා ආර්. ස්නෝට අනුව, "ඒ කාලයේ,...ශුද්ධවන්තයන් සිටියේ සුළු ගණනකි, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් දුප්පත්ව සිටියහ, එසේම දෙවියන්වහන්සේ කථාකරමින්,

උන්වහන්සේගේ නාමයෙන් ගෘහයක් ගොඩනැගිය යුතු බවට සහතිකයක් තිබින. උන්වහන්සේ එළිදරව් කලේ ගොඩනැගීම පමණක් නොව එහි දිග පළලද, නියම කළසේක. එසේ නොවුයේ නම්, එම කාලයේ පැවතුන තත්වය යටතේ එම දේවමාළිගාව ගොඩනැනීම, සෑම අකාරයකින්ම, ඉතා අඳොන ප්‍රකාශයක් වීමට ඉඩ තිබින."[16]

දෙවියන්වහන්සේ අවශ්‍ය උපකාර සහ ප්‍රතිපාදන ලබාදෙන ඇදහිල්ල ඇතිව, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්, සහ ශුද්ධවන්තයෝ අවශ්‍ය පරිත්‍යාග කිරීම ආරම්භ කළහ. ජෝන් ටැනර් දේවමාළිගාව ගොඩනැගීමට අවශ්‍ය වත්කම් ලබාදීමට ස්වාමීන්වහන්සේ සූදානම්කල පුද්ගලයා විය. ඔහු මෑතකදී නිව් යෝර්ක්, බෝල්ටන් නගරයෙන් 1834දී හැරී ආ අයෙකු වූ අතර, "රාත්‍රී කාලයේදී සිහිනයක් හෝ දර්ශනයක් මගින් ඔහුව අවශ්‍ය බවත්, බටහිර පැත්තේ සභාවට ඉක්මණින් යා යුතු බවටත් ඔහුට දැඩි හැඟීමක් ඇතිවූනේය....

"ඔහු කර්ට්ලන්ඩ් නගරයට ලඟාවීමේදී, ඔහු ඉක්මණින්ම සභාවට යා යුතු බවට එම දැඩි හැඟීම මගින් ඔහු දැනගත්තේය. අනාගතවක්තෘවරයා සහ සොහොයුරන් කිහිපදෙනෙක් යාච්ඤා රැස්වීමකදී හමුවී, දේවමාළිගාව ගොඩනගන ගොවිපළේ උකස බේරාදීමට වත් කම් ඇති සොහොයුරෙක් හෝ සොහොයුරන් කිහිපදෙනෙක් ඔවුන් වෙත එවන ලෙස ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලා තිබුනි.

"ජෝන් ටැනර් කට්ලන්ඩ් නගරයට පැමිණි පසුදින,...මුලින් සඳහන් කළ ගොවිපළේ උකස සින්නවීමට යන බව [ඔහුට] දන්වන ලදී. ඒ විගසම ඔහු ඩොලර් දෙදහසක් අනාගතවක්තෘවරයාට නයට දී පොළිය සඳහා වන ලියවිල්ලක් ගත්තේය. එම මුදලින් ගොවිපළ මුදාගැනින."[17]

කර්ට්ලන්ඩ් ශුද්ධවන්තයන් විසින් දැරූ විශිෂ්ඨ උත්සාහයන් වනාහි පරිත්‍යාග සහ කාලය කැපකිරීම, දක්ෂතා සහ උපක්‍රම ආදිය ගැන ආදර්ශයකි. වසර තුනක කාලයක් ඔවුහු ගොඩනැගිල්ල සඳහා වෙහෙසුනහ. මිනිසුන් විසින් සපයන ලද ඉදිකිරීම් දක්ෂතා සහ උත්සාහයන්ට බාහිරව, කාන්තාවෝ වැඩකරන අයට ඇඳුම් සැපයීමට නූල් කැට රෙදි ගෙතුහ. පසුව කාමර වෙන්කිරීමට ඔවුහු තිර රෙදි සකස් කළහ. දේවමාළිගාව විනාශකිරීමට කල දාමරික තර්ජන නිසා ඉදිකිරීම් ඉතා අසීරු විය. දහවල් වැඩ කළ අය රාත්‍රී කාලයේදී දේවමාළිගාව මුර කළහ. නමුත් ශුද්ධවන්තයන් කාලය සහ සම්පත් අති විශාල ලෙස පරිත්‍යාග කිරීමෙන් පසුව, අවසානයේදී 1836 ගිම්හානයේදී දේවමාළිගාව සම්පූර්ණ විය.

*දේවමාළිගාව කැපකිරීම*

දේවමාළිගාව සම්පූර්ණවීමත් සමග, ස්වාමීන්වහන්සේ කර්ට්ලන්ඩ් ශුද්ධවන්තයන් මත දර්ශන දැකීම සහ දේවදූතයන්ගේ මෙහෙකිරීම්ද ඇතුළු, බලවත් ආත්මික ආශිර්වාද වැගිරවූසේක. ජෝසෆ් ස්මිත් මෙම කාල පරිච්ඡේදය හැඳින්වූයේ, "අපට සංවස්තර වර්ෂයක් සහ ප්‍රීතිවීමේ කාලයක්"[18] වශයෙනි. ඩැනියෙල් ටයිලර් මෙසේ සාක්ෂි දැරීය, "සියල්-ලෝම ස්වර්ගය පූර්ව රසවිඳීමක් අත්වින්දෝය....සහශ්‍රය ආරම්භවී ඇත්දැයි අපි කල්පනා කලෙමු."[19]

මෙම ආත්මික වැගිරීමේ උච්චාවස්ථාව දේවමාළිගාව කැපකිරීමේ අවස්ථාව විය. සංඛ්‍යාත්මකව 1,000ක ජනතාවක් 1836 මාර්තු 27වෙනිදා ප්‍රීතිමත් ආකල්පයකින් දේවමාළිගාවට එකතුවූහ. කැපකිරීමේ ජාතික ගීත, "*The Spirit of God Like a Fire Is Burning*" ගීතිකාවද ඇතුළුව ගායනාකරන ලදී, එය මෙම අවස්ථාව සඳහා විලියම් ඩබ්ලිව්. ෆෙල්ප්ස් විසින් ලියන ලදී. සක්‍රමේන්තුව ලබාදීම කළ අතර, සිඩ්නි රිග්ඩන්, ජෝසෆ් ස්මිත් සහ වෙනත් අය දේශනා ඉදිරිපත් කළහ.

ජෝසෆ් ස්මිත් කැපකිරීමේ යාච්ඤාව කියවීය, එය දැන් දහම සහ ගිවිසුමේ 109 වෙනි කොටසේ වාර්තාවී සිබෙන අතර, එය එළිදරව්වක් මගින් ලබා දුන්නකි. එයින් ස්වාමීන්වහන්සේ පෙන්තකෝස්ත දවසේ කලාක් මෙන් ජනතාවට ආශිර්වාද කරන ලෙසත්-දේවමාළිගාව උන්වහන්-සේගේ මහිමයෙන් වේගයෙන් හමන සුළඟක් පරිද්දෙන් පුරවන ලෙසත් ස්වාමීන්වහන්සේට ආයාචනා කරන ලදී. (බලන්න ඩීසහඝී 109:37). එදින සවස අනාගතවක්තෘවරයා දේවමාළිගාව තුළදී පූජකවරයේ ගණපූර්ණයේ සාමාජිකයන් හමුවූ විට මෙම යාච්ඤාව ඉෂ්ඨවූ බව බොහෝ දෙනෙක් වාර්තාකර ඇත.

එලිසා ආර්. ස්නෝ මෙසේ ලියුවාය: "එම කැපකිරීමේ පූජා විධි නැවත කළ යුතුය. නමුත් එම අනුස්මරණීය දිනයේ ඇතිවූ ස්වර්ගික ප්‍රකාශවීම් කිසිදු මනුෂ්‍ය භාෂාවකින් විස්තර කළ නොහැකිය. පැමිණ සිටි සියලුදෙනාටම දිව්‍යමය සමීපතාවයේ හැඟීමක් අවබෝධවූ අතර, සමහරෙකුට දේවදූතයෝ ප්‍රකාශවූහ. හැම හදවතකම පිරී තිබුන 'සතුට ප්‍රකාශකළ නොහැකි මහිමයෙන් පිරී තිබුනි.'"[20] කැපකිරීමේ යාච්ඤා-වෙන් පසුව, මුළු සභාවම නැගිට, අත් ඔසවා කිහිප වතාවක් හොසන්නා යයි කීහ.

එක් සතියකට පසුව, 1836 අප්‍රේල් 3වෙනි දින, පසු-දවස්වල ඉතිහා-සයේ වඩාත් වැදගත් සිද්ධීන් කිහිපයක් සිදුවිය. එදින දේවමාළිගාව තුළදී,

ස්වාමීන්වහන්සේම ජෝසප් ස්මිත් සහ ඔලිවර් කව්ඩරිට ප්‍රකාශවී, උන්වහන්සේ මෙම ගෘහය පිළිගත් බවත් උන්වහන්සේගේ නාමය එහි තිබෙනු ඇති බවත්, එතුමා උන්වහන්සේගේ ජනතාවට දයාවෙන් යුතුව එහිදී ප්‍රකාශවෙන බවත් කීසේක (බලන්න ධීසහසී 110:7). ඉන්පසුව වෙනත් ශ්‍රේෂ්ඨ සහ මහිමාන්විත දර්ශනවලින් මෝසෙස්, එලායස්, සහ එලිජා ප්‍රකාශවී පූජකවරයේ අමතර යතුරු නැවත පිහිටුවූහ. මෝසෙස් ඉශ්‍රයෙල් එකතුකිරීමේ යතුරු දානය කළේය. එලායස් ජෝසප් සහ ඔලිවර්ට ආබ්‍රහම්ගේ සුභාරංචි කාලපරිච්ඡේදය බාරදුන් අතර, එලියා මුද්‍රාකිරීමේ යතුරු නැවත පිහිටුවූවේය (බලන්න ධීසහසී 110:11–16). මෙම සියළුම අමතර යතුරු කාලවල අවසාන කාලපරිච්ඡේදයේදී ස්වාමීන්වහන්සේගේ රාජ්‍යයේ අභිවෘධිය සඳහා අවශ්‍යව තිබින.

දේවමාළිගාව තුලදී මෙහෙයවන ලද සම්පූර්ණ පූජකවරයේ ආශිර්වාද කර්ට්ලන්ඩ් කාලය තුලදී එළිදරව්කිරීම හෝ මෙහෙයවීම නොකරන ලදී. මෙම ආශිර්වාද අනාගතවක්තෘ ජෝසප් ස්මිත් තුලින් සභාවට එළිදරව්කරන ලද්දේ වසර කිහිපයකට පසුව නාවූ දේවමාළිගාව ගොඩනගන කාලය තුලදීය.

## කර්ට්ලන්ඩ් නගරයෙන් නික්මයාම

දේවමාළිගාව ගොඩනැගීමෙන් බොහෝ ආශිර්වාද ගෙන ආ නමුත්, 1837 සහ 1838 වර්ෂවලදී, ඇදහිල්ලෙන් වැටීම සහ හිංසා පීඩාවලින් ඇතිවූ ප්‍රශ්නවලට ශුද්ධවනතයෝ මුහුණ දුන්හ. එමගින් කර්ට්ලන්ඩ්වල සභා යුගයේ අවසානය ඉක්මන්විය.

එක්සත් රාජ්‍යය මූල්‍යමය අවපාතයකින් පීඩා විඳි අතර, එහි ප්‍රතිපලය සභාවටත් දැනින. සමහර සාමාජිකයෝ වෙළඳ රැල්ලට සහ ණයවීමට හසුවී කර්ට්ලන්ඩ් ආරක්ෂිත සමාජයේ කඩාවැටීමද ඇතුළුව, ආර්ථික කඩාවැටීම සිදුවූ අඳුරු කාලයේදී ආත්මිකව ජීවත්වූයේ නැත. මෙම මුල්‍යමය ආයතන පිහිටුවන ලද්දේ කර්ලනඩ් සභා සාමාජිකයන් කිහිපදෙනෙක් මගින් වන අතර, ඒ සම්බන්ධව ඇතිවූ ප්‍රශ්නවලට සමහර සාමාජිකයෝ වැරදි සහගත ලෙස ජෝසප් ස්මිත්ට චෝදනා කළහ.

සංවිධානාත්මක හිංසා පීඩා සහ සාහසික දාමරික ක්‍රියා සිදුවුනේ ප්‍රදේශයේ නිවාස වාසීන්ගෙන් සහ නෙරපා හැර සිටි හෝ ඇදහිල්ලෙන් වැටී තිත්තකමින් සිටි සභාවේ සමාජිකයන්ගෙන්ය.

ශුද්ධවන්තයන්ට සහ ඔවුන්ගේ නායකයන්ට විරුද්ධව සාහසික ක්‍රියා ඉහළ නැගීමෙන්, කර්ට්ලන්ඩ්හි සිටීම ඔවුන්ට ආරාක්ෂාකාරී නොවින.

අනාගතවක්තෘවරයාගේ ජීවිතය බරපතල අනතුරකට පත්ව තිබුනෙන්, ඔහු 1838 ජනවාරියේදී කර්ට්ලන්ඩ් නගරයෙන් ෆා වෙස්ට්, මිසූරි නගරයට පලාගියේය. 1838 කාලය තුලදී ඇදහිලිමත් ශුද්ධවන්තයන්ටද පිටව යාමට බලකෙරින. ඔවුහු ඇදහිල්ලේ, කැපවීමේ, සහ පරිත්‍යාගයේ ස්මාරකයක්වූ දෙවියන්වහන්සේ වෙනුවෙන් ගොඩනැගූ දේවමාළිගාව අත්හැර ගියහ. ඔවුන්ගේ ජීවිත වල ආදර්ශයෙන්, ඔවුහු දෙවියන්ව-හන්සේ ආලේප කළ නායකයන්ට දැක්වූ ඇදහිලිමත් කීකරුකම සහ ස්වාමීන්වහන්සේගේ වැඩ කටයුතුවලදී කළ පුද්ගලික පරිත්‍යාගවල ස්ථිර උරුමයක්ද තබා ගියහ.

# මිසූරි නගරයේ සයෝනය පිහිටුවීම

### මිසූරියේ සිටි මුල්කාලීන කාලසීමාව

ශුද්ධවන්තයන් කර්ට්ලන්ඩ්, ඔහයියෝ, නගරයේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට පරිශ්‍රමදරන එම කාලයේදීම, ජැක්සන්, මිසූරියේ සිටි සභාවේ බොහෝ සාමාජිකයෝ, බලවත් දුෂ්කරතාවලට පාත්‍රවී සිටියහ.

කෝල්ස්විලී, නිව් යෝර්ක්වල වාසයකළ ශුද්ධවන්තයන්ට කර්ට්ලන්ඩ්-වලට එකතුවන ලෙස කැඳවීම ලැබූ විට, ඔවුහු සිය කැමැත්තෙන්ම ඔවුන්ගේ නිවාස අත්හැර ගියහ (බලන්න පිටුව 18). 1831 මැයි මැද භාගයේදී ඔවුන් ඔහයියෝ නගරයට පැමිණි විට, ඔවුන් වෙනුවෙන් වෙන් කර තිබූ දේශය එහි නැති බව ඔවුහු දැනගත්හ. අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් ශුද්ධවන්තයන් පත්ව සිටින මෙම තත්වය ගැන ස්වාමීන්වහන්සේට යාච්ඤා කළේය. ඔහුට ලැබුන එළිදරව්වකින් ඔහු සමග සිඩ්නි රිග්ඩන්, සහ තවත් වැඩිහිටියන් 28 දෙනෙක් මිසූරියට හරවා ගැනීමේ දූතමෙහෙයක් යාමට මගපෙන්වීම් ලැබුන අතර, කෝල්ස්විලී ශුද්ධවන්තයන්ද මිසූරියට ගමන්කිරීමට ස්වාමීන්වහන්සේ උපදෙස් දුන්සේක (බලන්න ධ්‍යීසහගී 54:8). පසු කාලයකදී සයෝනය ලෙස හැඳින්වූ දේශයේ වාසයකිරීමට ගිය මුල්ම ශුද්ධවන්තයයෝ ඔවුහුය.

කෝල්ස්විලී ශාඛාවේ සභාපතිවරයාවූ, නිවෙල් නයිට්, ඔහුගේ ජනතාව විගසකින්ම එකතු කළහ. එමිලි කොබර්න් මෙසේ පැවසුවාය, "අපි වඩාත් සත්‍ය ලෙසම වඩා හොඳ රටක් සොයමින් යන වන්දනා නඩයක් මෙන් වීමු."[1] ඔවුහු වෙල්ස්විලී, ඔහයියෝවලදී, දුම් බෝට්ටුවක නැගී, ඔහයියෝ, මිසිසිපි, සහ මිසූරි ගංගා දිගේ, මිසූරි, ජැක්සන් ප්‍රාන්තයට ගමන් කළහ. දුම් බෝට්ටුවේ කප්පිත්තා කථාකරමින් "ඔවුන් බටහිරට රැගෙන ගිය වඩාත් සාමකාමී සහ සංසුන් දේශාටකයන් පිරිස ඔවුන් බව කීවේය: 'කෙලෙසන කථා නැත, නරක වචන නැත, සූදු සෙල්ලම් නැත, සුරාපානය නැත.' "[2]

අනාගතවක්තෘවරයා සහ අනෙක් සභා නායකයන් ගොඩබිම මාර්ගයක් පාවිච්චි කරමින්, ජැක්සන් ප්‍රාන්තයේ ඔවුන්ට වාසයකිරීම සඳහා ස්ථානයක් කලින්ම සැලසුම්කිරීමට කෝල්ස්විලී ශුද්ධවන්තයන්ව ඉක්මණින්ම යැවූහ. අනාගතවක්තෘවරයාගේ කණ්ඩායම 1831 ජූලි 14වෙනිදා, මිසූරි, ඉන්ඩිපෙන්ඩන්ට් වෙත ලඟාවූහ. ප්‍රාන්තය දැකබලාගෙන, යාච්ඤාවෙන් දිව්‍යමය මගපෙන්වීම් සෙවීමෙන් පසුව, අනාගතවක්තෘවරයා මෙසේ කීවේයඃ "[ස්වාමීන්වහන්සේ] මා වෙතට ප්‍රකාශවී, නියමිත ස්ථානය මා හට සහ අන් අයට නියම කල අතර, එහි උන්වහන්සේ සැලසුම් කළ රැස්කිරීමේ වැඩකටයුතු පටන්ගැනීමට සහ ශුද්ධවූ නගරයක් ගොඩනැගීමටත්, එය සයෝනය යයි නම්කළ යුතු බවත් කීසේක."[3]

ශුද්ධවන්තයන්ගේ එකතුවීම සඳහා ස්වාමීන්වහන්සේ අදහස් කලේ මෙම ස්ථානය බව මෙම එළිදරව්වෙන් නම නියම කෙරින, "එසේම දැන් ඉන්ඩිපෙන්ඩන් නමින් හැඳින්වෙන ස්ථානය එහි මධ්‍යස්ථානය වන්නේය; දේවමාළිගාවට සුදුසු ස්ථානය උසාවියට නුදුරුව බටහිරට වන්නට ඇති භූමියයි. (බලන්න ධීසහසී 57:3). මිසූරි සහ ඉන්දියානු දේශසීමාවට වෙන්කරන සීමාවේ නගරයට බටහිරින් ඇති සෑම බිම් කොටසක්ම ශුද්ධවන්තයන් මිළදී ගත යුතුය (බලන්න ධීසහසී 57:1–5).

ජෝසෆ් ස්මිත් සහ සභානායක පාට්‍රිජ් විසින් කෝල්ස්විලී ශාඛාව සඳහා ඉන්ඩිපෙන්ඩන්වලට සැතපුම් 12 බටහිරට ඇති කෝ ගම්මානයෙන් ඉඩම් අත්කර ගත්හ. 1831 අගෝස්තු 2වෙනිදා, ශාඛා සාමාජිකයන්ගේ පැමිණීමෙන් පසුව, චාරිත්‍රානුකූල උත්සවයක් පැවැත්වූ අතර, එය සංකේතවලින් පිරී තිබින. මිනිසුන් 12 දෙනෙක්, ඉශ්‍රායෙල් ගෝත්‍ර දොළෙස නියෝජනය කරමින්, අළුත කැපූ ඕක් ලී කොටයක් රැගෙන ඔලිවර් කව්ඩරි විසින් සකස්කල ගලක් මත හරස් අතට එය තැබූහ. එලෙස සයෝනයේ පිහිටුවීමට සංකේතාත්මක පදනමක් දමන ලදී. එම නිහතමානී ආරම්භයෙන් ශුද්ධවන්තයෝ ඉදිකල ගොඩනැගිල්ල සභාව සහ පාසල් ගෘහයක් ලෙසද පාවිච්චි කෙරින.[4]

ඊට පසු දින, සොහොයුරන් කිහිපදෙනෙක් ඉන්ඩිපෙන්ඩන්ට් උසාවි ගෘහයට සැපුම් එකහමාරක් බටහිර උස් භූමියකට රැස්වූහ. ජෝසෆ් ස්මිත් අරමුණු කළ දේවමාළිගාව සඳහා කොන් ගලක් තැන්පත්කර එය ස්වාමීන්වහන්සේට කැප කළේය. සයෝන භූමියේ ප්‍රධාන අංගය ස්වාමීන් වහන්සේගේ ගෘහය වන්නේය.[5]

අනාගතවක්තෘවරයා කර්ට්ලන්ඩ් නගරයට නැවත පැමිණි අතර, ජැක්සන් ප්‍රාන්තයේ ශුද්ධවන්තයන්ට භූමියට අවශ්‍ය බිම් කොටස් සභානායක

එඩ්වඩ් පාට්‍රිජ්ගෙන් ලැබීම ආරම්භවිය. ඔවුන් ඉතා දුප්පත්ව සිටියෙන්, ගොඩනැගිලි තනන විට අව් වැසිවලින් ආරක්ෂාවීමට කූඩාරම්වත් නොතිබිනි. ඔවුන්ට ගොවි උපකරනවල සම්පූර්ණ හිඟයක් තිබූ බැවින්, ඒවා ලබාගැනීමට සැතපුම් 200කටත් එහා පිහිටි සෙන්ට් ලුවිස් වෙත අශ්ව කරත්ත යැවූහ. ශුද්ධවන්තයන්ට ඒවා ලැබුන පසු, ඔවුහු වගාකිරීම සඳහා බිම් කෙටීමට පටන් ගත්හ. මහත් විෂ්මයට පත් එමිලි කොබොන් මෙසේ කීවායඃ "ගොන් බාන් හතරක් හෝ පහක් සාරවත් පොළොව හැරීම දැකීම, ඇත්තවශයෙන්ම අමුතු දර්ශනයකි. වැටවල් ගැසීම සහ වෙනත් වැඩි දියුණුකිරීම් සාර්ථකව වේගවත් විය. පවුල් සඳහා නිවාස ගොඩනැනීම, කාලය, මුදල් සහ වැඩකිරීම අනුව වේගවත්ව සිදුවිය."[6]

දේශසීමා අපහසුකම් නොතකාහැර, කෝල්ස්විලී ශුද්ධවන්තයෝ ප්‍රීතියෙන් සහ සතුටින් සිටියහ. ඔවුන් සමග වාසයකළ, පාර්ලි පී. ප්‍රැට්, මෙසේ කීවේයඃ" අපගේ යාච්ඤා සහ වෙනත් රැස්වීම් තුලින් අපි බොහෝ කාලවල් සතුටින් සිටියෙමු. ස්වාමීන්වහන්සේගේ ආත්මය අප මත මෙන්ම කුඩා දරුවන් මත පවා, කෙතරම් වැගිරී තිබුනාද යත්, වයස අට, දහය සහ දොළහේ බොහෝ දරුවෝ අපගේ රැස්වීම් වලදී සහ අපගේ පවුලේ නමස්කාර මෙහෙයන් වලදී කථාකරමින්, යාච්ඤාකරමින් සහ අනාවැකි පවාද කීවෝය. සමාදානයේ සහ සමගියේ ආකල්පයක් එහි තිබූ අතර, ප්‍රේමය සහ හොඳ හිත වනාන්තරයේ කුඩා සභාවේ ප්‍රකාශවූ අතර, එහි මතකය මගේ හදවතට සදා මිහිරක් විය."[7]

1832 අප්‍රේල් මාසයේ අනාගතවක්තෘවරයා සහ සිඩ්නි රිග්ඩන්ගේ දෙවන බැහැදැකීමෙන් ශුද්ධවන්තයෝ ආශිර්වාදිතවූහ. නායකයෝ හයිරම්, ඔහයියෝවල ජෝන් ජොන්සන්ගේ ගොවිපළේ සිට පැමිණියේ ඉතා වේදනාකාරී අත්දැකීමක් සමගය, ඔවුහු එහි බයිබලයේ පරිවර්තන කටයුතු කරමින් සිටියහ. සභාවට සතුරු දාමරිකයන් රාත්‍රී කාලයේදී ජෝසෆ් ස්මිත්ව නිවසින් පිටතට ඇදගෙන විත්, ඔහුගේ බෙල්ල මිරිකා, ඔහුව නිර්වස්ත්‍රකර, ඔහුගේ ශරීරය තාර සහ පිහාටුවලින් වසා ඇත. සිඩ්නි රිග්ඩන්ව රළු, හිම පොළොව, දිගේ ඔහුගේ කකුලෙන් ඇදගෙන විත් ඔහුගේ හිසට බරපතල සීරීම් තුවාල සිදු කර ඇත.

දැන්, ඔවුහු එම ශාරිරික පහරදීම් වලින් මිදී, ඔවුන්ගේ මිතුරන් අතර සිටිති. ජෝසෆ්ට "එකම ඇදහීමකින්, සහ එකම බව්තීස්මයක් මගින් ඒකත්වයකින් එකමුතුවූ සොහොයුරන්ගේ පිළිගැනීමක් සහ එකම ස්වාමීන්වහන්සේගේ සහයෝගයටද ලැබුනු බවට සහතික විය. විශේෂයෙන්ම, කෝල්ස්විලී ශාඛාව, පැරණි කාලයේ පාවුළු සමග ප්‍රීතිවූවාක් මෙන්,

ප්‍රීතියට පත්වූහ. දෙවියන්වහන්සේගේ ජනතාව සමග ප්‍රීතිවීම යහපත් දෙයකි."[8]

**ජැක්සන් ප්‍රාන්තයේ හිංසා පීඩා**

ස්වාමීන්වහන්සේගේ නියෝගය අනුව යමින්, සභානායක පාර්ට්‍රිජ්, ඔහියෝ හෝ වෙනත් ප්‍රදේශවලින් පැමිණෙන සිය ගණන් ශුද්ධවන්තයන් සඳහා ජැක්සන් ප්‍රාන්තයෙන් ඉඩම් අක්කර සිය ගණනක් මිළදී ගත්තේය. නායකයෝ මෙම සාමාජිකයන් සඳහා ඉන්ඩිපෙන්ඩන්, කෝල්ස්විලී, විට්මර්, බිග් බ්ලූ, සහ ප්‍රෙයරී ශාඛා මුලින්ම ආරම්භ කළහ. 1833 අවසන් කාලයේදී පිහිටුවන ලද මුළු ශාඛා ගණන දහයකි.[9] ශුද්ධවන්තයෝ සභාව ආරම්භකිරීමේ තුන් වන සංවත්සරය සැමරීම සඳහා 1833දී බිග් බ්ලූ ගංගාව අසලදී සියලු ශාඛා එකට හමුවූ විට සමහරවිට 1,000ක පමණ ශුද්ධවන්තයෝ පැමිණ සිටියහ. නිවෙල් නයිට් මෙම එක්රැස්වීම ගැන සඳහන් කරමින් එය සයෝනයේ සහ එහි සාමාජිකයන්ගේ ප්‍රථම ස්මරනොත්සවයක්වු බවත්, ඔවුන් අතර මහා ප්‍රීතිමත් ආකල්පයක් තිබූ බවත් කීවේය. කෙසේවුවද, "ශුද්ධවන්තයන් ප්‍රීතිවන විට, යක්ෂයා පිස්සු වැටී, ඔහුගේ දරුවන්ව සහ සේවකයන්ව ඔහු විසින් අමනාපකරන ලදී."[10]

අප්‍රේල් මාසය අවසානවීමට පෙර, හිංසා පීඩා ආකල්පයක් ප්‍රකාශවිය. මුල් කාලයේදී, ප්‍රදේශවාසීහු සභා සාමාජිකයන්ට අනතුරු අඟවමින්, එපමණ ප්‍රමාණයක් පසු-දවස්වල ශුද්ධවන්තයන් පැමිණීම ගැන ඔවුන්ගේ අසතුට ප්‍රකාශ කලේ, චන්දයකදී ඔවුන් ඉක්මණින්ම ඔවුන්ව යටපත්කරනු ඇතැයි බියක් පැවති නිසාය. උතුරු ප්‍රාන්තවලින් මුලින් පැමිණි ශුද්ධවන්තයෝ සාමාන්‍යයෙන් කළු වහල් සේවයට විරුද්ධවූහ. එය එකළ මිසූරි ප්‍රාන්තයේ නීත්‍යානුකූල දෙයක් විය. මෝර්මන්ගේ පොත ශුද්ධ ලියවිලි ලෙස ශුද්ධවන්තයන්ගේ විශ්වාසය නිසාත්, ජැක්සන් ප්‍රාන්තය අවසානයේදී ඔවුන්ගේ සයෝනය වන බවට අයතිවාසිකම් කීමත්, අනාගතවක්තෘවරයෙකු විසින් ඔවුන්ට නායකත්වය දෙන නිසාත් ඔවුහු ඉතා කලබලයට පත්වූහ. එසේම, ඔවුන්ට ඉන්දියානුවරුන් සමග සම්බන්ධකම් තිබෙන බවට තිබූ චෝදනාවත්, ප්‍රදේශවාසීන්ගේ සැකය වැඩිකිරීමට හේතුවිය.

සමහර අවස්ථාවලදී රහසිගත ව්‍යවස්ථාවක් ලෙස හඳුන්වනු ලැබූ, චක්‍රලේඛයක්, විරුද්ධවාදීන් අතර යවා, "මෝර්මන් වසංගතය" මුලිනුපුටා දැමීමට කැමති අයගේ අත්සන් ඊට ලබාගත්හ. මෙම ද්වේෂ සහගත

හැඟීම් 1833 ජූලි 20වෙනි දින උච්චස්ථාවට පත්වී, 400කින් යුත් දාමරිකයෝ ඔවුන්ගේ උත්සාහයන් සම්බන්ධීකරණය කිරීමට ඉන්ඩිපෙන්ඩන්ට් උසාවි ශාලාව තුල හමුවූහ. ශුද්ධවන්තයන්ට ජැක්සන් ප්‍රාන්තයෙන් පිටවී යාමටත්; ඔවුන්ගේ *The Evening and the Morning St*, පුවත්පත මුද්‍රණයකිරීම නැවැත්වීමට; සහ අමතර ශුද්ධවන්තයන් ජැක්සන් ප්‍රාන්තයට පැමිණීමට ඉඩ නොදීමටත් ලිඛිත බලපෑම් සභා නායකයන් ඉදිරියේ තබන ලදී. සභා නායකයන් මෙම නීති විරෝධී අවශ්‍යතාවයන්ට එකඟ නොවන බව දාමරිකයන් දැනගත් විට, ඔවුහු පුවත්පත් කාර්යාලයට පහර දුන්හ, එය කතෘවරයාවූ විළියම් ඩබ්ලිව් ෆෙල්ප්ස්ගේ නිවසද විය. ප්‍රහාරකයෝ මුද්‍රණ යන්ත්‍රය සොරකම්කර, ගොඩනැගිල්ලද කඩා දැමූහ.

*පණත් පොත විනාශවීම*

පුවත්පත් කාර්යාලයේ මුද්‍රණයවෙමින් තිබූ ඉතා වැදගත් ව්‍යාපෘතික්වූයේ, අනාගතවක්තෘ ජෝසප් ස්මිත් විසින් ලබාගත් එළිදරව්වල ප්‍රථම සංග්‍රහයවූ පණත් පොතයි. දාමරිකයන් ගොඩනැගිල්ලට පහරදුන් විට, ඔවුහු එකට බැඳ නොතිබුන පොතේ කොල පාරට වීසි කළහ. පසුදවස්වල ශුද්ධවන්තයන්වූ තරුණ ශුද්ධවන්තයන් දෙදෙනෙක්වූ, මේරි එළිසබෙත් රොලින්ස් සහ ඇයගේ සොහොයුරිය, කැරොලින්, මෙය දැක, ඔවුන්ගේම ජීවිතය පරදුවට තබා, ඔවුන්ට හැකි පමණ කොල ආරක්ෂාකරගැනීමට තැත් කළහ. මේරි එළිසබෙත් මෙසේ සිහිපත් කළාය:

"[දාමරිකයෝ] විශාල කොල කිහිපයක් පිටතට ගෙනවිත්, 'මෙන්න මෝර්මන් පණත්' යයි කීහ. මගේ සොහොයුරිය සහ මම වැටක් අයිනේ සිටිමින් ඔවුන් දෙස බලා සිටියෙමු. ඔවුන් පණත් ගැන කී විට ඒවායින් කිහිපයක් ලබාගැනීමට මම නිශ්චය කළෙමි. මගේ සොහොයුරිය මා අමතා, මා ඒවා කිසිවක් ගැනීමට ගියහොත් ඇයත් මා සමග එන බව කියා, 'ඔවුන් අපව මරාවි'" යයි කීවාය. දාමරිකයන් නිවසේ එක් කොනක කාර්ය බහුලව සිටියදී, දිව ගිය ගැහැණු ලමයින් දෙදෙනා ඔවුන්ගේ අත් අගනා කොලවලින් පුරවා ගත්හ. ඔවුන් දුටු දාමරිකයෝ ලමුන්ට නවතින ලෙස කීහ. මේරි එළිසබෙත් මෙසේ වාර්තා කළාය: "අපි අපට හැකි තරම් වේගයෙන් දිව්වෙමු. ඔවුන් දෙදෙනෙක් අප පස්සේ එළවා ආහ. වැටේ සිදුරක් දැක, අපි එතුළින් විශාල ඉරිඟු යායකට ඇතුල් වූයෙමු. කොල බිම දැමූ අපි ඒවා අපගේ ශරීරවලින් වසා ගත්තෙමු. ඉරිඟු ගස් අඩි පහක් හයක් පමණ උසට ඝනව වැවී

තිබින. සැහෙන වෙලාවක් අපව සෙවූ ඔවුහු, අප සමීපයටම ආවද, අපව සොයා ගත්තේ නැත."

මැරවරයන් ගියාට පසු, ගැහැණු ළමෝ පැරණි ඉස්තාලයකට ගියහ. මෙතැන, මේරි එළිසබෙත් විසින් වාර්තාකර තිබූ ලෙස, "ෆෙලප්ස් සොහොයුරිය සහ ලමයින් අතු කැලි රැගෙන විත් ඒවා අටුවේ පැත්තක අඩුක්කරමින් සිටිනු ඔවුහු දුටුවෝය. මා ළඟ තිබෙන්නේ මොනවාදැයි ඇය ඇසුවාය—මම ඇයට කීවෙමි. ඇය එවිට ඒවා අපගෙන් ගත්තාය....ඔවුහු ඒවා කුඩා පොත් මෙන් එකට බැඳ මට එකක් එව්වාය. එය මට ඉතා උසස් වස්තුවක් විය."[11]

*සභානායක පාට්‍රිජ්ට තාරදැමීම සහ පිහාටු ගැසීම*

දාමරිකයෝ ඊළඟට සභානායක පාට්‍රිජ්ව සහ චාල්ස් ඇලන්ව අල්ලා ගත්හ. ඔවුන්ව ඉන්ඩිපෙන්ඩන්ට් මහජන චතුරශ්‍රයට ගෙන ගොස්, මෝර්මන්ගේ පොත ප්‍රතික්ෂේප කිරීමට සහ ප්‍රාන්තයෙන් පිටව යන ලෙස අණ කෙරින. සභානායක පාට්‍රිජ් මෙසේ කීවේය, "ශුද්ධවන්තයන් ලෝකයේ සෑම කාලයකම හිංසා පීඩා වින්ද බව මම ඔවුන්ට කීවෙමි; කිසිවෙක් අමනාපකිරීම පිණිස කිසිවක් මා කර නොමැති බවත්; ඔවුන් මට හිරිහැර කරතොත්, ඔවුන් අහිංසක මිනිසෙකුට හිරිහැරකරන බවත්; ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් වේදනා විඳීමට මා කැමති බවත්; නමුත් ප්‍රාන්තයෙන් පිටවී යාමට, එයට කැමැත්ත දීමට මා අකමැති බවත් මම කීවෙමි."

මෙම ප්‍රතික්ෂේප කිරීමත් සමගම, මිනිස්සු ඔවුන්ගේ බාහිර ඇඳුම් ගලවා, ඔවුන්ගේ ශරීර තාර සහ පිහාටුවලින් වැසූහ. සභානායක පාට්‍රිජ් මෙසේ කීවේය, "මම බොහෝ යටහත්ව මට කල හිරිහැර දරා සිටියෙමි. එය ජනතාවගේ විස්මයට හේතු විය. මට නිහඬව යාමට ඔවුහු ඉඩ දුන්හ. බොහෝ දෙනෙක් ඉතා ගෞරවනීයව බලා සිටි අතර, ඔවුන්ගේ හදවත් සහ මා සිතූ ලෙස ස්පර්ශවිය. මා ආත්මිකව සහ දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් පිරී ඇති බවක් මට දැනුනේ, මට හිංසා පීඩා කරන්නන්ට හෝ වෙනත් කිසිවෙකුට මා තුල වෛරයක් නොවූ නිසාය."[12]

*බිග් බ්ලූ සටන*

දාමරිකයෝ ජූලි 23 වෙනිදා නැවතත් පැමිණියෙන්, ඔවුන් ජනතාවට හිරිහැර නොකරන්නේ නම් සභා නායකයෝ තමන්ම වන්දියක් ලෙස

ඉදිරිපත්වන බව කීහ. නමුත් දාමරිකයෝ මුළු සභාවටම හිරිහැරකරන බවට තර්ජනය කරමින්, සියලුම පසු-දවස්වල ශුද්ධවන්තයන් ප්‍රාන්තයෙන් පිටවී යන බවට එකඟවීමට සොහොයුරන්ට බලකළහ. දාමරිකයනගේ ක්‍රියාව නීත්‍යානුකූ නොවන බැවින්, සහ එක්සත් ජනදයේ සහ මිසූරි ප්‍රාන්තයේ ව්‍යවස්ථාවට විරුද්ධ බැවින්ද, සභා නායකයෝ ප්‍රාන්තයේ ආණ්ඩුකාරයාවූ, ඩැනියෙල් ඩන්ක්ලීන්ගේ උපකාර සෙවූහ. ඔවුන්ගේ සිවිල් අයිතිවාසිකම් ගැන උපදෙස් දුන් ඔහු නීති උපදෙස් ගැනීමට ඔවුන්ට කීවේය. සබාව නියෝජනය කිරීමට අලෙක්සැන්ඩර් සහ වෙනත් අය යෙදවූ අතර එම ක්‍රියාව දාමරිකයන් තවත් කෝපකිරීමට සමත්විය.

අරගල වළක්වා ගැනීමට පසු-දවස්වල ශුද්ධවන්තයන් මුලදී ක්‍රියා කළහ; කෙසේවුවද, සාමාජිකයන්ට පහරදීම සහ දේපළ විනාශකිරීම නිසා අවසානයේදී බිග් බ්ලූ ගංගාව අසල සටනකට මුල පිරීය. දාමරිකයන් දෙදෙනෙක් මරා දැමුනු අතර, ශුද්ධවන්තයන්ට ඇන්ඩෘ බාබර් අහිමිවිය. ෆිලෝ ඩිබල්ට තුන්වරක්ම බඩට වෙඩි තබන ලදී. ඔහුට සාත්තු කිරීමට නිවෙල් නයිට් කැඳවන ලදී, ප්‍රතිඵල ආශ්චර්‍යමත් විය, ඩිබල් සොහොයුරා මෙසේ කීවේයඃ

"නිවෙල් නයිට් සොහොයුරා මා වෙතට පැමිණ, මගේ ඇඳේ පැත්තක වාඩිවිය....ඔහු මාව ස්පර්ශකිරීමට පෙර ආත්මයාණන් මගේ හිස් මුදුනේ නවතී සිටීම මට දැනුනෙන්, මා සුවපත්වීමට යන බව මම ක්ෂණයකින් දැනගත්තෙමි....මා ක්ෂණයකින් නැගිට ලේ තුන්කාලක් හෝ වැඩි ප්‍රමා-ණයක් සහ උණ්ඩ මගින් මගේ ශරීරයට ඇතුළුවූ රෙදි කෑලි කිහිපයක්ද මම පිට කළෙමි. මම ඉන්පසුව ඇඳගෙන පිටතට ගියෙමි....එම මොහොතේ සිට මගෙන් ලේ බිංදුවක්වත් පිට නොවූ අතර, ලේ ගැලීම නිසා මට තිබූ යම් දුර්වලකමක් හැර, මගේ තුවාලයෙන් සුළු වේදනාවක් හෝ අපහසුවක් හෝ ඉන්පසුව මට නොදැනින."[13]

ආණ්ඩුකාර ඩන්ක්ලින් මැදිහත් වෙමින් දෙපාර්ශවයම නිරායුධ කරන ලෙස ක්ලෝනල් තෝමස් පිචර්ට උපදෙස් දුන්නේය. කෙසේවුවද, කර්නල් පිචර් දාමරිකයන්ට සහයොගය දැක්වීමෙන්, ශුද්ධවන්තයන්ගේ ආයුධ ගත් ඔහු ඒවා දාමරිකයන්ට දුන්නේය. අනාරක්ෂිතවූ ශුද්ධවන්තයන්ට පහරදී ඔවුන්ගේ නිවාසද විනාශ කෙරින. ශුද්ධවන්තයන්ට වනාන්තරයේ සැඟවී සිටීමට සිදුවූ අතර ඔවුහු බරපතල පහරදීම්වලට ලක්වූහ. අවසානයේදී ජනතාවට ඔවුන්ගේ බඩු බාහිරාදිය රැගෙන ජැක්සන් ප්‍රාන්තයෙන් පළා යන ලෙස සභා නායකයෝ කීහ.

*ක්ලේ ප්‍රාන්තය තුල ආරක්ෂාව සෙවීම*

1833දී ශුද්ධවන්තයන්ගෙන් වැඩි පිරිසක් මිසිසිපි ගංගාව උතුරින් තරණය කොට ක්ලේ ප්‍රාන්තයට ගොස් එහි තාවකාලිකව පිහිට ලැබූහ, පාර්ලි පී. ප්‍රැට් විස්තරකළ ලෙසः

"වෙරලේ වරාය දෙපැත්තම මිනිසුන්ගෙන් කාන්තාවන් සහ ලමුන්ගෙන් පේළි සැදීම ආරම්භ විය; බඩු බාහිරාදිය, කරත්ත, පෙට්ටි, ආහාර ද්‍රව්‍ය යනාදියද විය., වරායේ නිරන්තරයෙන්ම වැඩ අධිකවිය; රාත්‍රිය නැවතත් අපව පුළුන් ඇට වැනි හිම පොළොවක වසා ගත් අතර, එය කඳවුරක රැස්වීමක් ලෙස පෙනුනි. හැම අතකම සිය ගණන් ජනතාව සිටියහ, සමහරු කූඩාරම් තුලද, සමහරු ගිනි මැල වටාද, සිටියදී වර්ෂාව අධික ලෙස ඇතිවිය. ස්වාමි පුරුෂයන් ඔවුන්ගේ භාර්‍යාවන් ගැනද, භාර්යාවන් ඔවුන්ගේ ස්වාමී පුරුෂයන් ගැන විමසූහ; දෙමාපියන් ලමයින්වද, ලමයින් දෙමාපියන්වද සෙවූහ. සමගරුන්ට ඔවුන්ගේ පවුල්, ගෘහ භාණ්ඩ සහ යම් ආහාර ද්‍රව්‍යද සමග ගැලවී යාමේ භාග්‍යය තිබින; අන් අය ඔවුන්ගේ මිතුරන්ගේ ඉරණම ගැන නොදැන සිටි අතර ඔවුන්ගේ සියලුම බඩුද අහිමිකර ගත්හ. එම දර්ශනය...අපට හිංසාකළ සහ අන්ධ සහ අඥාන සමාජය හැර, පොළොවේ ඕනෑම පුද්ගලයෙකුගේ හදවත උණුකරවන සුළුය."[14]

ජැක්සන් ප්‍රාන්තයේ සයෝනය සහ ඔවුන්ගේ දෙවියන්වහන්සේට දේවමාළිගාවක් ගොඩනැගීමේ අවස්ථාව මෙසේ තාවකාලිකව ශුද්ධවන්තයන්ගෙන් බලෙන් පැහැර ගන්නා ලදී, 1200ක් පමණ ශුද්ධවන්තයෝ දැන් ක්ලේ ප්‍රාන්තයේ ගංගාව අසල කරදරකාරී ශීත සෘතුවෙන් ගැලවීම සඳහා අවශ්‍ය දෙය කළහ. සමහරු කරත්ත පෙට්ටිවල, කූඩාරම්වල හෝ කඳුකරයේ වළවල් වල පිළිසරණ ලැබූහ. අන් අය අත්හැර දැමූ ගෙවල් වල සිටියහ. නිවෙල් නයිට් ශීත සෘතුවේදී ඉන්දියානු කූඩාරමක ජීවත්විය.

ශුද්ධවන්තයන් විසින් ක්ලේ ප්‍රාන්තයේ ඉදිකල ප්‍රථම ගොඩනැගිල්ල වූයේ නමස්කාර කිරීම සඳහා කොටවලින් තැනූ කුඩා ගෘහයකි. මෙහිදී ඔවුහු "දුෂ්ඨ සතුරන්ගෙන් ඔවුන්ව බේරාගැනීම ගැන සර්වබලධාරී දෙවියන්වහන්සේට ස්තුතිය පුදකිරීමට අමතක නොකළ අතර, අනාගතයේදී උන්වහන්සේගේ ආරක්ෂාවද සෙවූහ—උන්වහන්සේ ඔවුන් පළා ආ ප්‍රදේශයේ ජනතාවගේ හදවත් මෘදුකර, ඔවුන්ට ජීවත්වීමට යමක් ඔවුන් අතරින් සොයා ගැනීමටත් උපකාරකරන ලෙස ඉල්ලූහ."[15]

## සයෝන කඳවුරේ හිංසා පීඩා

3වෙනි පරිච්ඡේදයේ සාකච්ඡාවූ පරිදි, ජැක්සන් ප්‍රාන්තයේ තම නිවාසවලින් එළවා දැමූ ශුද්ධවන්තයන්ට උපකාර පිණිස කර්ට්ලන්ඩ් සිට මිසූරි දක්වා පෙළපාලි යැමට මිනිසුන් කණ්ඩායමක් එකතුකිරීමට ස්වාමීන්වහන්සේ ජෝසෆ් ස්මිත්ට නියෝග කළසේක. සයෝන කඳවුර 1834 ජූනි අග භාගයේදී නැගෙනහිර මිසූරි, ක්ලේ ප්‍රාන්තයට, ළඟාවූ විට, මිසූරි ජාතික 300ක දාමරිකයන් පිරිසක් ඔවුන්ව විනාශකිරීමේ අදහසින්—ඔවුන්ව හමුවීමට පිටතට පැමිණියහ. අනාගතවක්තෘවරයාගේ උපදෙස් අනුව සොහොයුරෝ කුඩා සහ ලොකු ධීවර ගංගාවල සංධිස්ථානයේ කඳවුරු ඉදි කළහ.

දාමරිකයෝ කාල තුවක්කුවලින් පහරදීමට පටන්ගත් නමුත්, ස්වාමීන්වහන්සේ ශුද්ධවන්තයන්ගේ සටන සටන් කළසේක. වළාකුළු ක්ෂණයකින් අහසේ එකතුවීමට පටන්ගත්තේය. අනාගතවක්තෘවරයා සිද්ධිය මෙසේ විස්තරකළේය: "වර්ෂාව සහ ගල් වර්ෂාව ආරම්භ විය....තද සුළඟ අති මහත්විය; සුළඟ සහ වර්ෂාව, ගල් වර්ෂාව සහ ගෙරවීම් විශාල කෝපයකින් ඔවුන්ට ගැසීය. ඔවුහු ඉක්මණින්ම අධෛර්‍යයට පත්වූහ, ඔවුන් සැලසුම් කළ 'ජෝ ස්මිත් සහ ඔහුගේ හමුදාව' මැරීමට ගත් සියලු ප්‍රයත්නයන් නිශ්ප්‍රභ විය....තද සුළඟ නවතින තුරු ඔවුහු කරත්ත යටට සහ ගස් බෙනවලට බඩ ගා ගියහ, කුඩා මඩුවලට රිංගුහ., ඔවුන්ගේ පතොරොම්, තුවක්කු තෙමී ගියේය." මුළු රාත්‍රියේම සුළඟ සහ වැහි පොද වලට හසුවීමෙන් පසුව, "මෙම 'බලාපොරොත්තුව අත්හැර,' 'පසුබැස,' ඉන්ඩිපෙන්ඩන්ට් බලා ගොස්, දාමරිකයන්ගේ ප්‍රධාන කණ්ඩායමට එක්වූහ. යෙහෝවාවහන්සේ සටන්කරන විට ඔවුන් එහි නොසිටීම වඩා හොඳ බව...සම්පූර්ණයෙන්ම ඒත්තුගත්හ.... දෙවියන්වහන්සේගේ සේවකයන් සතුරන්ගේ විනාශයෙන් ආරක්ෂාකිරීම සඳහා උන්න්වහන්සේ සටන්කරන විට, පළිගැනීමේ නියමය ඉවත්ව ගිය බව පෙනීමට තිබ්න."[16]

දාමරික හමුදාව ශුද්ධවන්තයන්ට මුහුණදීමත්, ඔවුන්ට උපකාර කිරීමට ආණ්ඩුකාර ඩන්ක්ලින් දුන් පොරොන්දු කඩාදමන බව පැහැදිළිව පෙනීමට තිබුන විට, අනාගතවක්තෘවරයා ස්වාමීන් වහන්සේගෙන් උපදෙස් පතා යාච්ඤා කළේය. සයෝනය මුදාගැනීම සඳහා තිබූ කොන්දේසි වැරදි බව ස්වාමීන්වහන්සේ ඔහුට කීසේක. සයෝනය ගොඩනැගීම සඳහා සූදානම්වීමට ශුද්ධවන්තයන්ට ඔවුන්ගේ පුද්ගලික ජීවිතයේ කළ යුතු බොහෝ දේවල් තිබ්න. ඔවුන් බොහෝ දෙනෙක් ස්වාමීන්වහන්සේ අපේක්ෂාකරන දේවල්වලට කීකරුවීමට තවමත් ඉගෙනගෙන තිබුනේ නැත. සෙලෙස්ටියල්

රාජ්‍යයේ නීතියේ මූලධර්ම මත මිස සයෝනය ගොඩනැගිය නොහැකිය. එසේ නැතිව සයෝනය උන්වහන්සේ වෙතට ලබාගැනීමට නොහැකිය. උන්වහන්සේගේ ජනතාව කීකරුකම ඉගෙනගන්නා තුරු, අවශ්‍ය නම් ඔවුන් වේදනාවින්ද දේවල් තුළින්ම, ඔවුන්ව හික්මිය යුතුය (බලන්න ඕසහසී 105:5–6).

සයෝන කඳවුර හමුදා අරමුණක් ලුහුබැඳ නොගිය යුතුයි ස්වාමීන්වහන්සේ උපදෙස් දුන්සේක, උන්වහන්සේගේ ජනතාවගේ පාපවල ප්‍රතිඵල තුලින්, උන්වහන්සේගේ අවශ්‍යතාවය එතුමාගේ වැඩිහිටියන් සයෝනය මුදාගැනීම සඳහා මඳ කාලයක් බලාසිටිය යුතු බවය. ඔවුන් ඔවුන්වම සූදානම් කරගත් විට, උන්වහන්සේගේ ජනතාවට වඩාත් සම්පූර්ණ ලෙස ඉගැන්විය හැකිය (බලන්න ඕසහසී 105:9–10). සයෝන කඳවුරේ සොහොයුරන්ව ගෞරවනීය ලෙස මුදාහැර, අනාගතවක්තෘවරයා කර්ට්ලන්ඩ් බලා නැවත පැමිණියේය

## සභා මූලස්ථානය ෆා වෙස්ට්වල

මිසූරියේ සිටි බොහෝ ශුද්ධවන්තයෝ, ඔවුන්ට ජැක්සන් ප්‍රාන්තයට යාමට හැකිවන තුරු එහි නැවතී සිටින බවට එම වැසියන්ට ඔවුන් පොරොන්දුවූ බව මතක්කරන තුරු, 1836 දක්වා ක්ලේ ප්‍රාන්තයේ දිගටම සිටියහ. මෙය දැන් කළ නොහැකි බව පෙනුන නිසා, පොරොන්දුවූ පරිදි ඔවුන්ට පිටවීමට කියන ලදී. නිත්‍යානුකූලව ශුද්ධවන්තයන් ඊට කීකරුවිය යුතු නැති නමුත්, ආරවුලක් ඇතිකිරීම වෙනුවට, ඔවුහු නැවත වරක් පිටත්ව ගියහ. රාජ්‍ය නීති අංශයේ සිටි ඔවුන්ගේ මිතුරාවූ ඇලෙක්සැන්ඩර් ඩබ්ලිව්. ඩොනිෆැන්ගේ උත්සාහයන් තුලින්, 1836 දෙසැම්බර මසදී, රේ ප්‍රාන්තය තුල ක්ලැඩ්වෙල් සහ ඩේවිස් නම් අළුත් ප්‍රාන්ත දෙකක් ඇති කෙරින. ක්ලැඩ්වෙල් ප්‍රාන්ත ආසනයේම, සැතපුම් 60ක් පමණ උතුරු දෙසින්වූ, ෆා වෙස්ට්හි ඔවුන්ගේම ගමක් පිහිටුවීමට ශුද්ධවන්තයන්ට අවසර ලැබින. ප්‍රාන්තයේ ප්‍රධාන නිළධාරීන් පසු-දවස්වල ශුද්ධවන්තයන්වූ අතර, මෙයින් ශද්ධවන්තයන්ගේ හිංසා පිඩා අවසන් වන බව බොහෝ ජනයා බලාපොරොත්තුවූහ.

කර්ට්ලන්ඩ්, ඔහයියෝ, සිට අසීරු ගමනකින් පසුව, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් 1838 මාර්තු මස ෆා වෙස්ට්, මිසූරියට පැමිණ, සභා මූලස්ථානය එහි පිහිටුවිය. මාර්තු මාසයේදී ඔහු උතුරේ ඩේවිස් ප්‍රාන්තයට ගොස්, ග්‍රෑන්ඩ් ගංගාව බැලීමට ගිය විටදී, එම ප්‍රදේශය ඇඩම්-ඔන්ඩි-අහමන් මිටියාවත ලෙස අනාවැකි අනුව හඳුනා ගත් අතර

එය ඇඩම් තම ජනතාව බැහැදැකීමට එන ස්ථානය විය (බලන්න ධීසහසී 116:1).[17] ඇඩම්-ඔන්ඩි-අහමන් ඩේවිස් ප්‍රාන්තයේ ශුද්ධවන්තයන්ගේ ප්‍රධාන ගම්මානය බවට පත්විය. 1838 ජූලි 4වෙනිදා ෆා වෙස්ට්හි දේව-මාළිගාවකට කොන් ගල් කැප කළ අතර, අවසානයේදී තම සතුරන්-ගෙන් තමන්ට විරාමයක් ලැබුන බවට හැඟීමක් ශුද්ධවන්තයන්ට ඇති-වීමට පටන්ගත්තේය.

**කෘක්ඩ් ගංගාවේ සටන**

කෙසේහෝ හිංසා පීඩා නැවතත් ඉක්මණින්ම ආරම්භවිය. 1838 අගෝස්තු 6වෙනිදා, ඩේවිස් ප්‍රාන්තයේ ගැලටින් ඡන්ද මධ්‍යස්ථානයේ සිටි දාමරිකයන් 100ක පිරිසක් ශුද්ධවන්තයන්ට ඔවුන්ගේ ඡන්දය දැමීමට ඉඩ නොදුන්හ. මෙය කෝළාහලයක්වී, එයින් මිනිසුන් කිහිපදෙනෙක්ම තුවාලවූහ. දමරිකයන් විසින් කැඩ්වෙල් සහ ඩේවිස් වල ඇති කල වර්ධ-නයවන කැළඹිලි නිසා ආණ්ඩුකාර ලිල්බර්න් ඩබ්ලිව්. බොග්ස්ට රාජ්‍ය හමුදාව යෙදවීමට සිදුවිය.

කපිතාන් සැමුවෙල් ඩබ්ලිව්. බොගාට්, එක් හමුදා නිළධාරියෙක්, සැබෑ ලෙසම දාමරිකයන් සමග සමීප සම්බන්ධයක් පැවැත්වීය. අරගලයක් පටන්ගැනීමට සිතා ඔහු පසු-දවස්වල ශුද්වන්තයන් තුන් දෙනෙක් පැහැරගෙන ගොස් උතුරු රේ ප්‍රාන්තයේ කෘක්ඩ් රිවර් කඳවුරේ තබාගැ-නීමට තීරණය කළේය. පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ භට කණ්ඩායමක් මෙම මිනිසුන්ව ගලවාගැනීම සඳහා යැවුනු අතර, 1838 ඔක්තෝබර් 25වෙනි දින දරුණු සටනක් ඇවිලී ගියේය. කණ්ඩායම මෙහෙයවූ ප්‍රේරි-තවරුන් දොළොස්දෙනාගෙන් එක් අයෙක්වූ, කපිතාන් ඩේවිඩ් ඩබ්ලිව්. පැටර්න්, සටනේදී තුවාල ලැබූ අය අතර විය. ඩේවිඩ්ගේ බිරිඳවූ, ෆෝබි ඈන්. පැටර්න්, ජෝසෆ් සහ හයිරම් ස්මිත්; සහ හීබර් සී. කිම්බල් ඔහු මියයාමට පෙර ඔහු සමග සිටීමට ෆා වෙස්ට් සිට පැමිණ සිටියහ.

ඩේවිඩ් පැටර්න් ගැන හීබර් මෙසේ කීවේයඃ "කලින් ඔහුට ඉතා වටිනාකමක් තිබූ සුභාරංචි මූලධර්ම, ඔහු මිය යන අවස්ථාවේදී, ඔහුව දරා සිටිමින් සහයෝගයදී සැනසීම දුන්නේය. එය මරණයේ කටුව සහ බිය තොරකර දැමීය." මියයමින් සිටි මිනිසා ඇඳ ළඟ සිටි අයට උද්යෝගයෙන් සිට පසුව ඇදහිල්ලෙන් වැටුනු ශුද්ධවන්තයන් කිහිපදෙ-නෙක් ගැන මෙසේ කීවේය, "'අහෝ, ඔවුහු සිටින්නේ මගේ තත්වයේය! මන්ද මා ඇදහිල්ල තැබූ බව මට හැඟෙයි.'" ඊළඟට ඔහු ෆෝබි ඈන් අමතා මෙසේ කීවේය, "'ඔබ වෙනත් කුමන දෙයක් කළත්, අහෝ

ඇදහිල්ල ප්‍රතික්ෂේප නොකරන්න.'" මියයාමට මොහොතකට පෙර ඔහු යාච්ඤා කළේය, "'පියාණෙනි, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් මා ඔබවහන්සේගෙන් ඉල්ලා සිටිමි, මාගේ ආත්මය ඔබවහන්සේ මුදාහැර, එය ඔබවහන්සේ වෙතට ලබාගනිත්වා.'" ඉන්පසුව ඔහු වටා සිටින අයට ඔහු ආයාචනා කළේය, "'සොහොයුරෙනි, ඔබලා ඔබගේ ඇදහිල්ල තුලින් මා දරා සිටි නමුත්, මා අත් හැර, මට යන්න දෙන්න, මම ඔබට කන්නලව් කරමි.'" කිම්බල් සොහොයුරා මෙසේ කීවේය, "අපි ඒ අනුව ඔහුව දෙවියන්වහන්සේට බාර කළෙමු. ඉක්මණින්ම ඔහු අවසන් හුස්ම පිටකර, කෙඳිරියකින් තොරව, යේසුස්වහන්සේ තුළ සැතපුනේය."[18]

කපිතාන් බොගාට්ගේ කණ්ඩායම ක්‍රියාකර තිබෙන්නේ රාජ්‍ය හමුදාවක් මෙන් නොව දාමරිකයන් ලෙසය. එසේවුවද, කෘක් ගංගාවේ අසල සටනින් හමුදා මිනිසුන්ගේ මරණ, සහ වෙනත් වාර්තාද ආණ්ඩුකාර ලිල්බර්න් ඩබ්ලිව්. බොග්ස් විසින් ඔහුගේ අපකීර්තිමත් "සහමුලින්ම විනාශකිරීමේ" නියමය නිර්මානයකිරීමට යොදා ගැනින. 1838 ඔක්තෝබර් 27 දාතම දරණ, එම ආඥාවේ, කොටසක මෙසේ දැක්වේ, "මෝර්මන්වරු සතුරන් ලෙස සැලකිය යුතුය, තවද මහජන සාමය සඳහා අවශ්‍ය නම් සහමුලින්ම වැනසීම හෝ ප්‍රාන්තයෙන් එළවාදැමිය යුතුය—මන්ද ඔවුන්ගේ සාහසික ක්‍රියා විස්තරකිරීම් අභිබවා යයි."[19] ආණ්ඩුකාරයාගේ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා හමුදා නිළදාරියෙක් පත්කෙරින.

### හෝන්ගේ මෝලේ සමූලඝාතනය

සහමුලින්ම විනාශකිරීමේ නියමය නිකුත්කර දින තුනකින් පසුව, 1838 ඔක්තෝබර් 30 වෙනිදා, 200ක පමණ මිනිසුන් පිරිසක්, ක්ලැඩ්වෙල් ප්‍රාන්තයේ, සෝල් ක්‍රීක් පිහිටි හෝන්ස් මෝලේ ශුද්ධවන්තයන්ගේ කුඩා ජනාවාසයකට හදිසි පහරදීමක් සැලසුම් කළහ. සටන්කරුවෝ, ද්‍රෝහී අදහසකින්, බේරීයාමට කැමති අය කම්හලට දිව යන ලෙස කෑගසා කීවෝය. ඉන්සුව ඔවුහු ගොඩනැගිල්ල වටා මුරට සිටමින්, එයට වෙඩි තබා, එහි සිටින හැම කෙනෙක්ම මියගොස් ඇතැයි ඔවුන් සිතන තුරු එහි සිටියහ. පැන යාමට තැත්කල අයට ඔවුහු වෙඩි තැබූහ. සම්පූර්ණයෙන්ම, මිනිසුන් සහ පිරිමි ළමුන් 17 දෙනෙක් මියගිය අතර, 15ක් තුවාල ලැබූහ.

සමූල ඝාතනයෙන් පසුව, අමන්දා ස්මිත් කම්හලට ගිය විට, ඇගේ ස්වාමි පුරුෂයාවූ වොරන්, ඇගේ පුත්‍රයෙක්වූ, සාදියස්, මියගොස් සිටිනු ඇය දුටුවාය. සංහාරය අතර බරපතල ලෙස තුවාල ලැබූ අයගේ කුඩා

පුතු ඇල්මා හමුවීමෙන් ඇය මහත් සතුටට පත්වූවාය. පිපිරීමෙන් ඔහුගේ උකුල පිපිරී ගොස් තිබින. මිනිසුන් බොහෝ දෙනෙක් මියගොස් හෝ තුවාලවී සිටියෙන් අමන්දා දණගසා ස්වාමීන්වහන්සේගෙන් උදව් ඉල්ලීය.

"අහෝ මාගේ ස්වර්ගික පියාණන්වහන්ස, මම කෑගසමි, මම කුමක් කරම්ද? මගේ දුප්පත් තුවාලවූ දරුවා ඔබ වහන්සේට පෙනේ, මගේ නොදැනුවත්කමද ඔබවහන්සේ දනිති, අහෝ ස්වර්ගික පියාණන් වහන්ස කරන දෙය මට පෙන්වා දෙනසේක්වා!" ඇයට "කටහඬක් මගින් මගපෙන්වමින්," අළුවලින් ද්‍රාවනයක් සාදා තුවාලය පිරිසිදුකරන ලෙස උපදෙස් ලැබූ බව ඇය කීවාය. ඊළඟ දවසේ ඇය බෝල්සම් බෝතලයක් තුවාලයට හැලුවාය.

අමන්දා සිය පුතු අමතා, "'ඇල්මා, මගේ දරුව,…ස්වාමීන්වහන්සේ ඔබගේ උකුල සෑදූ බව ඔබට විශ්වාසද?' යයි ඇසුවාය

"'ඔව්, අම්මා.'

"'හොඳයි, ඔබගේ උකුල වෙනුවට යමක් ස්වාමීන්වහන්සේ එහි සාදනු ඇත, උන්වහන්සේට හැකි බව ඔබ ට විශ්වාසද ඇල්මා?'

"'ස්වාමීන්වවහන්සේට හැකි යයි ඔබ සිතනවාද, අම්මා?' සුරතල් ලෙස දරුවා ඇසුවේය

"'ඔව්, මගේ පුතා, ඇය පිළිතුරු දුන්නාය,' එතුමා ඒ සියල්ල මට දර්ශනයකින් පෙන්වූසේක.'

"ඉන්පසුව මා ඔහුව මුනින් අතට පහසුවෙන් දිගාකරඃ 'දැන් ඔබ මේ අන්දමට දිගාවී සිටින්න, ස්වාමීන්වහන්සේ ඔබට උකුලක් සාදා දෙනු ඇත.'

"එනිසා ඇල්මා ඔහුට සම්පූර්ණ සුවය ලැබෙන තුරු, සති පහක්ම මුණින් අතට සිටියේය—නැමෙන සුළු අස්ථියක් නැතිවීගිය සංධිය සහ කෙවනිය වෙනුවට වැඩී තිබින."[20]

අමන්දා සහ අන් අයට ඔවුන්ගේ ආදරණීය අයගේ භූමදානයකිරීමේ භයානක ක්‍රියාව බලා සිටීමට සිදුවිය. බ්‍රිගම් යන්ගේ සොහොයුරාවූ ජෝසෆ් යන්ග්ද ඇතුළු ශක්තිමත් අය පමණක් එහි නතරව සිටියහ. මන්ද දාමරිකයන් නැවත පැමිණෙතැයි ඔවුන් බියවී සිටි නිසා, චාරිත්‍රානුකූල වළවල් හෑරීමට කාලයක් නොතිබින. ජලය නැති ලිඳක් විශාල වලක් ලෙස යොදා ගෙන ඒ තුලට මෘත ශරීර දමන ලදී. ජෝසෆ් යන්ග් කුඩා සාදියස් ඔසවාගෙන ඒමට උදව්කල නමුත්, "තම පිරිමි ළමයා ඒ භයානක වළ තුලට දැමීමට ඔහුට නොහැකි" බව කීවේය. ඔවුන් මිසූරියට එන විට ඔහු එම "සිත් ගත් පැංචා" සමග සෙල්ලම්කර තිබෙන අතර, ජෝසෆ්ගේ



*ලිබර්ටි සිරගෙදර සිරගතව සිටියදී, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් වේදනා විඳින ශුද්ධවන්තයන් වෙනුවෙන් ස්වාමීන්වහන්සේට ආයාචනාකර ලැබූ මගපෙන්වීම් සහ සහනය දැන් දහම සහ ගිවිසුමේ 121, 122, සහ 123 වෙනි කොටසේ වාර්තාකර ඇත.*

"ස්වභාවය එතරම් මෘදුවූ" බැවින් ඔහුට එය කිරීමට නොහැකි විය. අමන්-දා සාදියස්ව රෙද්දක ඔතා, පසු දිනයේදී ඇය තවත් පුත්‍රයෙකවූ, විලාඩ් සමග පැමිණ ශරීරය ලිඳට දැමුවාය. එම භයානක දර්ශනය වසාදැමීමට කුණු සහ තණ ලිඳට දමන ලදී.[21]

ඇඩම්-ඔන්ඩි-අහමන්හිදී 20 වියැති බෙන්ජමින් එෆ්. ජොන්සන්, ඒ හා සමාන ඉරණමකට ලක්ව, ඔහුට වෙඩිතැබීමට තීරණයකර සිටි මිසූරි ජාතිකයෙකුගේ හස්තයෙන් ගැලවුනි. බෙන්ජමින්ව සිරගතකර දවස් අටක් දැඩි ශීතලේ කඳවුරේ එළිමහනක ආරක්ෂා ඇතිව තබන ලදී. ඔහු ලී කොටයක් මත හිඳගෙන සිටියදී, නපුරු මිනිසෙක් තුවක්කුවක් අතැතිව ඔහු ලඟට පැමිණ, "නුඹ දැන්ම මෝර්මන් ආගම අත්හැරපන්, නැතිනම් මා නුඹට වෙඩිතියනවා" යයි කීවේය. බෙන්ජමින් ස්ථිරවම ප්‍රතික්ෂේප කළේය. ඒ සමගම නපුරු මිනිසා හිතාමතාම ඔහු වෙත මානා කොකා ඇද්දේය. උණ්ඩය පිට නොවුනි. මහ හඬින් ශාපකළ මිනිසා, එම

තුවක්කුව ඔහු "20 වසරක් පාවිච්චිකල බවත්, කිසි දිනක වෙඩි පිට නොවී-මක් කලින් සිදු නොවුන බවත්" කීවේය. ඔහු අගුල පරීක්ෂාකර, ආයුධයට නැවතත් උණ්ඩ දමා එය මානා කොකා ඇද්දේය—සාර්ථක නොවුනි.

එම ආකාරයටම ඔහු තුන් වෙනි වතාවටත් උත්සාහ කල නමුත්, ප්‍රතිපලය එයම විය. ඒ අසල සිටි කෙනෙක්" තුවක්කුව මඳක් ශුද්ධ කරන්න" එවිට "නුඹට ස්ථිරවම මෙම අධමයාව මරා දැමීමට පුළුවනි" යයි කීවේය. එනිසා හතරවෙනි සහ අවසාන වතාවට මිනීමරුවා, අළුත් උණ්ඩ යොදා සූදානම්විය. මේ වතාවේ තුවක්කුව පිපිරීගොස් ඒ ප්‍රයෝග-කාරයා මරා දමන ලදී. එක් මිසූරි ජාතිකයෙකු මෙසේ කියනු ඇසිනි, "නුඹ ඔය මිනිසා මැරීමට උත්සාහ නොකළ යුතුයි."[22]

## අනාගතවක්තෘවරයාව සිරගෙයක සිරකිරීම

හෝන්ස් මෝලේ සමූලඝාතනයෙන් ටික දිනකට පසු, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් සහ අනෙක් නායකයන්ව රාජ්‍ය හමුදාව විසින් සිරකරන ලදී. යුධාධිකරණ- විනිශ්චයක් පවත්වනු ලැබ, අනාගතවක්තෘවරයා සහ ඔහුගේ සහායකයන්ව ඊට පසුදින වෙඩි කණ්ඩායමක් විසින් ෆා වෙස්ට් නගර චතුරශ්‍රයේදී වෙඩි තබා මරාදමන ලෙස නියම කෙරින. කෙසේවුවද, හමුදා ප්‍රධානියා වන ඇලෙක්සැන්ඩර් ඩබ්ලිව්. ඩොනිෆාන් වෙඩිතැබීම ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේපකර, එම තීරණය "දරුණු- මිනීමැරීමක්" ලෙස හැඳින්වීය. හමුදාවට එම නියෝගය දුන් හමුදා ප්‍රධානියාට අනතුරු ඇඟවූ ඔහු, ඔහු මෙම මිනිසුන් මරා දැමීමට උත්සාහ කළ හොත්, "ඔබ මෙයට වගකිව යුතු බවට මම ඔබව පොළොවේ අධිකරණයක් තුලට ගෙන යමි, දෙවියන්වහන්සේ මට උදව්කරනසේක"[23] යයි කීවේය.

අනාගතවක්තෘවරයා සහ අනෙක් අයව ප්‍රථමයෙන් ඉන්ඩිපෙන්ඩන්ට් නගරයට ගෙන ගොස්, රේ ප්‍රාන්තයේ රිච්මන්ඩ් වෙත යැවූ අතර, එහිදී නඩු විභාගය දක්වා සිරගත කෙරින. පාර්ලි පී. ප්‍රැට් අනාගතවක්තෘවරයා සමග සිටි අයගෙන් කෙනෙකි. ඔහු කී පරිදි එක් සැන්දෑවක ආරක්ෂ-කයෝ සිරකරුවන්ව නින්දා සහගතව, පසු-දවස්වල ශුද්ධවන්තයන් අතර සිදුවූ දූෂනයකිරීම්, මිනීමැරීම් සහ සොරකම් යනාදී ඔවුන්ගේ ක්‍රියා ගැන කීහ. ඔහු ළඟ සිටි අනාගතවක්තෘවරයා අවදිව සිටි බව ඔහු දැන සිටි බවත්, ජෝසෆ් හදිසියේම කෙලින් සිටගනිමින් මහත් බලයකින් ආරක්ෂ-කයන්ට තරවටු කල බවටත් මෙසේ වාර්තා කළේයඃ

"'නිහඬවෙනු, එපා කරපු ජරා යක්ෂයෙනි, යේසුස් ක්‍රිස්තුස්වහන්-සේගේ නාමයෙන් මම නුඹලාට තරවටුකරමි, නිහඬවීමට මම නුඹලාට

නියෝග කරමි; එවන් ජරා කථා ඇසීමට මම තව මිනිත්තුවක් වත් ජීවත් නොවෙමි. එවැනි කථා නවත්වාපල්ලා, නැත්නම් නුඹලා හෝ මම හෝ මැරෙන්ට ඉඩ ඇත මේ මොහොතේම!'

"ඔහු කථාව නැවැත්වීය. ඔහු විශාල තේජසකින් කෙළින් සිට ගත්තේය. දම්වැල් සහිතව ආයුධයක් නොතිබින; සංසුන්ව, නිශ්චලව සහ දේවදූතයෙක් ලෙස උතුම්ව ඔහු වෙව්ලන ආරක්ෂකයන් දෙස බැලීය. ඔවුන්ගේ ආයුධ පහත්කරගෙන හෝ බිම දමා තිබුනි; ඔවුන් දණහිස් එකට වැදින. ඔහු අයිනකට ගුලිවෙමින් හෝ නැගිටීමට තැත්කරමින්, කමාව ඉල්ලමින් සහ ආරක්ෂකයන් මාරුවෙන තුරු නිහඬව සිටියේය.

ඉන්පසුව පාර්ලි මෙසේ කීවේය, "මම රජවරු, රාජකීය මාළිගා, රාජධානි සහ ඔටුනු ගැන; තවද රාජධානිවල ඉරණම තීරණයකිරීමට එකතුවුන අග රජවරු ගැනද තේරුම්ගැනීමට උත්සාහ කළෙමි; නමුත් ගෞරවය සහ තේජස මා දැක ඇත්තේ *එක්වරකි*, ඒ ඔහු දම්වැල් පිටින්, මධ්‍යම රාත්‍රියේ, මිසූරි ගම්මානයක අඳුරු දඟගෙයක් තුල සිටගත්විටය."[24]

උසාවි පරීක්ෂණ නිමවූ විට, ජෝසෆ් සහ හයිරම් ස්මිත්, සිඩ්නි රිග්ඩන්, ලයිමන් වයිට්. කාලිබ් බෝල්ඩ්වින්, සහ ඇලෙක්සැන්ඩර් මැක්රායිව 1838 දෙසැම්බර් 1වෙනිදා ක්ලේ ප්‍රාන්තයේ ලිබර්ටි සිරගෙදරට යවන ලදී. අනාගතවක්තෘවරයා ඔවුන් සිටි තත්වය මෙසේ පැහැදිළි කළේයඃ "අපව තබා තිබුනේ දහවල් සහ රාත්‍රී කාලයේ, බොහෝ රැකවල් ඇතිව, පවුරු සහ දොරවල් දෙකක බැගින් ඇති සිර ගෙදරකය. හෘද සාක්ෂියේ නිදහසක් නැතිවූ අතර, අපට ආහාර හිඟය….පිදුරු මත පොළොවේ නිදාගැනීමට අපට බල කෙරින. අපව උණුසුම්ව තබාගැනීමට පොරෝනා ප්‍රමාණවත් නොවුනි….අප අහිංසක බව විනිශ්‍යකරුවන් දන්නා බවත්, නිදහස්කල යුතු බවත් ඔව්හු විටින් විට අපට කීහ. නමුත් නීතිය ක්‍රියාත්මක කිරීමට ඔවුන් බියවුනේ, දාමරිකයන්ට ඇති බිය නිසාය."[25]

**ඉලිනොයිස් බලා නික්මයාම**

අනාගතවක්තෘවරයා සිරගතව සිටියදී, ශුද්ධවන්තයන් 8000කට වඩා වැඩි පිරිසක් සහමුලින්ම වැනසීමේ නියමයෙන් ගැලවීම සඳහා මිසූරි නැගෙනහිර තරණයකර ඉලිනොයිස් බලා පැමිණියහ. ශීත ඍතුවේ ශීත කාලයේදී පිටවී යාමට ඔවුන්ට බලකල අතර, දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සභාපති, බ්‍රිගම් යන්ග් ඔවුන්ට මගපෙන්වමින් දිය හැකි සියලු සහයෝගය දුන්නද, ඔවුහු බලවත් ලෙස වේදනා වින්දෝය.

ආරක්ෂාව සෙවූ බොහෝ පවුල් අතර ජෝන් හැමර් පවුලද එක් පවුලකි. අසීරු තත්වයන් ගැන ජෝන් මෙසේ සිහිපත්කරයිඃ

ඒ කාලයේ වේදනා විඳීම් සහ නපුරුකම් මට හොඳට මතක තිබේ…. අපගේ පවුලට තිබුනේ එක් කරත්තයක් සහ කණ්ඩයමක් ලෙස අපට සිටියේ එක් අන්ධ අශ්වයෙක් පමණි. එසේම එම අන්ධ එක් අශ්වයාට අපගේ බඩු ඉලිනොයිස් ප්‍රාන්තයට ප්‍රවාහනය කිරීමට සිදුවිය. අපගේ කරත්තය අශ්වයන් දෙදෙනෙක් සිටි සොහොයුරෙකුට එක් සැහැල්ලු අශ්ව කරත්තයකට හුවමාරු කලෙමු. මෙමගින් පාර්ශවයන් දෙකටම ඉඩ පහසුකම් සැලසුනි. මෙම කුඩා කරත්තයට අපි අපගේ ඇඳුම්, ඇඳ රෙදි ඉරිගු කෑම ටිකක් අපට රැස්කර ගත හැකි ආහාර ස්වල්පයක්ද දමාගෙන, ශීතල හිමේ පයින්ම ගමන් කිරීමට පටන් ගත්තෙමු, අතර මග කෑම ගනිමින් අප නිදාගත්තේ අහස වහලක් සේ යොදා ගනිමිනි. නමුත් එම රාත්‍රී කාලවල තිබූ මිදුනු හිම සහ තියුණු ශීතල සුළඟ මනුෂ්‍ය වේෂයෙන් සිටි අප ගැලවී ආ රෞද්‍ර යක්ෂයන්ට වඩා රළු බවින් අඩුවූ අතර කරුණාවන්තය. අපගේ පවුල සහ වෙනත් බොහෝ අයද සිටියේ පාවහන් නැතිවය. සමහරු ඔවුන්ගේ පාද රෙදිවලින් වසාගත්තේ ඒවා අයිස්වලින් මිදී යාම වළක්වාගැනීමට සහ හිම සහිත පොළොවේ තියුණු හිම වලින් ආරක්ෂාකර ගැනීමටය. මෙය හොඳම, එහෙත්, අසම්පූර්ණ ක්‍රමයක් විය. නිතරම අපගේ පාදවල ලෙයින් අයිස් පොළොවේ සලකුණු ඇතිවිය. අපගේ පවුල් සාමාජිකයන්ගෙන් පාවහන් ඇතිව සිටියේ මගේ මව සහ සොහොයුරිය පමණි. මේවා ගෙවී යාමෙන් ඉලිනොයිස්වල එකල තිබූ අනුග්‍රහශීලී වෙරළට යාමට පෙර ප්‍රයෝජනයක් නැතිවිය."[26]

අනාගතවක්තෘවරයා සිරගෙදර අසරණව සිටියදී, ඔහුගේ ජනතාව ප්‍රාන්තයෙන් එළවා දැමින. ඔහුගේ ආත්මයේ තිබූ දැඩි වේදනාව දහම සහ ගිවිසුමේ 121වෙනි කොටසේ වාර්තාවී තිබෙන ස්වාමීන් වහන්සේට කල කන්නලව්වෙන් මිණිය හැකඃ

දෙවියන්වහන්සේ සිටින ස්ථානයත්, උන්වහන්සේ සැඟවෙන ස්ථානය කොහිද? කියාත් ඔහු උන්වහන්සේගෙන් ඇසුවේය.

උන්වහන්සේගේ හස්තයන් කොපමණ කාලයක් නවතාගෙන සිටිනසේක්ද, ස්වර්ගවල සිට උන්වහන්සේගේ පිවිතුරු ඇසින් උන්වහන්සේගේ ජනතාවගේ සහ උන්වහන්සේගේ සේවකයන්ගේ වැරදි දෙස බලා, උන්වහන්සේගේ කණට ඔවුන්ගේ හඬ ඇතුල්වේවා? (බලන්න ධීසහසී 121:1–2).

ස්වාමීන්වහන්සේ මෙම සහනදායක වචන වලින් පිළිතුරු දුන්සේක. උන්වහන්සේ ජෝසෆ්ට එතුමාගේ පුත්‍රයා යයි අමතා, ඔහුගේ ආත්මයේ

සැනසීම ඔහුට හැඟිය යුතු බව කීසේක. ඔහුගේ විපත් සහ ඔහුගේ දුක් පීඩා සුළු මොහොතකට පමණි.

ඉන්පසුව ඔහු ඒවා හොඳින් දරාගත හොත්, දෙවියන්වහන්සේ ඔහුව ඉහළින් උත්කර්ෂයට පත්කරනසේක; ඔහු ඔහුගේ සියලුම සතුරන් අභිබවා ජයග්‍රහනය කරනු ඇත..

ඔහුගේ මිතුරන් තවදුරටත් ඔහු සමග සිටිමින්, ඔවුන් නැවතත් ඔහුට උණුසුම් හදවත්වලින් සහ මිත්‍රශීලී අත්වලින් සුභපතනු ඇත (බලන්න ධීසහයි 121:7–9).

ස්වාමීන්වහන්සේගේ වචන සත්‍ය ලෙසම 1839 අප්‍රේල්වලදී සම්පූර්ණවිය. මාස හයක නීති විරෝධී සිරගත කිරීමකින් පසුව, ස්ථානය වෙනස්කිරීම ඇරඹී, සිරකරුවන්ව පළමුව මිසුරි, ඩේවිස් ප්‍රාන්තයේ, ගැලටින්වලටද ඉන්පසුව බූන් ප්‍රාන්තයේ, කොලොම්බියාව දෙසටද ගෙනයන ලදී. කෙසේවුවද, "[ඔවුන්ව] බූන් ප්‍රාන්තයට රැගෙන නොයන ලෙස" ෂෙරීෆ් විලියම් මෝගන්ට උපදෙස් දෙන ලදී. උසස් ස්ථානවල සිටින පුද්ගලයෙක් හෝ පුද්ගලයෝ සිරකරුවන්ට ගැලවීයාමට ඉඩදිය යුතු යයි තීරණයකර ඇත, සමහරවිට ඔවුන්ට දඬුවම්කිරීමට සාක්ෂි නොමැති නිසා ඔවුන්ව නඩු විභාගයට රැගෙන ඒමෙන් මහජනයා ව්‍යාකූලවීම වැළැක්වීමට විය හැක. අශ්වයන් දෙදෙනෙකු මිළදී ගැනීමට සහ ඔවුන්ගේ ආරක්ෂකයන් මගහැර යාමට අවස්ථාවක් සිරකරුවන්ට දෙන ලදී. හයිරම් ස්මිත් මෙසේ කීවේය: "අපි අපගේ ස්ථාන වෙනස්කිරීම ඉලිනොයිස්වලට ගත්තෙමු. දින නමයක් හෝ දහයකින් පසුව ඇඩම් ප්‍රාන්තයේ, ක්වින්සිවලට, ආරක්ෂිතව ආවෙමු. එහිදී අපගේ පවුල් දුප්පත් තත්වයක සිටියද, මනා සුවෙන් සිටි බව දැක ගත්තෙමු."[27] එහිදී ඔවුන්ට ඇත්තවශයෙන්ම, උණුසුම් හදවත්වලින් සහ මිත්‍රශීලී අත්වලින් සුභපතන ලදී."

අනාගතවක්තෘවරයා සමග තමා නැවතත් සම්බන්ධවීම ගැන විල්ෆෝඩ් වුඩ්රෆ් මෙසේ කීවේය: "තවත් වරක් ජෝසෆ් සොහොයුරාගේ අත ගැනීමේ ප්‍රීතිමත් වරප්‍රසාදය මට තිබින....ඔහු මහත් සතුටකින් අපට සුභපැතීය....[ඔහු] සාමාන්‍ය ලෙස අවංක, විවෘත, සහ මිත්‍රශීලී වූ අතර අපගේ ප්‍රීතිය අති මහත් විය. එවන් හමුවීමකින් ඇතිවන ප්‍රීතිමත් හැඟීම, සුභාරංචියේ නාමයෙන් දුක් පීඩා වින්ද යමෙකුට හැර, වෙනත් කිසි මිනිසෙකුට තේරුම්ගැනීමට නොහැකිය."[28] ස්වාමීන්වහන්සේ ආශ්චර්යමත් ලෙස ජෝසෆ් ස්මිත්ව සහ සභාවේ ජනතාව ආරක්ෂාකර ඇතිසේක. නූතන-කාලයේ ඉශ්‍රායෙල් නැවත වරක් අළුත් ප්‍රස්ථාවන් සහ ගිවිසුම්ද සහිතව එක්රැස්වීම ආරම්භ කළහ.


# නාවූ නගරය තුල පරිත්‍යාග සහ ආශිර්වාද

ඉලිනොයිස් බලා ගිය පසු-දවස්වල ශුද්ධවන්තයන්ට කුවින්සි නගරයේදී ත්‍යාගශීලී නගරවාසීන්ගෙන් උණුසුම් පිළිගැනීමක් ලැබින. ජෝසෆ් ස්මිත් ලිබර්ටි සිරගෙදර සිරගතව සිට නැවත පැමිණීමෙන් පසුව, ශුද්ධවන්තයෝ මිසිසිපි ගංගාවෙන් සැතපුම් 35 පමණ උතුරු දෙසට පදිංචියට ගියහ. එහිදී ඔවුහු ප්‍රදේශයේ විශාල වගුරක ජලය හිස්කර ගංගාවේ වංගුවක් අසල නාවූ නගරය ගොඩනැගීම ආරම්භ කළහ. නගරය ඉතා ඉක්මණින් ක්‍රියාකාරකම් සහ වෙළඳාම්වලින් කළබලකාරී වීමට පටන් ගත්තේ ශුද්ධවන්තයන් එක්සත් ජනපදයේ සෑම කොටසකින්ම සහ කැනඩාව සහ එංගලන්තයේ සිට එහි එක්රැස්වන විටය. වසර හතරක් තුලදී, ඉලිනොයිස්වල එක් විශාලතම නගරයක් බවට පත්විය.

සභා සාමාජිකයෝ සමාදානයකින් යුතුව, අනාගතවක්තෘවරයා ඔවුන් අතරට යමින් වැඩකරන බවට ආරක්ෂිත හැඟීමකින් ජීවත්වූහ. අනාගතවක්තෘවරයා කැඳවනු ලැබූ සිය ගණන් ධර්මදූතයෝ සුභාරංචිය දේශනාකිරීමට නාවූ නගරයෙන් පිටවූහ. දේවමාළිගාවක් ගොඩ නැගින, දේවමාළිගා එන්ඩවුමන්ට් ලැබින, ප්‍රථම වතාවට කොට්ඨාශ ඇති කෙරින, ස්ටේක් පිහිටුවන ලදී. සහන සමිතිය සංවිධානය විය, ආබ්‍රහම්ගේ පොත ප්‍රසිද්ධ කෙරුන අතර, වැදගත් එළිදරව් ලැබින. වසර හයකටත් වඩා කාලයක්, ශුද්ධවන්තයෝ විශිෂ්ඨ එක්සත්කමක්, ඇදහිල්ලක්, සහ සතුටක් ප්‍රදර්ශනයකළ අතර, ඔවුන්ගේ නගරය උද්‍යෝගයේ සහ සත්‍යයේ ප්‍රදීපාගාරයක් විය.

### නාවූ ධර්මදූතයන්ගේ පරිත්‍යාග

ශුද්ධවන්තයන් නිවාස ගොඩනගමින් ධාන්‍ය සිටුවීමට පටන්ගත් විට, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් මැලේරියා නම් උණ සහ වෙව්ලීම ඇතිවන බෝවෙන රෝගයකින් රෝගී වූහ. රෝගීවීමට දොළොස්දෙනාගෙන් වැඩිදෙනෙක් සහ ජෝසෆ් ස්මිත්ද ඇතුලත් විය. 1839 ජූලි 22වෙනි දින අනාගතවක්තෘවරයා ඔහුගේ ලෙඩ ඇඳෙන් නැගිටුනේ දෙවියන්වහන්සේගේ බලය ඔහු සමග නැවතී සිටියදීය. පූජකවරයේ බලය



*ශුද්ධවන්තයෝ මිසිසිපි ගඟ අසබඩ අලංකාර නාවූ නගරය ගොඩනැගූහ. නාවූ දේවමාළිගාව නගරයට ඉහළින් පිහිටා තිබින.*

පාවිච්චිකරමින්, ඔහු තමාව සහ ඔහුගේම නිවසේ රෝගීන්ද සුවකරමින්, ඉන්පසුව ඔහුගේ මිදුලේ කඳවුරුවල සිටින අයටද සුවවීමට අණ කළේය. බොහෝ දෙනෙක් සුවය ලැබූහ. අනාගතවක්තෘවරයා කූඩාරමෙන් කූඩාරමට සහ නිවසකින් නිවසකට යමින්, සෑම කෙනෙකුටම ආශිර්වාද කළේය. එය සභා ඉතිහාසයේ ඇදහිල්ලේ සහ සුවකිරීමේ එක් ශ්‍රේෂ්ඨ දවසක් විය.

මෙම කාලය තුළදී, එංගලන්තයේ දූතමෙහෙයන් යාමට අනාගතවක්-තෘවරයා ප්‍රේරිතවරුන් දොළොස් දෙනාව කැඳවීය. දොළොස්දෙනාගේ එක් සාමාජිකයෙක්වූ ඕර්සන් හයිඩ්, යෙරුසලමට යවන ලද්දේ, යුදා ජනතාව සහ ආබ්‍රහම්ගේ අනෙක් දරුවන්ගේද එකතුවීම සඳහා පලස්තීනය කැපකි-රීමටය. අමෙරිකා එක්සත් ජනපදය සහ කැනඩාව මුළුල්ලේම දේශ-නාකිරීම සඳහා ධර්මදූතයෙක් යැවූ අතර, පැසිෆික් දූපත්වලට යාමට ඇඩිසන් ප්‍රැට් සහ තවත් අයට කැඳවීම් ලැබින.

ස්වාමීන්වහන්සේට සේවයකිරීම සඳහා ලැබූ කැඳවීමට ප්‍රතිචාර දක්වමින් තම නිවෙස් වලින් සහ පවුල්වලින් පිටව යමින් ඔවුහු විශාල පරිත්‍යාග කළහ. දොළොස්දෙනාගේ බොහෝ සාමාජිකයන් එංගලන්තය බලා පිටවී යාමට සූදානම්වෙන විටදී ඔවුහු මැලේරියාවෙන් රෝගීව සිටියහ. ඉතාමත් අසනීපයෙන් සිටි විල්ෆෝඩ් වුඩ්රෆ්, පිටවී යන විට ඔහුගේ බිරිඳවූ, ෆිබ්ට, ආහාර හෝ ජීවිතයේ අවශ්‍යතාවයන් කිසිවක් තිබු-නේම නැති තරම්ය. බාලම ප්‍රේරිතවරයාවූ, ජෝර්ජ්. ඒ ස්මිත්, බොහෝ අසනීපව සිටියෙන් කරත්තය වෙත ඔහුව ඔසවාගෙන යාමට සිදුවූ අතර, ඔහුව දුටු මිනිසෙක්, රියදුරා අමතා ඔවුන් සොහොන් බිම සොරකම් කරන්නේදැයි ඇසීය. තම බිරිඳ සහ දරුවන් රැගෙන ගියේ පාර්ලි පී. ප්‍රැට් පමණකි, ඔවුහු නාවූ වලින් පිටවන විට ජෝන් ටේලර් සුවවී සිටි අතර, පසුව ඔවුන් නිව්යෝර්ක් බලා ගමන්කරන විට දරුණු ලෙස අසනීපවී, මියයාමට ආසන්නව සිටියේය.

බ්‍රිගම් යන්ග් තදින්ම අසනීපව සිටි හෙයින් තවත් අයෙකුගේ සහා-යෙන් තොරව කෙටි දුරක්වත් යාමට ඔහුට නොහැකිවූ අතර, ඔහුගේ සහායකයාවූ, හීබර් සී. කිම්බල්ටද, එතරම් සනීපයක් නොතිබිනි. ඔවුන්ගේ භාර්‍යාවන් සහ දරුවන්ද, අසනීපයෙන් වැතිර සිටියහ. ප්‍රේරිතවරුන් තම නිවාසවලින් කෙටි දුරකින් පිහිටි කන්දක් මුදුනට ළඟාවූ විට, කරත්තයේ වැතිර සිටි ඔවුන් දෙදෙනාටම හැඟුනේ ඔවුන්ගේ පවුල් එතරම් අසරණ තත්වයක දමායාම ඔවුන්ට දරාගැනීමට නොහැකි බවය. හීබර්ගේ යෝජ-නාවක් අනුව, අසීරුවෙන් දෙපයින් නැගිටි සිටි ඔවුහු ඔවුන්ගේ තොප්පි තම හිස වටා කරකවමින්, "ජයවේවා, ජයවේවා, ඉශ්‍රායෙල්ට ජයවේවා"

යයි තුන් වරක් කෑගැසූහ. ඔවුන්ගේ භාර්යාවන්වූ, මේරි ඈන් සහ වයලට්, ශක්තිය ගෙන සිටගනිමින්, දොර උළුවස්සට හේත්තුවී, "ආයුබෝවන්, දෙවියන්වහන්සේ ඔබලාට ආශිර්වාද කරත්වායි" කෑ ගැසූහ. මිනිසුන් දෙදෙනා සතුටේ ආකල්පයකින් ඔවුන්ගේ කරත්තවල යහන්වලට ආපසු ගොස් ඔවුන්ගේ භාර්යාවන් ලෙඩ ඇඳන්වල සිටිනු වෙනුවට සිටගෙන සිටීම ගැන තෘප්ත්තිමත් වූහ.

දූත මෙහෙය කැඳවීම් බාරගත් අයට සහයෝගය දීමට පරිත්‍යාගශීලී වීමෙන් ඔවුන්ගේ ඇදහිල්ල ප්‍රදර්ශනය කළහ. ඇඩිසන් ප්‍රැට්ව සැන්ඩ්විච් දූපත්වල දූතමෙහෙයකට කැඳවූ විට, ඔහුගේ බිරිඳ, ලොයිසා බාන්ස් ප්‍රැට් මෙසේ පැහැදිළි කළාය: "මගේ ලමයින් හතරදෙනා පාසල් යැවීමට සහ ඔවුන්ගේ ඇඳුම් සඳහා මට මුදල් නොතිබින....ප්‍රථමයෙන් මගේ සිතට දුකක් දැනුන නමුත්, මම ස්වාමීන්වහන්සේ තුල විශ්වාසය තැබීමට සහ ජීවිතයේ කරදර වලට නිර්භීතව සිටීමට අධිෂ්ඨානකර, මගේ ස්වාමියා සුභාරංචිය දේශනාකිරීමට සුදුසුයයි ගණන්ගැනීම ගැන සතුටුවීමි."

ලොයිසා සහ ඇයගේ ලමයින්ද, ඔවුන්ගේ ස්වාමිපුරුෂයාට සහ පියාට සමුදීම සඳහා වරයාට ගියහ. ඔවුහු නැවත නිවසට පැමිණි විට, ලුවිසා මෙසේ වාර්තා කළාය, "දුක අපගේ සිත්වල අරක්ගත්තේය, මහ හඬින් ගෙරවීම් ඉතා ඉක්මණින් ආරම්භ විය. මාවත ඉදිරිපිට ජීවත්වූ පවුලකගේ නිවසේ ජල කාන්දුවීමක් තිබින; එය දුර්වල විශ්වාසයක් නැති නිවසකි. ඉක්මණින්ම ඔවුන් සියල්ලෝම කුනාටුවෙන් ආරක්ෂාව පතා අප නිවසට දිව ආහ. ඔවුන් ඇතුළට පැමිණීම දැකීම ගැන අපි ස්තුතිවන්ත වෙමු; ඔවුහු අපට සැනසීම දෙන කථා කීහ, ගීතිකාගායනා කළහ. ඒ සොහො-යුරා අප සමග යාච්ඤා කළ අතර කුණාටුව අවසන් වන තුරු ඔවුහු නැවතී සිටියහ."[1]

ඇඩිසන් පිටත්වීමෙන් ටික කලකින්, ඔහුගේ බාල දියණියට වසූරිය වැළඳින. රෝගය ඉක්මණින් බෝවෙන නිසා, ප්‍රැට් නිවසට එන පූජක සොහොයුරන්ට එය දැඩි අවදානමක් බැවින්, ලුවිසා ඇදහිල්ලෙන් යාච්-ඤාකර, "උණ රෝගයට තරවටු කළාය." කුඩා බිබිලි එකොළහක් ඇයගේ දියණියගේ ශරීරයෙන් පිටට ආ නමුත්, රෝගය වර්ධනයවුනේ නැත. ටික දිනකින් උණ බැස ගියේය. ලුවිසා මෙසේ ලියුවාය, "එම රෝගය හඳුනන කෙනෙකුට මම ලමයා පෙන්වූවෙමි; එය ආක්‍රමනයක් බව ඔහු කීවේය; මා එය ඇදහිල්ලෙන් ජයගෙන ඇත."[2]

එවන් පරිත්‍යාග කර නාවූ නගරයෙන් පිටවී ගිය ධර්මදූතයෝ දහස් ගණන් සභාවට ගෙන ආහ. හැරී ආ බොහෝ අයද විශිෂ්ඨ ඇදහිල්ලක්

සහ ධෛර්‍යයක් පෙන්වූහ. මේරි ඈන් වෙස්ටන්, ඇඳුම් මැසීම ඉගෙනගනි-මින් එංගලන්තයේ ජීවත්වුනේ විලියම් ජෙන්කින්ස් පවුල සමගය. ජෙන්කින් සොහොයුරා සුභාරංචියට හැරීවිත් සිටි අතර, විල්ෆෝඩ් වුඩ්රෆ් එම පවුල බැහැදැකීමට නිවසට ආවේය. ඒ අවස්ථාවේ නිවසේ සිටියේ මේරි ඈන් පමණි. විල්ෆෝඩ් ගිනි උදුන ලඟ හිඳගෙන, "මා දුර්වල මිනිසෙක් ගැන බිය වී, මට හැඟෙන ආත්මික ආනුභාවය ප්‍රතික්ෂේප කරන්නේද" ගායනා කළේය. ඔහු ගායනාකිරීම බලා සිටි මේරි ඈන්ට මෙසේ සිහිපත්විය, "ඔහුගේ පෙනුම බොහෝ සාමකාමී සහ ප්‍රීතිමත් එකක් විය, ඔහු යහපත් මිනිසෙක් විය යුතුය, ඔහු දේශනාකළ සුභාරංචියද සත්‍ය විය යුතුය."[3]

සභා සාමාජිකයන් සමග ආශ්‍රයකිරීම තුලින්, මේරි ඈන් ඉක්මණින්ම හැරීවිත් බව්තීස්ම වූවාය—නැවත පිහිටුවූ සුභාරංචි පණිවුඩයට ප්‍රතිචාර දැක්වූ ඇයගේ පවුලේ එකම සාමාජිකයා ඇය විය. ඇය සභාවේ සාමා-ජිකයෙක් හා විවාහවිය, ඔහු මාස හතරකින් පසුව මියගියේ, සභා රැස්වී-මක් කඩාකප්පල් කිරීමේ අදහසින් දාමරිකයන් කළ පහරදීමක ප්‍රතිඵලයක් වශයෙනි. හුදකලාවූ ඇය, නාවූ බලා යන පසු-දවස්වල ශුද්ධවන්තයන්-ගෙන් පිරුනු නැවක නැගී, ඇයගේ නිවස, ඇයගේ මිතුරන්, සහ ඇයගේ අභක්තිමත් දෙමාපියන්ද අත් හැර ගියාය. ඇයට නැවත කිසිදා සිය පවුල දැකීමට ලැබුනේ නැත.

ඇයගේ ධෛර්‍යය සහ කැපවීම නිසා අවසානයේදී බොහෝ දෙනෙ-කුගේ ජීවිත ආශිර්වාදිත විය. ඇය පීටර් මෝර්ගන් නම්, යුටා උතුරු දිග කැචී මිටියාවතේ පදිංචිව සිටි වැන්දඹු පුරුෂයෙකු හා විවාහවූවාය. එහිදී ඇය සභාවට සහ ඇයගේ නාමයටද ගෞරව කළ, විශාල ඇදහිලිමත් පවුලක් ගොඩ නැගුවාය.

### ප්‍රමිති පොත්

නාවූ සිටි කාලය තුලදී, යම් ලියවිලි කිහිපයක් පසුව අනගි මුතු ඇටය බවට පත්වී ප්‍රසිද්ධ කෙරින. මෙම පොතේ ඇතුළත්වන්නේ, මෝසෙස්ගේ පොතේ, ආබ්‍රහම්ගේ පොතෙන් තෝරාගත් කොටස්, මතෙව්ගේ සාක්ෂියේ උපුටාගැනීමක්, ජෝසෆ් ස්මිත් ඉතිහාසයේ සාරාංශයක්, සහ ඇදහිල්ලේ කරුණුය. මෙම ලියවිලි ලියන ලද්දේ ජෝසෆ් ස්මිත් විසින්, ස්වාමීන්ව-හන්සේගේ මග පෙන්වීම යටතේය.

ශුද්ධවන්තයන්ට දැන් සභාවේ ප්‍රමිති පොත් බවට පත්වෙන ශුද්ධ ලියවිලි තිබිනඃ බයිබලය, මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම, සහ අනගි මුතු ඇටය ඒවාය. මෙම පොත් දෙවියන්වහන්සේගේ දරුවන්ට

අගය නොකළැකි වටිනාකමකින් යුක්තය. මන්ද ඒවා සුභාරංචියේ මූලික සත්‍යයන් උගවන්වමින්, අවංකව සොයන්නාට දෙවිවූ සදාකාලික පියාණන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍රයාණන්වූ යේසුස් ක්‍රිස්තුස්වන්සේ ගැන දැනගැනීමට සලස්වන නිසාය. නූතන-කාලයේ ශුද්ධ ලියවිලිවලට, ස්වාමීන්වහන්සේ විසින් මගපෙන්වූ ලෙස උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන් තුළින් එන අමතර එළිදරව්ද එකතුකර ඇත.

## නාවූ නගරයේ දේවමාළිගාව

නාවූ නගරය ගොඩ නගා මාස 15ක් ගතවූ විට, පළමෙනි සභාපතිත්වය, එළිදරව්වලට කීකරුව, "යාච්ඤා ගෘහයක්, නිසි පිළිවෙලේ ගෘහයක්, අපගේ දෙවියන්වහන්සේට නමස්කාර කිරීමේ ගෘහයක්, උන්වහන්සේගේ දිව්‍යමය කැමැත්තට එකඟව නියෝග ඉටුකල හැකි ස්ථානයක් ඉදිකිරීමට"[4] දැන් කාලය පැමිණ ඇති බව නිවේදනය කළේය. ඔවුන්ගේම පවුල්වලට සැපයීමට පවා දුප්පත් කමින් පරිශ්‍රම දැරුවද, පසු-දවස්වල ශුද්ධවන්තයෝ ඔවුන්ගේ නායකයන්ගේ කැඳවීමට ප්‍රතිචාර දක්වා දේවමාළිගාව ගොඩනැගීමට අවශ්‍ය කාලය සහ මුදල් පරිත්‍යාග කිරීම ඇරඹූහ. 1,000 කට වැඩි මිනිසුන් පිරිසක් සෑම දින දහයකට වරක් සේවය කළහ. තරුණ ගැහැණු ළමයෙකුවූ, ලුවිසා ඩෙකර් විෂ්මයට පත්වූයේ, ඇයගේ මව පිඟන් බඩු සහ ලක්ෂන ඇඳ ඇතිරිලි දේවමාළිගා ඉදිකිරීම් සඳහා විකුණා දැමූ නිසාය.[5] වෙනත් පසු-දවස්වල ශුද්ධවන්තයන්යෝ දේවමාළිගා ඉදිකිරීම් කටයුතු සඳහා අශ්වයන්, කරත්ත, එළදෙනුන්, ඌරන්, සහ ධාන්‍ය දුන්හ. දේවමාළිගා අරමුදලට ඩයිම් හෝ පෙනීස් මුදල් වලින් දායකවීමට නාවූ නගරයේ කාන්තාවන්ට කියන ලදී.

කැරොලින් බට්ලර්ට දායකවීමට පැන්ස හෝ ඩයිම් නොතිබුන නමුත්, යමක් දීමට ඇයට දැඩි වුමනාවක් තිබින. එක් දිනක් ඇය කරත්තයකින් නගරය යන අතර, මියගිය මී ගවයන් දෙදෙනෙක් දුටුවාය. ඇයගේ දේවමාළිගා දීමනාව කුමක්දැයි ඇය දැනගත්තාය. ඇය සිය ළමයින්ද සමග මී ගවයන්ගේ බෙල්ලේ කේශ ගලවාගත් ඔවුහු ඒවා නිවසට රැගෙන ගියහ. ඔවුහු කේශ සෝදා, පීරා, ඒවා නූල් මෙන් අඹරා, බර ඇති අත් මේස් ජෝඩු අටක් ගොතා, ශී ත ඍතුවේ අධික ශීතලේ දේවමාළිගාව සඳහා කළු ගල් කපන්නන්ට දුන්නාය.[6]

හයිරම් ස්මිත්ගේ බිරිඳවූ, මේරි ෆීල්ඩින් ස්මිත්, එංගලන්තයේ පසු-දවස්වල ශුද්ධවන්ත කාන්තාවන්ට ලිපියක් ලියූ අතර, ඔවුහු වසරක් තුලදී රාත්තල් 434ක් බර, පැන්ස 50,000ක් එකතුකර, ඒවා නාවූ නගරයට

නැව්ගත කළහ. ගොවියෝ අශ්වයන් සහ කරත්ත ආධාර ලෙස දුන්හ. වෙනත් අය ඔවුන්ගේ ඉඩම් කිහිපයක් විකුණා එම මුදල් ගොඩනැගිලි සමිතියට දුන්හ. ඔරලෝසු සහ තුවක්කු බොහොමයක් ආධාර ලෙස ලැබින. නෝර්වේ, ඉලිනොයිස්, ශුද්ධවන්තයෝ දේවමාළිගා සමිතියේ පාවිච්චිය සඳහා බැටළුවන් 100ක් යැවූහ.

බ්‍රිගම් යන්ට මෙසේ සිහිපත්විය: "නාවූ දේවමාළිගාව සඳහා අපි බොහෝ වෙහෙසවී වැඩ කල අතර, ඒ කාලයේ වැඩකරන මිනිසුන්ට කෑම සඳහා පාන් සහ වෙනත් ආහාර ලබාගැනීම අසීරු විය." එසේ වුවද දේවමාළිගා අරමුදලේ තිබෙන සියලුම පිටි නිකුත් කිරීමට එහි ප්‍රධානීන්ට සභාපති බ්‍රිගම් යන්ග් උපදෙස් දුන්නේ, ස්වාමීන්වහන්සේ සැපයුම් ලබාදෙන බවට විශ්වාසයක් ඇතිවය. කෙටි කාලයක් තුලදී, මෑතකදී සභාවට හැරී ආ ආයෙක්වූ, ජෝසෆ් ටොරෙන්ටෝ, සිසිලියේ සිට නවුවූ වෙත ආවේය. ඔහු ඩොලර් 2,500ක රත්රන් ගෙනා ආ අතර, ඒවා සභා සොහොයුරන්ගේ දෙපා ලඟ තැබුවේය.[7] මෙම ටොරොන්ටෝ සොහොයුරාගේ ජීවිතයේ ඉතිරි කිරීම් යොදා ගැනුනේ අඩු පාඩුවූ පිටි පිරවීමට සහ වෙනත් බොහෝ අවශ්‍යව තිබූ ද්‍රව්‍යයන් මිළදී ගැනීමටය.

ශුද්ධවන්තයන් නාවු නගරයට පැමිණි විගසකින්ම වාගේ, සුභාරංචිය නොඅසා මියගිය මුතුන්මිත්තන් වෙනුවෙන් බව්තීස්ම කළ හැකි බව ස්වාමීන්වහන්සේ ජෝසෆ් ස්මිත් තුලින් එළිදරව් කළසේක (බලන්න ධීසහසී 124:29–39). මෙම පොළොවේදී සුභාරංචිය පිළිගත් අයට ලැබෙන ආශිර්වාදම මියගිය අයටද ලැබෙන පොරොන්දුව තුලින් බොහෝ ශුද්ධවන්තයන්ට විශාල සහනයක් ඇතිවිය.

ඉගැන්වීම්, ගිවිසුම් සහ දේවමාළිගා එන්ඩව්මන්ට් වශයෙන් දැන් හැඳින්වෙන ආශිර්වාද සම්බන්ධයෙන් වැදගත් එළිදරව්වක්ද අනාගතවක්තෘවරයාට ලැබිනි. මෙම පූජනීය නියෝගය නිසා ශුද්ධවන්තයන්ට "එම ආශිර්වාදවල පූර්ණත්වය ස්ථිරකිරීමට" හැකියාව ලබාදී ඔවුන්ව සදාකාලික ලෝකවල එලෝහිම්…දෙවියන්වහන්සේ සමීපයට පැමිණ වාසයකිරීමට"[8] සූදානම්කරනු ඇත. එන්ඩව්මන්ට් ලැබීමෙන් පසුව, ස්වාමි පුරුෂයා සහ භාර්යාව පූජකවරයේ බලය මගින් මෙලොව සහ සදාකාලය දක්වා මුද්‍රාකළ හැකිය. පොළොව මත තම කාලය කෙටි බව ජෝසෆ් ස්මිත් අවබෝධකරගත්තේය, එනිසා දේවමාළිගාව ඉදිවෙමින් තිබියදී, එහි ඉහළ මාලයේ රතු ගඩොල් ගබඩාව තුලදී, තෝරාගත් අනුගාමිකයන්ට එන්ඩව්මන්ට් දීම ඔහු ආරම්භ කළේය.

අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ව මරාදැමීමෙන් පසුව, ඉතා ඉක්මණින් තමන්ට නාවූ වලින් පිටවීමට සිදුවන බව අවබෝධකරගත් ශුද්ධවන්තයෝ, දේවමාළිගාව සම්පූර්ණකිරීමේ ඔවුන්ගේ කැපවීම වැඩි කළහ. දේවමාළි-ගාවේ නිම නොකළ කාමරය ගොඩනැගිල්ලේ කොටසක් ලෙස කැප කළ ඔවුහු, එහි එන්ඩව්මන්ට් මෙහෙයවූහ. මෙම පූජනීය එන්ඩව්මන්ට් ලබාගැ-නීමට ශුද්ධවන්තයන් බොහෝ උනන්දුවූ නිසා, බ්‍රිගම් යන්ග්, හීබර් සී. කිම්බල්, සහ ප්‍රේරිතවරුන් දොළොස් දෙනාගේ තවත් අයද, පැය හතරක් පමණක් රාත්‍රියට නිදා ගනිමින්, දිවා සහ රාත්‍රී දේවමාළිගාවේ නතරව සිටියහ. මේරි ෆීල්ඩින් ස්මිත්ට බාරව තිබුනේ දේවමාළිගා ඇඳුම් සේදීම සහ මැදීම මෙන්ම කෑම පිසීමද පරීක්ෂාකිරීමය. ඇයද දේවාමාළිගාවේම පදිංචිව සිටිමින්, පසු දිනයට සෑම දෙයක්ම සූදානම්කර තැබීමට සමහර අවස්ථාවලදී මුළු රාත්‍රිය පුරාම වැඩකළාය. අනෙක් සාමාජිකයන්ද එලෙසම කැපවී වැඩකළහ.

තමන්ට ඉක්මණින්ම අත්හැර යාමට සිදුවන ගොඩනැගිල්ලක් සම්පූර්ණ-කිරීමට මෙම ශුද්ධවන්තයෝ මෙතරම් මහන්සිවී වැඩ කළේ මන්ද? පසු-දවස්වල ශුද්ධවන්තයන් 6,000ක පමණ ප්‍රමාණයක් නාවූ නගරයෙන් පිට-වීමට පෙර ඔවුන්ගේ එන්ඩව්මන්ට් ලබාගත්හ. බටහිර දෙසට යන ඔවුන්ගේ ගමන ගැන ඇස් යොමුකළ ඔවුහු, ඔවුන්ගේ පවුල් සදාකාලිකවම එකට මුද්‍රාවී ආරක්ෂිතවී ඇති බවට ඇදහිලිමත් උප කල්පනයක් සහ අවබෝධයක් ඔවුන් තුල තිබින. අමෙරිකාවේ මෙයරී නම් විශාල තණ බිමක තම දරු-වෙකු හෝ සහකරුවෙකු මිහිදන් කිරීමෙන් පසුව, යෑමට සූදානම්වූ කඳුලින් යුතු මුහුණුවල, දේවමාළිගාව තුලදී ඔවුන් ලැබූ නියෝගවල ඇතුලත්ව තිබූ සහතික කිරීම නිසා, විශාල අධිෂ්ඨානයක් තිබින.

**සහන සමිතිය**

නාවූ දේව මාළිගාව ඉදිවෙමින් තිබියදී, හයිරම් කිම්බල්ගේ බිරිඳවූද, නගරයේ එක් පොහොසත්ම පුරවැසියෙක්වූද, සාරා ග්රේන්ජර් කිම්බල්, මාග්‍රට් ඒ. කුක් නම් මහන්නියක් කුලියට ගත්තාය. ස්වාමීන්වහන්සේගේ වැඩ කටයුතු තවදුරටත් කරගෙන යාමට සිතා, දේවමාළිගාවේ වැඩකරන මිනිසුන්ට කමිස මැසීමට සාරා රෙදි පරිත්‍යාග කළ අතර, ඒවා මැසීමට මාග්‍රට් එකඟ වූවාය. ඉන්පසුව, ඉක්මණින්ම වාගේ, සාරාගේ අසල්වැසි-යන් කිහිපදෙනෙක්ද කමිස මැසීමට සහභාගිවීමට කැමතිවූහ. කිම්බල් නිවසේ සාලයේදී හමුවූ සොහොයුරියෝ මූලික සංවිධානය තීරණය කළහ. අළුත් සමිතියට ව්‍යවස්ථාවක් සහ නීති ලිවීමට එලිසා ආර්. ස්නෝව පත්කරන ලදී.

සම්පූර්ණකරන ලද ලිපි ලේඛන එලිසා ජෝසෆ් ස්මිත්ට ඉදිරිපත් කළ අතර, එය ඔහු දැක තිබෙන ඉතා හොඳ ව්‍යවස්ථාවක් බව ප්‍රකාශ කළේය. නමුත් කාන්තාවන්ට ඉටුකර ගැනීමට හැකි දේ සම්බන්ධව ඔවුන්ගේ දර්ශනය පුළුල් කිරීමට ඔහු තුල තද හැඟීමක් ඇතිවිය. තවත් රැස්වීමකට සහභාගිවීමට කාන්තාවන්ට කී ඔහු, එහිදී ඔහු ඔවුන්ව නාවූ කාන්තා සහන සමිතිය ලෙස සංවිධානය කළේය. එමා ස්මිත්, අනාගතවක්තෘවරයාගේ බිරිඳ, සහන සමිතියේ පළවෙනි සභාපතිනිය බවට පත්වූවාය.

ජෝසෆ් සොහොයුරියන් අමතා, "දෙවියන්වහන්සේ විසින් පිහිටුවා තිබෙන මාර්ගය තුලින් නායකත්වයට පත්කල අයගෙන් ඔවුන්ට උපදෙස් ලැබෙන බව කීවේය— තවද දැන් මා දෙවියන් වහන්සේගේ නාමයෙන් ඔබට යතුරු බාරදෙන අතර, මෙම සමිතිය සතුටට පත්වනු ඇත, තවද අවබෝධය සහ ඥානය මෙම අවස්ථාවේ සිට ගලා එනු ඇත—මෙම සමිතියේ වඩා හොඳ දවස්වල ආරම්භය මෙය වන්නේය."[9]

සමිතිය සිය කටයුතු ආරම්භ කළ විගසම, කණ්ඩායමක් නාවූවල දුප්පතුන් බැහැදැකීමට ගොස්, ඔවුන්ගේ අවශ්‍යතාවයන් තක්සේරු කර, ඔවුන්ට උපකාර කිරීමට ආධාර ඉල්ලූහ. මුදල් ආධාර සහ ආහාර සහ ඇඳ ඇතිරිලි විකිණීමෙන් අවශ්‍ය අයට පාසල් යාමට උදව්කරන ලදී. හණ, වූල්, නූල්, ලී පතුරු, සබන්, ඉටිපන්දම්, බෙලෙක් භාජන, රන් භාණ්ඩ, බාස්කට්, ඇඳ ඇතිරිලි, ලූණු, ඇපල්, පිටි, පාන්, විස්කෝතු සහ මස් වර්ග අවශ්‍යතා ඇති අයට පරිත්‍යාග කෙරින.

දුප්පතුන්ට උපකාරකිරීමට අමතරව, සහන සමිතියේ සොහොයුරියෝ එක්ව යාච්ඤා කළහ. එක් රැස්වීමකදී එලිසා ආර්. ස්නෝ වාර්තාකළ පරිදි, "පැමිණ සිටි සියලු දෙනාම වාගේ, නැගිට කථාකළ බවත්, ස්වාමීන්වහන්සේගේ ආත්මය පිරිසිදුකිරීමේ දිය ඇල්ලක් මෙන්, සෑම හදවතක්ම අළුත්කල බව."[10] කීවාය. මෙම සොහොයුරියෝ එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කළහ, එකිනෙකාගේ ඇදහිල්ල ශක්තිමත් කරමින්, ඔවුන්ගේ ජීවිත සහ සම්පත් සයෝනයේ කටයුතු සඳහා තවදුරටත් උපකාර කිරීමට කැප කළහ.

**වේද මරණය**

නාවූවල සිටි කාලය ශුද්ධවන්තයන්ට බොහෝ ප්‍රීතිමත් අවස්ථාවන් ලබා දුනි. හිංසා පීඩා නැවතත් ඉක්මණින්ම ආරම්භවී, ජෝසෆ් සහ හයිරම් ස්මිත්ව මරාදැමීමට තරම් ඒවා උච්ඡවිය. මෙය කිසිදා අමතක කළ නොහැකි අඳුරු සහ ශෝකාත්මක කාලයකි. වේද මරණය ගැන ඇසීමෙන් තමාට ඇතිවූ හැඟීම් වාර්තාකරමින්, ලුවිසා බාන්ස් මෙසේ ලීවාය: "එය

නිසල රාත්‍රියක්වූ අතර, සඳ සම්පූර්ණයෙන්ම පායා තිබුනි. එය මරණයේ රාත්‍රියක් ලෙස පෙනුන අතර, එය සංවේගාත්මක වීමට සෑම දෙයක්ම ක්‍රියාත්මක විය! මිනිසුන්ට එකතුවීමට කැඳවන සභා නිළධාරීන්ගේ හඬවල් ඈතින් ඇසුනු අතර, එය හදවත්වලට දැනුනේ අවමංගල සණ්ටා නාද ලෙසිනි. කාන්තාවන් කණ්ඩායම් ලෙස එකතුව, හඬමින් සහ යාච්ඤාකරමින් සිටි අතර, සමහරු මිනීමරුවන්ට භයානක දඬුවම් ඉල්ලූහ. තවත් අය එම සිද්ධියේදී දෙවියන්වහන්සේගේ හස්තය භාරගත්හ."[11]

ලුවිසා බාන්ස් ප්‍රැට් මෙන්, තවත් බොහෝ පසු-දවස්වල ශුද්ධවන්තයන්ටද 1844 ජූලි 27 වෙනිදා සිද්ධීන් කඳුලින් සහ බිඳීගිය හදවත් සහිත කාලයක් ලෙස මතක තිබේ. මුල් කාලීන සභා ඉතිහාසයේ ඉතාමත්ම දුක්මුසු සිද්ධියකි ජීවිත පරිත්‍යාගය. කෙසේවුවද, එය බලාපොරොත්තු රහිත දෙයක් නොවීය.

1829 ආරම්භයේදී පටන්ගෙන, අඩු වශයෙන් විවිධ අවස්ථා 19කදී, තමාට මෙම ජීවිතයෙන් සමහරවිට සාමකාමීව පිටවී යාමට නොලැබිය හැකි බව ජෝසෆ් ස්මිත් ශුද්ධවන්තයන්ට කීවේය.[12] ඔහුගේ සතුරන් යම් දිනෙක ඔහුගේ ජීවිතය ගන්නා බවට හැඟීමක් ඔහු තුල තිබුනද එය කවදාදැයි ඔහු දැනසිටියේ නැත. 1844 වසන්තය ගෙවී ග්‍රීෂ්මය පැමිණි විට, සභාව තුල සහ ඉන් පිටත සිටි සතුරෝ ජෝසෆ්ගේ විනාශය පතා කටයුතු කළහ. තෝමස් ෂාප්, නම්, අසල පුවත්පතක කතුවරයෙක් සහ හැන්කොක් නගරයේ මෝර්මන්වරුන්ට විරුද්ධ දේශපාලන පක්ෂයක නායකයෙක්, අනාගතවක්තෘවරයා මරාදමන බව ප්‍රසිද්ධියේම කීවේය. පුරවැසි කණ්ඩායම්, ඇදහිල්ලෙන් වැටුනු අය, සහ සිවිල් නායකයෝ අනාගතවක්තෘවරයා විනාශකිරීම මගින් සභාව විනාශ කිරීමට කුමන්ත්‍රනය කළහ.

ඉලිනොයිස් ආණ්ඩුකාරයාවූ, තෝමස් ෆෝඩ්, ජෝසෆ් ස්මිත්ට ලියමින්, මහජනයා කැළඹීම වෙනුවෙන් නගර සභාවේ සාමාජිකයෝ මෝර්මන් නොවන ජූරි සභාවක නඩු විභාගයක් අසන බව අවධාරණය කළේය. ජනතාව තෘප්තිමත්කළ හැක්කේ එවැනි විභාගයකින් පමණක් බව ඔහු කීවේය. මිනිසුන්ට සම්පූර්ණ ආරක්ෂාව සලසන බව ඔහු පොරොන්දු වුවද, ඔහුගේ ප්‍රතිඥාව ඔහු තබන බවට අනාගතවක්තෘවරයා තුල විශ්වාසයක් නොතිබින. වෙනත් විකල්පයක් නොමැති බව පෙනීමට තිබුන විට, අනාගතවක්තෘවරයා, ඔහුගේ සොහොයුරු හයිරම් ජෝන් ටේලර් සහ තවත් අය කිසිදු අපරාධයකට වරදකරු නොවන බවට පූර්ණ විශ්වායකින් යුතුව, සිරගතකිරීමට බාරවූහ.

සැතපුම් 20ක පමණ දුරින්වූ ප්‍රාන්ත සිරගෙදරට යාමට නාවූ නගරයෙන් පිටවීමට අනාගත වක්තෘවරයා සූදානම්වන විට, ඔහුගේ පවුල සහ මිතුරන් ඔහු දකින්නේ අන්තිම වතාවට බව ඔහු දැන සිටියේය. ඔහු අනාවැකියක් කියමින්, "මා යන්නේ මරණයට ගෙන යන බැටළුවෙකු මෙන්ය, නමුත්, මා ග්‍රීෂ්මයේ උදෑසනක් මෙන් සන්සුන්ය."[13]

අනාගතවක්තෘවරයා ගමන පටන්ගත් විට, ජෝසෆ්ගේ ගොවි පළේ වසර තුනකට වඩා වැඩකර තිබූ, බී. රොජර්ස්, තවත් පිරිමි ළමුන් දෙදෙනෙක් ගොවි පළ තරණයකර, රේල් පාරේ වැට මත වාඩිවී, ඔවුන්ගේ මිතුරා සහ නායකයා එන තුරු බලා සිටියහ. ජෝසෆ් තම අශ්වයා පිරිමි ළමුන් ලඟ නතරකර, ඔහු සමග සිටි හමුදා මිනිසුන්ට මෙසේ කීවේය: "මහත්වරුනි, මේ මගේ ගොවිපළ සහ මේ මගේ පිරිමි ලමයි. ඔවුන් මා ප්‍රියකරන අතර මමද ඔවුන්ව ප්‍රියකරමි." හැම ලමයෙකුගේම අතගැනීමෙන් පසුව, ඔහු තම අශ්වයා පිට නැගී ඔහුගේ මරණයේ සංකේත ස්ථානයට ගියේය.[14]

වේල්සයේ හැරී ආවෙකුවූ, ඩැන් ජෝන්ස්, කාර්තේජ් සිරගෙදරදී අනාගතවක්තෘවරයාට එකතුවිය. 1844 ජූනි 26 වෙනිදා, ඔහුගේ ජීවිතයේ අවසාන දිනයේ, ජෝසෆ්ට වෙඩි ශබ්දයක් ඇසී. ඔහු ජෝන් අසල බිම දිගාවිය. අනාගතවක්තෘවරයා මෙසේ මිමිනුවේය, "ඔබ මැරෙන්ට බයද?" "එවන් හේතුවකට සම්බන්ධවීමෙන් මරණයට එපමණ බියක් ඇතැයි මම නොසිතමි" යයි ජෝන් පිළිතුරු දුන්නේය. "ඔබ තවමත් වේල්සයේ ඔබට පැවරූ දූතමෙහෙය ඔබ මියයාමට පෙර දකිමින් සිටියි." යයි ජෝසෆ් අනාවැකි කීවේය.[15] දහස් ගණන් ඇදහිලිමත් ශුද්ධවන්තයෝ අද සභාවේ ආශිර්වාද භුක්තිවිඳින්නේ, ඩැන් ජෝන්ස් පසුව වේල්සයේ ගෞරවනීය සහ සාර්ථක දූතමෙහෙයක සේවයකළ නිසාය.

1844 ජූනි 27වෙනිදා හවස පහ පසුවූ විගස, දාමරිකයන් 200ක පමණ කණ්ඩායමක් පාට කළ මුහුණු සහිතව කාර්තේජ් සිරගෙදරට කඩා වැදී, ජෝසෆ් සහ ඔහුගේ සොහොයුරු හයිරම්ට වෙඩිතබා මරාදමා, ජෝන් ටේලර්ව බරපතල ලෙස තුවාල කළහ. විලාඩ් රිචර්ඩ්ස් පමණක් අකතුරකින් තොරව සිටියේය. "මෝර්මන්වරු එන බවට කෑගැසීම් ඇසී," කාර්තේජ්හි වාසයකල අය කලාක් මෙන්, දාමරිකයෝ පලාගියහ. විලාඩ් රිචඩ්ස් තුවාලවී සිටි ජෝන් ටේලර් ගැන සොයා බැලූ අතර, ඔවුන් දෙදෙනාම මරාදැමූ ඔවුන්ගේ නායකයන් ගැන දුක්වූහ. හයිරම්ගේ ශරීරය සිරගෙදර ඇතුළේ තිබූ අතර, ජනේලයකින් බිමට වැටී සිටි, ජෝසෆ්, පිටත තිබූ ළිඳක් අසල වැතිර සිටියේය.



*කාර්තේජ් සිරගෙදර වේද මරණයේ දර්ශනය. පොළොව මැද වැතිර සිටින හයිරම් ස්මිත්ව, ක්ෂණයකින් මරාදැමීන; ජෝන් ටේලර්, පහත වමේ, දරුණුලෙස තුවාල ලබා සිටියි; ජෝසෆ් ස්මිත් ජනේලය දෙසට දිවයන විට, වෙඩිතබා මරාදැමීන; විලාඩ් රිචඩ්, ගිනි උදුන ලඟ, අනතුරක් නැතිව සිටියි.*

එම ස්ථානයට පැමිණි පළමු පසු-දවස්වල ශුද්ධවන්තයාවූයේ මියගිය වේද මරණකරුගේ සොහොයුරු සැමුවෙල්ය. ඔහු අන් අය හා එක්ව නාවූ බලා නැවත යන දීර්ඝ, දුක් මුසු ගමන සඳහා ශරීර සූදානම්කිරීමට විලාඩ් රිචර්ඩ්ස්ට උදව් කළහ.

ඒ අතරතුර, වෝරසෝ, ඉලිනොයිස්හි, සභාවේ සාමාජිකයන්වූ, ජේම්ස් කව්ලි පවුල, ඔවුන්ගේ සැන්දෑ අහාරය සූදානම් කළහ. දහ-හතර හැවිරිදි මතායස්,නගරයේ පවතින අසාමාන්‍ය කලබලය ගැන ඇසී, එකතුවන සෙනගට සම්බන්ධවිය. ප්‍රධාන කථිකයා තරුණ කව්ලිව දැක ඔහුට නිවසේ සිටින ඔහුගේ මව වෙතට යන ලෙස ඔහුට නියෝග කළේය. ඔහු අසල්-වැසියෙකුගේ මිදුල හරහා දිවගොස් බේරී යන තුරු, සභා සාමාජිකයන් නොවන පිරිමි ළමයි ඔහු එළවා ගොස් ඔහුට කුණුවලින් දමා ගැසූහ.

උණුසුම පහව ගොස් ඇති බව සිතූ මතායස්, වතුර බාල්දියක් ගැනීමට ගඟට ගියේය. දාමරික කණ්ඩායමේ සාමාජිකයෝ ඔහුව දැක, ඔහුව ජලයට වීසිකර දැමීම සඳහා බීමත් මහන්නෙකුට මුදල් දුන්නේය.

මතායස් වතුර ගැනීමට නැවතුන විට, මහන්නා ඔහුගේ ගෙල පිටුසින් ඔහුව අල්ලාගෙන, "නුඹව…මෝර්මන් පැටියා, මා ගිල්වා මරනවා" යයි කීවේය. මතායස්ද, "මා ගිල්වා මරන්නේ මන්ද, මා ඔහුට කවදා හෝ යම් වරදක් කර තිබේද? යයි මම ඔහුගෙන් ඇසුවෙමි." 'නැහැ, ඔහු කියයි, මා නුඹව ගිල්වා මරන්නේ නැහැ….නුඹ හොඳ ළමයෙක්, නුඹට ගෙදර යන්න පුළුවන.'" එදින රාත්‍රී දාමරිකයෝ කච්ලිගේ නිවසට ගිනි තැබීමට තුන්වරක්ම අසාර්ථක ප්‍රයත්නයන් දැරූහ. නමුත්, ඇදහිල්ල සහ යාච්ඤා තුළින් පවුල ආරක්ෂාවිය.[16] කච්ලි වැඩී සභාවේ ඇදහිලිමත්ව සිටියේය; ඔහුගේ පුත්‍ර මතායස් සහ මුනුපුරා මැතිව් පසුව ප්‍රේරිතවරුන් දොළොස් දෙනාගේ ගණපූර්ණයේ සේවය කළහ.

ඉලිනොයිස් ආණ්ඩුකාර තෝමස් ෆෝඩ් වේද මරණය ගැන මෙසේ ලීවේය: "මෝර්මන්වරුන්ගේ අවසානයක් දැකීම සඳහා ඔවුන්ව පළවාගැ-රීමට…එසේ වේයයි බොහෝ දෙනෙක් සිතුවද, ස්මිත් සොහොයුරන්ගේ ඝාතනය, වෙනත් කිසිදාකට වඩා ඔවුන්ව සමීපතාවයෙන් එකට එක්කර, ඔවුන්ගේ ඇදහිල්ලට අළුත් විශ්වාසයක් ලබා දුන්නේය."[17] ෆෝඩ් මෙසේද ලීවේය, "පාවුළු මෙන් කළ පරිත්‍යාගකි, සිය අලංකාර ව්‍යක්ත බවින් වශීකල දහස් ගණන් පිරිස්,…[මෝර්මන් සභාවට] අළුත් ජීවයක් සාර්ථකව ලබාදී දිවි පිදූ ජෝසෆ් සොහොයුරන්ගේ නාමය…ශබ්දනගා කියමින් මිනි-සුන්ගේ ආත්ම කළඹවනු ඇත. "ෆෝඩ් ජීවත්වූයේ මෙය සිදුවී, ඔහුගේම නම, පිලාත් සහ හෙරෝද් මෙන් පරම්පරා ගණනාවක් අපකීර්තිමත් වනු ඇතැයි යන බියකින්ය."[18] ෆෝඩ්ගේ බිය සැබෑවක් විය.

සභාපති ජෝන් ටේලර්ගේ තුවාල සුවවීමෙන් පසුව මරාදැමුනු නායකයන් ගැන ලියූ උපහාර දැන් දහම සහ ගිවිසුමේ 135වෙනි කොටසේ සඳහන්ව ඇත. ඔහු මෙසේ කීවේය, ජෝසෆ් ස්මිත්, ස්වාමීන්වහන්සේගේ අනාගතවක්තෘවරයා සහ දිවැසිවරයා, යේසුස්වහන්සේ හැරුන විට, මෙම ලෝකයේ මිනිසුන්ගේ ගැලවීම සඳහා, එහි ජීවත්වූ වෙනත් කිසිවෙකුටත් වඩා, විශාල දේවල් කර ඇත. ඔහු ශ්‍රේෂ්ඨ ලෙස ජීවත්විය, ඔහු දෙවියන්-වහන්සේගේ සහ ඔහුගේ ජනතාවගේ ඇස් ඉදිරියේ ශ්‍රේෂ්ඨ ලෙස මියගි-යේය. පැරණි කාලයේ ස්වාමීන්වහන්සේ ආලේපකළ බොහෝ දෙනෙක් මෙන්, ඔහුගේ දූතමෙහෙය සහ වැඩකටයුතු ඔහුගේම ලෙයින් මුද්‍රා කර ඇත. ඔහුගේ සොහොයුරු හයිරම්ද එලෙසය. ජීවිතයේදී ඔවුහු බෙදී නොසිටි අතර මරණයේදීද ඔවුහු වෙන් නොවී සිටියහ. ඔවුහු මහිමය සඳහා ජීවත්වූහ, ඔවුහු මහිමය සඳහා මියගිය අතර, මහිමය ඔවුන්ගේ සදාකාලික විපාකය විය (බලන්න ධීසහගි 135:3, 6).

## සභාපතිත්වයේ අනුපිළිවෙල

අනාගතවක්තෘ ජෝසෆ්ව සහ හයිරම් ස්මිත්ව කාර්තේජ් සිරගෙදරදී ඝාතනය වන විට, දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සහ වෙනත් සභා නායකයන් බොහොමයක් දූතමෙහෙයන්වල සේවයකරමින් සිටි නිසා නාවූ නගරයේ නොසිටියහ. මෙම මිනිසුන් මරණ ගැන දැනගත්තේ දින කිහිපයක් ගතවූ පසුවය. බ්‍රිගම් යන්ග් ප්‍රවෘත්තිය දැනගත් විට, පූජකවර නායකත්වයේ යතුරු තවදුරටත් සභාව සතුව තිබෙන බව ඔහු දැන සිටියේය. මන්ද මෙම යතුරු දොළොස්දෙනාගේ ගණපූර්ණයට ලබාදී තිබුනි. කෙසේවුවද, ස්වාමීන්වහන්සේගේ අනාගතවක්තෘවරයා, දර්ශන දකින්නා සහ එළිදරව්කරුවා ලෙස සිටි ජෝසෆ් ස්මිත් වෙනුවට පත්වන්නේ කවුදැයි සභාවේ සියලුම සාමාජිකයන්ට අවබෝධ නොවීය.

සිඩ්නි රිග්ඩන්, පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා, පිට්ස්බර්ග්, පෙනිසෙල්වේනියාවේ සිට 1844 අගෝස්තු 3 වෙනිදා පැමිණියේය. මේ කාලයට පෙර වසරේදී, ඔහු අනගතවක්තෘ ජෝසෆ් ස්මිත්ගේ උපදේශයන්ට විරුද්ධ මාර්ගයක නිරතවී, සභාවෙන් භේදවී සිටියේය. නාවූ නගරයට එවිටත් පැමිණ සිටි දොළොස්දෙනාගේ සමාජිකයන් තුන්දෙනා හමුවීම ප්‍රතික්ෂේපකළ ඔහු, ඒ වෙනුවට ඉරුදින නමස්කාර මෙහෙයට එකතුවී සිටි විශාල ශුද්ධවන්තයන් කණ්ඩායමක් සමග කථා කළේය. ඔවුන් ඇමතූ ඔහු, ඔහුට ලැබුනු දර්ශනයකින් ඔහු දැනගත් පරිදි ජෝසෆ් ස්මිත් වෙනුවට කිසිවෙකුට පත්විය නොහැකි බව කීවේය. සභාවට භාරකරුවෙක් පත්කළ යුතු බවත්, එම භාරකරු සිඩ්නි රිග්ඩන් විය යුතු බවත් ඔහු කීවේය. ශුද්ධවන්තයන් ටික දෙනෙක් ඔහුට සහාය දුන්හ.

බ්‍රිගම් යන්ග්, ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සභාපතිවරයා, 1844 අගොස්තු 6 වෙනිදා වන තුරු නව්වූ නගරයට නැවත පැමිණ සිටියේ නැත. ඔහු ප්‍රකාශයක් කරමින් ඔහුට අවශ්‍ය, සභාව මෙහෙයවිය යුත්තා ගැන "දෙවියන්වහන්සේ කුමක් කියන්නේද" යන්න දැනගැනීම පමණක් බව කීවේය.[19] දොළොස්දෙනා 1844 අගෝස්තු 8 වෙනි බ්‍රහස්පතින්දා රැස්වීමක් කැඳවූහ. සිඩ්නි රිග්ඩන් උදෑසන සැසිවාරයේදී පැයකට වඩා කථා කළේය. ඔහුගේ තත්වය විශ්වාස කළ කිහිප දෙනෙක් ඔහු දිනා ගත්තේය.


බ්‍රිගම් යන්ග් ඉන්පසුව කෙටියෙන් කථා කර, ශුද්ධවන්තයන්ගේ හදවත් සංසුන් කළේය. බ්‍රිගම් යන්ග් කථාකරන විට, ජෝර්ජ් සී. කැනන්ට මෙසේ සිහිපත්විය. "එය ජෝසෆ් ස්මිත්ගේම හඬය," තවද "ජනතාවගේ

ඇස්වලට පෙනීමට තිබුනේ ඔවුන් ඉදිරියේ සිටිගෙන සිටින පුද්ගලයා ජෝසෆ් ස්මිත්ම කියාය."[20] බ්‍රිගම් යන්ග්, අනාගතවක්තෘ ජෝසෆ්ගේ වැනි කටහඬකින් කථාකල බවට විලියම් සී. ස්ටේන්ස් සාක්ෂිදැරීය. "මා සිතුවේ ඒ ඔහු කියාය," ස්ටේන්ස් කීවේය. "එය ඇසුන දහස් ගණන් අයට සිතුනේද එසේමය."[21] විල්ෆෝඩ් වුඩ්රෆ්ද එම අසිරිමත් මොහොත සිහිපත් කරමින් මෙසේ ලීවේය, "මා ඔහුව මගේම ඇස්වලින් දැක නොතිබුනේ නම්, ඒ ජෝසෆ් ස්මිත් නොවන බව මට ඒත්තු ගැන්වීමට කිසිවෙකුට නොහැකිය. එසේම මෙම මිනිසුන් දෙදෙනා හඳුනන ඕනෑම අයෙකුට මෙයට සාක්ෂි දැරිය හැකිය."[22] බොහෝ දෙනෙක් දුටු, මෙම ආශ්වර්‍යමත් ප්‍රකාශවීම මගින් ජෝසෆ් ස්මිත් වෙනුවට සභාවේ නායකයා වශයෙන් ස්වාමීන්වහන්සේ බ්‍රිගම් යන්ව තෝරාගෙන තිබෙන බව ශුද්ධ-වන්තයන්ට පැහැදිළි විය.

දහවල් සැසිවාරයේදී, බ්‍රිගම් යන්ග් නැවතත් කථාකරමින්, මුළු ලෝකයේම දෙවියන්වහන්සේගේ රාජ්‍යයයේ තබා ගැනීමට ජෝසෆ් ස්මිත් ප්‍රේරිතවරුන් පත්කළ බවට සාක්ෂි දැරීය. දොළොස්දෙනා අනුග-මනය නොකරන අය සමෘද්ධිමත් නොවන අතර, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමේදී ප්‍රේරිතවරුන් පමණක් ජයග්‍රාහකයන් වන බවට අනාවැකි කීවේය.

ඔහුගේ කථාවෙන් පසුව, සභාපති යන්ග් සිඩ්නි රිග්ඩන්ට කථා කිරීමට කී නමුත්. ඔහු නිහඬව සිටියේය. විලියම් ඩබ්ලිව්. ෆෙල්ප්ස් සහ පාර්ලි පී. ප්‍රැට්ගේ කථාවලින් පසුව, බ්‍රිගම් යන්ග් නැවතත් කථා කළේය. නාවූ දේවමාළිගාව සම්පූර්ණකිරීමටත්, වනාන්තරයට යාමට පෙර එන්-ඩව්මන්ට් ලබාගැනීමට සහ ශුද්ධ ලියවිලිවල වැදගත්කම ගැනද ඔහු කථා කළේය. ඔහු ජෝසෆ් ස්මිත්ට දැක්වූ ප්‍රේමය ගැනත්, ඔහුගේ පවුලේ අයට ඇති ආදරය ගැනත් කථා කළේය. ශුද්ධවන්තයෝ ඉන්ප-සුව ප්‍රේරිතවරුන් දොළොස්දෙනා සභාවේ නායකයන් ලෙස ඒකමතිකව ඔවුන්ගේ ඡන්දය දුන්හ.

ටික දෙනෙක් සභාවේ සභාපතිත්වයට අයිතිවාසිකම් කියන විට, ශුද්ධ-වන්තයන් බොහෝ දෙනෙකුට පත්වීමේ අර්බුදය අවසන්වී තිබුනි. බ්‍රිගම් යන්ග්, ජ්‍යෙෂ්ඨ ප්‍රේරිතවරයා සහ දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සභා-පතිවරයාව, තම ජනතාව මෙහෙයවීමට දෙවියන්වහන්සේ තෝරාගෙන තිබූ මිනිසාවූ අතර, ජනතාව එකමුතුවී ඔහුව ස්ථිරකළහ.



*දාමරික සැහැසිකම් තමන් ආදරයකළ නාවූ නගරය අත්හැරීමට ශ්‍රද්ධවන්තයන්ට බලකෙරින.*

# සෑම පියවරක් තුලම ඇදහිල්ල

## නාවූවලින් පිටවීමට සූදානම්වීම

ශුද්ධවන්තයන්ට සමාදානයෙන් ජීවත්විය හැකි, බටහිර කඳුකරයට පිටවී යාම ගැන සභා නායකයෝ 1834 සිටම කථා කර ඇත. කාලය ගතවන විට, නායකයෝ ගවේශකයන් සමග නිවැරදි භූමි ප්‍රදේශ ගැන කථාකර, වාසයකිරීමට නියමිත ස්ථාන සොයාගැනීමට සිතියම් අධ්‍යයනය කළහ. 1845 අවසානය වන විට, සභා නායකයෝ බටහිර ගැන වඩාත් නවතම තොරතුරු ලබාගෙන තිබින.

නාවූ හිංසා පීඩා අධිකවන විට, ශුද්ධවන්තයන් පිටවී යාම අවශ්‍ය බව පැහැදිළිව පෙනෙන්ට තිබින. 1845 නොවැම්බරය වන විට, නවුවූ නගරය කඩිමුඩියේ සූදානම්වීමේ කටයුතුවලින් යුක්තවිය. නික්මයාම සඳහා ශුද්ධ-වන්තයන් මෙහෙයවීමට සියය, පනහ සහ දහයේ මුලාදෑනීන් කැඳවන ලදී. එක් එක් 100 කණ්ඩායමකට එකක් හෝ ඊට වැඩියෙන් කරත්ත පට්ටල පිහිටුවන ලදී. රෝද සාදන්නෝ, වඩු කාර්මිකයෝ, සහ නිවාස සාදන්නෝ රෑ බෝවන තුරු ලී සූදානම්කරමින් සහ කරත්ත නිපදවමින් වැඩකළහ. යකඩ මිළදී ගැනීමට සාමාජිකයන්ව නැගෙනහිරට යැවූ අතර, කම්මල්කරුවෝ ගමනට අවශ්‍ය බඩු සහ නව සයෝනය ජනාවාස කිරීමට අවශ්‍ය ගොවි උපකරණ නිපදවූහ. පවුල් ආහාර සහ නිවාසවලට අවශ්‍ය උපකරණ එකතුකර ගබඩාකරන භාජනවල වියලි පලතුරු, හාල්, පිටි සහ බෙහෙත් වර්ග පිරවූහ. පොදු යහපත තකා වැඩකරමින්, ශුද්ධවන්තයෝ ඉතා කෙටි කලයක් තුලදී තම හැකියාවට වඩා දේවල් ඉටුකළහ.

## ශීත ඍතුවේ ගමන්මග බාධක

නාවූ අත්හැර යාම මුලදී සැලසුම් කෙරුනේ 1846 අප්‍රේල් මාසයේදීය. නමුත් තර්ජනවල ප්‍රතිඵලයක් ලෙස, ශුද්ධවන්තයන් බටහිරට යාම වැළැක්වීමට රාජ්‍ය හමුදා අදහස්කිරීම නිසා, ප්‍රේරිතවරුන් දොළොස්දෙනා සහ ප්‍රධාන පුරවැසියෝ ඉක්මණින්ම 1846 පෙබරවාරි 2 වෙනිදා සභාවක්

පැවැත්වූහ. ඉක්මණින්ම බටහිරට ගමන් ඇරඹීම අවශ්‍ය බවට ඔවුන් එකඟවී, නික්මයාම පෙබරවාරි 4 වෙනිදා ආරම්භවිය. බ්‍රිගම් යන්ගේ මගපෙන්වීම යටතේ, පළමු ශුද්ධවන්ත කාණ්ඩායම ඔවුන්ගේ ගමන ආශාවෙන් ආරම්භ කළහ. කෙසේවුවද, එම ආශාව විශාල පරීක්ෂාවකට මුහුණදීමක් විය. මන්ද ශීත ඍතුවේ පසු භාගයේ කාලගුණය සහ වර්ෂා සහිත තත්වයෙන් විවේකයක් ගැනීමට ස්ථිර කඳවුරු තැනීමට පෙර ඔවුන්ට සැතපුම් ගණනාවක් යාමට තිබුනි.

තමන්ට හිංසා පීඩා කරන්නන්ගෙන් ආරක්ෂාව සෙවීමට, දහස්ගණන් ශුද්ධවන්තයන්ට අයිවෝ දේශසීමාවට යාමට පළමුව පළල්වූ මිසිසිපි ගංගාව තරණයකිරීමට සිදුවින. ඔවුන්ගේ ගමනේ පළමු විපත මුලින්ම ආරම්භවුනේ ශුද්ධවන්තයන් බොහෝ දෙනෙක් යමින් තිබූ බෝට්ටුවකට ගවයෙක් පයින් ගසා එහි සිදුරක් සෑදී බෝට්ටුව ගිලී යාමෙනි. මෙම අවාසනාවන්ත මගීන් පිහාටු මෙට්ට, ලී කොටන් "ලී දඬු හෝ අතට හසුවුනු ඕනෑම දෙයක් අල්ලාගෙන අනුකම්පා විරහිත ශීත ජලයේ කරුණාව මත ජලයේ වීසිවෙමින් සිටි බව එය දුටුවෙක් කීවේය....සමහරු කරත්තවල මුදුනට නැගගත්තේ ඒවා සම්පූර්ණයෙන්ම ජලයට යට නොයාම සහ පහසුව නිසාය. එළදෙනුන් සහ ගවයන් ඔවුන් පැමිණි දෙසටම පීනායනු දක්නට ලැබින."[1] අවසානයේදී සියලුම දෙනා බෝට්ටු-වලට දමාගෙන අනෙක් පැත්තට රැගෙන යන ලදී.

පළමු තරණයෙන් සති දෙකකට පසුව, ගංගාව යම් කාලයකට මිදී තිබින. අයිස් ලිස්සන සුළු වුවද, එය කරත්තවලට සහ කණ්ඩායම්වලට පහසුවෙන් තරණයකිරීමට අධාරකයක් විය. නමුත් ශීතල සුළඟ බලවත් හිරිහැරයක්වී ශුද්ධවන්තයන්ට අයිස් මත ඇවිදීමද අපහසුවිය. ගංගාවේ එහා පැත්තේ සුගර් ක්‍රීක් කඳවුරේ, තද සුළඟත් සමග අඟල් අටක් පමණ ගැඹුරට හිම කැට වැටුනි. ඉන්පසුව හිම දියවී පොළොව මඩවිය. වටෙන් ඉහළින් සහ පහළින් ස්වභාවික දේවල් සියල්ල සම්බන්ධවී, 2,000ක ශුද්-ධවන්තයන් පිරිසකට දුක්ඛිත පරිසරයක් නිර්මානයවීය, ඔවුහු යාමට අණ ලැබෙන තෙක් කුඩාරම්වල, කරත්තවල සහ ඉක්මණින් තනාගත් නවා-තැන්වල බලා සිටියහ.

ගමනේ ඉතා අසීරු කොටස වූයේ මෙම අයිවෝ පසු කල මුල් කාලය විය. හොසී ස්ටවුට් වාර්තා කල පරිදි ඔහු, "රාත්‍රිය ගතකිරීමට ඇඳ ඇතිරිලි වලින් තාවකාලික කුඩාරමක් සෑදුවේය. මේ අවස්ථාවේදී මගේ බිරිඳට හිඳ ගැනීමට ඉතා අසීරුවූ අතර, මගේ කුඩා පුතාට ඉතා තදින් උණ ගැනී අසනීපව සිටි නිසා සිදුවන කිසි දෙයක් ගැන දැනගැනීමට

පවා නොහැකිවිය."[2] තවත් බොහෝ ශුද්ධවන්තයන්ද දැඩි ලෙස හිරිහැර වින්දාහ.

## සියල්ල හොඳින්

මෙම ශුද්ධවන්තයන්ගේ ඇදහිල්ල, ධෛර්‍යයය සහ අධිෂ්ඨානය, ඔවුන්ව ශීතල, කුසගින්න, සහ ආදරණීය අයගේ මරණ තුලින් ඉදිරියට ගෙන ගියේය. විලියම් ක්ලේටන්ව නවුවූ නගරයෙන් පිටත්ව යන ප්‍රථම කණ්ඩායම සමග සිටීමට කැඳවා තිබුනි, ඔහු සිය බිරිඳවූ, ඩයන්තාව ඇයගේ දෙමාපියන් සමග තනිකර යන විට ඇයගේ පළවෙනි දරුවා ලැබීමට තිබුනේ මසක් පමණි. මඩ සහිත පාරවල ශීතලෙන් අමාරුවෙන් යමින්, ශීතල කූඩාරම්වල සිටියදී, ඔහුගේ ඩයන්තාගේ සෞඛ්‍යය ගැන කණගාටුවීමෙන් ඔහුගේ නහර තුනීවී ගියේය. මාස දෙකකට පසුව, ඇය ආරක්ෂිතව බිළිඳා බිහිකල බවක් නොදැන සිටියදී, අවසානයේදී "කදිම මහත පිරිමි දරුවෙක්" ඉපදුන ප්‍රීතිමත් පණිවුඩය ලැබින. පණිවුඩය ඔහුට ලැබුන විගසම වාගේ, විළියම් හිඳගෙන ලියූ ගීතය විශේෂයෙන් අර්ථවත් වූයේ ඔහුට පමණක් නොව, එය පරම්පරා ගණනාවක සහා සාමාජික-යන්ට ආනුභාවාත්මක කෘතඥපූර්වක ජාතික ගීයක් බවට පත්විය. එම ගීතය "*Come, Come, Ye Saints*," (එන්න, එන්න, නුඹලා ශුද්ධවන්තයෙනි) වූ අතර එහි ප්‍රසිද්ධ පදවලින් ඔහුගේ ඇදහිල්ල සහ දහස්ගණන් ශුද්ධ-වන්තයන්ගේ ඇදහිල්ලද ප්‍රකාශවීමෙන් ඔවුහු විපත් මධ්‍යයයේද එය ගායනා කළහ. "All is well! All is well!"[3] (සියල්ල හොඳින්! සියල්ල හොඳින්!) ඔවුන් අනුව ගිය සාමාජිකයන් මෙන්, ඔවුන්ද, සතුට සහ සමාදානය ලැබූ අතර, පරිත්‍යාගවල සහ දෙවියන්වහන්සේගේ රාජධානිය තුල කීකරුවීම වෙනුවෙන් ලැබූ යහපත් විපාකද එය විය.

## වින්ටර් ක්වාටර්ස්

නාවූ සිට බටහිර අයිවෝ ජනාවාසයකට යාමට ශුද්ධවන්තයන්ට සැතපුම් 310ක් ගමන්කිරීමට දින 131ක් ගතවූ අතර, ඔවුන්ට 1846–47 දක්වාවූ ශීත කාලය එහි ගතකර, රොකී කඳුකරයට යන ගමනට සූදා-නම්වීමට ඔවුන්ට හැකිවිය. මෙම අත්දැකීමෙන් ඔවුන් ගමන්කිරීම ගැන බොහෝ දේවල් ඉගෙනගත් අතර, එමගින් ඔවුන්ට සැතපුම් 1,000ක අමෙරිකානු මහා තැනිතලා බිම් ඉක්මණින් තරණය කිරීමට හැකියාව ලැබී, ඊට පසු වර්ෂයේ දින 111කින් එය සිදු විය.

ශුද්ධවන්තයන්ගේ ජනාවාස ගණනාවක්ම මිසුරි ගංගාව අයිනේ දෙ-පැත්තේම විහිදී තිබින. විශාලතම ජනාවාසයවූ, වින්ටර් ක්වාටර්ස්, නෙබ්-රෙස්කාවේ බටහිර පැත්තේ තිබුනි. එය ඉක්මණින්ම 3,500ක් පමණවූ සභා සාමාජිකයන්ගේ ගම්මානය බවට පත්ව, ඔවුහු දැව නිවාස සහ විලෝ ගස් හාරා තනාගත් ස්ථානවල ජීවත්වූහ. 2,500ක් පමණවූ ශුද්ධ-වන්තයෝද ඒ අවට කෙන්ස්වීලී නම් මිසුරි ගංගාවේ පැත්තක ජීවත්වූහ. මෙම ජනාවසවල ජීවිතය ඔවුන්ගේ ගමන් මග සේම බොහෝ අභි-යෝගාත්මක විය. ග්‍රීෂ්ම ඍතුවේදී ඔවුහු මැලේරියාවෙන් පීඩා වින්දෝය. ශීත ඍතුව පැමිණි විට, අළුත් ආහාර තව දුරටත් ලබා ගැනීමට නොති-බිනි. ඔවුහු අතීසාරය, සමේ රෝග, දත් කැක්කුම, රාත්‍රියට ඇස් නොපෙනීම සහ අජීරණ රෝගවලින් පීඩා වින්දෝය. සිය ගණන් ජනතාව මිය ගියහ.

එහෙත් ජීවිතය ගත විය. කාන්තාවෝ ඔවුන්ගේ කාලය පවිත්‍ර කරමින්, මදිමින්, සෝදමින්, ඇතිරිලි මසමින්, ලිපි ලියමින්, ඔවුන් සතු මඳ ආහා-රවලින් කෑම සකස්කරමින්, සහ ඔවුන්ගේ පවුල් බලා ගනිමින් ගත කළ බව මේරි රිචඩ් කීවය, ඇයගේ ස්වාමි පුරුෂයාවූ, සැමුවෙල් ස්කොට්ලන්-තයේ දූත මෙහෙයක නියුතුව සිටියේය. ශුද්ධවන්තයන් වින්ටර් ක්වාටර්ස්-වලට ඒම සහ යාම ගැන සහ ආගමික සාකච්ඡා, නැටුම්, සභා රැස්වීම්, උත්සව, උද්‍යෝගයන්ද ඇතුළු සියල්ල ඇය සතුටින් යුතුව වාර්තා කර තැබුවාය.

මිනිස්සු එක්ව වැඩකරමින්, ගමන් සැලසුම් සහ ශුද්ධවන්තයන්ගේ අනාගත ජනාවාස ස්ථාන ගැන සාකච්ඡා කිරීමට නිතර හමුවූහ. ඔවුහු ක්‍රමානුකූලව කඳවුර අවට තණබිම්වලට ආහාර සඳහා සත්ව රැළවල් යැවීමේදී එකමුතුව කටයුතු කළහ. ඔවුහු ගොවිපළවල වැඩ කළහ. ජනා-වාසවල සීමා මුර කළහ. පිටි මෝල් ඉදිකර ක්‍රියාත්මක කළහ. ගමන්කි-රීමට කරත්ත සූදානම් කරමින් නිතරම වෙහෙසට පත්ව ලෙඩවූහ. ඔවුන් කළ යම් වැඩ පරාර්ථකාමී ඒවාය, ඔවුන් බිම් සකස්කර ඒවායෙහි වගා කර පසුව එන ශුද්ධවන්තයන්ට අස්වැන්න නෙළාගැනීමට ප්‍රේමයෙන් කළ වැඩය.

[ලොරෙන්සෝ] යන්ගේ පුත්‍ර ජෝන්, වින්ටර් ක්වාටර්ස් "මෝර්මන් ෆෝජ් මිටියාවත" ලෙස හැඳින්වීය. ඔහු එහි සොහොන් බිමක් අසල ජීවත්වී සිටි නිසා "ඔහුගේ නිවස අසලින් නිතරම යන කුඩා වැළපෙන-අවමඟුල් පෙරහැරවල්" ඔහු දුටුවේය. ඔහුගේ පවුලේ ඉරිඟු පාන්, ලුණු බේකන්, හා කිරි ටිකක ආහාර වේල පෙනීමට තිබුනේ "ඒ අන්දමට

කෙතරම් පොඩි ලෙසද" යයි ඔහු සිහිපත් කළේය. හතු සහ බේකන් කෑම බොහෝ විට ඔක්කාරයට ඒමෙන්, කෑමගැනීම බෙහෙත් බීම හා සමානව ගිලීමට අපහසුවූ බව ඔහු කීවේය.[4] මෙම අසීරු කාලවල් තුළදී ශුද්ධවන්තයන්ව උසුලා සිටියේ ඔවුන්ගේ ඇදහිල්ල සහ කැපවීමය.

**මෝර්මන් පාබල සේනාංකය**

ශුද්ධවන්තයන් අයිවෝවල සිටියදී, 1846 ආරම්භවූ මෙක්ෂිකෝ යුද්ධයේ සේවයේ යෙදීමට මිනිසුන් සේනාංකයක් ලබාදෙන ලෙස එක්සත් ජනපද හමුදාවේ බඳවාගන්නා නිළධාරීහු සභා නායකයන් ගෙන් ඉල්ලූහ. එසේ පැමිණි මිනිසුන් මෝර්මන් පාබල සේනාංකය ලෙස හැඳින්වූ අතර, ඔවුන් දකුණු දිග ජාතික ප්‍රදේශය හරහා කැලිෆෝනියාවට යා යුතු අතර, ඔවුන්ට වැටුප්, ඇඳුම් සහ ආහාර සලාකය ලැබෙනු ඇත. බ්‍රිගම් යන් ඊට සහභාගිවීමට මිනිසුන් දිරිගැන්වූයේ, එය නාවූවලින් දුප්පත් අය එක්රැස්කිරීමට සහ එම සොල්දාදුවන්ගේ පවුල්වල පුද්ගලයන්ට ආධාරකිරීමට මුදල් උපයාගත හැකි මාර්ගයක් වන නිසාය. මෙම උත්සාහයේදී ආණ්ඩුව සමග සහායවීම සභා සාමාජිකයන් ඔවුන්ගේ රටට පක්ෂපාතවීම පෙන්වීමක් මෙන්ම, මහජනයාගේ සහ ඉන්දියානු භූමියේ තාවකාලිකව කුඩාරම් ගැසීම සාධාරණ හේතුවක් ලෙසද සිතනු ඇත. අවසානයේදී, මිනිසුන් 541 දෙනෙක් තම නායකයන්ගේ උපදේශය පිළිගෙන සේනාංකයට එක්වූහ. ඔවුන්ට කාන්තාවන් 33 දෙනෙක් සහ ළමුන් 42ක්ද එක්වූහ.

යුද්ධයට යාමේ මෙම කර්තව්‍යය සේනාංක සාමාජිකයන්ට පැටලිලි සහිතවූයේ අසීරු කාලයකදී ඔවුන්ගේ භාර්යාවන් සහ දරුවන් දමා යාමට සිදුවීම නිසාය. විලියම් හයිඩ් මෙසේ මෙනෙහි කළේය:

"මෙම අවදානම් අවස්ථාවේ මගේ පවුල දමා යාමේ සිතිවිලි විස්තරකිරීම පවා අපහසුය. ඔවුන් සිටියේ ඔවුන්ගේ උපන් බිමෙන් ඈත තිබෙන හුදකලා තණ බිමක මිනිස් වාසයක් නැති කරත්තයකය, ඔවුන්ව දවාලන හිරු රශ්මියෙන් බැට කමින්, දෙසැම්බරයේ ශීත සුළඟ එම අඳුරු, නීරස ස්ථානයෙන් ඔවුන් සොයාගන්නා අපේක්ෂාවෙනි.

"මගේ පවුලට භාර්යාවක් සහ කුඩා දරුවන් දෙදෙනෙක් අයත්වන අතර, ඔවුන් සමග මහළු පියෙක් සහ මවක් සමග සොහොයුරෙක්ද සිටිති. සේනාංකයෙන් බොහෝ දෙනෙක් පවුල් දමා ගියහ.... නැවතත් අප ඔවුන්ව නැවත හමුවන්නේ කවදාද, දන්නේ දෙවියන්වහන්සේ පමණි. එසේවුවද, අප තුළ මිමිණීමට හැඟීමක් තිබුනේ නැත."[5]

සේනාංකය, කෑම සහ ජල හිඟයෙන් පීඩා විඳිමින්, ප්‍රමාණවත් විවේකයක් සහ සෞඛ්‍ය පහසුකම් නැතිව, සැතපුම් 2,030ක් එක දිගටම, නිරිතදිගට ගමන් කළහ. ඔවුහු වෘත්තීමය සොල්දාදුවන් ලෙස, සැන් දියාගෝ, සැන් ලුවිස් රේ, සහ ලොස් ඇන්ජලීස් නගරවල සේවය කළහ. ඔවුන්ගේ ලේඛනගත කාලසීමාව අවසානයේදී, ඔවුන්ව මුදා හැර ඔවුන්ගේ පවුල් සමග නැවත සම්බන්ධවීමට ඉඩදෙන ලදී. එක්සත් ජනපද ආණ්ඩුවට ඔවුන් දැක්වූ පක්ෂපාතකම සහ උත්සාහයන් නිසා, ඔවුන්ව මෙහෙයවූ අයගේ සැලකිල්ල ලැබුනි.

ඔවුන්ව මුදාහැරීමෙන් පසුව, සේනාංකයේ සාමාජිකයන් බොහෝ දෙනෙක් කාලයක් වැඩකිරීම සඳහා කැලිෆෝර්නියාවේ නතරව සිටියහ. ඔවුන්ගෙන් කිහිපදෙනෙක් අමෙරිකා ගංගාව දෙසට උතුරට ගොස් ජෝන් ෂටර්ගේ ලී මෝලේ රක්ෂාව ලැබුනේ 1848 දී එහි රත්රන් සොයාගත් විටය. එය කැලිෆෝනියාවේ අසීරු රත්රන් සෙවීම ලෙස ප්‍රසිද්ධවිය. නමුත් පසු-දවස්වල ශුද්ධවන්තයන් මෙම අවස්ථාව මුදල් උපයා ධනවතෙකුවීමට සිතා කැලිෆෝනියාවේ නැවතී සිටියේ නැත. ඔවුන්ගේ හදවත් තිබුනේ අමෙරිකානු තැනිතලා හරහා බටහිර රොකී කඳුකරයට යාමට පරිශ්‍රම දරන ඔවුන්ගේ සොයුරු සොයොරියන් වෙතය. ඔවුන්ගෙන් කෙනෙකුවූ, ජේම්ස් එස්. බ්‍රවුන්, මෙසේ පැහැදිළි කළේයඃ

"මා මින් පෙර එවැනි සරු ස්ථානයක් පොළොව මත දැක නැතඃ මා ඒ ගැන කනගාටු වන්නේද නැත, මන්ද මා අභියස නිතරම රත්රන්වලට වඩා උසස් බලාපොරොත්තුවක් තිබින....අපගේම වාසිය තකා අප අන්ධවී ඇති බව සමහර අය සිතිය හැකිය; නමුත් වසර හතලිහකටත් වැඩි කාලයකට පසුව අපි කණගාටු නොවී අතීතය දෙස බලනවිට, දේශයේ වාසනාව දැක, නැවතීමට බොහෝ හේතු අපට තිබින. 'මෙන්න ගල පාමුල රත්රන්, කඳුවල රත්රන්, දිය පාරවල රත්රන්, සෑම තැනකම රත්රන්,...ඉක්මණින්ම ඔබට නිදහසේ වාසනාව උදාකරගත හැකියයි' මිනිස්සු කියති. අපට ඒ හැම දෙයක්ම තේරුම්ගත හැක. රාජකාරිය තවමත් ඇත. අපගේ ගෞරවය අනතුරට භාජනයවෙයි. අපි එකිනෙකා හා ගිවිසුම් කර ඇත, එහි මූලධර්මයක් ගැබ්වී ඇත; මන්ද දෙවියන්වහන්සේ හා එතුමාගේ රාජ්‍යය පළමුව ඇත. අපගේ මිතුරෝ සහ ඥාතීහු වනාන්තරයේ එසේය, කලින් නොගිය, කාන්තාර දේශයක සිටිති. ඔවුන්ගේ තත්වය ගැන දන්නේ කවුද? අපි දැනසිටියේ නැත. අප පිටත්වීමට පෙර ඇතිවූ එම පෙළඹවීම නිසා සතුටට පෙර, වස්තුවට පෙර, අපගේ රාජකාරිය ඇත්තේ එහිය."[6] මෙම ලෝකයේ කිසිදු ලෞකික

දෙයකට වඩා දෙවියන්වහන්සේගේ රාජ්‍යය බොහෝ විශාල ලෙස වටින බව මෙම සොහොයුරෝ පැහැදිළිව දැන සිටි නිසා, ඔවුන් ඒ අනුව මාර්ගය තෝරාගත්හ.

### බෘක්ලීන් ශුද්ධවන්තයෝ

බොහෝ ශුද්ධවන්තයන් නාවූ සිට ගොඩබිමින් රොකී කඳුකරයට ගමන්කරමින් සිටියදී, නැගෙනහිර එත්සත් ජනපදයේ සිට ශුද්ධවන්තයන් කණ්ඩායමක් මුහුදු මාර්ගයෙන් ගමන් කළහ. 1846 පෙබරවාරි 4වෙනිදා, මිනිසුන් 70ක්ද, කාන්තාවන් 68ක් සහ ළමයින් 100ක්ද, *බෘක්ලීන්* නැවට නැග නිව්යෝර්ක් වරායෙන් කැලිෆෝනියා වෙරළ දක්වා සැතපුම් 17,000ක ගමනක් ආරම්භ කළහ. මෙම ගමන අතරතුරදී අත්ලාන්තික් සහ පැසිෆික් නම් ළමයින් දෙදෙනෙක් උපත ලැබූ අතර 12 දෙනෙක් මියගියහ.

මාස හයක ගමන ඉතා දුස්කර විය. මගීහු දේශගුණ උෂ්ණත්වයට සමීපවී සිටි අතර ඔවුන්ට තිබුනේ අහිතකර ආහාර සහ ජලය පමණි. කේප් හෝන්වලට පැමිණි විට, ඔවුහු ජුවාන් ෆර්නැන්ඩස් දූපතේ දින පහක විවේකයක් සඳහා නතරවූහ. කැරොලින් ඔගස්ටා පර්කින්ස් සිහිපතකළ පරිදි, "එහි තද පොළොව දැක එහි ගිය විට, නැවත වරක් නැවේ ජීවිතයෙන් බොහෝ සහනයක් ලැබින. එය අපි බොහෝසේ අවබෝධකරගෙන ප්‍රීති වුනෙමු." ඔවුහු ස්නානයකර, පිරිසිදු ජලයෙන් ඔවුන්ගේ ඇඳුම් සෝදා, පළතුරු සහ අල එකතුකරගෙන, මාළු සහ ආඳන් අල්ලා, "රොබින්සන් කෘසෝගේ ගුහාව."[7] සොයමින් දූපතේ ඇවිද්දෝය.

1846 ජූලි 31වෙනිදා, දරුණු සුළඟට නැව හසුවීමෙන් පසුව, ආහාර හිඟයෙන් සහ දීර්ඝ ගමනකින් පසුව, ඔවුහු සැන් ෆ්‍රැන්සිස්කෝ වෙත ලඟාවූහ. සමහරු එහි නැවතී, නිව් හෝප් නම් ජනාවාසය පිහිටුවූ අතර, අන් අය කඳුකරය හරහා නැගෙනහිරට ගමන්කර, ග්‍රේට් බේසින්වල ශුද්ධවන්තයන් හා සම්බන්ධවීමට ගියහ.

### එක්රැස්වීම සිදුවෙමින් පවතියි

අමෙරිකාවේ සියලුම කොටස්වලින් සහ විවිධ ජාතීන්ගෙන්, නොයෙක් ආකාර මාර්ගවලින්, අශ්වයෝ පිටින් හෝ පා ගමනින්, ඇදහිලිමතුන් සිය නිවාස සහ උපන් බිම්වලින් පිටත්ව ශුද්ධවන්තයන්ට එක්වීම සඳහා රොකී කඳුකරයට යන දීර්ඝ ගමන ඇරඹූහ.

1847 ජනවාරියෙදී, සභාපති බ්‍රිගම් යන්ග් ආනුභාමත් "ඉශ්‍රායෙල් කඳවුර සම්බන්ධ ස්වාමීන් වහන්සේගේ වචනය සහ කැමැත්ත" නිකුත් කල අතර (බලන්න ධීසහසී 136:17) එය පුරෝගාමීන්ගේ බටහිරට සංක්‍රමනයවීම හසුරුවන ව්‍යවස්ථාවක් බවට පත්විය. කණ්ඩායම් සංවිධානය කර ඔවුන් අතර සිටින වැන්දඹුවන් සහ පියා නැත්තවුන් බලාගැනීම ඔවුන්ට පවරාදුනි. අන් අය හා සම්බන්ධය නපුරින්, තණ්හාවෙන් සහ වාදයෙන් තොරවිය යුතුය. ජනතාව සතුටින් සිටිමින්, තම කෘතඥතාවය සංගීතය තුලින්, යාච්ඤාවෙන් සහ නැටීමෙන් පෙන්විය යුතුය. සභාපති යන්ග් තුලින් ස්වාමීන්වහන්සේ ශුද්ධවන්තයන් අමතා, ඔවුන්ගේ මාර්ගයේ යන ලෙසත්, උන්වහන්සේ කී ලෙස කරමින්, ඔවුන්ගේ සතුරන්ට බිය නොවන ලෙසත් කීසේක (බලන්න ධීසහසී 136:17).

පුරෝගාමීන්ගේ පළමු කණ්ඩායම වින්ටර් ක්වාටර්ස්වලින් පිටවීමට සූදානම්වන විට, පාර්ලි පී. ප්‍රැට් එංගලන්ත දූතමෙහෙයෙන් නැවත පැමිණ සිටි අතර, ජෝන් ටේලර් එංගලන්ත ශුද්ධවන්තයන්ගෙන් ත්‍යාගයක් රැගෙන එන බව වාර්තා කළේය. ටේලර් සොහොයුරා ඊට පසු දින පැමිණ මෙම ශුද්ධවන්තයන් විසින් ගමන්කරන්නන්ට ආධාර පිණිස, ඔවුන්ගේ ප්‍රේමය සහ ඇදහිල්ලේ සාක්ෂියක් ලෙස, එවන ලද දසයෙන් කොටස මුදල් රැගෙන ආවේය. ඔහු විද්‍යා උපකරණද ගෙන ආ අතර ඒවා පුරෝගාමීන්ගේ ගමන්මග සිතියම්කිරීමට සහ ඔවුන්ගේ වටපිටාව දැනගැනීමටද උපකාරවත් විය. 1847 අප්‍රේල් 15වෙනි දින, බ්‍රිගම් යන්ග් විසින් මෙහෙයවනු ලැබූ පළමු කණ්ඩායම පිටත්විය. ඊළඟ දශක දෙක තුලදී, 62,000ක් පමණ ශුද්ධවන්තයන් කරත්තවලින් සහ අත් කරත්තවලින් තණ බිම් අතරින් සයෝනයට එකතුවීමට ඔවුන් අනුව යනු ඇත.

මෙම ගමන්කරන්නන්ට ඔවුන්ගේ ගමනේදී අසිරිමත් දර්ශන මෙන්ම අසීරුකම්ද තිබින. ජෝසෆ් මෙනර් සෝල්ට් ලේක් තැනිතලාවට යාමට තිබූ "අසීරු කාලයක්" ගැන සිහිපත් කළේය. නමුත් ඔහු කලින් දැක නොතිබූ දේවල්—කඳුවල විශාල මී හරක් රංචු සහ දේවදාර ගස්ද ඔහු දුටුවේය.[8] පිපී තිබෙන සූර්ය කාන්ත මල් විශාල යායවල් දුටු බව තවත් අයට මතකය.

ශුද්ධවන්තයන්ගේ ශාරීරික අවශ්‍යතා සැහැල්ලු වෙන ඇදහිල්ල වැඩිකරන අත්දැකීම්ද ඔවුන්ට තිබින. දවසේ වැඩි කාලයක් ගමන්කිරීමෙන් පසුව, ගිනි මැලයක් දල්වා ආහාරයක් සාදාගෙන, දවසේ කාර්යයන් ගැන සාකච්ඡාකිරීමට මිනිස්සු සහ කාන්තාවෝ එකරැස්වූහ. ඔවුහු සුභාරංචි

මූලධර්ම ගැන කථාකරමින්, ගීත ගායනාකරමින්, නටමින් සහ එක්ව යාච්ඤා කළහ.

ශුද්ධවන්තයන් බටහිර බලා සෙමෙන් ගමන් කරත්දී මරණය නිතරම ඔවුන් කරා ආවේය. 1850 ජූනි 23 වෙනිදා, ක්‍රැන්ඩෝල් පවුලේ පහළොස් දෙනෙක් සිටියහ. සතිය අවසානවන විට, මරණීය වසංගතයක් වන කොලරාවෙන් සත් දෙනෙක් මියගොස් ඇත. ඊළඟ දින කිහිපය තුලදී තවත් සාමාජිකයන් පස්දෙනෙක් මියගියහ. ඉන්පසුව ජූනි 30 වෙනිදා ක්‍රැන්ඩෝල් සොයුරිය දරු උපතකදී අළුත උපන් බිළිඳාද සමග මියගියාය.

ශුද්ධවන්තයන් සෝල්ට් ලේක් මිටියාවතට යන ගමනේදී ඔවුන් බොහෝ වේදනා වින්දද, එක්සත්කම, සහයෝගය සහ යහපත්කම බලපැවැත්වුනි. ස්වාමීන්වහන්සේට ඇදහිල්ලෙන් සහ කැපවීමෙන් එකට බැඳී සිටිමින් පරීක්ෂාවන් මැද ඔවුහු සතුට භුක්ති වින්දෝය.

### නියම ස්ථානය මෙයයි

1847 ජූලි 21 වෙනිදා, පළවෙනි පුරෝගාමී කණ්ඩායමේ ඔර්සන් ප්‍රැට් සහ ඉරෙස්ටස් ස්නෝ සෝල්ට් ලේක් මිටියාවතට සංක්‍රමිකයන් පෙරටුව ගමන් කළහ. පුද්ගලයෙක් එරී යාමට හැකි තරම් ගැඹුරේ තණ කොළද වගාකිරීමට සුදුසු භූමියක් සහ මිටියාවතේ තිබූ කලපු කිහිපයක්ද ඔවුහු දුටුවෝය. දින තුනකට පසුව, කඳුකර උණෙන් අසනීපව සිටි, සභාපති බ්‍රිගම් යන්ග්, ඔහු සිටි කරත්තයෙන් මිටියාවතට විවරව තිබූ කඳු විවර-යකට ගෙන යන ලදී. සභාපති ස්ථානය දෙස බලා, ඔවුන්ගේ ගමනේ අවසාන අනාවැකිය දුන්නේයඃ "දැන් ඇති. නියම ස්ථානය මෙයයි."

පසුපසින් පැමිණි ශුද්ධවන්තයෝ කඳුවලින් මතුවූ විට, ඔවුහුද, ඔවුන්ගේ පොරොන්දු දේශය දෙස බැලූහ! බටහිර අහසේ හිරු රැසින් දිළිසෙන ලුණු විලකින් යුතු තැනිතලාව, ඔවුන් ඇතුළු ඔවුන්ට පසුව එන දහස්ගණන් අයද පැතු, දර්ශන සහ අනාවැකියෙන් බලාපොරොත්තුවූ දේශය විය. මෙය ඔවුන්ගේ ආරක්ෂිත දේශය විය. මෙම රොකී කඳුකරය මධ්‍යයේ ඔවුන්ට බලවත් ජනතාවක් බවට පත් විය හැකිය.

වසර කිහිපයකට පසුව, එංගලන්තයේ සිට හැරී ආවෙක්වූ, ජීන් රියෝ ගිෆිත් බේකර්, පලමු වතාවට සෝල්ට් ලේක් මිටියාවත දැක ඇගේ හැඟීම් මෙස් වාර්තා කළාය. "නගරය...හතරැස් කොටු හෝ කට්ටි වශයෙන් ඔවුන් මෙහි කැඳවූවිට බෙදා තිබුනි, හැම එකක්ම අක්කර දහ-යකින් සමන්විතවු අතර එය කොටස් අටකට බෙදා තිබුනි, හැම කොට-සකම එක් ගෙයක් විය. මම සිටගෙන බැලීමි. මගේ හැඟීම් අමාරුවෙන්

තුලනය කිරීමට හැකිවිය. නමුත් මා සිතන්නේ, මා සතුටු හැඟීම්වලින් යුතුව, මට සහ අපගේ දීර්ඝ විපත්ති දායක ගමනේදී මට ලැබූ ආරක්ෂාව වෙනුවෙන් කෘතඥපූර්වක බවය."[9]

**අත්කරත්ත පුරෝගාමීන්**

1850 ගණන්වලදී, වියදම් අඩු කිරීමේ මාර්ගයක් ලෙස, අත් කරත්ත කණ්ඩායම් බිහිකර, සංක්‍රමිකයන් විශාල පිරිසකට ආධාර ලබා දීමට සභා නායකයෝ තීරණය කළහ. මේ අන්දමින් ගමන්ගත් ශුද්ධවන්තයෝ පිටි රාත්තල් 100ක්, සහ සීමිත ආහාර ද්‍රව්‍ය සහ බඩු බාහිරාදිය කරත්තයට පටවා ඉන්පසුව කරත්තය තැනිතලාව හරහා තල්ලු කරති. 1856 සිට 1860 අතර කාලයේදී, අත්කරත්ත කණ්ඩායම් දහයක් යූටා නගරයට ගමන් කළහ. කණ්ඩායම් අටක් සෝල්ට් ලේක් මිටියාවතට සාර්ථකව ලඟාවූහ. නමුත් ඒවායින් දෙකක්, ශීත සෘතුවේ මුල් කාලයට හසුවී, ඔවුන් අතර සිටි ශුද්ධවන්තයෝ බොහොමයක් විනාශවූහ.

නෙලී පුසෙල්, මෙම දුක්මුසු ඉරණමට ලක්වූ කණ්ඩාමේ පුරෝගාමියෙක්, තැනිතලාවේදී දස වියට පත්විය. ඇයගේ දෙමාපියෝ ගමනේදී මියගියහ. කණ්ඩායම කඳුවලට සමීපවූ විට, කාලගුණය ඉතා ශීතල විය. සලාකය අඩුවී, ශුද්ධවන්තයෝ කුසගින්නෙන් දුර්වලවී ඉදිරියට ගමන් කළහ. නෙලී සහ ඇයගේ සොහොයුරිය ඇද වැටුනි. ඔවුන් බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම අත්හැර දැමූ විට, කණ්ඩායමේ නායකයා කරත්තයකින් ඔවුන් වෙත ආවේය. ඔහු නෙලීව කරත්තයේ තබා, එය අල්ලාගෙන එයට සමීපව දැඩිව ගමන්කිරීමට මැගීට කීවේය. වෙහෙසව ගමන්කිරීම නිසා හිම තුවාල වලින් ගැලවීමට ඇය වාසනාවන්ත විය.

ඔවුන් සෝල්ට් ලේක් නගරයට ලඟාවූ විට, නෙලී තැනිතලාව හරහා ගමන්කරන විට පැළඳ සිටි, ඇගේ මේස් සහ සපත්තු ගැලවූ විට, හිම තුවාල නිසා ඇයගේ හම ඒවාත් සමග ගැලවී ආවේය. මෙම නිර්භීත ගැහැණු ළමයාගේ පාද වේදනාත්මකව කපා දැමූ අතර, ඇයගේ ජීවිතයේ ඉතිරි කාලය ඇයගේ දණහිස් වලින් ඇවිදීමට ඇයට සිදුවිය. ඇය පසුව විවාහවී ලමුන් හය දෙනකු බිහිකර, ඇයගේම නිවසක් තබාගනිමින්, කදිම පරම්පරාවක් ගොඩනැගුවාය.[10] ඇය සිටි තත්වය නොසළකා ඇය තුල වූ අධිෂ්ඨානය සහ ඇයට සැලකිල්ලක් දැක්වූ අයගේ කරුණාවද, මෙම මුල් කාලීන ශුද්ධවන්තයන්ගේ ඇදහිල්ල සහ පරිත්‍යාගකිරීමේ කැමැත්ත ගැන උදාහරණයකි. ඔවුන්ගේ ආදර්ශය ඔවුන්ව අනුගමනයකරන සියල්ලන්ටම තිබෙන ඇදහිල්ලේ උරුමයකි.



සීත සෘතුව ආරම්භයේදී මිටියාවතේ අසරණව සිටි මාටින් අත්කරත්ත කණ්ඩායමේ සාමාජිකයන් බේරාගැනීම සඳහා සෝල්ට් ලේක් මිටියාවතෙන් පැමිණි ශුද්ධවන්තයෝ තම ජීවිත පරදුවට තැබූහ

මාටින් අත්කරත්ත කණ්ඩායම සමග තැනිතලාව තරණයකළ මිනිසෙක් වසර ගණනාවක්ම යුටා නගරයේ ජීවත්විය. එක් දිනක් ඔහු මිනිසුන් කණ්ඩායමක් සමග සිටි අතර, ඔවුහු සභානායකයන් තියුණු ලෙස විවේචනයකරමින්, අත් කරත්ත කණ්ඩායමේ ආරක්ෂාව පමණක් ඇතිව, ප්‍රමාණවත් අහාර හෝ වෙනත් ආරක්ෂාවක් නැතිව ශුද්ධවන්තයන්ට තැනිතලාව තරණය කිරීමට ඉඩ දීම ගැන දොස් කීහ. මහළු මිනිසා තමන්ට දරාසිටීමට හැකි තරම් දුරට සවන් දුන්නේය. ඉන්පසුව විශාල චිත්ත වේගයකින් නැගිටි ඔහු මෙසේ කීවේයඃ

"මා එම කණ්ඩායමේ සිටි අතර මාගේ බිරිඳද එහි සිටියාය....ඔබට සිතිය හැකි සියල්ලකටම වඩා අප දුක් වේදනා විඳි අතර, බොහෝ දෙනෙක් ශීතලට නිරාවරණයවීම සහ කුසගින්නෙන් මියගිය නමුත්, එම කණ්ඩායමේ සිටි කිසිදු ජීවත්වන අයෙක් එකුදු විවේචනාත්මක වචනයක් කියනු ඔබ අසා තිබේද? ...අපි] *දෙවියන්වහන්සේ ජීවමාන බවට ඒකාන්ත විශ්වාසයක් අපට ඇතිවුනි, මන්ද අපගේ බලවත් පීඩාවේදී අප එතුමා හඳුනාගත් නිසාය.*

"මගේ අත් කරත්තය මා තල්ලු කලේ අසනීපයෙන් සහ ආහාර හිඟයෙන් ඉතා දුර්වලව සිටියදී බැවින්, මට අඩියක් ඔසවා තවත් එකක් තැබීමට හැකිවුනේ ඉතා අසීරුවෙනි. ඉදිරිය බැලූ විට වැලි ගොඩක් හෝ කඳු බෑවුමක් හෝ දුටු මම, මට එතරම් දුරක් යාමට හැකි බවත් එහිදී ගමන නවත්වන බවත් කීවෙමි. මන්ද එය අතරින් බර තල්ලුකිරීමට මට නොහැකිය....මා එම වැලිගොඩ ලඟට ගිය විට, කරත්තය මාව තල්ලුකරන්ට පටන්ගත්තේය. මගේ කරත්තය තල්ලුකරන්නේ කවුදැයි බැලීමට මා කිහිපවරක්ම පසුපස බැලූ නමුත්, මගේ ඇස්වලට කිසිවෙක් නොපෙනුනි. දෙවියන් වහන්සේගේ දේවදූතයන් එහි සිටි බව මම එවිට දැනගත්තෙමි.

"අත්කරත්තයෙන් පැමිණීම ගැන මම කණගාටුවූවෙම්ද? නැත, ඒ කාලයේ හෝ මගේ ජීවිතයේ කිසිදු අවස්ථාවක නැත. *දෙවියන්වහන්සේ හඳුනාගැනීම සඳහා අපට ගෙවීමට සිදුවූ මිලය අප ලැබූ වරප්‍රසාදයකි. තවද මාටින් අත්කරත්ත කණ්ඩායම සමග පැමිණීමට වරප්‍රසාදයක් ලැබීම ගැන මම ස්තුතිවන්තවෙමි.*"[11]

අපගේ ගීතිකා පොතේ මුල් කාලීන සභා සාමජිකයන් නිර්භීතව සුභාරංචිය පිළිගෙන, ශිෂ්ඨාචාරයකින් එපිට ස්ථානයක ජීවත්වීමට බොහෝ දුරක් ගමන්කිරීම ගැන ගීතයක් ඇතුළත්ව ඇත.

ජාතීන් ගොඩනගන ඔවුහු,
ගමන් මගේ සලකුණු ගොඩනගමින්,
ඔවුන්ගේ දිනපතා ක්‍රියාවලින්
පසුව එන පරම්පරාවන්ට මාර්ගයක් සැදූහ.
අලුත් සහ ස්ථිර පදනමක් ගොඩනගමින්,
කාන්තාර දේශ සීමාවට තල්ලුකරමින්
අමාරුවෙන් ඉදිරියට, ඉදිරියටම ගිය
ආශිර්වාදිතවූ, ගෞරවනීය පුරෝගාමියා!

ඇදහිල්ල සහ ධෛර්‍යය වර්ධනයකරගෙන අපගේම රටවල ජීවත්වන අන්දම ගැන ඔවුන්ගේ ආදර්ශය අපට උගන්වයි

නිරන්තර සේවය ඔවුන්ගේ ආදර්ශ වාක්‍යයයි;
ප්‍රේමය ඔවුන්ගේ මගපෙන්වන තාරකාව විය;
ළඟ සහ දුර රැස් විහිදුවන,
ධෛර්‍යය ඔවුන්ගේ නොවරදින පහන්කණුවය.
සෑම දිනකම යම් බරක් ලිහිල් කෙරින,
සෑම දිනකම සතුටුකිරීමට යම් හදක් තිබින
සෑම දිනකම යමෙක් දිරිගැන්වින,
ආශිර්වාදිතවූ, ගෞරවනීය පුරෝගාමියා![12]

# ජාතියට කොඩියක් පිහිටුවීම

ශුද්ධවන්තයන් පළමු කණ්ඩායම සාර්ථකව තැනිතලාව තරණයකර යුටා නගරයට ගෙනැවිත්, සභාපති බ්‍රිගම් යන් දැන් ඔහුගේ අවධානය යොමු කළේ දේව රාජ්‍යය කාන්තාරයේ පිහිටුවීමටය. ඔහුගේ දර්ශනය සහ නායකත්වය තුළින්, වරක් හිස් කාන්තාරයක් දියුණු ජනාවාසයක් සහ ශුද්ධවන්තයනට ස්වර්ගයක් බවටද පත්විය. ඔහුගේ සරල මගපෙන්වීම ඔවුන්ගේ අලුත් වාසස්ථානයේ හැකියාවන් ගැන සිතිමට ශුද්ධවන්තයන්ට උපකාරවත්වී, දේව රාජ්‍යය ගොඩනැගීමට ඔවුන් සෙවූ ස්ථානයට ඔවුන්ව මෙහෙයවීය.

පළමු කණ්ඩායම පැමිණ දින දෙකකට පසු, බ්‍රිගම් යන් සහ දොළොස්දෙනාගෙන් කිහිපදෙනෙක් නාවූ නගරයෙන් පිටවීමට පෙර යන් දර්ශනයකින් දුටු කඳුකරයේ වටකුරු කඳු බෑවුකට නැගගත්හ. බොහෝසේ පැතිරී ගිය තැනිතලාව දෙස බැලූ ඔවුහු, ලෝකයේ සියලුම ජනතාව මෙම ස්ථානය පිළිගන්නා බවටත්, ශුද්ධවන්තයන් මෙහි සමෘධිමත්ව සමාදානය භුක්තිවිඳින බවටත් අනාවැකි කීහ. ඔවුහු එම කන්ද එන්සයින් තුඩුව යයි නම් කළේ යෙසායා පොතේ ශුද්ධලියවිලිවල මෙම පොරොන්දුවට අනුවය, "උන්වහන්සේ ජාතීන්ට කොඩියක් ඔසවා පන්නා දැමූ ඉශ්‍රායෙල්වරුන් රැස්කරනු ලබනසේක." (යෙසායා 11:12)[1]

සභාපති යන් 1847 ජූලි 28 වෙනිදා කළ මහජන සේවාව වූයේ, දේවමාළිගාවට ස්ථානයක් තෝරා, එහි සැලසුමක් සාදා ඉදිකිරීම් සැලසුම් කිරීමය. ඔහු තම වේවැල තෝරාගත් ස්ථානයේ තබා,"මෙහි අපි අපගේ දෙවියන්වහන්සේට දේවමාළිගාවක් ගොඩනගන්නෙමු" යයි කීවේය. මෙම ප්‍රකාශය ශුද්ධවන්තයන්ට සැනසීමක් ගෙනදුන්නේ, මීට කෙටි කාලයකට පෙර ඔවුන් නාවූ වලින් පිටවන විට දේවමාළිගා වන්දනාව නැවැත්වීමට ඔවුන්ට බලපෑම් ඇතිවූ නිසාය.

අගෝස්තු මාසයේදී, සභානායකයන් සහ පළමු පුරෝගාමී කණ්ඩායමේ බොහෝ දෙනෙක්, ඊළඟ වසරේදී ඔවුන්ගේ පවුල්වල අය මිටියාවතට

පැමිණීමට සූදානම්කිරීම සඳහා වින්ටර් ක්වාටර්ස් වෙත පැමිණියහ. ඔවුන් පැමිණි විගසම, පළවෙනි සභාපතිත්වය නැවත සංවිධානය කිරීමට කාලය පැමිණ ඇති බවට බ්‍රිගම් යන් සහ දොළොස් දෙනාගේ ගණපූර්ණයට තද හැඟීමක් ඇතිවිය. දොළොස් දෙනාගේ ගණපූර්ණයේ සභාපතිවරයා ලෙස, බ්‍රිගම් යන්ව සභාවේ සභාපතිවරයා ලෙස ස්ථිර කෙරින. ඔහු තම උපදේශකයන් ලෙස හීබර් සී. කිම්බල් සහ විලාර්ඩ් රිචඩ්ස් තෝරාගත් අතර, ශුද්ධවන්තයෝ ඔවුන්ගේ නායකයන්ව ඒකමතිකව ස්ථිර කළහ.

**මිටියාවතේ ගතකළ පළමු වර්ෂය**

තවත් ශුද්ධවන්තයන් කණ්ඩායම් දෙකක් 1847 ග්‍රීෂ්ම ඍතුව අවසානයට පෙර සෝල්ට් ලේක් මිටියාවතට පැමිණි අතර සම්පූර්ණයෙන් 2,000ක පමණ සාමාජිකයන් පිරිසක් සෝල්ට් ලේක් නගරයට සංවිධානය කෙරින. ධාන්‍ය වගා කළද අස්වැන්න මඳවූ නිසා, වසන්තය පැමිණි විට බොහෝ දෙනෙක් අහාර මඳකමින් පීඩා වින්දෝය. ඒ කාලයේ ළමයෙක්ව සිටි ජෝන් ආර්. යන්ග් මෙසේ ලීවේයඃ

"තණ කොල වැවීම ආරම්භවන විට, සාගතය දැඩි ලෙස වැඩිවිය. මාස කිහිපයක්ම අපට පාන් තිබුනේ නැත. මස්, කිරි, ඌරු වැල්, සෙගෝස් [ලීලී මුල්], අප ආහාර සකස්කරන කටු පැලැටි නොතිබින. මා රළේ ළමයාවූ අතර, සතුන් බලාගන්නා විටදී, එළදෙනෙක්ගේ මෙන් මගේ බඩ පිරෙන තුරු කටු ගස් කෑමට මම පුරුදුව සිටියෙමි. අවසානයේදී කුසගින්න ඉතා අධිකවීමෙන් පියා කුරුල්ලො හොට ගැසූ හරක් හම් ගාතයකින් බොහෝ රසවත් සුප් එකක් සකස් කළේය."[2] ජනපදිකයෝ නිදහසේ සහයෝගයෙන් එකිනෙකා අතර බෙදා ගනිමින්, මෙම අසීරු කාලයේ ජීවිතය රැක ගත්හ.

1848 ජූලි වන විට, ජනපදිකයෝ අක්කර පහේ සිට හය දහසක පමණ භූමි ප්‍රදේශයක් වගාකර තිබුනෙන්, කොළපාටින් යුතු තැනිතලාව සාරවත් බවක් පෙන්වීය. නමුත් ශුද්ධවන්තයන් බියට පත්කරමින් කළු කුරුමිනියෝ විශාල රංචු වශයෙන් වගාව මතට පහත්වූහ. ජනපදිකයෝ ඔවුන්ට හැකි සියල්ල කළහ. ඔවුහු අගල් කපා කුරුමිනියන්ට දිය පහරවල් විද්දාහ. ඔවුහු කුරුමිනියන්ට පොලුවලින්, කොසුවලින් පහරදී, ඔවුන්ව ගිනිතැබීමට උත්සාහ කළහ. නමුත් උත්සාහයන් අසාර්ථක විය. කුරුමිනියෝ නිමක් නොමැති සංඛ්‍යාවකින් එනු පෙනින. ආදි පීතෘ ජෝන් ස්මිත්, සෝල්ට් ලේක් සභාපතිවරයා, උපවාස සහ යාච්ඤා දිනයක් කැඳවීය. ඉක්මනින්ම මුහුදු ලිහිනියන් රංචු අහසෙන් මතුවී

කුරුමිනියන් මත වැසූහ. මෙම අත්දැකීම ගැන සුසාන් නෝබල් ග්‍රාන්ට් මෙසේ කීවාය: "අප මවිතයට පත්කරමින්, ලිහිනියෝ ඝෝෂාකරමින් යමින් බඩගාමින්, පනිමින් යන කුරුමිනියන්ව ගිලදැමූහ."[3] ශුද්ධවන්තයෝ සතුටින් සහ පුදුමයෙන් බලා සිටියහ. ජීවිත ආරක්ෂා කෙරින.

ශුද්ධවන්තයෝ අසීරුකම් නොසලකා ශක්තියෙන් සහ ඇදහිල්ලෙන් වැඩකළහ, ඉක්මණින්ම ඔවුහු විශාල වර්ධනයක් ලබා ගත්හ. 1849දී කැලිෆෝනියාව බලා යන සංචාරකයෙක් සොල්ට් ලේක් පසුකර යන විට මේ අන්දමින් ඔවුන්ට උපහාරය පුදකළේය: "වඩාත් නිසි පිළිවෙලේ,, උනන්දුශීලී, සග උද්‍යෝගී සිවිල් ජනතාවක් වූ මොවුන් හා සමාන ජනතාවක් අතර මා මින් පෙර සිටියේ නැත. මෙතරම් කෙටි කාලයකින් මෙම වනාන්තරයේ ඔවුන් කර තිබෙන දේවල් අද්විතීයවේ. මෙම නගරයේ වැසියන් හාර පන්දහසක් සිටින මුත්, නිකරුණේ කාලය ගතකරන හෝ කම්මැලි නගර වැසියෙක් මට හමු නොවීය. ඔවුන්ගේ වගාවේ සමෘද්ධිය සාධාරණය, ඔවුන්ට තිබූ ආත්මික බව සහ ශක්තිය මා ගොස් තිබෙන ඕනෑම ප්‍රමාණයක කිසිදු නගරයකට මිනිසුන් හා සමාන කළ නොහැකිය"[4]

## ගවේශනයකිරීම

1848 ග්‍රීෂ්ම කාලයේදී, සභාපති බ්‍රිගම් යන්ග් නැවතත් වින්ටර් ක්වාටර්ස්වල සිට සෝල්ට් ලේක් මිටියාවතට ගමන් කළේය. ඔහු එහි ලඟාවූ විට, ඔවුන්ගේ අලුත් පරිසරයේ තිබෙන සම්පත් ගැන දැනගැනීම ශුද්ධවන්තයට අවශ්‍යබව ඔහුට අවබෝධවිය. එම ප්‍රදේශයේ ජීවත්වූ ඉන්දියන්වරුන්ගෙන් බොහෝ දේවල් ලබා ගත් නමුත්, සභාපති යන්ග්ද බෙහෙත් වර්ග ගස් සහ ස්වභාවික සම්පත් තිබෙන ස්ථාන ගැන ගවේශනයකර සොයාගැනීමට ශුද්ධවන්තයන් යැවීය.

වාසයකිරීමට ස්ථාන සෙවීමටද ඔහු තවත් ගවේශක කණ්ඩායම් යැවීය. මෙම සාමාජිකයෝ තම සංචාරයන්වලදී ඛනිජ නිධි, විශාල දැව වර්ගද, ජල මූලාශ්‍ර සහ තණ බිම් මෙන්ම වාසයකිරීමට සුදුසු ස්ථානද සොයාගත්හ. ඉඩම් වෙළඳාම්කිරීම නැවැත්වීමට, ශුද්ධවන්තයන්ට පවරා තිබෙන ඉඩම් අන් අයට විකිණීම සඳහා කට්ටි නොකිරීමට අනාගතවක්තෘවරයා ඔවුන්ට අවවාද කළේය. ඉඩම් ඔවුන්ගේ භාරකරත්වයක් නිසා මුදල් ඉපයීමට නොව, ඒවා ඥානවන්තව සහ උද්‍යෝගයෙන් පලානයකළ යුතුය.



*ඔවුන්ගේ ඇදහිල්ල සහ උදෙයා්ගය තුලින්, ශුද්ධවන්තයෝ සෝල්ට් ලේක් මිටියාවතේ නගරයක් ගොඩනැගීම ආරම්භ කළහ. මෙම කැටයම් චිත්‍රය 1853 දී මිටියාවත තිබූ ආකාරය පෙන්වයි.*

1849 අග භාගයේදී, නිරන්තර සංක්‍රමනික අරමුදලක් සභාපති යන්ගේ මගපෙන්වීම යටතේ පිහිටුවනු ලැබීය. එහි අරමුණ වූයේ සභාවේ සෙනගට සම්බන්ධවීම සඳහා ගමන්කිරීමට වත්කම් නොමැති දුප්පත් අයට ආධාරකිරීමය. විශාල ලෙස කැපකරමින්, බොහෝ ශුදධවන්තයෝ අරමුදලට දායකවූහ. එහි ප්‍රතිපලයක් ලෙස, දහස්ගණන් සාමාජිකයන්ට සෝල්ට් ලේක් මිටියාවතට ගමන්කිරීමට හැකිවිය. උපකාර ලැබූ අය, හැකියාවක් ලැබූ විගසම ඔවුන් ලබාගත් මුදල ආපසු ගෙවීම ඔවුන්ගෙන් අපේක්ෂා කෙරින. මෙම අරමුදල් අන් අයට ආධාරකිරීමට තවදුරටත් පාවිච්චි කෙරින. මෙම සහයෝගී උත්සාහයන් තුලින්, ශුද්ධවන්තයෝ අවශ්‍යතා ඇති අයගේ ජීවිත ආශිර්වාද කළහ.

### ධර්මදූතයෝ කැඳවීමට පිළිතුරු දෙති

වැඩකිරීමේ සහ ගෘහ ජීවිතයේ ශබ්දකාරී බව සුළගේ පිරී තිබියදී, සභාපති බ්‍රිගම් යන්ග් සභාවේ අරමුණ වෙත යොමුවිය. 1849 ඔක්තෝබර් 2 වෙනි දින පැවැත්වූ ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, විදේශ දූතමෙහෙයන්වල සේවයකිරීම සඳහා, ඔහු අලුතින් කැඳවූ ධර්මදූතයන්ව දොළොස්දෙනාගේ

සාමාජිකයන් කිහිපදෙනෙකුට පැවරුවේය. ඔවුන් මෙම කැඳවීම් බාරගත්තේ, ඔවුන්ගේ පවුල්, ඔවුන්ගේ අලුත් නිවාස සහ තවත් නිම නොකළ කාර්‍යයන් පවා නවත්වා දමමින්ය. ඉරෙස්ටස් ස්නෝ සහ වැඩිහිටියන් කිහිපදෙනෙක් ස්කැන්ඩිනේවියාව තුල ධර්මදූත කටයුතු ආරම්භකළ අතර, ලොරෙන්සෝ ස්නෝ සහ ජෝසෆ් ටොරොන්ටෝ ඉතාලියට ගමන් කළහ. ඇඩිසන් සහ ලුවිසා බාන්ස් ප්‍රැට් ඔවුන් කලින් සේවය කළ සොසයිටි දූපත්වල ක්ෂේත්‍රයේ සේවයට නැවත ගියහ. ජෝන් ටේලර් ප්‍රංශයට සහ ජර්මනියට කැඳවීම් ලැබීය ධර්දූතයෝ නැගෙනහිරට ගමන්කරන විට, රොකී කඳුකරයේ අලුත් සයෝනය කරා යන ශුද්ධවන්තයන් ඔවුන්ට හමුවිය.

ඔවුන් සේවය කළ ක්ෂේත්‍ර තුලදී, ධර්මදූතයෝ ආශ්චර්‍යයන් දකිමින් බොහෝ දෙනෙක් සභාවට බව්තීස්ම කළහ. පසු කාලයකදී සභාවේ සභාපතිවරයා බවට පත්වූ, ලොරෙන්සෝ ස්නෝ, ඉතාලියේ දේශනාකරමින් සිටියදී, මරණ මංචකයේ පසුවූ තුන් හැවිරිදි පිරිමි ලමයෙක් දුටුවේය. මෙම දරුවා සුවකිරීමේ අවස්ථාව හඳුනාගෙන ඔහු ප්‍රදේශයේ ජනතාවගේ හදවත් විවෘත කළේය. එදින රාත්‍රී ඔහු දීර්ඝලෙස සහ උනන්දුවෙන් දෙවියන්වහන්සේගේ මග පෙන්වීම් පතා යාච්ඤාළ අතර. පසු දිනයේ ඔහු සිය සහායකයාද සමග පිරිමි ලමයා වෙනුවෙන් උපවාස කරමින් යාච්ඤා කළේය. එදින සවස ඔවුහු ඔහුට තෙල් ආලේපකර, ඔවුන්ගේ වැඩ කටයුතුවලට උපකාර පතා නිහඬ යාච්ඤාවක් පුද කළහ. පිරිමි ලමයා මුළු රාත්‍රියම සමාදානයෙන් නිදාගත් අතර, ආශ්චර්‍යමත් ලෙස සුවය ලැබුවේය. මෙම සුවකිරීමේ පුවත ඉතාලියේ පීඩ්මොන්ට් තැනිතලාව හරහා පැතිර ගියේය. ධර්මදූතයන්ට දොරවල් විවෘතවී, ප්‍රදේශයේ පළවෙනි බව්තීස්මය සිදුවිය.[5]

1852 අගෝස්තු මාසයේදී, සෝල්ට් ලේක් නගරයේදී විශේෂ සම්මන්ත්‍රනයක් පවත්වන ලදී, ලෝකය මුළුල්ලේම රටවල්වලට දූතමෙහෙයන් සඳහා යාමට වැඩිහිටියන් 106 දෙනෙක් කැඳවන ලදී. මෙම ධර්මදූතයන් සහ මෙන්ම පසුව තවත් අයද දකුණු අමෙරිකාව, චීනය, ඉන්දියාව, ස්පාඤ්ඤය, ඔස්ට්‍රේලියාව, හවායි සහ දකුණු පැසිෆික් රටවල සේවය සඳහා කැඳවන ලදී. මෙම ප්‍රදේශ බොහොමයක් තුල, ධර්මදූතයන්ට මඳ සාර්ථකත්වයක් තිබුනි. කෙසේවුවද, ඔවුන් පැළකල බීජවල ප්‍රතිඵලයක් ලෙස පසු කාලීන ධර්මදූත කටයුතු වලදී බොහෝ දෙනෙක් සභාවට බඳවා ගැනින.

වැඩිහිටි එඩ්වඩ් ස්ටීවන්සන්ව ස්පාඤ්ඤයේ ජිබ්‍රෝල්ටා දූතමෙහෙයට කැඳවන ලදී. මෙම කැඳවීමේ අදහස ඔහුගේ උපන් ස්ථානයට නැවත යාමය, එහිදී ඔහු නිර්භීතව ඔහුගේ රටවැසියන්ට නැවත පිහිටුවූ සුභාරංචිය ප්‍රකාශකළේය. දේශනාකිරීම ගැන ඔහුව සිරගතකර, මඳ කාලයක් සිරගෙයි ගත කරමින් සිටියදී, ඔහු ආරක්ෂකයන්ට දේශනාකර ඔවුන්ගෙන් එක් අයෙකු හරවාගත් බව අධිකාරීවරු දැනගත්හ. ඔහුව නිදහස්කිරීමෙන් පසුව, ඔහු දෙදෙනෙක්ව සභාවට බව්තීස්මකර, 1854 ජනවාරි වන විට, ඉතාලියේ සාමාජිකයන් දහදෙනෙකුගෙන් යුත් ශාඛාවක් සංවිධානය කෙරින, ජූලි මාසයේදී, සාමාජිකයන් හය දෙනෙක් ආසියාව තුල බ්‍රිතාන්‍ය හමුදාවේ සේවයකිරීමට පිටත්ව ගියද, ශාඛාව තුල සිටි සාමාජිකයන් දහඅට දෙනෙක් අතර, හැත්තෑවරුන් එක් අයෙක්, එක් වැඩිහිටියෙක්, එක් පූජකවරයෙක්, සහ එක් ගුරුවරයෙක් එය වර්ධනයවීම ට අවශ්‍ය නායකත්වය දෙමින් ශඛාව තුල සිටියහ.[6]

ප්‍රංශ පොලිනීසියාවේ පළාත් ආණ්ඩුව 1857දී ධර්මදූතයන්ව පිටමන් කරන ලදී. නමුත් හැරී ආ ශුද්ධවන්තයෝ 1892 හරවා ගැනීමේ කටයුතු කෙරෙන තුරු සභාව ප්‍රාණවත්ව තබාගත්හ. ටිහෝනි සහ මෙයිහී නම් වැඩිහිටියෝ විශේෂයෙන්ම ඔවුන්ව සිරගතකිරීම් සහ වෙනත් අසීරුකම් තුලදී ඇදහිල්ල ප්‍රතික්ෂේප නොකර දරාසිටිමින් නිර්භීතවූහ. ඔවුහු එකිනෙකා ශුද්ධවන්තයන්ව සුභාරංචිය තුල ක්‍රියාකාරීව සහ ඇදහිලිමත්ව තැබීමට උත්සාහ කළහ.[7]

අමෙරිකා එක්සත් ජනපදයෙන් පිටතදී සභාවට සම්බන්ධවූ අයට, සයෝනයට එකතුවීමේ කාලය පැමිණ තිබින, එහි අදහස බෝට්ටු මගින් අමෙරිකාවට යාමය. එලිසබෙත් සහ චාල්ස් වුඩ් 1860දී දකුණු අප්‍රිකාවේ සිට යාත්‍රාකළ අතර, ගමන සඳහා මුදල් උපයාගැනීමට ඔවුහු වසර කිහිපයක් මහන්සිවී ඇත. එළිසබෙත් පොහොසත් මිනිසෙකුගේ ගෙයක් බලාගත් අතර ඇයගේ ස්වාමි පුරුෂයා අවශ්‍ය අරමුදල් ලැබෙන තුරු ගඩොල් සෑදුවේය. එළිසබත්ව නැවක් තුල ඇඳක 24 පැයම තබා සිටි අතර, පුතෙක් ලැබුන පසුව කපිතාන්ගේ ඇඳක් දීමෙන් වඩාත් සැපපහසුවකින් සිටිය හැකිවිය. ගමන අතරතුරදී ඇය ඉතා අසනීපව සිටිමින්, දෙවරක්ම මියයාමට ගිය නමුත්, යුටා, පිල්මෝර්වල වාසය කිරීමට ජීවත්ව සිටියාය.

ධර්මදූතයෝ ඔවුන් සේවයකළ රටවල ශුද්ධවන්තයන්ට ඉතා ප්‍රිය ජනක බවට පත්වූහ. ජෝසෆ් එෆ්. ස්මිත් හවායි දූතමෙහෙය නිමවීමට ආසන්න වන විට 1857දී, දැඩි ලෙස උණගැනීමෙන් අසනීපවීම නිසා

මාස තුනක්ම වැඩකිරීමෙන් වැළකී සිටීමට ඔහුට සිදුවිය. ඔහු ඇඳහිලිමත් හවායි මා මාහා නම් ශුද්ධවන්තියකගේ සැලකිල්ල ලැබීමට තරම් ආශිර්වාදිතවිය. ඇය ජෝසෆ්ට සැලකුවේ ඇයගේම පුතෙකුට පරිද්දෙනි. ඔවුන් දෙදෙනා අතර දැඩි ප්‍රේමයේ බැම්මක් වර්ධනයවිය. වසර ගණනා-වකට පසුව, ජෝසෆ් එෆ්. ස්මිත් සභාවේ සභාපතිවරයාවූ විට, ඔහු හොනලලු නගරයට ගිය අතර, ඔහු එහි ලඟාවූ විගසම මහළු අන්ධ කාන්තාවක් කෙසෙල් ගෙඩි කිහිපයක් ත්‍යාගයක් ලෙස අතේ ඇතිව එහි ගෙන එනු ඔහු දුටුවේය. "අයිසෙපා, අයිසෙපා" (ජෝසෆ්, ජෝසෆ්) යයි ඇය කථාකරනු ඔහුට ඇසුනි, ඔහු ක්ෂණයකින් ඇය වෙත දිවගොස්, කිහිපවාරයක්ම ඇය බදාගෙන ඇය සිඹ, ඇගේ හිස අතගාමින්, "මමා, මමා, මගේ ආදර මහළු මමා"[8] යයි කීවේය.

## ජනාවාසකිරීමට කැඳවීම්

යුටා සහ දකුණු දිග අයිඩහෝ සහ පසුව ඇරිසෝනා, වයෝමින්, නෙවාඩා, කැලිෆෝනියාවේ ප්‍රදේශවල බොහෝ ජනාවාස ඇතිකරන ලද්-දේ ප්‍රධාන සම්මන්ත්‍රනයේදී කැඳවනු ලැබූ පුද්ගලයන් සහ පවුල් විසිනි. සභාපති බ්‍රිගම් යන් මෙම ජනාවාස පිහිටුවීමට මගපෙන්වනු ලැබූ අතර, ඒවායෙහි දහස් ගණන් අලුත් ජනපදිකයන්ට ජීවත්වීමට සහ ගොවිතැන්-කිරීමට හැකිවිය.

සිය ජීවිත කාලය තුලදී, සෝල්ට් ලේක් මිටියාවත මුළුල්ලේම සහ ඒ අවට ප්‍රදේශ 1877වන විට ජනාවාසකර, බ්‍රිගම් යන් මියයන විට, 350කටත් වඩා වාසභූමි පිහිටුවා තිබුන අතර, 1900 වන විට ඒවා 500ක් පමණ එහි තිබින. මුල් කාලීන සභා අධිකාරී බ්‍රිගම් හෙන්රි රොබට්ස් සඳහන් කරමින්, මෝර්මන් ජනාවාසකිරීමේ සාර්ථකවීමට හේතුව "ජනතාව ඔවුන්ගේ නායකයන්ට පක්ෂපාතීවීම සහ [ඔවුන්ගේ] පරාර්ථකාමී සහ පුද්ගලික භක්තිමත් කැපවීම" සහ සභාපති බ්‍රිගම් යන්ග් ඔවුන්ට දුන් කැඳවීම ක්‍රියාත්මක කිරීම බව කීවේය.[9] ජනපදිකයෝ ස්වාමීන්වහන්සේගේ අනාගතවක්තෘවරයෙක්ව අනුගමනය කිරීම සඳහා ඔවුන්ගේ ලෞකික සැපපහසුකම්, මිතුරන් ආශ්‍රයකිරීම සහ සමහර අවස්ථාවලදී ඔවුන්ගේ ජීවිත පවා පරිත්‍යාග කළහ.

ප්‍රධාන සම්මන්ත්‍රන රැස්වීමේදී, සභාපති යන්ග් ඔහු පෙන්වූ ප්‍රදේශවල පදිංචියට යෑමට කැඳවා තිබූ සොහොයුරන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල නම් කියවීය. මෙම ජනපදිකයන් සිතා සිටියේ ඔවුන්ව කැඳවා තිබුනේ දූතමෙහෙයන්වලට බවත්, ඔවුන්ට පවරාදුන් ස්ථානවල ඔවුන්ව මුදාහරින



සභාපති බ්‍රිගම් යන්ග්ගේ කැඳවීම්වලට පිළිතුරු දෙමින්, ශුද්ධවන්තයෝ බොහොමයක්
ඔවුන් පිහිටුවූ නිවාසවලින් පිටත්ව අලුත් ජනාවාස ඇතිකිරීමට ගියහ.

තුරු රැඳී සිටිය යුතු බවත් ඔවුහු දැන සිටියහ. ඔවුහු තම වියදමෙන් සහ ඔවුන්ගේ කෑම බීම රැගෙන ඔවුන්ගේ අලුත් ප්‍රදේශවලට ගමන්කළහ. ඔවුන්ගේ සාර්ථකත්වය රැඳී තිබුනේ ඔවුන් සතු සම්පත් පාවිච්චිකරන අන්දම අනුවය. ඔවුහු භූමිය පරීක්ෂාකර, ශුද්ධකර, ඇඹරුම් හල් ගොඩ නගා, භූමියට ජලය ගෙන ඒමට වාරි මාර්ග කානු කපා, සතුන් සඳහා තණ පිට්වල වැටවල් ගසා, පාරවල්ද සෑදූහ. ඔවුහු භෝග ගෙවතුද වගා කර, සභා සහ පාසල් ගොඩ නගා, ඉන්දියන්වරු සමග මිත්‍ර සම්බන්ධකම් පවත්වාගැනීමට උත්සාහ කළහ. ඔවුහු ලෙඩදුක් වලදී මෙන්ම, උපත්, මරණ සහ විවාහවලදීද එකිනෙකාට උදව් කළහ.

1862දී චාල්ස් ලොවෙල් වෝකර්ට යුටා දකුණුදිග පදිංචිවීමට කැඳවීමක් ලැබින. ඔහු කැඳවීම් ලැබූ අයගේ රැස්වීමකට සහභාගිවී මෙසේ වාර්තා කළේය: "මෙහිදී මා ඉගෙනගත් මූලධර්මය මට කාලයකට අමතක නොවේ. කීකරුකම ස්වර්ගයේ සහ පොළොවේ ශ්‍රේෂ්ඨ මූලධර්මයක් බව එහිදී මට පෙනුනි. මෙහි පසුගිය වසර හතක්ම මා උණුසුම සහ ශීතල, කුසගින්න සහ සතුරු කරදර මැද වැඩකර තිබෙන අතර, අවසානයේදී මට නිවසක්ද සමග පළතුරු හටගැනීමට ආරම්භවී ඇති ලක්ෂණ ඉඩමක්ද ලැබී තිබේ. මා එය අත්හැර ගොස් මගේ ස්වර්ගික පියාණන්ගේ කැමැත්ත කළ යුතුය, එතුමාට ප්‍රේමකරමින් බිය දක්වන අයගේ යහපත සඳහා එතුමා සියල්ල පාලනය කරන සේක. මා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්නේ, මාගෙන් අපේක්ෂාකරන දෙය උන්වහන්සේට පිළිගත හැකි ආකාරයකට ඉෂ්ඨකිරීම සඳහා මට ශක්තිය දෙන ලෙසය."[10]

ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සාමාජිකයෙක් වන, චාල්ස් සී. රිච්ද, ජනාවාස කිරීමේ කැඳවීම ලැබුවේය. බ්‍රිගම් යන් ඔහුව සහ තවත් සොහොයුරන් කිහිපදෙනෙක් කැඳවා, ඔවුන්ගේ පවුල්ද රැගෙන සෝල්ට් ලේක් නගරයට සැතපුම් 150ක් පමණ දුරින් පිහිටි, බෙයර් ලේක් මිටියාවතට ගොස් පදිංචිවන ලෙස කීවේය. මිටියාවත උස් ස්ථානයක පිහිටා තිබුනෙන් ශීත ඍතුවේදී තදින් හිම වැටුනු අතර, අධික ශීතලෙන් යුතු විය. රිච් සොහොයුරා මෑතකදී යුරෝපා දූත මෙහෙයකින් නැවත පැමිණ සිටි අතර, අසීරු තත්වයන් යටතේ තම පවුල සමග පිටව ගොස් අලුතින් ආරම්භකිරීමට උනන්දුවක් නොදැක්වීය. නමුත් කැඳවීම පිළිගත් ඔහු, 1864දී බෙයර් ලේක් මිටියාවතට ලගාවිය. ඊළඟ සීත ඍතුව අසාමාන්‍ය ලෙස දරුණුවූ අතර, වසන්තයේදී සොහොයුරන් කිහිප දෙනෙක් සමග පිටවී යාමට ඔහු තීරණය කළේය. මෙ ශීත කාලගුණයේදී ජීවත්වීම පහසු නොවන බව අවබෝධකර ගත් රිච් සොහොයුරා මෙසේ කීවේය:

"නොයෙක් අසිරුතාවයන් එහි තිබුනි. එය මමම කියමි...මේවා අපි එකට බෙදාගත්තෙමු. නමුත් ඔබට වෙන යම් තැනකට යාමට වුවමනා නම් එය ඔබගේ අයිතිවාසිකමක් වන අතර, ඔබව එයින් වැළැක්වීමට මට වුවමනා නැත....නමුත් මා මෙහි තනිවම නැවතී සිටියත්, මා මෙහි නැවතිය යුතුය. සභාපති යන්ග් මා මෙහි කැඳවීය. ඔහු මාව මුදාහැර යාමට නිවාඩු දෙන තුර, මම මෙහි නැවතී සිටිමි." රිච් සොහොයුරා සහ ඔහුගේ පවුල එහි නැවතී සිටි අතර, ඔහු ඊළඟ දශක කිහිපය සමෘද්ධිමත් සමාජයක නායකයා බවට පත්විය.[11] දහස් ගණන් තවත් අය මෙන්, ඔහුද ස්වාමීන් වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට උදව්කිරීම සඳහා ඔහුගේ නායකයන්ට කැමැත්තෙන්ම කීකරු විය.

## ඉන්දියන්වරු සමග සම්බන්ධතා

ජනපදවාසීහු තවත් ඉදිරියට ගියහ. ඔවුහු නිතරම ඉන්දියන්වරු සමග සම්බන්ධකම් තබා ගත්හ. බටහිර සමහර ජනපද වාසීන් මෙන් නොව, ඔවුන්ගේ ස්වදේශීය සොහොයුරන් පෝෂණය කර, ඔවුන්ව සභාවට ගෙන ඒමට උත්සාහකරන ලෙස සභාපති බ්‍රිගම් යන් ශුද්ධවන්තයන්ට ඉගැන්වීය. ඉන්දියන්වරුන් අතර හරවාගැනීමේ කටයුතු අයිඩගෝ දේශසීමාවේ සල්-මොන් ගංගාව පළාතේ ලෙම්හි වරාය අසලදී උත්සාහ කෙරින. සභාපති යන් සහන සමිති පිහිටුවූ අතර, එහි සාමාජිකාවෝ ඉන්දියානු සොහොයු-රන් සහ සොහොයුරියන් සඳහා රෙදි මසාදී, ඔවුන්ව පෝෂණය කිරීමට මුදල් ඉපයීමට උපකාර කළහ.

තෝමස් එල්. කේන්ගේ බිරිඳවූ, එළිසබෙත් කේන්, ශුද්ධවන්තයන්ගේ සාමාජික නොවන ශ්‍රේෂ්ඨ මිතුරියක්, යුටා තුලින් ගමන්කර, වෙහෙසට පත් මෝර්මන් කාන්තාවකගේ නිවසේ නතරව සිටියාය. ඇය ඉන්දියන්ව-රුන්ට සලකන ආකාරය දකින තුරු, එළිසබෙත් ඒ කාන්තාව ගැන එතරම් දුරට නොසිතුවාය. කාන්තාව සිය අමුත්තන්ට රාත්‍රී ආහාරය සඳහා කැඳවූ විට, බලා සිටින ඉන්දියන්වරුන්ටද ඇය වචන කිහිපයක් කථා කළාය. කාන්තාව ඉන්දියන්වරුන්ට කුමක් කීවේ දැයි එළිසබෙත් ඇසූ විට, පවුලේ පුතෙක් ඇයට මෙසේ කීවේය, "මෙම අමුත්තන් පළමුව පැමිණ සිටි නිසා මම කෑම පිසුවේ ඔවුන්ට ප්‍රමාණවත් පරිදි පමණකි; නමුත් ඔබලාගේ කෑම ලිපේ උයමින් ඇත. එය සූදානම්වූ විගස මම ඔබලා කැඳවමි." එළිසබෙත්ට විශ්වාස කළ නොහැකිව, ඇය සැබවින්ම ඉන්දියන්වරුන්ට කෑම දෙන්නේදැයි ඇසුවාය. පුත්‍රයාද "මව ඔබට මෙන් ඔවුන්ටද, කෑම ලැහැස්තිකර, ඇයගේ මේසයේ ඔවුන්ටද ස්ථානයක් දෙනු

ඇත" යයි කීවේය. ඔවුන් කෑම කන අතර ඇය ඔවුන්ට කෑම සපයා දුන්නාය.[12]

**පූජකවරයේ සහ උප ශාඛා සංවිධාන ක්‍රියාත්මකවෙයි**

සිය අවසාන කාලයේදී, සභාපති බ්‍රිගම් යන්ග් පූජකවරයේ යම් වැදගත් වගකීම් කිහිපයක් පැහැදිළි කර පිහිටුවීය. සෑම ස්ටේකයකම සම්මන්ත්‍රන පැවැත්වීමට ඔහු දොළොස්දෙනා මෙහෙයවීය. එහි ප්‍රතිඵල-යක් ලෙස, අලුත් ස්ටේක හතක් සහ අලුත් කොට්ඨාශ 140ක් යුටා නගරය මුළුල්ලේම නිර්මානය විය. ස්ටේක් සභාපතිත්වයන්, උත්තම පූජක, සභානායකත්වයන්, සහ ගණපූර්ණ සභාපතිත්වයන්වල අර්ථය පැහැදිළිකර, මෙම තනතුරු පිරවීමට මිනිසුන් සියගණනක් කැඳවනු ලැබීය. ඔහු සභා සාමාජිකයන්ට ඔවුන්ගේ ජීවිත පිළිවෙලකට තබාගෙන, ඔවුන්ගේ දසයෙන් කොටස, උපවාස පිදුම් සහ වෙනත් ආධාර ගෙවීමට උපදෙස් දුන්නේය.

1867දී අනාගතවක්තෘවරයා ඉරුදින පාසලේ ප්‍රධාන විධායක ලෙස ජෝර්ජ් කිව්. කැනන්ව පත්කළ අතර, වසර කිහිපයක් තුලදී, ඉරුදින පාසල සභාවේ ස්ථිර කොටසක් විය. 1869දී සභාපති යන්ග් ඔහුගේ දියණියන්ට විනීතව ජීවත්වීම ගැන විධිවත් උපදෙස් දීම ආරම්භ කළේය. ඔහු 1870දී සමිතිය නිර්මානය කිරීමේදී අතිරේකය කපා හරිමින් මෙම උපදේශය සියලුම තරුණ කාන්තාවන් සඳහා දීර්ඝ කළේය. මෙය තරුණ කාන්තා සමිතියේ ආරම්භය විය. 1877 ජූලි මාසයේදී ඔහු සහන සමිතියේ පළවෙනි ස්ටේකය සංවිධානය කිරීම සඳහා ඔරිගන් යුටා දක්වා ගමන් කළේය.

**සභාපති බ්‍රිගම් යන්ගේ මරණය සහ උරුමය**

නායකයෙකු ලෙස සභාපති බ්‍රිගම් යන් ප්‍රායෝගික සහ බලවත්ය. ඔහු සභාවේ ජනාවාසවල සංචාරයකර, ශුද්ධවන්තයන්ට උපදෙස් දෙමින් ඔවුන්ව දිරිමත් කළේය. මගපෙන්වීමෙන් සහ ආදර්ශයෙන්, සභාවේ කැඳවීම් ඉටුකිරීමට ඔහු සාමාජිකයන්ට ඉගැන්වීය.

තම ජීවිතයේ වටිනාකම විනිශ්චයකරමින්, සභාපති යන්ග් නිව්යෝර්ක් පුවත්පතක කතුවරයෙකුට පහත සඳහන් ප්‍රතිචාරය දැක්වීය:


"පසුගිය වසර 26ක කාලයක මගේ වෙහෙසවීමේ ප්‍රතිඵල කෙටියෙන් මෙසේය: මෙම ප්‍රදේශය පසු දවස්වල ශුද්ධවන්තයන්ගේ ආත්ම 100,000කින් පමණ ජනාවාස කිරීම; අපගේ ජනතාව වාසයකරන

200කටත් වඩා නුවරවල්, නගර සහ ගම්මාන නිර්මානය කිරීම,…සහ පාසල්, කර්මාන්තශාලා, සහ වෙනත් ආයතන අපගේ සමාජ වැඩිදියුණු කර ප්‍රයෝජනය සඳහා ඇතිකිරීම….

"මගේ මුළු ජීවිතයම සර්වපරාක්‍රමයාණන්ගේ සේවය සඳහා කැපකිරීම."[13]

1876 සැප්තැම්බර් මාසයේදී, සභාපති යන් ගැලවුම්කරුවාණන් ගැන බලවත් සාක්ෂියක් දැරුවේයඃ "යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බවත්, ලෝකයාගේ ගැලවුම්කරුවාණන් සහ මිදුම්කරුවාණන් බවට මම සාක්ෂි දරමි; එතුමා කියන දෙයට මම කීකරුවී, එතුමාගේ පොරොන්දුව අවබෝධකර ගතිමි. මට එතුමා ගැන ඇති දැනුම, මෙම ලෝකයේ ප්‍රඥාවට දීමට නොහැකි අතර, එය ආපසු ගැනීමටද නොහැකිය."[14]

1877 අගෝස්තු මාසයේදී, සභාපති යන්ට තදින්ම අසනීපවිය. වෛද්‍යවරුන්ගේ සැලකිල්ල අපතේ හරිමින්, සතියක් තුලදී මියගියේය. ඔහු 76වෙනි වියේ පසුවූ අතර, වසර 33ක් සභාවට මග පෙන්වීය. අද අපි ඔහුව සිහිපත් කරන්නේ, නූතන කාලයේ ඉශ්‍රායෙල්ව ඔවුන්ගේ පොරොන්දු දේශයට මග පෙන්වූ අනාගතවක්තෘවරයා ලෙසය. ඔහුගේ දේශනා දිනපතා ජීවිතයේ සෑම පැත්තකටම ස්පර්ශවූ අතර, ආගම යනු දිනපතා අත්දැකීමක කොටසක් බව ඔහු පැහැදිළි කළේය. පෙරමුණ ගැන ඔහුගේ තේරුම්ගැනීම සහ ඔහුගේ සංවේදී මග පෙන්වීම්, ඔහුගේ ජනතාව ප්‍රබෝධමත්කර අසීරු ලෙස පෙනෙන දේවල් ඉටුකිරීමට ස්වර්ගයේ ආශිර්වාද සමග ක්‍රියාකිරීමෙන් ඔවුහු කාන්තාරයේ ස්වර්ගයක් නිර්මාණය කළහ.



*සොල්ට් ලේක් දේවමාළිගාවේ මුල්ගල තැබීම බැලීමට දහස්ගණන් ශුද්ධවන්තයෝ 1892 අප්‍රේල් 6 වෙනිදා එහි එක්රැස්වූහ.*

# පරීක්ෂාවන් සහ පරීක්ෂාකිරීමේ කාලයක්

## සභාපති ජෝන් ටේලර්

සභාපති බ්‍රිගම් යන් මියගිය පසුව, ජෝන් ටේලර් මූලාසනය උසුලන ලද, ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය, වසර තුනක කාලයක් සභාව මෙහෙයවීය. 1880 ඔක්තෝබර් 10වෙනිදා, සභාවේ සභාපතිවරයා ලෙස ජෝන් ටේලර්ව ස්ථිරකරන ලදී. සභාපති ටේලර් දක්ෂ ලේඛක-යෙක් සහ මාධ්‍යවේදියෙක් වු අතර, ඔහු වන්දිගෙවීම නම් පොත ප්‍රසිද්-ධකර, *ටයිම්ස් ඔෆ් සීසන් සහ මෝර්මන්* ඇතුළු සභාවේ ඉතා වැදගත් සඟරා කිහිපයක සම්පාදකවරයෙක්ද විය.කාර්තේජ් සිරගෙදරදී ස්වේච්ඡා-වෙන්ම සොහොයුරන් හා එකතුවීමද ඇතුළුව, ඔහු අවස්ථා කිහිපයකදීම, සුභාරංචියට තම ගැඹුරු නිර්භීතභාවය සහ කැපවීම පෙන්වූ අතර, එහිදී ඔහුට හතර වතාවක්ම වෙඩිතබන ලදී. "දේවියන්වහන්සේගේ රාජ්‍යය හැර කිසිවක් වුවමනා නැත," යන ඔහුගේ පුද්ගලික ආදර්ශ වාක්‍යය දෙවියන්-වහන්සේට සහ සභාවට තිබූ ඔහුගේ පක්ෂපාතකම පෙන්වයි.

## ධර්මදූත කටයුතු

පොළොවේ කෙළවර දක්වා සුභාරංචිය ප්‍රකාශකිරීමට සභාපති ටේලර් ඔහුට හැකි සියල්ල කිරීමට කැපවී සිටියේය. 1879 ඔක්තෝබර් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, ඔහු සභාවේ අළුත්ම ප්‍රේරිතයාවූ, මෝසෙස් තැචර් කැඳවා, මෙක්සිකෝවේ, මෙක්සිකෝ නගරයේ හරවාගැනීමේ කටයුතු ආරම්භකිරීමට කීවේය. තැචර් සහ තවත් ධර්මදූතයන් දෙදෙනෙක්, 1879 නොවැම්බර් 13 වෙනිදා මෙක්සිකෝ නගරයේ ප්‍රථම සභාව සංවිධාන-යකල අතර එහි ශාඛා සභාපතිවරයාවූයේ වෛද්‍ය ප්ලොටිනෝ සී. රොඩාකානිටිය. වෛද්‍ය රොඩාකානිට්ගේ හැරී ඒම සිදුවූයේ ස්පාඤ්ඤ භාෂාවෙන් ලියනලද මෝර්මන්ගේ පොතේ පත්‍රිකාවක් කියවා සභාව ගැන අමතර තොරතුරු ඉල්ලා සභාපති ටේලර්ට ලිපියක් ලිවීමෙන් පසුවය.

සාමාජිකයන් දොළොස් දෙනාගේ සහ ධර්මදූතයන් තුන් දෙනෙකුගේ ආරම්භයෙන්, නැවත පිහිටුවූ සුභාරංචිය මෙක්සිකෝ ජනතාව අතර ප්‍රචාරයවීම සෙමෙන් ආරම්භවිය. 1881 අප්‍රේල් 6 වෙනිදා, වැඩිහිටි තැචර්,ෆෙරාමෝස්ට්, යන්ග් සහ පයිස් සොහොයුරා පොපාකාට්පෙල් කන්දේ අඩි 15,500ක් නැග, කෙටි කැපකිරීමේ මෙහෙයක් පැවැත්වූහ. ස්වාමීන්වහන්සේ ඉදිරියේ දණගසමින්, වැඩිහිටි තැචර් මෙක්සිකෝ භූමිය සහ එහි ජනතාව කැපකර, ඔවුන්ගේ සැබෑ එඬේරාණන්වන, ස්වාමීන් වහන්සේගේගේ හඬ ඇසීමට ඔවුන්ට හැකිවේවායි කීවේය.

වැඩිහිටි තැචර් නැවත සෝල්ට් ලේක් නගරයට පැමිණ අමතර ධර්මදූතයන් මෙක්සිකෝවේ සේවයකිරීමට කැඳවීමට නිර්දේශ කළේය. ඉක්මණින්ම පළවෙනි සභාපතිත්වයේ අනාගත සාමාජිකයෙක්වීමට සිටි, ඇන්තනි ඩබ්ලිව්. අයිවින්ස්ද ඇතුළුව, තරුණ මිනිසුන් කිහිපදෙනෙක්, මෙක්සිකෝ නගරයේ සේවයකිරීමට ගියහ. මෙක්සිකෝ දූතමෙහෙයේ සභාවේ කටයුතුවල කොටසක් ලෙස, මෝර්මන් පොතේ ස්පාඤ්ඤ භාෂාවේ සංස්කරණයක් 1886දී ප්‍රසිද්ධවිය. මෝර්මන්ගේ පොත සහ වෙනත් සභා පොත් ස්පාඤ්ඤ භාෂාවට පරිවර්තනයකිරීමට උපකාරකළ, මිල්ටන් ට්‍රෙජෝ කථාවෙන් ප්‍රදර්ශනය වන්නේ ස්වාමීන්වහන්සේ උන්ව-හන්සේගේ කටයුතුවලට මග පෙන්වන අන්දමය.

මිල්ටන් ට්‍රෙජෝ ස්පාඤ්ඤයේ ඉපදී කිසිදු ආගමකට සම්බන්ධ නොවී හැදී වැඩුනේය. ඔහු පිලිපීන හමුදාවේ සේවයකරන අතර රොකී කඳුක-රයේ සිටින මෝර්මන්වරුන් ගැන තොරතුරු අසන්ට ලැබී, ඔවුන්ව බැහැ-දැකීමට ඔහු තුල තද ආශාවක් ඇතිවිය. පසුව ඔහුට ඉතා අසනීපවූ අතර, ඔහු යුටා නගරයට යා යුතුයයි සිහිනයකින් ඔහුට කියා ඇත. ඔහුට සුවවූ විට, ඔහු සොල්ට් ලේක් නගරයට ගියේය. බ්‍රිගම් යන්ග් හමුවූ ඔහු සුභා-රංචිය ගැන සොයා බැලීය. ඔගුට සත්‍යය සොයාගැනීමට ලැබුන බවට අවබෝධවී, ඔහු සභාවේ සාමාජිකයෙක් බවට පත්විය. ඔහු මෙක්සිකෝවේ දූතමෙහෙයක සේවයකර පසුව, ස්පාඤ්ඤ භාෂාව කථාකරන ජනතාවට මෝර්මන්ගේ පොත ඔවුන්ගේම භාෂාවෙන් කියවීමට හැකිවීම සඳහා ප්‍රධාන කාර්‍යභාරයක් ඉටුකිරීමට, ආත්මිකව සහ බුද්ධිමත්ව සූදානම්විය.

අමෙරිකාවේ බටහිර ජීවත්වන ඉන්දියන්වරුන්ට සුභාරංචිය ගෙනයාම සඳහා සභාපති ටේලර් ධර්මදූතයන් කැඳවීය. ආමොස් රයිට්ගේ සේවය වයෝමින් වින්ඩ් රිවර් ජලාශය අවට ජීවත්වන සෝසෝන් ගෝත්‍ර අතර ප්‍රතිඵලදායක විය. මාස කිහිපයක කාලයක් පමණක් සේවයකිරීමෙන් පසුව, ප්‍රධාන වසාකීද ඇතුළුව, 300කට වැඩි ඉන්දියන්වරු පිරිසක් රයිට්

බව්තීස්මකර ඇත. පසු-දවස්වල ශුද්ධවන්ත ධර්මදූතයෝ ඇරිසෝනාවේ සහ නිව් මෙක්සිකෝවේ ජීවත්වන නවාස්වරු, පෙබල්ස්වරු, සහ සුනෝස්වරුන්ට සුභාරංචිය රැගෙන ගියහ. විල්ෆෝඩ් වුඩ්රෆ් හොපිස්වරු, අපාචිවරු සහ සුනෝස්වරු ඇතුළුව ඉන්දියන්වරු අතර හරවාගැනීම සඳහා වසරක් ගත කළේය. ඇමොන් එම්. ටෙනී සුනෝස් ඉන්දියන්වරුන් 100කටත් වඩා බව්තීස්මකිරීමට සහායවීය.

ධර්මදූතයෝ එංගලන්තය සහ යුරෝපයේ සුභාරංචිය ඉගැන්වීම නොකඩවා කළහ. 1883දී, යුටා, ලිහායිවල ජීවත්ව සිටි, ජර්මන් ජාතික තෝමස් බීසින්ගර්, යුරෝපා දූතමෙහෙයක සේවයකිරීමට කැඳවීමක් ලැබුවේය. ඔහු සහ පෝල් හැමර්ව පැරගුවේ සහ චෙකෝස්ලෝවෙකියාවටද, පසුව ඔස්ට්‍රෝ හන්ගේරියන් අධිරාජ්‍යටද යවන ලදී. හරවාගැනීම් ධර්මදූතයන්ට තහනම්වූ නිසා හමුවූ අය හා ඔවුහු මූලික සාකච්ඡා පමණක් පැවැත්වූහ. මෙම සාකච්ඡා නිතරම ආගම් මාතෘකාවට හැරුනි. මේ අන්දමින් මාසයක් පමණක් වැඩකිරීමෙන් පසුව, වැඩිහිටි බීසින්ගර්ව සිරගත කොට මාස දෙකක් සිරගෙදර රඳවා ගැනින. ඔහු නිදහස්වූ විට, ඇන්තනින් ජස්ට් බව්තීස්මකිරීමට ඔහු ආශිර්වාදිතවූ අතර, ඔහුගේ චෝදනාව නිසා ඔහුව සිරගත කෙරින. ජස්ට් සොහොයුරා චෙකෝස්ලෝවෙකියාවේ ජීවත්වන පළවෙනි පසු-දවස්වල ශුද්ධවන්තයා බවට පත්විය.[1]

පොලිනීසියොවේද සුභාරංචිය දේශනා කෙරින. හවායි ජාතිකයන් දෙදෙනෙකුවූ, වැඩිහිටි කිමෝ පෙලියෝ සහ සැමුවෙලා මනෝවා 1862දී සැමෝවාවට යවන ලදී. ඔවුන් මිනිසුන් 50 දෙනෙක් බව්තීස්මකළ අතර, වැඩිහිටි මනෝවා හැරී ආ අය සමග ඊළඟ වසර 25ක් සැමෝවාවල දිගටම ජීවත්විය. 1887දී යුටා, සෝල්ට් ලේක් නගරයේ ජෝසෆ් එච්. ඩීන්ට, සැමෝවාවල දූතමෙහෙයක සේවයකිරීමට කැඳවීමක් ලැබුනි. වැඩිහිටි මනෝවා සහ ඔහුගේ ඇදහිලිමත් බිරිඳ ඔවුන්ගේ නිවස වැඩිහිටි ඩීන් සහ ඔහුගේ බිරිඳ, ෆ්ලොරන්ස්ට, විවෘතකළ අතර, දසක දෙකකටත් වඩා කාලයකින් පසුව සැමෝවාවලින් පිටත ඔවුන් දුටු පළවෙනි පසු-දවස්වල ශුද්ධවන්තයන්වූයේ ඔවුන්ය. වැඩිහිටි ඩීන් කෙටි කලකින් මිනිසුන් 14 දෙනෙක් සභාවට බව්තීස්මකර, මාසකින් පමණ පසුව සැමෝවා භාෂාවෙන් ඔහුගේ පළවෙනි දේශනාව කළේය.[2] මෙලෙස එම දූපතේ ධර්මදූත කටයුතු අලුතෙන් ආරම්භවිය.

ලාදුරු රෝගය පැතිරීම වැළැක්වීම සඳහා, හවායි බලධාරීහු රෝගයෙන් පීඩාවිඳින ජනතාව මොලෝකායි දූපතේ කලාපපා අර්ධද්වීපයට රැගෙන යාම 1886 දී ආරම්භ කළහ. 1873දී පසු-දවස්වල ශුද්ධවන්තයන්වූ,

ජොනතන් සහ කිටී නපේලාව එහි පිටුවහල් කෙරින. රෝගය තිබුනේ කිටීට පමණක් වුවද, සෝල්ට් ලේක් එන්ඩවුමන්ට් ගෘහයේදී, ජොනතන්ව කිටීට මුද්‍රාකර තිබූ නිසා, ඇයව එහි තනිකර දමායාමට ඔහු අකමැතිවිය. පසුව ජොනතන්ට රෝගය වැළඳුන අතර, වසර නවයකට පසුව ඔහුව බැහැදුටු හොඳම මිතුරෙකුට ඔහුව හඳුනාගැනීමට පවා නොහැකිවිය. ඔහු යම් කාලයක් එම අර්ධද්වීපයේ ශුද්ධවන්තයන්ගේ මුලසුන හෙබවූ අතර, 1900වන විට එහි සංඛ්‍යාව 200කට වඩා වැඩිවිය. සභා නායකයෝ මෙම රෝගයෙන් දුර්වලවූ ඇදහිලිමත් සාමාජිකයන්ව අමතක නොකර, ඔවුන්ගේ ආත්මික අවශ්‍යතාවයන් සොයාබැලීමට නිතරම ශාඛාවට ගියහ.[3]

## රන් ජුබිලි සංමන්ත්‍රනය

1880 අප්‍රේල් 6වෙනිදා, සභා සාමාජිකයෝ සභාව සංවිධානය කිරීමේ පනස්වෙනි සංවත්සරය සැමරූහ. පැරණි ඔවුහු එය ජුබිලි වර්ෂය ලෙස හැඳින්වූහ. පැරණි ඉශ්‍රායෙල්වරු සෑම පනස්වසරම එසේ හැඳින්වූහ. සභාවට ණයවී සිටි අවශ්‍යතා තිබෙන සාමාජිකයන්ට සභාපති ටේලර් කමාව දුන්නේය. "අවශ්‍යතා ඇති දුප්පතුන්" අතර බෙදාහැරීමට එලෙ-දනුන් 300ක් සහ බැටළුවන් 2,000කින් සභාවට ආධාර කළේය.[4] සභාවේ සහන සමිතියේ සොහොයුරියෝ අවශ්‍යතා ඇති අයට තිරිඟු බුසල් 35,00ක් පමණ පරිත්‍යාග කළහ. විශේෂයෙන් විපතට පත්වූවන්ගේ, පුද්ග-ලික ණයට කමාවන ලෙස, ටේලර්ද සභා සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටි-යේය. "ජුබිලි අවස්ථාව එය බව!" ඔහු ප්‍රකාශ කළේය.[5] කමාවදීමේ සහ ප්‍රීතියේ ආකල්පයක් පසු-දවස්වල ශුද්ධවන්තයන් අතර තදින්ම ඇතිවිය.

1880 අප්‍රේල් ජුබිලියේ අවසාන දිනයේ ප්‍රධාන සම්මන්ත්‍රනය ඉතා ආත්මික විය. ප්‍රේරිතවරුන්ගෙන් එකොළොස් දෙනෙක් අවසාන සැසිවා-රයේදී ඔවුන්ගේ සාක්ෂිය දැරූහ. පෝරිතවරුන් දොළොස් දෙනාගේ ගණපූර්ණයේ එක් මුල් සාමාජිකයෙක්වූ, ඔරසන් ප්‍රැට්, නිව් යෝර්ක්, ෆෙයට්වල, පීටර් විට්මර් ජො‍්‍ය. නිවසේ මුළු සභාවම රැස්වූ අවස්ථාවක් ගැන කථා කළේය. ශුද්ධවන්තයන්ට මුහුණදීමට සිදුවූ, පරීක්ෂාවන්, එක්-රැස්වීම්, හිංසා පීඩා, සහ දුක් පීඩා සිහිපත්කළ ඔහු, තවමත් "ඔහුගේ ජනතාව අතර ඔහු ගණන්ගැනීම" ගැන ස්තුති පූර්වක හැඟීමක් ඇති බව කීවේය. ඉන්පසුව ඔහු "ගතවූ පනස් වසර තුලදී අපගේ ස්වාමීන්වූ දෙවියන්වහන්සේ කළ ශ්‍රේෂ්ඨ වැඩකටයුතු ගැන" සාක්ෂිය දැරීය.[6] ජීවත්-වීමට මාස කිහිපයක් පමණක් තිබූ, වැඩිහිටි ප්‍රැට්, පසු-දවස්වල ශුද්ධ-වන්තයෙකු ලෙස අවසානය දක්වා දරාසිටීම ගැන බොහෝ සතුටුවිය.

ජුබිලි සංවත්සරයට වසර දෙකකට පෙර, ළමයින්ට ආගමික උපදෙස් දීම සඳහා සංවිධානයක් පිහිටුවීමට සභාපති ජෝන් ටේලර් අවසර දී තිබින. පළවෙනි ප්‍රාථමිකය සෝල්ට් ලේක් නගරයට සැදපුම් 15කට පමණ උතුරු දෙස පිහිටි යුටා, ෆාමින්ටන්හි ආරම්භකර තිබුන අතර, 1880 මැද භාගයේදී, පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ සියලුම ජනාවාසවලම වාගේ ප්‍රාථමික ආරම්භවී තිබින. එය ලෝකය මුළුල්ලේම කෝටි ගණන් ළමයින් ඇතුළත්ව වර්ධනයවූ අතර, හැම සතියකම සුභාරංචි උපදෙස්, සංගීතය සහ මිතුරු ඇසුර භුක්තිවිඳීමට ඔවුහු ආශිර්වාදිතවූහ.

**හිංසා පීඩා දිගටම පවතියි**

1830 ගණන්වලදී බයිබලය පරිවර්තන කටයුතු කරමින් සිටියදී, ආබ්‍රහම්, යාකොබ්, දාවිත් සහ පරණ ගිවිසුමේ තවත් නායකයන්ට එක් භාර්‍යාවකට වඩා සිටීම අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ට ප්‍රශ්නයක් බවට පත්විය. අනාගතවක්තෘවරයා අවබෝධය පතා යාච්ඤාකර, යම් අවස්ථාවල, විශේෂ අරමුණු සඳහා, දිව්‍යමය ලෙස ලැබුනු නීති අනුව, බහු භාර්‍යා සේවනය දෙවියන්වහන්සේ අනුමතකර හසුරුවන බව දැනගත්තේය. දිව්‍යමය අනුමැතිය ඇතිව, පූජක නායකයන් විසින් තෝරාගන්නා පසු-දවස්වල යම් ශුද්ධවන්තයන්ට එක් භාර්‍යාවකට වඩා විවාහකරගැනීමට හැකි බවද ජෝසෆ් ස්මිත් දැනගත්තේය. පසු-දවස්වල ශුද්ධවන්තයන් ගණනාවක්ම නාවූ නගරයේදී බහු භාර්යා සේවනය කළහ. නමුත් 1852 සෝල්ට් ලේක් නගරයේ ප්‍රධාන සම්මන්ත්‍රනය පවත්වන තුරු, මෙම දහම සහ ප්‍රතිපත්තිය ගැන ප්‍රසිද්ධියේ නිවේදනය නොකෙරින. මෙම සම්මන්ත්‍රනයේදී, සභාපති බ්‍රිගම් යන්ගේ මග පෙන්වීම අනුව, වැඩිහිටි ඔරසන් ප්‍රැට් නිවේදනයකරමින්, මිනිසෙකුට එක් භාර්‍යාවකට වඩා තැබාගැනීමේ ප්‍රතිපත්තිය ස්වාමීන්වහන්සේගේ සියලු දේ නැවත පිහිටුවන කාලවල් දක්වා කොටසක්ව පවතින බව කීවේය (බලන්න ක්‍රියා 3:19–21).

යුටා නගරයේ ජීවත්වන පසු-දවස්වල ශුද්ධවන්තයන් දිරිගන්වන විවාහ ක්‍රමය ගැන දැනගත් අමෙරිකාවේ බොහෝ ආගමික සහ දේශපාලන නායකයෝ එය දුරාචාරමත්, ක්‍රිස්තියානි විරෝධී වුවක් ලෙස සැලකුවෝය. සභාවට සහ එහි සාමාජිකයන්ට විරුද්ධව විශාල දේශපාලන ව්‍යාපාරයක් දියත් කෙරින. එක්සත් ජනපද කොන්ග්‍රස් සභාව නීතියක් පැනවීමෙන් එමගින් පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ නිදහසට බාධා පැමිණ ආර්ථිකවශයෙන් සභාවටද හානි පැමිණුනි. මෙම නීතියේ ප්‍රතිඵලයක් ලෙස, එක් භාර්යාවකට වඩා සිටින මිනිසුන් සිරභාරයට ගැනීමට සහ ඔවුන්ගේ

චන්ද්‍රබලය, ඔවුන්ගේ නිවාසවල පෞද්ගලික නිදහස සහ වෙනත් සිවිල් ස්වාධීනතාවයන් භුක්තිවිඳීමද අහිමි කෙරින. සිය ගණන් ඇදහිලිමත් පසු-දවස්වල ශුද්ධවන්තයෝ සහ කාන්තාවන් කිහිපදෙනෙක්ද, යුටා, අයිඩහෝ, ඇරිසෝනා, නෙබ්රෙස්කා, මිචිගන් සහ දකුණු ඩකෝටාවේ තිබූ සිරගෙ-වල්වල සිර දඬුවම් වින්දෝය.

විශේෂයෙන්ම දකුණු දිග එක්සත් ජනපදයේ, සුභාරංචිය දේශනාකි-රීමට කැඳවීම් පිළිගත් බොහෝ දෙනෙකුට හිංසා පීඩා අධිකවිය. උදාහර-ණයක් ලෙස, 1878 ජූලි මාසයේදී ජෝසෆ් ස්ටෑන්ඩින්ව ජෝර්ජියාවේ, රෝමය අසල සේවයේ යෙදී සිටියදී දරුණු ලෙස මරා දැමින. ඔහුගේ සහායකයා, අනාගත ප්‍රේරිත රජර් ක්ලෝසන් පමණක් යාන්තමින් මරණ-යෙන් ගැලවින. සෝල්ට් ලේක් ශුද්ධවන්තයන් වැඩිහිටි ස්ටැන්ඩින්ගේ මරණය ගැන ඇසීමෙන් දැඩි කම්පාවට පත්ව, දහස් ගණන් ජනතාවක් සෝල්ට් ලේක් දේවස්ථානයේ ඔහුගේ අවමගුලට සහභාගිවූහ.

වැඩිහිටි ජෝන් ගිබ්ස්, විලියම් බෙරි, විලියම් ජෝන්ස්, සහ හෙන්රි තොම්ප්සන් ටෙනසි නගරයේ බොහෝ කොටස්වල ගමන්කරමින් සභාව ගැන මහජන මතය වෙනස්කිරීමට උත්සාහ ගත්හ. 1884 අගෝස්තු මස එක් සබත් උදෑසනක ටෙනසිවල කේන් ක්‍රීක් අසල ජේම්ස් කොන්ඩෝගේ නිවසේ ඔවුහු විවේක ගත්හ. වැඩිහිටි ගිබ්ස් ශුද්ධ ලියවිලි අධ්‍යයනයකර-මින්, ඔහුගේ දේශනාවකට මාතෘකාවක් සොයමින් සිටියදී, කැලය තුලින් කඩාවැදුනු දාමරිකයන් කණ්ඩායමක් වෙඩිතැබීමට පටන්ගත්හ. වැඩිහිටි ගිබ්ස් සහ බෙරි මරාදැමින. පාසල් ගුරුවරයෙකුවූ, වැඩිහිටි ගිබ්ස්ගේ මරණයෙන් හඬාවැටෙන බිරිඳක් සහ දරු තුන්දෙනෙක් තනිවූහ. ගිබ්ස් සොහොයුරිය වසර 43ක්ම වැන්දඹුවක් ලෙස සිටිමින් සිය දරුවන් රැකගැනීමට සාත්තු සේවිකාවක් වූවාය. ඇය සුභාරංචියට ඇදහිලිමත්ව සිටිමින් තම ස්වාමිපුරුෂයා සමග ප්‍රීතිමත් එක්වීමකට බලාපොරොත්තු-වෙන් මියගියාය. මිනීමැරුම් සිදුවූ කාලයේ සිටි, වැඩබලන ධර්මදූත සභා-පතිවරයාවූ, බ්‍රිගම් හෙන්රි රොබට්ස්, ගිබ්ස් සහ බෙරීගේ ශරීර ගොඩගැ-නීම සඳහා සොහොන් වල් කැපීමට තම ජීවිතය පරදුවට තබමින් වෙස්වලාගෙන ගියේය. ඔහු ශරීර යුටාවලට නැවත යැවූ අතර, එහිදී වැඩිහිටියන් දෙදෙනාට ගරුකිරීම සඳහා ස්මරණ මෙහෙයන් පැවැත්වූහ.

වෙනත් ප්‍රදේශවල ධර්මදූතයන්වද ඔවුන්ගේ පිට දිගේ ලේ වැගිරෙන තුරු පහරදෙන ලද අතර, බොහෝ දෙනෙක් මෙම කස පහරවල්වල ලකුණු ඔවුන්ගේ සොහොන් ගෙවල්වලටද රැගෙන ගියහ. එය සභාවේ සාමාජිකයෙක්ව සිටීමට පහසු කාලයක් නොවීය.

එක් භාර්යාවකට වැඩියෙන් සිටින මිනිසුන් සොයන ප්‍රාන්ත නිළධාරීන් විසින් සිරගත කිරීමෙන් වැළකීමට සභා නායකයෝ බොහොමයක් සැඟවී සිටියහ. මෙම නිළධාරීන් රාත්‍රී කාලයේදී නිවෙස්වලට ඇතුල් වෙතැයි පවුල් බියට පත්වූහ. සභාපති ජෝර්ජ් කිව්. කැනන්, ලොරෙන්සෝ ස්නෝ, රජර් ක්ලෝසන්, බ්‍රිගම් හෙන්රි රොබට්ස්, ජෝර්ජ් රෙනෝල්ඩ්ස්, සහ තවත් බොහෝ දෙනෙක් සිරගෙට යවන ලදී. එහිදී ඔවුහු පොත් ලියමින්, පාසල්වල උගන්වමින්, සහ ඔවුන්ගේ පවුල්වලට ලිපි සකස්කරමින් කාලය ගතකළහ. සභාපති ජෝන් ටේලර්ට, සෝල්ට් ලේක් නගරයට උතුරින් සැතපුම් 20ක් පමණ ඈතින් පිහිටි, කේස්විලීවල පිටුවහලෙක් ලෙස ජීවත්වීමට බලකරන ලද අතර, එහිදී ඔහු 1887 ජූලි 25වෙනිදා මියගියේය. ඔහු ඇදහිල්ල සහ නිර්භීතකමින් යුත් මිනිසෙක්වූ අතර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සාක්ෂියට සහ දෙවියන්වහන්සේගේ රාජ්‍යය පොළොව මත පිහිටුවීමට ඔහුගේ ජීවිතය කැපකළේය.

### සභාපති විල්ෆෝඩ් වුඩ්රෆ්

විල්ෆෝඩ් වුඩ්රෆ් සභාවේ ඉතාමත්ම සාර්ථකවූ ධර්මදූතයෙක් මෙන්ම ඔහුගේ අනාවැකි දානය මෙන්ම සභාවේ පක්ෂපාතීව සිටීම ගැනද ප්‍රසිද්ධවූ අයෙකි. ඔහු ඉතා නිවැරදි ජර්නල් තැබූ අතර, ඒවායින් සභාවේ මුල් කාලීන තොරතුරු බොහොමයක් ලබාදෙයි. ජෝන් ටේලර් මියගිය විට, ඔහු ප්‍රේරිතවරුන් දොළෙස්දෙනාගේ ගණපූර්ණයේ සභාපති ලෙස සේවය කරමින් සිටි අතර, වසර දෙකකට පසුව ඔහුව සභාවේ සභාපතිවරයා ලෙස ස්ථිර කරන ලදී.

ඔහුගේ පරිපාලන කාලයේදී, පසු-දවස්වල ශුද්ධවන්තයන්ට විරුද්ධ ව්‍යාපාරය ඉතා දැඩි විය. නමුත් සභාව ඉදිරියට ගියේය. යුටා, සාන්ත ජෝන්, ලෝගන්, සහ මැන්ටි නගරවල—දේවමාළිගා ක්‍රියාත්මකවූ අතර—සෝල්ට් ලේක් දේවමාළිගාව නිමවීමට ආසන්නව තිබින. මෙම ස්වාමීන් වහන්සේගේ ගෘහයන් තුලින් දහස්ගණන් ශුද්ධවන්තයන්ට එන්ඩව්මන්ට් ලබාගැනීමට සහ ඔවුන්ගේ මියගිය දොතීන් වෙනුවෙන් කටයුතු කිරීමට හැකියාව ලැබින. සභාපති වුඩ්රෆ්ට දේවමාළිගා සහ පවුල් ඉතිහාස කටයුතු ගැන ජීවිත කාලයේම උනන්දුවක් තිබින. ඔහු අවස්ථා කිහිපයක්දීම ශුද්ධවන්තයන්ට අවවාද කරමින් ඔවුන්ගේ මුතුන්මිත්තන් සඳහා නියෝග ඉටුකිරීමට කීවේය.

මියගිය අය සඳහා ශුද්ධවන්තයන් ඉටුකල කටයුතුවල වැදගත්කම ගැන පහත සඳහන් සිද්ධීන් අවධාරනය කරයි. 1884 මැයි මාසයේදී, ලෝගන්

දෙවෙනි කොට්ඨාශයේ සභානායක, හෙන්රි බැලඩ් ඔහුගේ නිවසේ දේව-මාළිගා නිර්දේශ අත්සන් කරමින් සිටියේය. හෙන්රිගේ නව හැවිරිදි දියණිය, නිවස අසල පාර අයිනේ මිතුරන් සමග කථාකරමින් සිටියදී, වැඩිමහළු මිනිසුන් දෙනෙක් පැමිණෙනු දුටුවාය. ඇයට කථාකළ ඔවුහු, ප්‍රවෘත්ති පත්‍රයක් ඇයට දී, එය ඇයගේ පියාට දෙන ලෙස කීහ.

ගැහැණු ලමයා තමාට කී ලෙස කළාය. සභානායක බැලඩ් *නිව්බරි වීක්ලි නිව්ස් නම්*, එංගලන්තයේ පළවූ එම ප්‍රවෘත්ති පත්‍රයේ, ඔහු සහ ඔහුගේ පියා හඳුනන්නන් 60 කට වැඩි ප්‍රමාණයක නම්, පෙළපත් තොරතුරුද සහිතව ඇතුළත්ව තිබින. 1884 මැයි 15වෙනි දිනැති, මෙම ප්‍රවෘත්ති පත්‍රය, එය මුද්‍රණයවී දින තුනකින් පමණ, ඔහුට දී තිබින. අහසින් ප්‍රවාහන කටයුතු සිදුවීමට බොහෝ පෙර කාලයකදී, එංගලන්තයේ සිට බටහිර අමෙරිකාවට ලිපි ලැබීමට සති කිහිපයක් ගතවන යුගයක, මෙය ආශ්චර්යයක් විය.

ඊළඟ දිනයේ, සභානායක බැලඩ් ප්‍රවෘත්ති පත්‍රය දේවමාළිගාවට ගෙනගොස්, එය ලැබීමේ කථාව ගැන දේවමාළිගාවේ සභාපතිවරයාවූ, මැරිනර් ඩබ්ලිව්. මෙරිල්ට කීවේය. මෙරිල් මෙසේ කීවේය, "බැලඩ් සොහොයුර, එහා පැත්තේ සිටින යමෙක් ඔවුන්ගේ කටයුතු ඉටුකරගැනීමට බොහෝ උනන්දුවෙන් සිටින අතර, මෙම පත්‍රය ඔබේ අතට ලැබුනහොත් ඔබට එය කළ හැකි බව ඔවුහු දනිති"[7] මෙම ප්‍රවෘත්ති පත්‍රය යුටා, සෝල්ට් ලේක් නගරයේ, සභා ඓතිහාසික පුස්තකාලයේ ආරක්ෂාකර ඇත.

හිංසා පීඩා නොතකා හැර, සභා නායකයෝ බටහිර අමෙරිකාවේ පදිංචි නොවූ ප්‍රදේශ ජනාවාස කිරීමට තවදුරටත් උනන්දු කළහ. 1885දී ආරම්භවී, පසු-දවස්වල ශුද්ධවන්ත පවුල් බොහොමයක් මෙක්සිකෝවේ, සොනෝරා සහ චිහාහුහාවල පදිංචිවී, කොලෝනියා ජුරේස් සහ කොලෝනියා ඩයස් වැනි නගර පිහිටුවූහ. උතුරුදිග මෙක්සිකෝවේ වෙනත් ප්‍රදේශවලටද සභා සාමාජිකයන්ගේ සංක්‍රමනය සිදුවිය.

සභා සාමාජිකයෝ ජනාවාසකිරීමට ස්ථාන සොයා උතුරු කැනඩාව දෙසද බැලූහ. කැචී වැලි ස්ටේකයේ සභාපතිවරයා ලෙස සේවය කළ, චාල්ස් ඕ. කාඩ්, 1886දී දකුණු දිග ඇල්බටාවේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ ජනාවාසයක් ආරම්භ කළේය. 1888 ශීත ඍතුව වන විට, පසු-දවස්වල ශුද්ධවන්තයෝ 100කට වඩා බටහිර කැනඩාවේ ජීවත්වූ අතර, 1890 ගණන්වලදී තවත් අය පැමිණ, ජල පවාහන ක්‍රමයක් සහ දුම්රිය

පාරක් ඉදිකිරීමට සේවය ලබා දුන්හ. සභා නායකයන් බොහොමයක් ඇල්බටාවේදී පරිණතවූහ.

**ප්‍රකාශපත්‍රය**

1880 ගණන්වල අවසානයට ලඟාවීමේදී, එක්සත් ජනපද ආණ්ඩුව අමතර නීති පනවමින් බහු විවාහය සේවනය කරන අයගේ ඡන්ද අයිතිය, සහ ජූරියේ සේවයකිරීම වළක්වා, සභාවට හිමිකර ගත හැකි දේපළවලට දැඩි ලෙස තහංචි පැනවීය. පියවරු වැඩි වශයෙන් සැඟවීමට පටන්ගත් නිසා පසු-දවස්වල පවුල් වේදනාවට පත්වූහ. සභාපති වුඩ්රෆ් ස්වාමීන්වහන්සේගෙන් උපදෙස් ඇයදීය. 1890 සැප්තැම්බර් 23 වෙනිදා සවස, අනාගතවක්තෘවරයා, ආනුභාවය අනුව ක්‍රියාකරමින්, ප්‍රකාශ පත්‍රයක්, ලියවිල්ලක්, ලියූ අතර, එමගින් සභා සාමාජිකයන්ගේ බහු විවාහ අවසන් කෙරින. ස්වාමීන්වහන්සේ සභාපති වුඩ්රෆ්ට දුන් දර්ශනයකින් බහු විවාහ සේවනය අවසන් නොකළ හොත්, දේවමාළිගාවල් එක්සත් ජනපද ආණ්ඩුව බාරයට ගන්නා බවත්, එවිට ජීවත්වන සහ මියගිය අය සඳහා කරන කටයුතු අවසන්වන බවත් පෙන්වූසේක.

1890 සැර්තැම්බර් 24 වෙනිදා, පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය ප්‍රකාශපත්‍රය ස්ථිර කළහ. ශුද්ධවන්තයෝ එය 1890 ඔක්තෝබර් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී අනුමත කළහ. වර්තමානයේදී මෙම ලියවිල්ල දහම සහ ගිවිසුමේ 1 වෙනි නිළ ප්‍රකාශනය ලෙස ඇතුළත්ව ඇත.

සභාව ගත් ක්‍රියාමාර්ගය අනුව යමින්, ප්‍රාන්ත බලධාරීහු බහුභාර්‍යා සේවනයට විරුද්ධ නීති කැඩීම ගැන දඬුවම් ලැබූ පසු-දවස්වල ශුද්ධවන්ත මිනිසුන්ගෙන් කමාව ඉල්ලීමක් නිකුත්කළ අතර, හිංසා පීඩා නැවැත්වූහ. නමුත් සභාපති වුඩ්රෆ් පැහැදිළිකරමින්, "මා කළ දෙය කිරීමට ස්වර්ගයේ දෙවියන්වහන්සේ මට නියෝගකර නොතිබුනේ නම්, සියලුම දේවමාළිගා අපගේ අත්වලින් ගිලිහීයාමට ඉඩදීමට මට සිදුවේ; මමත් සිරගෙට ගොස්, සෑම මිනිසෙක්ම එහි යාමට ඉඩදීමට මට සිදුවේ; එසේම එය කිරීමට මට නියෝගකළ පැය ලඟාවූ විට, ඒ සියල්ලම මට පැහැදිළිවිය. මම ස්වාමීන්වහන්සේ ඉදිරියට ගොස්, මට ලිවීමට ස්වාමීන්වහන්සේ කී දෙය මම ලියුවෙමි" ("ප්‍රකාශපත්‍රය සම්බන්ධයෙන් සභාපති විල්ෆෝඩ් වුඩ්රෆ් විසින් කළ ප්‍රකාශ තුනකින් උපුටාගැනින," නිළ ප්‍රකාශනය—1 අනුව ඇතුළත් කෙරින). බහු විවාහය අත්හිටුවීමට නිළ ප්‍රකාශනය ගෙන ආවේ එක්සත් ජනපද කොන්ග්‍රසය නොවේ, දෙවියන්වහන්සේය.

## පෙළපත් පිළිබඳ සමිතිය

පසු-දවස්වල ශුද්ධවන්තයන් පෙළපත් සමිතිය ඇතිකිරීමට බොහෝ පෙර, සභා සාමාජිකයෝ ඔවුන්ගේ මියගිය මුතුන්මිත්තන්ගේ ජීවිත ලේඛනගතකළ වාර්තා එකතු කළහ. විල්ෆෝඩ් වුඩ්රෆ්, ඔරසන් ප්‍රැට්, සහ හීබර් ජේ. ග්‍රාන්ට්, දහස් ගණන් මුතුන්මිත්තන්ගේ නම් ලබාගත් අය අතර සිටියහ, ඔවුන් වෙනුවෙන් ඔවුහු දේවමාළිගා නියෝග ඉටුකළහ. 1894දී පළවෙනි සභාපතිත්වයේ මගපෙන්වීම අනුව පෙළපත් පිළිබඳ සමිතියක් සංවිධානයකර, එහි පළවෙනි නායකයා ලෙස වැඩිහිටි ෆ්‍රැන්ක්ලින් ඩී. රිචඩ් පත්විය. පුස්තකාලයක් පිහිටුවූ අතර, සමිතියේ නියෝජිතයෝ දේවමාළිගා නියෝග ඉටුකළ යුතු අයගේ නම් සොයමින් ලෝකය මුළුල්ලේම ගියහ. සභාවේ පවුල් ඉතිහාස තොරතුරු දෙපාර්තමේන්තුවක් ඇතිකිරීමට මෙම සමිතිය මගපෙන්වීය.

1894 අප්‍රේල් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, සභාපති වුඩ්රෆ්ට පෙළපත් කටයුතු ගැන එළිදරව්වක් ලැබුන බව ඔහු නිවේදනය කළේය. පසුදවස්වල ශුද්ධවන්තයන් "ඔවුන්ට හැකි තරම් ඔවුන්ගේ පෙළපත් සොයාගැනීම සහ ඔවුන්ගේ පියවරුන්ට සහ මව්වරුන්ට මුද්‍රාවීම දෙවියන්වහන්සේට අවශ්‍ය බව ඔහු ප්‍රකාශ කළේය. ළමයින් ඔවුන්ගේ දෙමාපියන්ට මුද්‍රාවී, ඔබට හැකි තරම් දුරට එම දම්වැල රැගෙන යන්න….මෙය එතුමාගේ ජනතාවට ඇති එතුමාගේ කැමත්තය," යයි ඔහු කීවේය. "තවද ඔබ ඒ ගැන සිත යොමුකරන විට, එය සත්‍ය බව ඔබට වැටගෙනවා ඇත"[8] පසු-දවස්වල ශුද්ධවන්තයන් ඔවුන්ගේ මියගිය මුතුන්මිත්තන්ගේ වාර්තා සොයා ඔවුන් වෙනුවෙන් දේවමාළිගා නියෝග ඉටුකිරීමට ඔවුන්ව තවමත් දිරිගන්වනු ලැබේ.

1850 සිට 1900 දක්වා, බොහෝ සභා සාමාජිකයෝ පෙළපත් දූතමෙහෙයන්වල සේවය කළහ. ඔවුන්ගේ දූතමෙහෙයන්ට ප්‍රධාන අධිකාරීවරයෙකුගෙන් ආශිර්වාදයක් ලබාදීම සඳහා ඔවුන්ව සෝල්ට් ලේක් නගරයට කැඳවන ලදී. ඔවුන්ට ධර්මදූත කාඩ්පතක් සහ පත්වීමේ ලිපියක්ද ලබාදෙන ලදී. ඔවුහු ඥාතීන් බැහැදැක, සොහොන් ගල්වලින් නම් සටහන්කරගෙන, විනාශවී ගිය වාර්තා පවුල් බයිබලවලින් කියවා, දේවමාළිගා කටයුතු කිරීමට අවශ්‍ය වටිනා තොරතුරු රැගෙන ඔවුන්ගේ නිවාසවලට නැවත ගියහ. බොහෝ ධර්මදූතයන් ලැබූ ආත්මික අත්දැකීම්වලට අනුව ස්වාමීන් වහන්සේ ඔවුන් සමග නිතරම සිටිමින්, ඔවුන්ට අවශ්‍යව තිබූ උපකාර ලබාදීම හෝ ඥාතියෙකු වෙතට ඔවුන්ව නිතරම යොමු කළබවට දැඩි විශ්වාසයක්ද ඔවුන්ට තිබින.[9]

## සෝල්ට් ලේක් දේවමාළිගාව කැපකිරීම

සභාපති විල්ෆෝඩ් වුඩ්රෆ් සිය ජීවිතයෙන් වැඩි කාලයක් දේවමාළිගාවේ කටයුතු වෙනුවෙන් කැප කළේය. ශාන්ත ජෝර්ජ් දේවමාළිගාවේ පළවෙනි සභාපතිවරයාවූ අතර, ඔහු මැන්ටි දේවමාළිගාවද කැප කළේය. සෝල්ට් ලේක් දේවමාළිගාවට කොන් ගල තබා දැන් වසර හතළිහක් ගතවී ගොස්ය, සභාපති වුඩ්රෆ් විශාල බලාපොරොත්තුවකින් මෙම භූමියේ දේවමාළිගාව කැපකරන තුරු බලා සිටියේය. කැපකිරීමේ මෙහෙයන් 1893 අප්‍රේල් 6 වෙනිදා සිට මැයි 18 වෙනිදා දක්වා සිදු කළ අතර, 75,000ක පමන ජනතාවක් ඊට සහභාගිවූහ.[10]

අප්‍රේල් 6 වෙනිදා සිදුවූ මූලික කැපකිරීමේ මෙහෙයෙන් පසුව, සභාපති වුඩ්රෆ් සිය ජර්නලයේ මෙසේ ලියුවේයඃ "දෙවියන්වහන්සේගේ ආත්මය සහ බලය අප මත නැවතින. අනාවැකි සහ එළිදරව් ආත්මය අප මතවූ අතර, ජනතාවගේ හදවත් උණුවීමෙන් කාරණා බොහොමයක් අපට එළිදරව් විය."[11] පසු-දවස්වල ශුද්ධවන්තයන් කිහිපදෙනෙක් දේවදූතයන් දුටු අතර, තවත් අය කලින් සිටි සභාවේ සභාපතිවරුන් සහ මියගිය සභා නායකයන් දුටුවෝය.[12]

සභාපති වුඩ්රෆ් ඔහුගේ අනූවෙනි උපන්දිනය සමරන විට, ඔහුට ගරුකිරීම සඳහා දහස් ගණන් ඉරුදින පාසලේ ළමයින්ගෙන් දේවමාළිගා චතුරශ්‍රයේ දේවස්ථානය පිරී ගියේය. ඔහු ගැඹුරු ආත්මික බවකින්, සහ බලවත් ආවේගයකින් බාලයන්ගේ සභාව අමතා කථාකරමින්, ඔහු දසවැනි වියේ සිටියදී ප්‍රොතෙස්තන් ඉරුදින පාසලකට සහභාගිවී ප්‍රේරිතවරුන් සහ අනාගතවක්තෘවරුන් ගැන කියවූ බව කීවේය. ඔහු නිවසට පැමිණි විට, ප්‍රේරිතවරුන් සහ අනාගතවක්තෘවරුන් පොළොව මත සිටිනු තවත් වරක් දැකීම සඳහා ජීවත්වීමට ඔහුට හැකිවේවායි යාච්ඤා කළේය. දැන් ඔහු සිටගෙන සිටින්නේ ප්‍රේරිතවරුන් සහ අනාගතවක්තෘවරුන්වන මිනිසුන් සමීපයේය; ඔහුගේ යාච්ඤාවට කිහිප වරක්ම පිළිතුරු ලැබී ඇත.[13]

වසරකට පසුව 1898 සැප්තැම්බර් 2 වෙනිදා, සභාපති වුඩ්රෆ් ශාන්ත ෆ්‍රැන්සිස්කෝ නගරයේ සිටියදී මියගියේය.

## සභාපති ලොරෙන්සෝ ස්නෝ සහ දසයෙන් කොටස

සභාපති වුඩ්රෆ්ගේ මරණයෙන් පසුව, ලොරෙන්සෝ ස්නෝ, ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සභාපතිවරයා, සභාවේ සභාපතිවරයා බවට පත්විය. ඔහු ඥානවන්ත ආදරණීය නායකයෙක්වූ අතර, ඔහුගේ වගකීම් ගැන හොඳින් සූදානම්ව සිටියේය. ඒ කාලයේ පසු-දවස්වල

ශුද්ධවන්තයන්ගේ සෑම අනාගතවක්තෘවරයෙක්ම ඔහු දැන සිටි අතර ඔහුට උගන්වාද ඇත. 1900 නොවැම්බර් මාසයේදී, දේවස්ථානයේ රැස්වසිටි ශුද්ධවන්තයන් ඇමතූ ඔහු, ජෝසෆ් ස්මිත් සහ ඔහුගේ පවුල ඔහු නිතරම බැහැදැක, ඔහුගේ මේසයේ කෑම ගෙන, ඔහු සමග පුද්ගලික සමූමුබ පරීක්ෂන පැවැත්වූ බවත් කීවේය. ජෝසෆ් ස්මිත් දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවයෙකු බව ඔහු දැනසිටියේ, ස්වාමීන්වහන්සේ එම සත්‍යය "වඩාත් පැහැදිළිව සහ සම්පූර්ණයෙන්ම"[14] ඔහුට පෙන්වා තිබුන නිසාය.

සභාපති ස්නෝගේ පරිපාලන කාලය තුලදී, ප්‍රාන්ත ආණ්ඩුව බහු විවාහයට විරුද්ධව ගෙන ආ නීතියක් නිසා සභාව උග්‍ර මුදල් හිඟයකට මුහුණ පා තිබින. සභාව දුර්වලකළ ණය බරින් එය නිදහස්කරගන්නේ කෙසේදැයි සිතමින් සභාපති ස්නෝ උපදෙස් පතා යාච්ඤා කළේය. 1899 අප්‍රේල් ප්‍රධාන සම්මන්ත්‍රනයෙන් පසුව, යූටා, සාන්ත ජෝර්ජ් බලා යාමට ඔහුට තද හැඟීමක් ඇතිවිය. එහි රැස්වීමක් අමතමින් සිටියදී ටික වේලා-වක් නිහඬව සිටි ඔහු, නැවතත් කථාකරමින්, ඔහුට එළිදරව්වක් ලැබුනු බව කීවේය. සභාවේ ජනතාව දසයෙන් කොටසේ නීතිය නොසලකාහැර ඇත, සභා සාමාජිකයන් වඩාත් ඇදහිලිමත්ව සම්පූර්ණ දසයෙන් කොටස ගෙවන්නේ නම්, ඔවුන් මත ආශිර්වාද වගුරුවන බව ස්වාමීන්වහන්සේ ඔහුට කියා ඇත.

දසයෙන් කොටසේ වැදගත්කම ගැන අනාගතවක්තෘවරයා යූටා නගරය මුළුල්ලේම සභාවලට දේශනා කළේය. ශුද්ධවන්තයෝ ඔහුගේ උපදේශයට කීකරුවී, එම වසරේදී පසුගිය වසරට වඩා දෙගුණයක් දසයෙන් කොටස ගෙවූහ. 1907 වන විට, සභාවට ප්‍රමාණවත් අරමුදල් තිබුන බැවින් සියලුම ණය හිමියන්ට මුදල් ගෙවා ණයබරින් නිදහස්විය.

1898 දී, තරුණ කාන්තාවන්ගේ අන්‍යොන්‍ය වර්ධන සමිතියේ ප්‍රධාන මණ්ඩලයේ පිළිගැනීමේ උස්සවයකදී, සභාපති ජෝර්ජ් කිව්. කැනන් නිවේදනයක් කරමින්, "අප අතර සිටින ඥානවන්ත කාන්තාවන් කිහිපදෙ-දනෙක් දූතමෙහෙය ක්ෂේත්‍රයට කැඳවීමට"[15] පළවෙනි සභාපතිත්වය තීර-ණයකට එළඹ ඇති බව කීවේය. මේ කාලයට පෙර, සොහොයුරියන් කිහිපදෙනෙක් ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් සමග දූතමෙහෙයන්ට ගොස් ඇත, නමුත් ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මදූත නියෝජිතව-රියන් ලෙස සොහොයුරියන් කැඳවා වෙන් කළ ප්‍රථම අවස්ථාව මෙය විය. සොහොයුරියන්ට දූතමෙහෙයන්වල සේවයකිරීමේ රාජකාරි නොතිබූ පසුගිය දශකයේදී, දහස්ගණන් මෙම වරප්‍රසාදය ලබාගෙන, පූර්ණ-කාලීන ධර්මදූතියන් ලෙස නිර්භීතව ස්වාමීන්වහන්සේට සේවය කර ඇත.

සභාපති ලොරෙන්සෝ ස්නෝ විසිවෙනි ශතවර්ෂය දක්වා සභාව මෙහෙයවීය. අලුත් ශතවර්ශයේ මූලාරම්භය වන විට, සභාව සතුව ස්ටේක් 43ක්ද, දූතමෙහෙයන් 20ක් සහ කොට්ඨාශ සහ ශාඛා 967ක් තිබින. සාමාජිකයන් 283,765ක් සිටි අතර. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් වාසය කලේ අමෙරිකා එක්සත් ජනපදයේ රොකී කඳුකරයේය. දේවමාළිගා හතරක් ක්‍රියාත්මකව තිබුන අතර, *ජුවෙනිල් උපදේශකවරයා, ඉම්පෲව්මන්ට් ඒරා,* සහ *තරුණ කාන්තා ජර්නලයේ* සභාව සහ එහි සාමාජිකයන් ගැන ලිපි ඇතුළත්ය. කටකතාවලින් කියවුනේ අඩු වශයෙන් එක් අලුත් දූතමෙහෙයක් හෝ ආරම්භවිය යුතු බවය, ඊළඟ වසර සියය තුලදී ලැබෙන දෙය ගැන පසු-දවස්වල ශුද්ධවන්තයන්ට යාන්තම් සිතාගත හැකිවිය. එහෙත් සභාවේ ගමනාන්තය ගැන කී අනාවැකි ඉටුවන බවට ඔවුන්ට විශ්වාසයක් තිබුනි.

# ව්‍යාප්තවන සභාව

වර්ධනයවන සභාවේ 1901 සිට 1970 දක්වා, ජෝසෆ් එෆ්. ස්මිත්, හීබර් ජේ. ග්‍රාන්ට්, ජෝර්ජ් ඇල්බට් ස්මිත්, සහ ඩේවිඩ් ඕ. මැකේ නම්—අනාගතවක්තෘවරු හතරදෙනෙක් මූලාසනය දැරූහ. අශ්වයන්ගෙන් සහ කරත්තවලින් ප්‍රවාහනය කිරීමේ සිට රොකට්වලින් අභ්‍යාවකාශයට ගමන්-කිරීමද මෙම සභාපතිවරු දැක ඇත. ලෝක යුද්ධ දෙකකින් සහ සමස්ත ලෝක වෙළඳ පරිහානියකින්ද ශුද්ධවන්තයන්ට අභියෝග එල්ලවිය. මෙම කාලයේදී, දේවමාළිගා නවයක් ගොඩනැගින. 1901දී, ස්ටේක 50ක 300,000ක් සාමාජිකයෝ සිටි අතර, 1970 වන විට, සාමාජිකයෝ 2,800,000ක් ලෝකය මුළුල්ලේම ස්ටේක 500කට එක්රැස්වූහ.

**සභාපති ජෝසෆ් එෆ්. ස්මිත්**

ජෝසෆ් එෆ්. ස්මිත් උපත ලැබුවේ, මිසූරියේ හිංසා පීඩාවල උච්චතම අවස්ථාවක, ෆා වෙස්ට්වල දේවමාළිගාව අසල කුඩා කාමරයකය. ජෝසෆ් ඉපදුන කාලයේ, ඔහුගේ පියා, හයිරම් ස්මිත්, මිසූරියේ, රිච්මන්ඩ්වල, සිරගතවී සිටි අතර, ඔහුගේ මව, මේරි ෆීල්ඩින් ස්මිත් හුදකලාවම ඇයගේ ළමයින් බලාගෙන සිටියාය.

තරුණ ජෝසෆ් ඔහුගේ පවුල සමග මිසූරු සිට ඉලිනොයිස්, නාවූ නගරයට පදිංචියට ගිය විට, එහි සිදුවූ සිද්ධීන්වූ ඔහුගේ පියාව සහ මාමාව කාර්තේජ් සිරගෙදරදී මරාදැමීම—ඔහුගේ ජීවිතයේ ඉතිරි කාලයේදී ඔහුගේ මතකයේ තිබින. ඔහුගේ පියා කාර්තේජ් බලා යන අතර, අශ්ව-යාගේ පිට උඩ සිට, අන්තිම වරට. ඔහුගේ පුතාව ඔසවාගෙන, ඔහුව සිඹ, නැවත බිම තැබීම ඔහුට කිසිදාක අමතක නොවේ. අසල්වැසියෙකු රාත්‍රියේදී ජනේලයට තට්ටුකර හයිරම් මරාදැමා ඇති බව කියන භයානක ප්‍රවෘත්තය ඇසීමද ඔහුට අමතක නොවේ. ඔහුගේ පියා සහ මාමා නාවූ මැන්සන් ශාලාවේ මිණී පෙට්ටිවල සැතපී සිටීම ඔහුගේ මතකයෙන් කිසිදා බොඳ නොවේ.

ජෝසෆ් පිරිමි ළමයා එක් රාත්‍රියක් තුළදී මිනිසෙක් බවට පත්විය. මේරි ෆීල්ඩින් ස්මිත් සහ ඇයගේ පවුල නාවු සිට නික්මයාමට සම්බන්ධවූ විට, ඇයගේ එක් කරත්තයක කණ්ඩායම් නායකයා වූයේ 7 හැවිරිදි ජෝසෆ්ය. ඔහුගේ මව මියයන විට ජෝසෆ්ට වයස 13කි. අනාථයෙක්වූ ඔහු, වයස 16 වීමට පෙර, (පසුව හවායි දූපත් ලෙස හැඳින්වූ) සැන්විච් දූපත්වලට දූතමෙහෙයක් ගියේය. හොනලුලු වලට ලඟාවී මාස තුනක් තුළදී, ඔහු ස්වදේශීය භාෂාව දක්ෂ ලෙස කථා කළේය. වැඩිහිටි පාර්ලි පී. ප්‍රැට් විසින් ආත්මික දීමනාවක් ඔහුට දානයකළ අතර, දොළොස්දෙනාගේ ඔරසන් හයිඩ් ඔහුව තනතුරකට වෙන් කළේය. ඔහුට අවුරුදු 21ක් වන විට, ඔහු තවත් දූතමෙහෙයකට ගිය අතර, මේ වතාවේ බ්‍රිතාන්‍ය දූපත්වලට අවුරුදු තුනක් සඳහාය.

සභාපති බ්‍රිගම් යන්ග් ඔහුව ප්‍රේරිතයෙකු ලෙස පත්කරන විට ජෝසෆ්ගේ වයස අවුරුදු 28ක් පමණකි. ඊට පසු වසරවලදී ඔහු සභාපතිවරුන් හතරදෙනෙකුගේ උපදේශකයෙකු ලෙස සේවය කළේය. 1901 ඔක්තෝබර් මාසයේදී ලොරෙන්සෝ ස්නෝ මියගිය විට, ජෝසෆ් එෆ්. ස්මිත් සභාවේ හතරවෙනි සභාපතිවරයා බවට පත්විය. සුභාරංචි සත්‍යයන් විස්තරකර ආරක්ෂාකිරීමට තිබූ හැකියාව ගැන ඔහු මනා ප්‍රසිද්ධියක් ඉසිලීය. ඔහුගේ දේශනා සහ ලියවිලි *සුභාරංචි දහම* නමින් පොතක් ලෙස සම්පාදනයවූ අතර, එය සභාවේ වැදගත් දහම් පොතක් බවට පත්විය.

විසිවෙනි ශතවර්ෂයේ ආරම්භක දසකවලදී, සභාව වැදගත් මාර්ග කිහිපයකින් ඉදිරියට ගියේය. දසයෙන් කොටස නිරන්තර අවධාරනය කිරීම් සහ ශුද්ධවන්තයන්ගේ ඇදහිලිමත් ප්‍රතිචාරවලින්, සභාවට එහි සියලුම ණය ගෙවා දැමීමට හැකිවිය. එයින් පසුව සමෘධිමත් කාලයක් ඇතිවීමෙන්, දේවමාළිගා, දේවස්ථාන සහ ආගන්තුක මධ්‍යස්ථාන ගොඩනැගීමට සහ සභාවේ ඓතිහාසික ස්ථාන මිළදීගැනීමටත් සභාවට හැකියාව ලැබින. සෝල්ට් ලේක් නගරයේ පරිපාලන ගොඩනැගිල්ලක්ද සභාව ගොඩ නැගූ අතර, එය තවමත් එහි ප්‍රධාන කාර්‍යාලය ලෙස ක්‍රියාත්මක වෙයි.

ලෝකය මුළුල්ලේම දේවමාළිගාවල අවශ්‍යතාවය ගැන සභාපති ස්මිත් හඳුනාගෙන සිටියේය. 1906 ස්විස්සර්ලන්තයේ බර්න්, සම්මන්ත්‍රනයේදී, ඔහු තම අත දිගුකොට, මෙසේ ප්‍රකාශ කළේය, "මෙම දේශය දේවමාළිගාවලින් පිරවීමට කාලය පැමිණෙනු ඇත, ඔබට එහි ගොස් ඔබගේ මියගිය අය මුදවාගැනීමට හැකිය."[1] පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ පළවෙනි යුරෝපා දේවමාළිගාවවූ, ස්විස් දේවමාළිගාව, ශතවර්ෂ භාගයකට පමණ පසුව, නගරයෙන් පිටත සභාපති ස්මිත් අනාවැකි කී

ස්ථානයේදී කැප කෙරින. සභාපති ස්මිත් 1931දී, දේවමාළිගාවක් සඳහා කාඩ්සන්, ඇල්බටා, කැනඩාවේ භූමියද, 1915දී හවායි දූපතද දේවමාළිගා-වක් සඳහා කැප කළේය.

1900 වර්ෂය ආරම්යේ සිටම, ශුද්ධවන්තයන් යූටා නගරයට එකතුවීම වෙනුවට ඔවුන්ගේම භූමිවල සිටීමට සභා නායකයෝ ඔවුන්ව දිරිමත් කලහ. ජෝසෆ් එෆ්. ස්මිත් සහ පළවෙනි සභාපතිත්වයේ ඔහුගේ උපදේ-ශකයෝ 1911දී මෙම ප්‍රකාශය නිකුත්කළහඃ "අපගේ ජනතාව ඔවුන්ගේම උපන් දේශවලම සිටිමින් හරවාගැනීම් කටයුතු වලට ආධාරකිරීමට ස්ථිර පිරිසක් නිර්මාණයකිරීම යෝග්‍යවේ."[2]

සභාපති ස්මිත් මියයාමට සති හයකට පෙර, මියගිය අය මුදවාගැනීම ගැන එළිදරව්වක් ඔහුට ලැබින. ආත්මික ලෝකයේ ගැලවුම්කරුවාණන්ගේ මෙහෙය ඔහු දර්ශනයකින් දැක, ඇදහිලිමත් ශුද්ධවන්තයන්ට ආත්මික ලෝකයේ සුභාරංචිය දිගටම ඉගැන්වීමේ අවස්ථාව ඇති බව දැනගත්-තේය. මෙම එළිදරව්ව 1976දී අනගි මුතු ඇටයට එකතුකරන ලද අතර, 1979දී දහම සහ ගිවිසුමේ 138 වෙනි කොටසට මාරුකරන ලදී.

### සභාපති හීබර් ජේ. ග්‍රාන්ට්

1918 ඔහු මියයාමට කෙටි කලකට පෙර, සභාපති ජෝසෆ් එෆ්. ස්මිත්, එවකට දොළොස්දෙනාගේ සභාපතිවරයාව සිටි, හීබර් ජේ. ග්‍රාන්ට්ගේ අත ගෙන මෙසේ කීවේයඃ "ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරනසේක, මා දරුව, ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරනසේක, ඔබට විශාල වගකී-මක් තිබේ. මෙය ස්වාමීන්වහන්සේගේ වැඩක් මිස, මිනිසාගේ වැඩක් නොවන බව නිතරම මතකතබාගන්න. ස්වාමීන්වහන්සේ කිසිදු මිනිසෙ-කුට වඩා ශ්‍රේෂ්ඨය. කිසිදු වරදක් නොකර, එතුමාගේ සභාව මෙහෙය-වීමට එතුමාට අවශ්‍ය කවරෙක්දැයි එතුමා දන්නාසේක."[3] හීබර් ජේ. ග්‍රාන්ට්, 1882 සිට ප්‍රේරිතවරයෙක් ලෙස සේවයකර, වයස 62 දී සභාවේ හත්වෙනි සභාපතිවරයා බවට පත්විය.

තරුණයෙක් ලෙස සහ තම මුළු ජීවිත කාලයේම, හීබර් ඔහුගේ ඉලක්කය ඉටුකරගැනීම සඳහා අසාමාන්‍ය අධිෂ්ඨානයක් පෙන්නුවේය. වැන්දඹු මවක් හදාවඩාගත් එකම දරුවා ලෙස, ඔහුගේ සම වයසේ පිරිමි ළමුන්ගේ ක්‍රියාකාරකම්වලදී යම් කොන්කිරීමක් ලැබුවේය. බේස්බෝල් කණ්ඩායමට එක්වීමට ඔහු උත්සාහකළ විට, ඔහුගේ නොගැලපීම සහ අදක්ෂකම නිසා ඔහුට සරදම්කර කණ්ඩායමේ සාමාජිකයෙක් ලෙස පිළි නොගැනින. අධෛර්‍යයමත්වනු වෙනුවට, ඔහු නොකඩවාම බෝලය

වීසිකිරීමට පැය ගණන් ගත කොට පුහුණුවී, අවසානයේ වෙනත් කණ්ඩායමක සාමාජිකයෙක් බවට පත්වී ප්‍රාදේශීය ශුරතා කිහිපයක්ම දිනාගත්තේය.

පිරිමි ළමයෙක් ලෙස ඔහු සපත්තු ඔපදැමීම කල අතර පොත් තබන්නෙක් වුවහොත් ඊට වඩා වැඩි මුදලක් ලැබෙන බව ඔහු දැනගත්-තේය. ඒ දවස්වල, පොත් තබන්නෙකුට අත් අකුරු ලක්ෂණට ලිවීම අවශ්‍යතාවයක්වූ නමුත්, ඔහුගේ අත් අකුරු එතරම් හොඳ නොවූ නිසා ඔහුගේ මිතුරන් දෙදෙනෙක් කීවේ ඒවා කුකුල් අඩි වාගේ කියාය. එවරත් ඔහු අධෛර්‍යය නොවී, අත් අකරු ලිවීම පුහුණුවිය. ලක්ෂණට ලිවීම ගැන ඔහු ප්‍රසිද්ධියට පත්ව, අවසානයේදී විශ්වවිද්‍යාලයක අත් අකුරු ලිවීම ගැන උගන්වා, වැදගත් ලිපි ලිවීමේ සඳහා නිතරම ඔහුට කැඳවීම් ලැබින. ස්වාමීන්වහන්සේට සහ ඔහුගේ සහෝදර ජනතාවට හැකි පමණ හොඳින් සේවය කිරීමට ඇති ඔහුගේ අධිෂ්ඨානය දුටු අයට ඔහු විශාල ආදර්ශයක් විය.

ඥානවන්ත සාර්ථක ව්‍යාපාරිකයෙක්වූ සභාපති ග්‍රාන්ට්ගේ හැකියාවන් එකල ලෝකයේ තිබූ මූල්‍ය අවපාතය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ පුද්ගලික ප්‍රශ්න තුලින් සභාව මෙහෙයවීමට ඔහුට උපකාරවත් විය. රජය ගැන නොව, ස්වයං-ශක්තිය සහ ස්වාමීන්වහන්සේ තුල විශ්වාසය තැබීම සහ වෙහෙසවී වැඩකිරීම ගැන ඔහු දැඩි ලෙස විශ්වාස කළේය. ඔහු උපයාගත් මුදල්වලින් බොහෝ අවශ්‍යතා ඇති අයට ඔහු ආශිර්වාද කළේය.

1900 ගණනවලදී ශුද්ධවන්තයෝ, ලෝකයේ වෙනත් බොහෝ අය මෙන්, විශාල අවපාතයක් තිබූ සමයේ විරැකියාවෙන් සහ දිළිඳුකමින් පීඩා වින්දාහ. 1936 දී, ස්වාමීන්වහන්සේගේ එළිදරව්වක ප්‍රතිඵලයක් ලෙස, සභාපති ග්‍රාන්ට් සභාවේ සුභසාධන වැඩසටහන පිහිටුවා, අවශ්‍යතා ඇති අයට උදව්කිරීමට සහ සාමාජිකයන් සියල්ලන්ටම ස්වයං-ශක්තිය ලැබීමට උදව් කළේය. මෙම වැඩසටහන ගැන පළවෙනි සභාපතිත්වය මෙසේ කීවේය: "අපගේ මූලික අරමුණ මෙය සකස් කිරීමය, එය ට තවදුරටත් හැකියාවක් ඇත, මෙම ක්‍රමය අනුව කම්මැලිකමේ ශාපය ඉවත්ව යනු ඇත. නපුර අවලංගුවෙන අතර නිදහස, කාර්‍යක්ෂම බව, අරපරෙස්සම සහ ආත්ම ගරුත්වය අප ජනතාව අතර තවත් වරක් පිහිටුවනු ලැබීය. සභාවේ ඉලක්කය වන්නේ තමන්ටම උපකාරවත්වීමට උපකාරකිරීමය. මෙම වැඩකටයුතු අපගේ සභා සාමාජිකත්වයේ ජීවිත පාලනයකරන මූලධර්මයක් ලෙස නැවත කිරුළු පළඳිනු ඇත."[4]



*අවශ්‍යතා ඇති අයට උපකාරකිරීම සඳහා සභාව සුභසාධන ගොවිපළවල් පිහිටුවීය. 1933 සිට බීට් සීනි ගොවිපළවල වැඩකරමින් ශුද්ධවන්තයන් පෙන්වාදුන් ලෙස, සභා සාමාජිකයෝ ඔවුන්ගේ සේවයෙන් දායකවූහ.*

වසර 28ක් පළවෙනි සභාපතිත්වයේ උපදේශකයෙකු ලෙස සේවය කළ සභාපති ජේ. රූබන් ක්ලාක් මෙසේ අවධාරණය කළේය, "සුභසාධන සැලසුමේ දීර්ඝ කාලීන සැබෑ අරමුණ නම්, සභා සාමජිකයන්ගේ ගුණාංග ගොඩනගා දෙන්නන් සහ ලබන්නන් කර, ඔවුන්ගේ ඇතුළාන්තයේ ගැඹුරේ ඇති හොඳම දෙය ආරක්ෂාකර, ආත්මයේ සාරවත්ම අප්‍රකට කොටසේ සාරය ගලායාමට සැලැස්සීමය."[5]

සභාවේ සුභසාධන කටයුතු සොයා බැලීම සඳහා 1936දී සුභසාධන ප්‍රධාන කොමිටියක් පිහිටුවන ලදී. හැරල්ඩ් බී. ලී, පයනියර් ස්ටේකයේ සභාපතිවරයා, කොමිටියේ කළමනාකාර අධ්‍යක්ෂකවරයා කරන ලදී. පසුව, විරැකියාවෙන් සහ ආබාධවලින් පෙළෙන අයට උපකාරකිරීම සඳහා ඩෙසරට් ඉන්ඩස්ට්‍රීස් ගබඩාව සංවර්ධනය කර, අවශ්‍යතා ඇති අයට උපකාරකිරීම සඳහා ගොවිපළ සහ නිෂ්පාදන ව්‍යාපෘති පිහිටුවන ලදී. සුභසාධන වැඩසටහන වර්තමානයේදී දහස්ගණන් සභා සාමාජික-යන්ට සහ ලෝකය මුළුල්ලේම අසරණ තත්වයට පත් ජනතාවට ආශිර්-වාද කිරීම සඳහා දිගටම ක්‍රියාත්මකවේ.[6]

ධර්මදූත කටයුතු දිගටම වේගයෙන් පැතිර යද්දී, සභාපති ග්‍රාන්ට් බොහෝ අසාමාන්‍ය පරිවර්තනයක මෙවලමක් විය. ඉතාලි ජාතික ආගමික දේශකයෙක්වූ, වින්සෙන්සෝ ඩි ප්‍රැන්සෙස්කා, නිව්යෝර්ක් නගරයේ වීථියක ඔහුගේ සභාව දෙසට ඇවිදයන විට අළුවලින් පිරුණු බැරලයක කවරයක් නැති පොතක් තිබෙනු ඔහු දුටුවේය. ඔහු පොත අහුලා ගෙන, පිටු පෙරලා, පළමු වතාවට, නිෆායි, මොසායා, ඇල්මා, සහ මොරෝනි යන නම් දුටුවේය. එහි නම සහ ආරම්භය සහ එහි සත්‍යතාවය ගැන යාච්ඤාකිරීමට ඔහු නොදැන සිටියද, පොත කියවීමට ඔහුට පෙළඹවීමක් ඇතිවිය. ඔහු එසේ කළ විට, "යම් වටිනා අපූර්ව දෙයක් සොයාගැනීමේ ප්‍රීතියක හැඟීමක් ඇතිවී, මගේ ආත්මයට සැනසීමක් ලබාදී, මට ඇතිවූ සතුට විස්තරකිරීමට වචන මනුෂ්‍ය භාෂාවක සොයාගැනීමට නොහැකිය"යි කීවේය. ඔහු එම පොතේ මූලධර්ම ඔහුගේ සභා සාමාජිකයන්ට ඉගැන්වීමට පටන්ගත්තේය. ඔහුගේ සභා නායකයෝ එසේ කිරීම ගැන ඔහුට තරවටුකර, පොත පිළිස්සීමට පවා ඔහුව මෙහෙයවූ නමුත්, එය ඔහු ප්‍රතික්ෂේප කළේය.

පසුව ඔහු නැවත ඉතාලියට ගොස්, එම පොත යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසින් ප්‍රසිද්ධකල බව 1930 දී ඔහු දැනගත්තේය. ඔහු යුටා, සභාවට ලිපියක් ලියූ අතර, එය සභාපති ග්‍රාන්ට්ට ඉදිරිපත් කෙරින. සභාපති ග්‍රාන්ට් මෝර්මන්ගේ පොතේ ඉතාලි පිටපතක් ඔහුට යවා, යුරෝපා දූතමෙහෙයේ සභාපතිවරයාට ඔහුගේ නම දුන්නේය. යුද්ධකාලයේ අසීරුතා නිසා වසර ගණනාවක්ම වින්සෙන්සෝගේ බව්තීස්මය වැළැක්වූ නමුත්, 1951 ජනවාර් 18වෙනිදා, සභාවේ සමාජිකයෙකු වීමට අවසානයේදී ඔහුට හැකියාව ලැබී, සිසිලි දූපත්වල බව්තීස්මවූ පළවෙනි පුද්ගලයාද විය. වසර පහකට පසුව ස්විස් දේවමාළිගාවේදී ඔහු එන්ඩව්විය.[7]

1922 මැයි 6වෙනිදා සභාපති ග්‍රාන්ට් සභාවේ පළවෙනි ගුවන්විදුලි මධ්‍යස්ථානය කැප කළේය. වසර දෙකකට පසුව සැසිවාර විසුරුවාහැරීමට මධ්‍යස්ථානයට පටන්ගත් අතර, එමගින් බොහෝ සාමාජිකයන්ට ප්‍රධාන අධිකාරියේ පණිවුඩ ඇසීමට ඉඩ ලැබින. ඉන්පසුව වැඩි කල් නොගොස්ම, 1929 ජූලි මාසයේදී, දේවස්ථාන සංගීත කණ්ඩායම සතිපතා වැඩසටහනක්වූ, *සංගීතය සහ කථාකරන වචන* නම්, ආනුභාමත් සංගීතය සහ කථාකරන පණිවුඩය ගුවනින් යැවීය. මෙම විකාශනය වර්තමානයේදීද හැම සතියකම දිගටම විකාශනයවේ.

සභාපති ග්‍රාන්ට් 1945 මැයි 12 වෙනිදා මියගියේය. සභාවේ සභාපති ලෙස ඔහුගේ 27 වසරක සේවා කාලය ඉක්මවා ගියේ බ්‍රිගම් යන්ගේ වසරවල සේවා කාලය මගින් පමණය.

**සභාපති ජෝර්ජ් ඇල්බර්ග් ස්මිත්**

ජෝර්ජ් ඇල්බට් ස්මිත් සභාපති හීබර් ජේ. ග්‍රාන්ට් වෙනුවට පත්විය. සභාපති ස්මිත්, සුභාරංචි අනුව ජීවත්වී සතුට ලැබූ ජීවිතයක ආදර්ශයකි, ඔහු මෙසේ සහතික කරයිඃ "සෑම සතුටක් සහ සෑම ප්‍රීතියක්ම ලැබීමට සුදුසුවූ නාමය, දෙවියන්වහන්සේගේ පණත් රැකීමෙන් සහ එතුමාගේ අවවාද සහ උපදෙස් පිළිපැදීමේ ප්‍රතිඵලයකි."[8]

දෙවියන්වහන්සේගේ පණත්වලට සහ සභා නායකයන්ගේ උපදෙස්වලට කීකරුවීම සභාපති ස්මිත්ගේ පවුලට සහ පරම්පරාවටලටද ධර්මිෂ්ඨතාවයේ මෝස්තරයක් විය. ඔහුව ඔහුගේ පිය පාර්ශවයේ සීයාවූ, ජෝර්ජ් ඒ. ස්මිත් අනුව නම්කල අතර, ඔහු අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ගේ ඥාති පුත්‍රයෙක් සහ සභාපති බ්‍රිගම් යන්ගේ උපදේශකවරයෙක්ද විය. ජෝර්ජ් ඇල්බට්ගේ පියා, ජෝන් හෙන්රි ස්මිත්, ජෝසෆ් එෆ්. ස්මිත් යටතේ පළවෙනි සභාපතිත්වයේ සේවය කළේය. ජෝර්ජ් ඇල්බට් ස්මිත්ගේ වයස අවුරුදු 33 දී, දොළොස්දෙනාගේ ගණපූර්ණයට ඔහුට කැඳවීමක් ලැබිනි. 1903 සිට 1910 දක්වා, ජෝන් හෙන්රි සහ ජෝර්ජ් ඇල්බට් දෙදෙනාම දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සේවය කළ අතර, එය මෙම කාලපරිච්ඡේදයේ පියෙක් සහ පුතෙක් ගණපූර්ණයේ එකට සේවය කළ අවස්ථාවක්ද වේ.

ජෝර්ජ් ඇල්බට් ස්මිත්ගේ දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වසර 42 කාලය දුර්වල සෞඛ්‍යය තත්වයක් යටතේ වුවද, උදාර සේවයෙන් පිරී ඇත. දකුණුදිග යුටාහි දුම්රිය පාරක් පරීක්ෂාකරමින් සිටියදී ඔහුගේ ඇස් හිරු එළියෙන් හානියට පත්විය. අන්ධභාවයට පත්වීම වැළැක්වීමට ශල්‍යකර්මයට නොහැකිවිය. ඔහුගේ කාලයේ ඇතිවූ බලපෑම් සහ අභියෝගයන් අධිකවීම නිසා ඔහුගේ සිහින් ශරීරය දුර්වලවී 1909දී ඔහු අධික වෙහෙසින් ඇදවැටින. සම්පූර්ණ විවේකයන් ලබාගැනීමට වෛද්‍යවරුන් නියමකිරීමෙන්, ඔහුගේ ආත්ම-විශ්වාසය දියවී ගොස්, නුසුදුසු කමේ හැඟීම් ඔහු තුල ඇතිවී නොරිස්සුම් බව උග්‍රවිය.

මෙම අසීරු කාලයේදී, විශාල විලක් අසල ලක්ෂණ වනාන්තරයක් ඔහු සිහියකින් දුටුවේය. යම් දුරක් ඔහු වනානා්තරය තුල ගමන්කිරීමෙන් පසුව, ඔහු ඉදිරියට එන ඔහුගේ ආදරණීය සීයා, ජෝර්ජ් ඒ. ස්මිත්ව ඔහු

හඳුනාගත්තේය. ජෝර්ජ් ඉක්මන් ගමනින් ඉදිරියට ගිය මුත්, ඔහුගේ සීයා ලඟටම පැමිණ, නැවතී, "මගේ නාමයෙන් ඔබ කල දේවල් දැනගැනීමට මට අවශ්‍යයයි" කීවේය. සිය මුළු ජීවිතයම සිහිපත්කල ජෝර්ජ් නිහතමානීව මෙසේ කීවේය, "ඔබට ලජ්ජා සිතෙන කිසිවක් මම ඔබගේ නාමයෙන් නොකළෙමි." මෙම සිහනයෙන් ඔහුගේ ආත්මික සහ ශාරීරික ශක්තිය අලුත්වී, ඉක්මණින්ම නැවත වැඩකිරීමට ඔහුට හැකියාව ලැබින. මෙම අත්දැකීම පසුව ඔහු නිතර විස්තර කළේ ඔහුගේ ජීවිතය වෙනස්වූ ප්‍රධාන මොහොතක් ලෙසය.[9]

1945 සිට 1951 දක්වාවූ, සභාපති ජෝර්ජ් ඇල්බට් ස්මිත්ගේ පරිපාලනය තුලදී, සභාවේ සාමාජික සංඛ්‍යාව දස ලක්ෂය දක්වා වැඩිවිය; අයිඩහෝ ෆෝල්ස්, අයිඩහෝ, දේවමාළිගා කැපකරන ලදී; තවද ධර්මදූත කටයුතුද II. වෙනිලෝක යුද්ධයෙන් පසුව නැවත ක්‍රියාත්මක විය.

එසේම, යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස අසරණවූ යුරෝපයේ ශුද්ධවන්තයන් සඳහා සහන කටයුතු සංවිධානයවිය. ඇඳුම් සහ වෙනත් භාණ්ඩවලින් ආධාරකිරීමට එක්සත් ජනපදයේ සභා සාමාජිකයන් දිරිගන්වනු ලැබීය. සභාපති ස්මිත්, එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා හමුවී එකතුකල ආහාර, ඇඳුම් සහ ඇඳ රෙදි යුරෝපයට යැවීමට අවසර ඉල්ලුවේය. එම හමුව සභාපති ස්මිත් මෙසේ විස්තර කළේයඃ

ජනාධිපති ට්‍රෑමන් මෙසේ කීවේයඃ "'ඔබ එහි බඩු නැව්ගතකරන්නේ කුමක් සඳහාද? ඔවුන්ගේ මුදල්වල එතරම් වටිනාමක් නැහැනේද.'

"මම මෙසේ කීවෙමි, 'අපට ඔවුන්ගේ මුදල් අවශ්‍ය නැහැ.' මා දෙස බැලූ ඔහු මෙසේ ඇසීයඃ 'ඔබ කියන්නේ ඔබ ඒවා ඔවුන්ට දෙන බවද?'

"මම මෙසේ කීවෙමිඃ 'ඇත්ත වශයෙන්ම අපි ඒවා ඔවුන්ට දෙන්නෙමු. ඔවුන් විපතට පත්ව සිටින අපගේ සොයුරු සොයුරියන් වන අතර, අපට රජයේ සහයෝගය ලැබුනොත්, අපි ඒවා සතුටින් යවන්නෙමු.'

"ඔහු මෙසේ කීවේයඃ 'ඔබ සිටින්නේ හරි මාර්ගයේය,' කියා, 'අපට හැකි ඕනෑම අන්දමින් අපි සතුටින් උදව්කරන්නෙමු'"[10] යයිද කීවේය.

යුටා නගරයේදී පරිත්‍යාග තෝරා විදේශයට යැවීමට මිටි බඳින විට, කටයුතු නිරීක්ෂණය කිරීමට සභාපති ස්මිත් පැමිණියේය. ඉතා නිර්ලෝභීව පරිත්‍යාගකර තිබූ බඩු මුට්ටු විශාල ප්‍රමාණය දුටු ඔහුට කඳුළු වැගිරින. මිනිත්තු කිහිපයකට පසුව තම අළුත් කබාය ගැලවූ ඔහු "කරුණාකර මෙයත් නැව්ගත කරන්න" යයි කීවේය. එම ශීතල දිනයේ කබාය ඔහුට තිබිය යුතු බව ඒ අසල සිටි අය කිහිප දෙනෙක් ඔහුට පැවසුවද, එය යැවිය යුතු බව ඔහු එකහෙලාම කීවේය.[11]

යුරෝපගේ දූතමෙහෙයන් ආරම්භකර, සහන සේවා බෙදාහැරීම ගැන සොයාබලා, ශුද්ධවන්තයන්ගේ ආත්මික අවශ්‍යතාවයන්ද මෙහෙයවීම සඳහා දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි එස්රා ටැෆ්ට් බෙන්සන්ව පත්කරන ලදී. රයින් ගංගාව අසබඩ කාල්ස්රුහේ ජර්මන් නගරයට ශුද්ධ-වන්තයන්ගේ සම්මන්ත්‍රනයකට වැඩිහිටි බෙන්සන් කලින් ගොස් තිබිනි. මෙම අත්දැකීම ගැන වැඩිහිටි බෙන්සන් මෙසේ කීවේයඃ

"අපි අවසානයේදී කොටසක් බෝම්බ-දමා තිබූ, ගොඩනැගිල්ලේ ඇතුළත පිහිටි රැස්වීම් ස්ථානයට යන මාර්ගය සොයාගත්තෙමු. සැසිවා-රයේ සිටි ශුද්ධවන්තයෝ අපව බලාපොරොත්තුවෙන් පැය දෙකක් පමණ බලා සිට ඇත්තේ අප සම්මන්ත්‍රනයට සහභාගිවන පණිවුඩය ඔවුන්ට ලැබූ තිබූ නිසාය. තවද ඉන්පසුව අප වේදිකාව මතට ගමන්කරන විට මගේ ජීවිතයේ ප්‍රථම වතාවට මුළු සභාවක් හඬමින් සිටිනු මම දුටුවෙමි. වසර හයකට හෝ හතක දීර්ඝ කාලයකට පසුව, ඔවුන් හඳුන්වන, සයෝනයේ නියෝජිතයන් අවසානයේදී ඔවුන් වෙත පැමිණ ඇති බව ඔවුන්ට අවබෝධවිය....ඔවුන්ගේ ඉහළට එසවුන, සුදුමැලිවූ, මැලවුනු මුහුණු දෙස මම බැලුවෙමි, මෙම ශුද්ධවන්තයන් බොහෝ දෙනෙක් හැඳ සිටියේ වැරහැලිය, සමහරෙක් සිටියේ පා වහන් නොැමැතිවය. ඔවුන් මෙම පසු-දවස්වල වැඩකටයුතුවල දිව්‍යමය භාවය ගැන සාක්ෂිදරමින්, ස්වාමීන්වහන්සේගේ ආශිර්වාද ගැන ඔවුන්ගේ කෘතඥතාවය පළකරන විට, ඔවුන්ගේ ඇස්වල තිබුනු ඇදහිල්ල මට දැකගත හැකිවිය."[12]

වැඩිහිටි බෙන්සන්ට තිබූ නොයෙක් වගකීමවලින් එකක් වන, දුම්රිය මැදිරි 127ක ආහාර, ඇඳුම්, ඇඳ ඇතිරිලි, සහ බෙහෙත් යුරෝපය මුළුල්ලේම බෙදාහැරීමට ඔහු කටයුතු කළේය. වසර ගණනාවකට පසුව, සභාපති තෝමස් එස්. මොන්සන් ජර්මනියේ සුවිකාවීහි නව දේවස්ථාන-යක් කැපකරන විට, වැඩිමහළු සොහොයුරෙක් කඳුළු පිරි දෙනෙතින් ඉදිරියට පැමිණ, සභාපති එස්රා ටැෆ්ට් බෙන්සන්ට මතක්කිරීමක් කරන ලෙස ඔහුගෙන් ඉල්ලීය. "ඔහු මගේ ජීවිතය සහ මගේ මවු බිමේ සොහොයුරු සොහොයුරියන්ගේ ජීවිතද ඔහු අමෙරිකාවේ සභා සාමාජික-යන්ගෙන් අපට ගෙනා ආහාර සහ ඇඳුම් නිසා ගලවාගත් බව ඔහුට කියන්න."[13]

ජර්මනියේ කුසගින්නේ සිටින ශුද්ධවන්තයන්ට සැබෑ ක්‍රිස්තියානි සේවයක් ලබාදීමේ අවස්ථාවක් ඕලන්ද ශුද්ධවන්තයන්ටද ලැබින. ඕලන්ද ශුද්ධවන්තයන් යුද්ධ කාලය තුළදී බොහෝ සෙයින් දුක් පීඩා විඳ පසුව,



*නෙදර්ලන්ත දූතමෙහෙයේ සභාපති කොරනේලියස් සැපී සහ ධර්මදූතයෝ 1947දී ජර්මානු ශුද්ධවන්තයන්ට යැවීමට සුභසාධන අර්තාපල් සකස්කරති*

එක්සත් ජනපදයේ සභා සාමාජිකයන්ගෙන් සුභසාධන උපකාර ඔවුන්ට ලැබී ඇත. 1947 වසන්ත කාලයේදී, ඔවුන්ගේම සුභසාධන ව්‍යාපෘතියක් ආරම්භකිරීමට ඔහුට කියා තිබෙන අතර එය උනන්දුවෙන් කෙරින. ඔවුහු මුලින්ම අර්තාපල් වගාකර එයින් විශාල අස්වැන්නක් අපේක්ෂාවෙන් සිටිති.

මෙම කාලයේදී, වෝල්ටර් ස්ටෝවර් නැගෙනහිර ජර්මනියේ සිට ඕලන්දයට පැමිණ, ජර්මනියේ සභා සාමාජිකයන් කුසගින්නෙන් අසරණව සිටීම ගැන කඳුලින් යුතුව කීවේය. සභාපති කෝර්නේලියස් සැපී, නෙදර්ලන්ත දූතමෙහෙයේ සභාපතිවරයා, සාමාජිකයන් අමතා, ඔවුන්ගේ අල අස්වැන්න යුද කාලයේදී ඔවුන්ගේ සතුරන්ව සිටි, ජර්මන්වරුන්ට දීමට කැමතිදැයි ඔවුන්ගෙන් ඇසුවේය. සාමාජිකයෝ කැමැත්තෙන්ම එකඟවී වැඩි සතුටකින් යුතුව ඔවුන්ගේ වැඩෙන අල වගාව දෙස බැලූහ. අස්වැන්න කිසිවෙකු බලාපොරොත්තුවූවාටටත් වැඩියෙන් තිබූ අතර, ඕලන්ද ශුද්ධවන්තයෝ ජර්මනියේ ඔවුන්ගේ සොයුරු සොයුරියන්ට අල ටොන් 75ක් යැවූහ. වසරකට පසුව, ඕලන්ද ශුද්ධවන්තයෝ ජර්මනියේ ශුද්ධවන්තයන්ට අල ටොන් 70ක් සහ හුරුල්ලන් ටොන් 9ක් යැවූහ.[14]

මෙම ශුද්ධවන්තයන් විසින් පෙන්වන ලද ක්‍රිස්තු ප්‍රේමයේ ගලායාම, සභාපති ජෝර්ජ් ඇල්බට් ස්මිත් විශිෂ්ඨ අන්දමින් විහිදුවන ලද ක්‍රිස්තු ප්‍රේමයට සමාන සම්බන්ධකමක් ඇත. ඔහු මෙසේ කීවේය, "මගේ සොයුරු සොයුරියනි, මෙම ලෝකයේ ප්‍රීතිමත්ම ජනතාව නම් තම අසල්වැසියන්ට තමන්ට මෙන් ප්‍රේමකරමින්, ඔවුන්ගේ ජීවිතයේ හැසීරීම මගින් දෙවියන්වහන්සේගේ ආශිර්වාද අගයකරමින් ප්‍රකාශකරන අයවේ."[15]

## සභාපති ඩේවිඩ් ඕ. මැකේ

ඩේවිඩ් ඕ. මැකේ පළවෙනි සභාපතිත්වයේ ජෝර්ජ් ඇල්බට් ස්මිත් සභාපතිවරයාගේ උපදේශකවරයෙක් විය. 1951 වසන්තයේදී, සභාපති මැකේ සහ ඔහුගේ බිරිඳ, එමා රේ, කල්දමා තිබූ ඔවුන්ගේ කැලිෆෝර්-නියා නිවාඩුව සඳහා සෝල්ට් ලේක් නගරයෙන් පිටත්වීමට තීරණය කළහ. ඔවුහු රාත්‍රිය ගතකිරීමට යුටා, සෙන් ජෝර්ජ්හි නතරවූහ. සභාපති මැකේ, පසුදා උදෑසන අවදිවූවිට, සභා ප්‍රධාන කාර්යාලයට යායුතු බවට පැහැදිළි තද හැඟීමක් ඔහුට ඇතිවිය. ඔහු සෝල්ට් නගරයට පැමිණීමෙන් පසුව දින කිහිපයක් තුලදී, සභාපති ස්මිත්ට වැළඳුන හදවත් රෝගයකින් 1951 අප්‍රේල් 4 වෙනිදා ඔහු මිය ගියේය. සභාපති ඩේවිඩ් ඕ. මැකේ ඉන්පසුව සභාවේ නමවෙනි සභාපතිවරයා බවට පත්විය.

සභාපති මැකේ සභාව මෙහයවීමට හොඳින් සූදානම්ව සිටියේය. අට හැවිරිදි ළමයෙක්ව සිටියදී, ඔහුගේ පියාට බ්‍රිතාන්‍ය දූපත්වල දූතමෙහෙ-යකට කැඳවීම ලැබුනුවිට, ඔහු නිවසේ ප්‍රධානියා ලෙස වගකීම් ඉටුක-ළේය. ඔහුගේ වැඩිමහල් සොහොයුරියන් දෙදෙනෙක් මියගිය අළුත, ඔහුගේ මව තවත් බිළිඳෙකු බලාපොරොත්තුව සිටි අතර, ගොවිපළේ වගකීම් ඩේවිඩ්ගේ මවට භාරදීමට විශාල වැඩි බව ඔහුගේ පියාට හැඟුනි. මෙම තත්වය යටතේ මැකේ සොහොයුරා ඔහුගේ බිරිඳ අමතා, "ඇත්ත වශයෙන්ම මට යාමට හැකියාවක් ඇත්තේම නැත" යයි කීවේය. ඔහු දෙස බැලූ මැකේ සොහොයුරිය මෙසේ කීවාය, "ඇත්තවශයෙන්ම ඔබ පිළිගත යුතුය; ඔබ මා ගැන කණගාටුවීම අවශ්‍ය නැත. ඩේවිඩ් ඕ. සහ මම මේවා හොඳින් බලාගන්නෙමු!"[16] ඔහුගේ දෙමාපියන්ගේ ඇදහිල්ල සහ කැපවීම තුලින් සිය ජීවිතය මුළුල්ලේම ස්වාමීන්වහන්සේට සේවයකිරීමේ කැමැත්තක් ළමා ඩේවිඩ්ගේ මනසට කාවැදී තිබුනි. 1906දී දොළොස්දෙනාගේ උපදේශක සභාවට ඔහුව කැඳවන විට ඔහුගේ වයස 32ක්වූ අතර, ඔහු එම උපදේශක සභාවේ සහ පළවෙනි සභාපතිත්වයේ (සභාපති හීබර් ජේ. ග්‍රාන්ට් සහ සභාපති ජෝර්ජ් ඇල්බට් ස්මිත්ගේ



*සභාපති ඩේවිඩ් ඕ. මැකේ බාල කාලයේ ඔහුගේ පවුල සමග, ඩේවිඩ් සිය පියාගේ උකුල මත.*

උපදේශකවරයෙකු ලෙස) වසර 45ක් සභාවේ සභාපතිවරවරයා වීමට පෙර සේවය කළේය.

සභාපති මැකේ දීර්ඝ සංචාරක කාලසටහනක් සකස්කර සභා සාමාජිකයන් බැහැදැකීම අරම්භකල අතර, එය ලෝක ව්‍යාප්ත එකක් බවට පත්විය. ඔහු මහා බ්‍රිතාන්‍යය, යුරෝපය, දකුණු අප්‍රිකාව, ලතින් අමෙරිකාව, දකුණු පැසිෆික් දූපත්, සහ තවත් ස්ථාන බැහැ දුටුවේය. ඔහු යුරෝපයේ සිටියදී, ලංඩනයේ සහ ස්විස්සර්ලන්තයේ දේවමාළිගා ඉදිකිරීමට මූලික සැලසුම් සකස් කළේය. ඔහුගේ සභාපතිත්වය නිමවීමට පෙර, ඔහු සභාවේ සාමාජිකයන්ට ආශිර්වාද සහ ප්‍රබෝධය ලබාදෙමින්, මුළු ලෝකයේම වාගේ සංචාරයකර ඇත.

සෑම සාමාජිකයේම අඩු වශයෙන් එක් අළුත් සාමාජිකයෙකු හෝ හැම වසරකම සභාවට ගෙනඒමට ඔවුන්ගෙන් ඉල්ලා සිටිමින් සභාපති මැකේ ධර්මදූත කටයුතුවල වැදගත්කම නැවත අවධාරණය කළේය. ඔහුගේ මෙම නිරන්තර උපදේශය නිසා ඔහු ප්‍රසිද්ධියට පත්විය: "සෑම සාමාජිකයෙක්ම ධර්මදූතයෙකි."

1952 දී, පූර්ණ-කාලීන ධර්මදූතයන්ගේ සාර්ථකත්වය වැඩිකිරීමේ උත්සාහයකදී, හරවාගැනීමේ ප්‍රථම නිළ සැලසුම ලෝකය මුළුල්ලේම සිටින ධර්මදූතයන්ට යවන ලදී. එය නම්කර තිබුනේ සුභාරංචිය ඉගැන්වීමේ

ක්‍රමානුකූල වැඩසටහනක් යනුවෙනි. එහි ධර්මදූත සාකච්ඡා හතක් ඇතුළත්වූ අතර, ආත්මයාණන් මගින් උගන්වා, දේවශීර්ෂයේ ස්වභාවය, ගැලවීමේ සැලසුම, ඇදහිල්ලෙන් වැටීම, සහ නැවත පිහිටුවීම, සහ මෝර්මන්ගේ පොතේ වැදගත්කම පැහැදිළිව ඉගැන්වීම එයින් අවධාරණය කෙරිනි. ලෝකය මුළුල්ලේම සභාවට හැරී ආ අයගේ සංඛ්‍යාව අතිශ-යින්ම වැඩිවිය. 1961 දී, සභා නායකයන් විසින් සියලුම ධර්මදූත සභාප-තිවරුන් සඳහා ප්‍රථම වැඩමුළුවක් සැලසුම්කළ අතර, එහිදී ඔවුන්ට උගන්වනු ලැබුවේ, තම මිතුරන් හා අසල්වැසියන් සමග මිත්‍රත්වයක් ඇතිකරගැනීමට පවුල්වලට අවධාරණයකර, මෙම ජනතාවට ඔවුන්ගේ නිවෙස් තුළදීම ධර්මදූතයන් ලවා ඉගැන්වීමය. අළුත කැඳවූ ධර්මදූතයන්ට භාෂා පුහුණුකිරීමේ වැඩසටහනක් 1961දී පිහිටුවනු ලැබූ අතර, පසුව ධර්මදූත පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකරන ලදී.

සභාපති මැකේගේ පරිපාලන කාලය තුලදී, ආසියාව තුල සභාව වැඩීමේ බීජ සිටුවන ලද්දේ සන්නද්ධ හමුදාවල සේවයකරන සභා සාමාජිකයන් විසින්ය. දකුණු කොරියාවේ සේවයකරන, යුටා, අමෙරිකා ෆෝක්හි, තරුණ හේවා භටයෙක් දැක තිබෙන පරිදි, කොරියානු සිවිල් ජනතාව අමෙරිකානු සොල්දදුවන්ව හමුවන විට සිවිල් ජනයා, මාර්ග-යෙන් ඉවතට පැන සොල්දාදුවන්ට යාමට ඉඩදෙති. තරුණ සභා සාමාජි-කයෙක් මීට ප්‍රතිවිරුද්ධ ලෙස, පැතතකට ගොස් කොරියානුවන්ට මාර්ග පාවිච්චිකිරීමට ඉඩදුන්නේය. ඔවුන් ඔහුව පසුකර යන විට ඔවුන්ගේ නම් අසා ගෙන ඔවුන්ට ප්‍රසන්න ලෙස සුභ පැතීමටද ඔහු කටයුතු කළේය. එක් දිනක් ඔහු, ඔහුගේ මිතුරන් පස් දෙනෙක් සමග භෝජනගාරයට ඇතුළුවිය. ආහාර ගැනීමේ පෝළිම ඉතා දිගට තිබින. එනිසා ඔහු මේස-යක් අසල ටික වේලාවක් බලා සිටියේය. එකිනෙහිම කොරියානු සේවක-යෙක් අහාර සහිත බන්දේසියක් ඇතිව එහි ආවේය. ඔහුගේ අතේ තිබෙන පටිය පෙන්වූ සොල්දාදුවා, "මට කෑම දීමට ඔබට බැහැ, මම හේවා භටයෙක්මි" යයි කීවේය. ඔහු ඇමතු කොරියානුවා, "මම ඔබට කෑම දෙමි, ඔබ අංක එකේ ක්‍රිස්තියානුවෙකි" යයි කීවේය."[17]

1967 වන විට, ධර්මදූතයන් සහ හමුදා නිළධාරීන් කොරියාව තුල කෙතරම් සාර්ථක ලෙස සුභාරංචිය ඉගැන්වූයේද යත්, මෝර්මන්ගේ පොත කොරියන් භාෂාවට පරිවර්තනයකර, ඉකමණින්ම දේශය ස්ටේක් සහ කොට්ඨාශවලින් පිරී ගියේය.

ජපානය තුලද ධර්මදූතයෝ විශාල සාර්ථකත්වයක් ලැබූහ. II වන ලෝක යුද්ධයෙන් පසුව, ජපානයේ සභා සාමාජිකයෝ වසර කිහිපයක්ම

සභාවේ නියෝජිතයන් සමග නිරන්තර සම්බන්ධතා පැවැත්වූහ. නමුත් ජපානයේ සිටි පසු-දවස්වල ශුද්ධවන්ත හමුදා නිලධාරීහු යුද්ධයෙන් පසුව සභාව ශක්තිමත්ව වැඩීමට උදව් කළහ. 1945දී, පසු-දවස්වල ශුද්ධවන්ත හමුදා නිළධාරීන් තේ බීම ප්‍රතික්ෂේප කිරීමේ මගින් ටැට්සුයි සාටෝ විෂ්මිත විය. ඔහු ඔවුන්ගෙන් ප්‍රශ්න ඇසීමෙන් පසුව ඔහු බව්තීස්මවී ඊළඟ වසරේදී ඔහුගේ පවුල් සාමාජිකයෝ කිහිපදෙනෙක්ද බව්තීස්ම වූහ. එළියට් රිචඩ්ස් සාටෝව බව්තීස්මකළ අතර, පසු කාලයකදී දොළොස්දෙනාගේ සාමාජිකයෙකු බවට පත්වූ, බොයිඩ් කේ. පැකර්, හමුදා නිළධාරියා, සාටෝ සොහොයුරිය බව්තීස්ම කළේය. බොහෝ ජපාන ජනතාව නැවත පිහිටුවූ ශුභාරංචිය ගැන මුල්වරට ඇසූ ස්ථානය වූයේ සාටෝගේ නිවසය. II වන ලෝක යුද්ධයේදී ජපානයට විරුද්ධව සටන් කළ පසු-දවස්වල ශුද්ධවන්තයෝ නොබෝ කලකින් ධර්මදූත කටයුතුවලට ජපානයේ නගර විවෘතකළහ.

පිලිපීනයේ තිබෙන සභාව තුලද, II වන ලෝක යුද්ධයෙන් පසුව අමෙරිකානු හමුදා නිළධාරීන්ගේ සහ අන් අයගේ උත්සාහයන් සොයාගැනීමට හැකිවුවද, එහි සභාව ශක්තිමත්ව වැඩීම ආරම්භවූයේ 1961දීය. සභාවේ සාමාජිකාවක් නොවූ, තරුණ පිලිපීන කාන්තාවක් මෝර්මන්ගේ පොත ගැන අසා පසු-දවස්වල ශුද්ධවන්තයන් කිහිපදෙනෙකු හමුවූවාය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇය හඳුනන රජයේ නිළධාරීන් හමුවීමට හැගීමක් ඇතිවූ ඇය ඔවුන් හමුවී, පසු-දවස්වල ශුද්ධවන්ත ධර්මදූතයන්ට පිලිපීනයට ඒමට අවසර දිය හැකිදැයි ඇසුවාය. අවසරය ලැබුනු අතර මාසයකට පසුව, දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි ගෝර්ඩන් බී. හින්ක්ලි එම රට ධර්මදූත කටයුතු සඳහා නැවත කැපකළේය.

1950 ගණන්වලදී සභාවේ විෂ්මිත වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, පූජකවරයේ උප ශාඛා වැඩසටහන ගැන සභාපති මැකේ නිවේදනය කළේය. දොළොස්දෙනාගේ ගණපූර්ණයේ, වැඩිහිටි හැරල්ඩ් බී. ලීගේ ප්‍රධානත්වයෙන්, සමිතියක් පත්කර, එය මෙහෙයවීමටත්, සභාවේ සියලු වැඩසටහන් යාච්ඤාවෙන් අධ්‍යයනය කර, එමගින් සභාවේ බොහෝ වැදගත් අරමුණ කෙසේ ඉටුවන්නේදැයි වගබලාගැනීමත් ඔහුට පැවරීය. 1961දී, පළවෙනි සභාපතිත්වයේ අනුමැතිය ඇතිව, වැඩිහිටි ලී නිවේදනයක් නිකුත්කරමින්, සභාවේ සියලුම අධ්‍යාපන පොත් පත් සැලසුම්කිරීම, ලිවීම සහ ක්‍රියාත්මක කිරීම පාලනයකිරීමේ ප්‍රතිපත්ති වැඩිදියුනු කල යුතු බව කීවේය. කලින් මේ පොත් පත් වලින් බොහොමයක් සභාවේ උපශාඛා සංවිධාන මගින් වැඩිදියුණුකර තිබුනි. මෙම අලුත් මග පෙන්වීම අනුව

අනවශ්‍ය වැඩසටහන් සහ පාඩම් නැවත කිරීම වැළකෙන නිසා, ලෝක ව්‍යාප්ත සභාව තුල සියලු භාෂාවලින් සෑම වයසකම සාමාජිකයන්ට සුභාරංචිය ඉගැන්වීම වඩාත් සාර්ථක ලෙස කළ හැකිය.


සියලුම වැඩසටහන් සහ ක්‍රියාකාරකම් වඩාත් සාර්ථක ලෙස සම්බන්ධීකරණය කිරීම සඳහා—සුභසාධනය, ධර්මදූත, සහ පවුල් ඉතිහාස කටයුතුද ඇතුළුව— සභාවේ දූතමෙහෙය වඩාත් හොඳින් ඉටුකරගැනීමට සභාව තවත් වෙනස්කම් කළේය. ජෝසෆ් ස්මිත්ගේ කාලයේ පටන් සභාවේ කොටසක්ව පැවති නිවාස ඉගැන්වීම්, සියලුම සභා සාමාජිකයන්ගේ ලෞකික සහ ආත්මික අවශ්‍යතාවයන් සඳහා උපකාරකර සැලකිලිමත්වීමේ මාර්ගයක් ලෙස 1960 ගණන්වලදී නැවත අවධාරණය කරන ලදී. ඉගැන්වීම් වැඩිකිරීමට රැස්වීම් ගෘහ පුස්තකාල පිහිටුවන ලද අතර, ගුරු අභිවෘධිමත් වැඩසටහනක් ස්ථාපනය කෙරින. 1971දී ප්‍රධාන අධිකාරියේ සුපරීක්ෂාව යටතේ සඟරා තුනක්: *මිතුරා* ළමුන් සඳහාද, *නිව් ඊරා* තරුණ ජනයා සඳහාද, *එන්සයින්* වැඩිහිටියන් සඳහාද, ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත්කිරීම සභාව ආරම්භ කළේය. මෙම කාලයේදීම වාගේ, විවිධ දූතමෙහෙයන් මගින් කලින් පුද්ගලිකව ප්‍රකාශයට පත් කළ විදේශ සඟරාද සභාව ඒකාබද්ධ කළේය. එක් සඟරාවක් දැන් භාෂා ගණනාවකට පරිවර්තනයකර ලෝකය පුරාම සභා සාමාජිකයන් වෙත යවනු ලැබේ.

වර්තමාන ජීවිතයේ පරීක්ෂාවන් සහ පෙළඹවීම්වලට විරුද්ධවීමේ නොවරදින ආරක්ෂාවක් සහ සතුටේ උල්පත වන්නේ නිවාස සහ පවුල් ජීවිතය බව සභාපති ඩේවිඩ් ඕ. මැකේ දීර්ඝ කාලයක සිට අවධාරණය කළේය. තම පවුල ගැන ඔහු තුල තිබූ ප්‍රේමය ගැන සහ ඔහුගේ බිරිඳවූ, එමා රේගෙන්, ඔහුට ලැබුනු නොවරදින සහයෝගය ගැනත් ඔහු නිතරම කීවේය. සභාපති මැකේගේ පරිපාලන කාලය තුලදී, සතිපතා පවුල් නිවාස සැන්දෑව පැවත්වීමේ පුරුද්ද දරුවන් දෙමාපියන් සමීපයට කැඳවා සුභාරංචි මූලධර්ම ඉගැන්වීමේ මාර්ගයක් බවට තදින්ම අවධාරණය කළේය.

නිවාස සහ පවුල් ශක්තිමත් කිරීමේ වැදගත්කම ගැන අවධාරනය කිරීම තුලින් සහන සමිතිය අනාගතවක්තෘවරයාට සහයෝගය දක්වන ලදී. නාවූවලින් එය ආරම්භවූදා සිටම, සහන සමිතිය ලොව පුරාම දහස්ගණන් කාන්තාවන් සහිතව වර්ධනයවී ඇති අතර, එහි ඉගැන්වීම් සහ සහන සමිතිය තුලින් ඔවුන් ලබන මිත්‍රත්වය මගින් පුද්ගලිකව සහ පවුල් වශයෙන්ද ඔවුන් ආශිර්වාදිතවී ඇත. 1945 සිට 1974 දක්වා, සහන සමිතියේ ප්‍රධාන සභාපතිනිය වූයේ සභාපති බෙල් එස්. ස්පැෆෝඩ්ය, දක්ෂ නායිකාවක්වූ ඇය 1968 සි 1970 දක්වා එක්සත් ජනපදයේ ජාතික

කාන්තා උපදේශක සභාවේ සභාපතිනිය ලෙස සේවය කරන විට ජාතික සම්මානය ලබාගත්තාය.

සභාපති මැකේ වයස 96දී 1970 ජනවාරි මස මියගියේය. ඔහු වසර 20කටත් වඩා සභාවේ මූලාසනය දැරූ අතර, එම කාලය තුළදී සභාවේ සාමාජිකත්වය තුන් ගුණයකින් වැඩිවී සුබාරංචි පණිවුඩය මුළු ලෝකයටම ගෙනයාමෙන් විශාල පියවර රාශියක් ගෙන ඇත.



ලෝකයේ සෑම තැනකින්ම පැමිණි ශුද්ධවන්තයෝ
සුභාරංචියේ ආශිර්වාදවලින් සතුටුවෙති.

# ලෝක ව්‍යාප්ත සභාව

**සභාපති ජෝසප් ෆීල්ඩින් ස්මිත්**

ඩේවිඩ් ඕ. මැකේ මියගිය පසුව, එකල 93වෙනි වියේ පසුවූ, සභාපති ජෝසප් ෆීල්ඩින් ස්මිත්, සභාවේ සභාපතිවරයා බවට පත්විය. ඔහු සභාවේ කලින් සිටි සභාපතිවරයාවූ ජෝසප් එෆ්. ස්මිත්ගේ පුත්‍රයාය.

ළමා කාලයේදී, ජෝසප් ෆීල්ඩින් ස්මිත් ස්වාමීන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමට කැමතිව සිටි බැවින්, ඔහු දහවෙනි වියේ සිටියදී මෝර්මන්ගේ පොත දෙවරක් කියවීමට සහ ඔහු ඇවිදින විට ශුද්ධ ලියවිලි රැගෙනයාමටද පෙළඹවීමක් ඔහුට ලැබිනි. බෝල කණ්ඩයමට ඔහු නොපැමිණිවිට, ඔහු අටුවේ ශුද්ධ ලියවිලි කියවමින් සිටිනු ඔවුන්ට නිතරම දක්නට ලැබින. පසු කාලයකදී ඔහු මෙසේ කීවේය, "මට මුලින්ම කියවීමට හැකිවූදා සිට, මගේ මුල්කාලීන මතකය අනුව, ශුද්ධ ලියවිලි කියවීමෙන් සහ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැන සහ අනාගතවක්තෘ ජෝසප් ස්මිත් ගැන සහ මිනිසුන්ගේ ගැලවීම සඳහා කරන ලද වැඩ කටයුතු කියවීමෙන්, ලෝකයේ වෙනත් කිසිවකටත් වඩා වැඩි සතුටක් සහ විශාල තෘප්තියක් මට ලැබී ඇත."[1]

මෙම මුල්කාලීන අධ්‍යයනකිරීම් මගින් ශුද්ධ ලියවිලි සහ සභා ඉතිහාසය ගැන පුළුල් දැනීමකට පදනමක් දමා ඇත. ඔහු එය ලබාගත්තේ දේශනාවලින් සහ පොත්වලින් මෙන්ම දහම් මාතෘකාවලින් ලියන ලද ලිපි දුසිම් දෙකක් පමණ කියවීමෙනි.

ඔහුගේ පරිපාලන කාලය තුලදී, ආසියාවේ (ටෝකියෝ, ජපානය) සහ අප්‍රිකාවේ (ජොහැන්ස්බර්ග්, දකුණු අප්‍රිකාවේ) ප්‍රථමවරට ස්ටේක් සංවිධානයකරන ලදී. සභා සාමාජිකත්වය වැඩීමත් සමගම, සභාපති ස්මිත් සහ ඔහුගේ උපදේශකවරු ලෝකය මුළුල්ලේම ප්‍රාදේශීය සම්මන්ත්‍රන පැවැත්වීම ආරම්භකර, ප්‍රාදේශීය නායකයන් පුහුණුකර, ප්‍රධාන අධිකාරිවරුන් මුණගැසීමට සාමාජිකයන්ට ඉඩ ලබා දුන්හ. එවන් ප්‍රථම සම්මන්ත්‍රනයක් එංගලන්තයේ මැන්චෙස්ටර්හි පවත්වන ලදී. ලෝකය



*සභාවේ ප්‍රථම ප්‍රාදේශීය සම්මන්ත්‍රනය 1971 අගෝස්තු මාසයේදී සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්ගේ මගපෙන්වීම යටතේ එංගලන්තයේ පවත්වන ලදී. වැඩිහිටි හෝවඩ් ඩබ්ලිව්. හන්ටර් ආසනයේ සිටියි.*

මුළුල්ලේම ජනතාවට වඩා හොඳින් සේවයකිරීම සඳහා, සෞඛ්‍ය සේවා ධර්මදූයන් කැඳවා මූලික සෞඛ්‍ය මූලධර්ම සහ සනීපාරක්ෂක ක්‍රම උගන්වන ලදී. නොබෝ කලකින් 200කටත් වඩා සෞඛ්‍ය ධර්මදූතයෝ බොහෝ රටවල සේවය කළහ.

1912 සිට, සභාවේ අනුග්‍රහයෙන් බටහිර එක්සත් ජනපදයේ උසස් පාසල්වලට යාබද ගොඩනැගිලිවල සෙමනේරි පංති පැවැත්වින. 1920 ගණන්වලදී, විද්‍යාලවල සහ විශ්වවිද්‍යාලවල ආගමික ඉන්ස්ටිටියුට් ආරම්-භවු අතර පසු-දවස්වල ශුද්ධවන්තයෝ විශාල ප්‍රමාණයක් ඊට සහභා-ගිවූහ. 1950 මුල්කාලයේදී, හිමිදිරි උදෑසන සෙමනේරි පංති, ලොස් ඇන්ජලීස්, කැලිෆෝනියා ප්‍රදේශයේ පටන්ගත් අතර, නොබෝ කලකින් ශිෂ්‍යයෝ 1,800කට වඩා සහභාගිවූහ. ආගමික අධ්‍යයන පංතිවලට සහභාගිවීමට සතියකට දින පහක් 15 සිට 18 දක්වා වයසේ පසුවන තරුණ පසු-දවස්වල ශුද්ධවන්තයෝ උදෑසන 5.30ට අවදිවීම දුටු සාමාජික නොවන අය පුදුමයට පත්වූහ. 1970 මුල් කාලයේ, නිවාස අධ්‍යයන සෙමනේරි වැඩසටහන හඳුන්වාදීම නිසා, ලෝකය මුළුල්ලේම

පසු-දවස්වල ශුද්ධවන්තයන්ට ආගමික උපදෙස් ලබාගැනීමට හැකිවිය. සභාපති ස්මිත්ගේ පරිපාලන කාලයේදී, සෙමනේරි සහ ඉන්ස්ටිටියුට් බඳවාගැනීම් විශ්මිත ලෙස වැඩිවිය.

සභාපති ස්මිත් 1972 අප්‍රේල් සම්මන්ත්‍රනයේදී කළ අවසාන ප්‍රසිද්ධ කථාවේදී ඔහු මෙසේ කීවේය: "ලෝකයේ ආපදාවන්ට ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය හැර වෙනත් ප්‍රතිකාරයක් නැත. සමාදානය සඳහා, ලෞකික සහ ආත්මික සමෘද්ධිය සඳහා, සහ අවසානයේදී දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ උරුමය සඳහා අපගේ බලාපොරොත්තුව තිබෙන්නේ නැවත පිහිටුවූ සුභාරංචියේ සහ එතුල පමණකි. සුභාරංචිය දේශනාකිරීම සහ පොළොව මත දෙවියන්වහන්සේගේ සභාව සහ රාජ්‍යය ගොඩනැගීමට වඩා, අප කිසිවෙකුට කළ හැකි වෙනත් කිසිදු වැදගත් කාර්යයක් නැත."[2]

වසර දෙකහමාරක කාලයක් සභාවේ සභාපතිවරයා ලෙස සේවය කිරීමෙන් පසුව, ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්, ඔහුගේ දියණියගේ නිවස තුල සාමකාමීව මියගියේය. ඔහු 95වෙනි වියට එළඹ සිටි අතර, ඔහුගේ මුළු ජීවිත කාලයේම නිර්භීතව ස්වාමීන්වහන්සේට සේවය කර ඇත.

## හැරල්ඩ් බී. ලී

සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් මියගිය දිනට පසුදින, දොළොස්දෙනාගේ ගණපූර්ණයේ ජ්‍යෙෂ්ඨ සාමාජික, සභාපති හැරල්ඩ් බී. ලීගේ පවුල, නිවාස සැන්දෑවකට එකතුව සිටියහ. සභාපති ලීට වඩාත් උපකාරයක් ලෙස කළ හැකි කුමක්දැයි එක් පවුල් සාමාජිකයෙක් ඇසීය. "අවංකව ඇදහිලිමත්වන්න; මා ඔබට උගන්වා ඇති පරිදි සුභාරංචිය අනුව ජීවත්වන්න," යයි ඔහු පිළිතුරු දුන්නේය. එම පණිවුඩය සභා සාමාජිකයන් සියල්ලන්ටම අදාලවේ. සභාවේ සභාපතිවරයා ලෙස පැවැත්වූ ඔහුගේ ප්‍රථම ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයේදී, හැරල්ඩ් බී. ලී මෙසේ ප්‍රකාශ කළේය: "දෙවියන්වහන්සේගේ පණිත් ආරක්ෂාකරන්න. මෙම කරදරකාරී කාලවල් තුලදී පුද්ගලයන්ගේ සහ ජනතාවගේ ගැලවීම පවතින්නේ එහිය."[3]

හැරල්ඩ් බී. ලී 1972 ජූලි 7වෙනිදා, වයස 73 දී, සභාවේ සභාපතිවරයා බවට පත්විය, ඔහු හීබර් ජේ. ග්‍රාන්ට්ට පසුව සභාපතිවරයා බවට පත්වූ බාලම ප්‍රේරිතවරයාද විය. 1935 දී සභාවේ සුභසාධන වැඩසටහන මෙහෙයවීමට කැඳවීමේ සිට, ඔහු සභා පරිපාලනයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකර ඇත (බලන්න පිටුව 109.) සභා වැඩසටහන් සහ ඉගැන්වීමේ

පොත් පත් සම්බන්ධවද ප්‍රධාන කාර්‍යභාරයක් ඔහු ඉටුකල අතර, එමගින් සභා වැඩසටහන් සරළ ලෙස අනුබද්ධ කිරීමට මග පෑදින. ගැඹුරු ආත්මික මිනිසෙක්වූ ඔහු, ඔහුට ස්වර්ගයෙන් ලැබුනු හැඟීම්වලට ක්ෂණයකින් ප්‍රතිචාර දැක්වීය.

සභාපති ලී සහ ඔහුගේ උපදේශකයෝ මෙක්ෂිකෝ නගරයේ පවත්වන ලද, දෙවෙනි ප්‍රාදේශීය සම්මන්ත්‍රනයේ මුලසුන හෙබවූහ. අලුත් පළවෙනි සභාපතිත්වය ස්ථිරකළ ප්‍රථම පසු-දවස්වල ශුද්ධවන්තයන් වූයේ මෙම සම්මන්ත්‍රනයට එකතුවූ සභා සාමාජිකයෝය. මෙක්ෂිකෝ නගරයේ රැස්වීම් පවත්වනු ලැබුවේ "සභාවේ අති විශාල වර්ධනයක් ඇතිකිරීමට මෙවලම් බවට පත්ව...විශිෂ්ඨ සේවයක් කළ බොහෝ දෙනෙකු පිළිගැනීමට සහ ප්‍රශංසා කිරීමට" බව ලී පැහැදිළි කළේය.

මෙක්ෂිකෝ නගරයේ ප්‍රාදේශීය සම්මන්ත්‍රනයක් පවත්වන බව මෙක්ෂිකෝවේ සහ මධ්‍යම අමෙරිකාවේ ශුද්ධවන්තයන් දැනගත් විට, බොහෝ දෙනෙක් ඊට සහභාගිවීමට සැලසුම් සකස් කළහ. එක් සොහොයුරියක් ගෙයක් ගානේ ගොස් රෙදි ඇපිල්ලීමට දෙන ලෙස ඉල්ලුවාය මාස පහක්ම ඇය සිය අසල්වැසියන්ගේ රෙදි අතුල්ලා උපයාගත් පේසෝ ඉතිරිකරගත් නිසා, සම්මන්ත්‍රනයට සහ සැසිවාරවලට සහභාගිවීම සඳහා එහි ගමන්කිරීමට ඇයට හැකිවිය. බොහෝ ශුද්ධවන්තයෝ සම්මන්ත්‍රන දිනවලදී කැමැත්තෙන්ම උපවාස කළේ, වැඩකර ඉතිරිකල මුදල් රැස්වීම්වලට සහභාගිවීමට වියදම්වීමෙන් ආහාර මිළදීගැනීමට මුදල් නොමැතිවූ නිසාය. පරිත්‍යාගකළ අය විපාක ලෙස විශාල ආත්මික ශක්තියක් ලැබූහ. එක් සාමාජිකයෙන් සම්මන්ත්‍රනය ගැන ප්‍රකාශකරමින්, "එය මගේ ජීවිතයේ වඩාත් අලංකාර අත්දැකීමක්!" යයි කීවේය. තව කෙනෙක් වාර්තාකරුවෙකුට මෙසේ කීවේය, "මේ දවස්වලදී අප මෙහිදී අත්වින්ද ප්‍රේමය අමතක කිරීම අපට පහසුවන්නේ නැත."[4]

සිය පරිපාලන කාලය තුලදී, සභාපති ලී ශුද්ධවූ දේශය බැහැදුටුවේය, මෙම කාලපරිච්ඡේදයේදී එසේ කල සභාවේ ප්‍රථම සභාපතිවරයා ඔහු විය. කුඩා දේවමාළිගා දැන් ඉදිකෙරෙන බවත්, අවසානයේ ලෝකය මුළුල්ලේම ඉදිවන බවත් ඔහු නිවේදනය කළේය.

1973 නත්තලට පසු දින, සභාවේ සභාපතිවරයා ලෙස මාස 18ක් සේවය කිරීමෙන් පසුව, සභාපති ලී මියගියේය. ආත්මික යෝධයෙක් ඔහුගේ සදාකාලික නිවසට ගොස් ඇත.

## සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්

වේදනාව සහ දුක හොඳින් දැනසිටි මිනිසෙක්වූ, ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්, දොළොස්දෙනාගේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක්වූ අතර, සභාපති ලී මියගිය පසුව සභාවේ සභාපතිවරයා ලෙස ස්ථිරකරන ලදී. ඔහුගේ ස්වර රජ්ජු බොහොමයක් පිලිකාවක් නිසා ඉවත්කර තිබුනෙන්, ඔහු සන්සුන් ගොරෝසු හඬකින් කථාකිරීම නිසා එම හඬ පසු-දවස්වල ශුද්ධවන්තයෝ ප්‍රිය කළහ. ඔහුගේ නිහතමානීබව, ඔහුගේ කැපවීම, වැඩකිරීමට ඔහු සතුව තිබූ හැකියාව, ගැන ඔහු ප්‍රසිද්ධව සිටි අතර, "එය කරන්න" යන ඔහුගේ උද්‍යෝගී පාඨය, සභාපති කිම්බල් සිය මුළු ශක්තියෙන්ම තදින් ක්‍රියාත්මක කළේය.

සභාපතිවරයා ලෙස ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් සභාවේ ප්‍රාදේශීය නියෝජිතවරුන් අමතා කළ ප්‍රථම කථාව, සහභාගිවූ සියල්ලන්ටම අනුස්-මරණීය විය. රැස්වීමට සහභාගිවූවෙක් සිය මතකය සිහිපත් කරමින්, කථාව ආරම්භ කළ මොහොතේම, "අපි විෂ්මිත ආත්මික සමීපතාවයකින් සිත යොමු කළ අතර, අපි සවන්දෙන්නේ යම් අසාමාන්‍ය, බලවත්, වෙනස් දෙයකට බව අපට අවබෝධවිය….අපට දැනුනේ සර්වපරාක්‍රමයා-ණන්ගේ අරමුණු වසා තිබෙන තිරය ඉවත්වී, ඔහුත් සමග සුභාරංචියේ ගමනාන්තය සහ එහි දූත මෙහෙයේ දර්ශනය දැකීමට අපට ආරාධනා-කරන ලෙසකි" යයි කීවේය.

"ස්වාමීන්වහන්සේ තම ජනතාවගෙන් අපේක්ෂාකරන සම්පූර්ණ ඇදහිල්ලකින් සභාව ජීවත් නොවන බවත්, එසේම, පෙනෙන්ට තිබෙන කාරණා අනුව යම් ප්‍රමාණයකට, අපි ආත්මික ප්‍රසන්න බවකට සහ තෘප්-තියකට පත්ව සිටින බවත්, සභාපති කිම්බල් නායකයන්ට පෙන්වා දුන්-නේය. දැන් ප්‍රසිද්ධව තිබෙන 'අපි අපගේ පියවර දික්කළ යුතුය" යන උද්‍යෝග පාඨය, ඔහු කීවේ ඒ මොහොතේය." පොළොවේ ජනතාවට සුභාරංචිය දේශනාකිරීමට වැඩි කැපවීමක් දක්වන ලෙස ඔහු පැමිණ සිටින අයට උපදෙස් දුන්නේය. තමන්ගේම රටවල සේවයකිරීමට හැකි ධර්මදූයන්ගේ විශාල වැඩිකිරීමක් කරන ලෙසද ඔහු කීවේය. සිය දේශ-නාව අවසන්කරමින් සභාපති එස්රා ටැෆ් බෙන්සන් මෙසේ ප්‍රකාශ කළේය, "සැබවින්ම, ඉශ්‍රායලයේ අනාගතවක්තෘවරයෙක් ඇත."[5]

සභාපති කිම්බල්ගේ ක්‍රියාශීලී නායකත්වය යටතේ, තවත් බොහෝ සාමාජිකයෝ පූර්ණකාලීන දූතමෙහෙයන්වල සේවයකල අතර, සභාව ලෝකය පුරාම ඉදිරියට ගියේය. 1977 අගෝස්තු මාසයේදී සභාපති කිම්-බල් වෝර්සෝ නගරයේ සංචාරය කර, ස්වාමීන්වහන්සේගේ වැඩකටයුතු

ඉදිරියට ගෙන යාමට හැකිවීම සඳහා පෝලන්ත දේශය කැපකර, එහි ජනතාවට ආශිර්වාද කළේය. ධර්මදූත පුහුණු මධ්‍යස්ථාන, බ්‍රසීලය, චීලී, මෙක්ෂිකෝවේ, සහ ජපානයේ පිහිටුවන ලදී. 1978දී දෙවියන්වහන්සේගේ එළිදරව්වක් අනුව ධර්මදූත කටයුතු ලෝක ව්‍යාප්තව අති විශාල ලෙස ප්‍රතිඵල ලබන බව ඔහු නිවේදනය කළේය. වසර ගණනාවක්ම අප්‍රිකානු ජාතිකයන්ට පූජකවරයේ ආශිර්වාද ප්‍රතික්ෂේපවී තිබුනු නමුත්, දැන් පූජ-කවරය සහ දේවමාළිගා ආශිර්වාද සියලුම සුදුසු පිරිමි සාමාජිකයන්ට ලබාදෙනු ලැබේ.

ලෝකය මුළුල්ලේම ඇදහිලිමත් ජනතාව විසින් මෙම එළිදරව්ව බොහෝ කාලයක සිට බලාපොරොත්තු වූවකි. අප්‍රිකාව තුල සුභාරංචිය පළමුවෙන් පිළිගත් කළු ජාතිකයා වූයේ විළියම් පෝල් ඩැනියෙල්ස්ය. ඔහු සභාව ගැන දැනසිටියේ 1913 මුල් කාලයේදී සිටය. ඔහු යුටා නගරයට ගමන්කර, එහිදී සභාපති ජෝසප් එෆ්. ස්මිත්ගෙන් විශේෂ ආශිර්වාදයක් ලබාගත්තේය. ඔහු ඇදහිලිමත්ව සිටින්නේ නම්, ඔහු මෙම ජීවිතයේදී හෝ ඊළඟ ජීවිතයේදී හෝ පූජකවරය උසුලනු ඇති බව සභාපති ස්මිත් ඔහුට පොරොන්දුවිය. ඩැනියෙල්ස් සොහොයුරා 1936දී, ඇදහිලිමත් සාමා-ජිකයෙකුව සිට මියගිය අතර, 1978 පූජකවරය ගැන දුන් එළිදරව්වෙන් පසුව නොබෝ කලකින්, ඇයගේ දියණිය විසින් සිය පියා වෙනුවෙන් දේවමාළිගා නියෝග ඉටුකර ඇත.[6]

අප්‍රිකාවේ තවත් බොහෝ ජනතාවක් සහා පොත් පත් හෝ ආශ්චර්යමත් පුද්ගලික අත්දැකීම් තුලින් සුභාරංචියේ සත්‍යතාවය පිළිබඳ සාක්ෂි ගොඩනගාගත් නමුත්, ඔවුන්ට සුභාරංචියේ සියලුම ආශිර්වාද භුක්තිවිඳීමට නොහැකිවිය.

1978 ජූනි එළිදරව්වට පෙර මාස ගණනාවක්ම, සභාපති කිම්බල් ඔහුගේ උපදේශකයන් සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනා සමග අප්‍රිකානු ජාතික ජනතාවට පූජකවරයේ අධිකාරීබලය ප්‍රතික්ෂේපවීම ගැන සාකච්ඡා කළේය. සුභාරංචියේ පූර්ණ ආශිර්වාද සුදුසු සභා සාමාජිකයන්ට දානයකි-රීමට නොහැකි ලෝකයේ ප්‍රදේශවල දූත මෙහෙයන් ආරම්භකිරීමට සභා නායකයෝ මැලිකමක් දැක්වූහ. දකුණු අප්‍රිකා ප්‍රදේශයකදී සභාපති කිම්-බල් මෙසේ ප්‍රකාශ කළේය: "මම වඩාත් උනන්දුවෙන් යාච්ඤා කළෙමි. අප ඉදිරියේ තිබෙන යමක් දෙවියන්වහන්සේගේ දරුවන් බොහෝ දෙ-නෙකුට ඉතාමත්ම අවශ්‍ය බව මම දැන සිටියෙමි. ස්වාමීන්වහන්සේගේ එළිදරව් අපට ලබාගත හැක්කේ, සුදුසුව සිටීමෙන්, සහ ඒවාට සූදානම්වී-මෙන් සහ ඒවා පිළිගෙන ඒවා නිසි පරිදි ස්ථානගතකිරීමෙන් පමණක්

බවද මම දැන සිටියෙමි. මම දිනපතාම දැඩි ගෞරවයකින් සහ දැඩි වුවමනාවකින් දේවමාළිගාවේ ඉහළ කාමරයට ගොස්, එහිදී මගේ ආත්මය පුදකර, මෙම වැඩසටහන ඉදිරියට ගෙනයාමේ මගේ උත්සාහය පුද-කළෙමි. මට වුවමනා කළේ උන්වහන්සේට අවශ්‍ය දෙය කිරීමය. මා ඒ ගැන උන්වහන්සේ සමග කථාකර, 'ස්වාමීන්වහන්ස, මට අවශ්‍ය හරි දේ පමණය' යයි කීවෙමි."[7]

සභා පති කිම්බල් තම උපදේශකවරුන් සහ ප්‍රේරිතවරුන් දොළොස්-දෙනාගේ ගණපූර්ණයද සමග දේවමාළිගාවේ පැවැත්වූ විශේෂ රැස්වීමකදී, කළු ජාතික පිරිමින්ට පූජකවරය ලබාදීම ගැන ඔහුන්ගේ අදහස් නිදහස්ව ප්‍රකාශ කළේදැයි ඔවුන්ගෙන් ඇසුවේය. ඉන්පසුව ඔවුන් සමග අල්තාරය වටා සිට සභාපති කිම්බල් යාච්ඤා කළේය. එහි සිටි වැඩිහිටි බෲස් ආර්. මැකොන්කි, පසුව මෙසේ කීවේය, "මේ අවස්ථාවේදී, කන්නලව්ව සහ ඇදහිල්ල නිසා, පැය සහ කාලය ලඟවී තිබූ නිසාද, ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ බලයෙන් පළවෙනි සභාපතිත්වය සහ දොළොස්දෙනා මත ආශ්චර්යමත් සහ අසිරිමත් ලෙස එහි සිටි කිසිවෙක් කලින් අත්විඳි නොවිඳි පරිදි ශුද්ධාත්මයාණන් වැගිරවූ සේක."[8] සියලුම සුදුසු මිනිසුන්ට පූජකවරයේ ආශිර්වාද සියල්ලම ලබාගැනීමට කාලය පැමිණ තිබෙන බව සභාවේ නායකයන්ට පැහැදිළි විය.

1978 ජූනි 8වෙනිදා පළවෙනි සභාපතිත්වය පූජකවරයේ නායකයන්ට ලිපියක් යවමින්, "සභාවේ සියලුම සුදුසු පිරිමි සාමාජිකයන්ව ජාතිය හෝ පාට ගැන නොසලකා පූජකවරයට පත්කළ හැකි බව" ස්වාමීන්වහන්සේ එළිදරව්කර ඇති බව පැහැදිළි කළහ. 1978 සැප්තැම්බර් 30වෙනිදින, ප්‍රධාන සම්මන්ත්‍රනයේ සිටි ශුද්ධවන්තයෝ තම නායකයන්ගේ ක්‍රියාවට සහයෝගය දක්වා ඒකමතිකව ඊට ඡන්දය දුන්හ. මෙම ලිපිය දැන් දහම සහ ගිවිසුමේ නිළ ප්‍රකාශනය—2 තුලින් දැකගත හැකිය.

මෙම නිවේදනය නිකුත්කළ කාලයේ සිට, අප්‍රිකානු ජාතික පුද්ගලයන් දහස් ගණනක් සභාවට පැමිණ ඇත. අප්‍රිකාවේදී හැරී ආ එක් අයෙකුගේ අත්දැකීමකින් ස්වාමීන්වහන්සේගේ හස්තය මෙම ජනතාවට ආශිර්වාදකළ අන්දම ප්‍රදර්ශනයවේ. එක් විද්‍යාලයක උපාධිධාරියෙක් සහ ගුරුවරයෙක් දුටු සිහිනයකින් කණු හෝ කුළුණු සහිත විශාල ගොඩනැගිල්ලක් තුලට සුදු ඇඳගත් ජනතාව ඇතුල්වෙනු ඔහු දුටුවේය. පසුව ඔහු ගමන්කරන විට, පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ දේවස්ථානයක් දැක, ඔහුගේ සිහි-නයට මෙම සභාව හා යම් සම්බන්ධයක් තිබෙන බවට ඔහු තුල තද හැඟීමක් ඇතිවිය. එනිසා ඔහු ඉරුදින එහි දේවමෙහෙයට සහභාගිවිය.



මෑත වර්ෂවලදී, ලෝකය මුළුල්ලේම දේවමාළිගා වැඩිම ගණනාවක් ගොඩනගන ලදී. දැන් සභා සාමාජිකයන්ට ආශිර්වාදකරන බොහෝ දේවමාළිගාවලින් එකකි ජර්මනියේ ප්‍රැන්ක්ෆර්ට් දේවමාළිගාව.

රැස්වීම්වලින් පසුව, ධර්මදූත සභාපතිවරයාගේ බිරිඳ ඔහුට පත්‍රිකාවක් පෙන්වූවාය. එය විවෘතකල විට එම මිනිසා සිහිනෙන් දුටු සෝල්ට් ලේක් දේවමාළිගා ගොඩනැගිල්ලේ පින්තූරය විය. පසුව ඔහු මෙසේ කීවේය: "මා හඬමින් සිටි බව දැනගැනීමට පෙර…තිබූ එම හැඟීම් පැහැදිළිකි-රීමට මට නොහැකිය. සියලුම කරදරවලින් මා නිදහස් විය….මට හැඟුනේ මා නිතරම බැහැදුටු ස්ථානයකට මා ගිය බවකි. එසේම මා දැන් නිවසට පැමිණ ඇත."[9]


සභාපති කිම්බල්ගේ පරිපාලනය තුලදී, හැත්තෑවරුන්ගේ පළවෙනි ගණපූර්ණය නැවත සංවිධානය කර, පැය තුනක ඒකාබද්ධ ඉරුදින රැස්-වීමක න්‍යාය පත්‍රයක් සකස්කරනලද අතර, දේවමාළිගා වේගවත්ව ඉදි-කරන ලදී. 1982දී, ලෝකය මුළුල්ලේම දේවමාළිගා 22ක් සැලසුම් කරමින් හෝ ඉදිවෙමින් හෝ තිබුන අතර, එය සභා ඉතිහාසය තුල ඒ කාලයේ තිබූ වැඩිම සංඛ්‍යාව විය. එසේම, සභාපති කිම්බල් වේගවත් සංචාරක න්‍යාය පත්‍රයක් අනුව බොහෝ රටවල්වලට ගොස් ප්‍රාදේශීය සමමන්ත්‍රන

පැවැත්වීය. මෙම රැස්වීම්වලදී, ඔහු තම අවශ්‍යතාවයන් නොසලකා ප්‍රාදේශීය ශුද්ධවන්තයන් හමුවී, ඔවුන් ශක්තිමත්කර ආශිර්වාද කිරීම සඳහා හැකි සෑම අවස්ථාවක්ම යොදාගත්තේය.

බොහෝ රටවල්වල, සභා සාමාජිකයෝ දේවමාළිගාවල පිරිනමන ගැලවීමේ පූජනීය නියෝග ලබාගැනීමට බොහෝ ආශාකළහ. මේ අය අතර දූතමෙහෙයන් බොහොමයක සේවය කරමින් සහ ධර්මදූත සභාපතිත්වයේ වෙහෙසුන ස්වීඩන් ජාතික පසු-දවස්වල ශුද්ධවන්තයෙක් විය. ඔහු මියගිය විට, ඔහුගේ දේපළවලින් සෑහෙන ප්‍රමාණයක් ස්වීඩනයේ දේවමාළිග අරමුදලට වෙන්කර තිබුනේ, එම රටේ දේවමාළිගාවක් ඉදිකරන බවට සභාව නිවේදනයකිරීමටත් බොහෝ කාලයකට පෙරය. සභාපති කිම්බල් දේවමාළිගාව ගැන නිවේදනයකළ විට, මෙම මිනිසාගේ පරිත්‍යාගය පොලියත් සමග විශාල මුදලක් බවට පත්ව තිබුනි. දේවමාළිගාව කැපකිරීමෙන් පසු ඉක්මණින්ම වාගේ, ජීවත්ව සිටියදී එන්ඩව්වී සිටි, මෙම ඇදහිලිමත් සොහොයුරාව, ඔහුගේ මුදල්වල උපකාරයෙන් ගොඩනගන ලද එම දේවමාළිගාව තුළදීම, ඔහුගේ දෙමාපියන්ට මුද්‍රාකරන ලදී.

සිංගප්පූරුවේ පියෙක් සහ මවක් ඔවුන්ගේ පවුල දේවමාළිගාවට රැගෙන ගොස් දේවමාළිගාවේ මුද්‍රාකර ආශිර්වාද ලබාගැනීමට තීරණය කළහ. අවශ්‍ය අරමුදල් සොයාගැනීමට ඔවුහු බොහෝ දේවල් පරිත්‍යාගකර, අවසානයේදී දේවමාළිගාවට සහභාගිවීම සඳහා යාමට ඔවුන්ට හැකිවිය. වසර ගණනාකට පෙර ඔවුන්ට උගන්වන ලද ධර්මදූතයෙකුගේ නිවසේ ඔවුහු නතරව සිටියහ. වෙළඳ සැලකට ගිය අවස්ථාවකදී මෙම සොහොයුරිය ඇයගේ ස්වාමිපුරුෂයාගෙන් සහ ධර්මදූතයාගෙන් මගහැරී ගොස් ඇත. ඔවුන්ට ඇය හමුවූ විට, ඇය ෂැම්පූ බෝතලයක් අතැතිව හඬමින් සිටියාය. දේවමාළිගාවට සහභාගිවීම සඳහා ඇය කරන ලද එක් පරිත්‍යාගයක් නම්, ෂැම්පූ පාවිච්චි නොකිරීමවූ අතර, ඇය එය වසර හතක්ම පාවිච්චි නොකර ඇත. ඇය කළ පරිත්‍යාග කරගෙන යාම අසීරුවුවද, එය කුඩා දෙයක් බව පෙනුනද, ස්වාමීන්වහන්සේගේ ගෘහයේ නියෝගවලින් ඇයගේ පවුල සදාකාලිකවම එකට එක්වන බව ඇය දැනසිටියාය.

සභාපති කිම්බල්ගේ පරිපාලනය තුලදී සිදුවූ තවත් එක් ප්‍රධාන දියුණුවක් නම්, 1979 දී ජේම්ස් රජතුමාගේ බයිබලයේ අළුත් සංස්කරනයක් ඉංග්‍රීසි භාෂාවෙන් සභාව විසින් ප්‍රකාශනය කිරීමය. පොතේ කොටස් වෙනස් නොකළ නමුත්, පාද සටහන් එකතුකිරීම තුලින්, එහි බයිබලය සහ මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම සහ අනගි මුතු ඇටය හා



*සභාපති ස්පෙන්සර් ඩබ්ලිව් කිම්බල් නිරිතදිග එක්සත් රාජ්‍යයේ ඉන්දියන්වරුන් සමග.*

එක්වන හරස්-පද දක්වා ඇත. විශාල ගැට පද විවරණය සහ බයිබල් ශබ්ද කෝෂය නූතන කාලයේ ශුද්ධ ලියවිලිවලට අද්විතීය ඥානයක් ලබාදෙයි. මෙම සංස්කරනයේ සියලුම පරිච්ඡේද සඳහා අළුත් මාතෘකා තිබෙන අතර, ජේම්ස් රජතුමාගේ බයිබලයේ ජෝසෆ් ස්මිත්ගේ ආනුභා-සම්පන්න සංශෝධන උපුටාගැනීම්ද ඇතුලත්ව ඇත.

1981දී, මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම, සහ අනගි මුතු ඇටය පොත්වල අළුත් සංස්කරනද ප්‍රසිද්ධ කෙරින. මෙම පොත්වල අළුත් පාද සටහන්, අළුත් පරිච්ඡේද, කොටස්, මාතෘකා, සිතියම්, සහ පටුනක්ද නව ක්‍රමයකට ඇතුලත්ව ඇත. මෙම කාලයේදීම වාගේ, පසු-දවස්වල ශුද්ධ ලියවිලිද වෙනත් බොහෝ භාෂාවලට පරිවර්තනයකිරීමට වැඩි අවධානයක් යොමුකරන ලදී.

සිය ආදර්ශය සහ ඉගැන්වීම් තුලින්, සභාපති කිම්බල් සභා සාමාජික-යන්ගේ සියලුම උත්සාහයන් වැඩිකිරීමටද පොළඹවන ලදී. බ්‍රිගම් යන්ග් විශ්වවිද්‍යාලය ආරම්භකර 100 වෙනි සංවත්සරය සැමරීමේදී, ඔහු මෙසේ කීවේය, "මෙම විශ්වවිද්‍යාලයෙන් සහ සභාවේ අධ්‍යාපන ක්‍රමයෙන් නාට්‍ය, පොත් පත්, සංගීතය, ප්‍රතිමා කලාව, චිත්‍ර කලාව, විද්‍යාව සහ වෙනත් සියලුම පාණ්ඩිත්ව වරප්‍රසාදවල අනර්ඝ තාරකාවන් නැගී එන බව මගේ බලාපොරොත්තුව සහ අපේක්ෂාවයි."[10] වෙනත් අවස්ථාවලදී, පසු-දවස්වල ශුද්ධවන්ත චිත්‍ර ශිල්පීන් නැවත පිහිටුවූ සුභාරංචිය ගැන කථාව බලවත් ඒත්තුගැන්වෙන ආකාරයකින් කියනු ඇතැයිද ඔහු තම බලාපොරොත්තුව ප්‍රකාශ කළේය.

සභාපති කිම්බල් තම කාර්‍යබහුල කාල සටහන් ගැන නොතකා, අන් අය වෙත ප්‍රේමයෙන් සහ සේවය තුලින් ලඟාවිය. උතුරු සහ දකුණු අමෙරිකාවේ ස්වදේශික අමෙරිකානු ජනතාව සහ පොලිනීසියානු දූපත්වල ජනතාව කෙරෙහි ඔහු තුල විශේෂ හැඟීමක් තිබූ නිසා, ඔවුන්ට උපකාරකිරීම සඳහා ඔහු විවිධ කටයුතුවලට පැය ගණන් ගත කළේය. ඔවුන්ව බලාගැනීම සඳහා ඔහුට සභාපති ජෝර්ජ් ඇල්බට් ස්මිත්ගෙන් ආශිර්වාදයක් ලැබී තිබුනි. සභාවේ සභාපතිවරයා ලෙස, ඔහු සුභාරංචිය දේශනාකිරීම සඳහා මධ්‍යම සහ දකුණු අමෙරිකාවේ දේශයන් කැපකි-රීමට හෝ නැවත කැපකිරීමට දොළොස්දෙනාගේ සමාජිකයන් පත්ක-ළේය. එම කාලයේ සිට, මධ්‍යම සහ දකුණු අමෙරිකාවේ දහස් ගණන් ජනතාව සුභාරංචියේ ආශිර්වාදවලින් ප්‍රීතිමත්ව ඇත.

සියල්ලන්ටම දක්වන ඔහුගේ සැලකිල්ලට සමාන සිද්ධියක් සෙනගින් පිරිගිය ගුවන් තොටුපලක සිදුවිය. එක් තරුණ මවක්, අයහපත් කාල-ගුණය නිසා පීඩාවට පත්ව, ඇයගේ ගමනාන්තයට යාමට ගුවන් යාන-යකට ගොඩවීම සඳහා සිය දෙගැව්රිදි දියණිය සමග පෝලිම් කිහිපයකම සිටියාය. දෙමසක ගැබිනියක්ව සිටි ඇයට වෛද්‍යවරුන්ගේ නියමය පරිදි ඇයගේ බාල දරුවාව වඩාගත නොහැකිවූ අතර, ඔහුද වෙහෙසින් සහ කුසගින්නෙන් සිටියේය. ඇයගේ හඬන දරුවා ගැන විවේචන කළද, කිසිවෙක් ඇයට උදව් කිරීමට ඉදිරිපත් නොවීය. පසුව එම කාන්තාව මෙසේ කීවාය:

"යමෙක් අප ඉදිරියට පැමිණ කාරුණිකව සිනහසෙමින්, 'ඔබට උදව්-කිරීමට කළ හැකි යමක් තිබේද?' යයි ඇසුවේය. කෘතඥපූර්වක සුසුමකින් යුතුව මම ඔහුගේ උපකාරය පිළිගත්තෙමි. හඬමින් සිටින මගේ කුඩා දරුවාව ශීතල පොළොව මතින් ඔසවා ගත් ඔහු, මෘදුලෙස ඇයගේ පිට

අතගැවේය. ඇයට චුවින්ගම් කැල්ලක් අවශ්‍යදැයි ඔහු ඇසීය. ඇය සැනසීමට පත්වූ විට, ඇය ඔසවාගත් ඔහු මා ඉදිරිපිට පෝලිමේ සිටින අයට කරුණාවෙන් අමතා, මට උපකාර අවශ්‍යව තිබෙන බව කීවේය. ඔවුන් එකඟවූ බවක් පෙන්වූ අතර, ඔහු [පෝලිම ඉදිරිපිට තිබෙන] ප්‍රවේශපත් කවුළුව වෙත ගොස්, මඳ වේලාවකින් පිටත්වන ගුවන්යානයකට මා ඇතුල්කිරීමට ලිපිකරුවෙකුට කියා අවශ්‍ය කටයුතු කළේය. ඔහු අප සමග බංකුවක් වෙත පැමිණි අතර, මගේ තත්වය හොඳ බව ඔහුට ස්ථිරවන තුරු, අපි මොහොතක් කථාබස් කළෙමු. ඔහු ඔහුගේ ගමන ගියේය. සතියකට පමණ පසුව ප්‍රේරිතවරයෙක්වූ ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ පින්තූරයක් දුටු මම, ගුවන් තොටුපලේ අමුත්තා ඔහු බව හඳුනාගත්තෙමි."[11]

සභාපති කිම්බල් මියයාමට පෙර මාස කිහිපයක්ම බරපතල රෝගවලින් පීඩා වින්ද නමුත්, ඔහු නිතරම, ඉවසීම, දීර්ඝ ඉවසීම, සහ පරීක්ෂාවන් ඉදිරියේ උද්‍යෝගයෙන් සිටීමේ ආදර්ශයක් විය. සභාවේ සභාපතිවරයා ලෙස වසර 12ක් සේවයකිරීමෙන් පසුව ඔහු 1985 නොවැම්බර් 5වෙනිදා මියගියේය.

# වර්තමාන කාලයේ සභාව

**සභාපති එස්රා ටැෆ්ට් බෙන්සන්**

ස්පෙන්සර් ඩබලිව්. කිම්බල්ගේ මරණයෙන් පසුව එස්රා ටැෆ්ට් බෙන්සන් සභාවේ සභාපතිවරයා බවට පත්විය. ඔහුගේ මුල්කාලීන පරිපාලනය තුලදී, මෝර්මන්ගේ පොත කියවා අධ්‍යයනය කිරීමේ වැදගත්කම ගැන ඔහු අවධාරනය කළේය. ඔහු සාක්ෂිදරමින් "මෝර්මන්ගේ පොත මිනිසුන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන එයි" කියා, මෙම පොතෙහි ඇතුළත්වන ජෝසෆ් ස්මිත්ගේ ප්‍රකාශය මෙසේ නැවත ස්ථිරකරයි, "අපගේ ආගමේ මුල් ගල එය වන අතර, වෙනත් කිසිම පොතකට වඩා, එහි ශික්ෂාවන් අනුව ජීවත්වීමෙන්, මිනිසා දෙවියන්වහන්සේට සමීපවනු ඇත."[1]

1986 අප්‍රේල් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, සභාපති බෙන්සන් මෙසේ ප්‍රකාශ කළේයඃ "සභාව මූල්‍යමය බැඳීමෙන් මුදවාගැනීම සඳහා දසයෙන් කොටස මූලධර්මය නැවත අවධාරනයකරන ලෙස ස්වාමීන්වහන්සේ එතුමාගේ සේවකයා පෙළඹවූසේක….දැන්, අපගේ කාලයේදී, මෝර්මන්ගේ පොත නැවත අවධාරණයකිරීමේ අවශ්‍යතාවය ගැන ස්වාමීන්වහන්සේ එළිදරව්කර ඇතිසේක….මා ඔබට පොරොන්දුවන්නේ මේ මොහොතේ සිට ඉදිරියට, අපි දිනපතාම එහි පිටු කියවා එහි ශික්ෂාවන් අනුව ජීවත්වන්නේ නම්, සයෝනයේ එක් එක් දරුවාට සහ සභාවටද මේදක්වා නොදැන සිටි ආශිර්වාද දෙවියන්වහන්සේ වගුරවනසේක."[2] ලෝකය වටා දහස්ගණනක් අභියෝගය පිළිගෙන පොරොන්දු ආශිර්වාද ලබාගත්හ.

තවත් ප්‍රධාන විෂයක් නම් ආඩම්බරකමින් වැළකීමේ වැදහත්කමයි. 1989 අප්‍රේල් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, "ආඩම්බරකම ජයගෙන ඇතුළාන්තය පිරිසිදුකරගැනීමට" ඔහු සභෘවේ සාමාජිකයන්ට අවවාද කළේ, නිෆායි ජනතාවගේ විනාශයට හේතුවුයේ එය නිසාය. "ආඩම්බරකමේ නාශක ඖෂධය නම් නිහතමානීකම—විනීතකම සහ යටහත්බව" යයි උපදෙස් දුන්නේය.[3]



*ලෝකය මුළුල්ලේම ජනතාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පිහිටුවූ සුභාරංචිය පිළිගන්නා විට, පූජනීය නියෝගවල ආශිර්වාද ලබාගැනීමට ඔවුන්ට හැකිවන්නේය.*

දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සේවයකරන අතර, සුභාරංචිය අනුව ජීවත්වීමේ ආදර්ශයක් වීමට අසාමාන්‍ය අවස්ථාවක් එස්රා ටැෆ්ට්. බෙන්-සන්ට ලැබුනි. 1952 දී, සභාපති ඩේවිඩ් ඕ. මැකේගේ දිරිගැන්වීම අනුව, ඔහු එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාවූ ඩ්වයිට් අයිසන්හවර් යටතේ කෘෂිකර්ම ලේකම් ලෙස පත්වීමක් ඔහු පිළිගත්තේය. සභා ඉතිහාසයේ මුල්වරට දොළොස්දෙනාගේ ගණපූර්ණයේ සාමාජිකයෙක් එක්සත් ජනප-දයේ ඇමති මණ්ඩලයේ සේවය කළ එකම අවස්ථාව මෙයවිය. ඔහුගේ වසර අටක සේවා කාලය තුලදී, එක්සත් ජනපද රජයේ කෘෂිකර්ම ප්‍රති-පත්ති ගැන උපදෙස්දෙමින් ඒවා අවංකව ක්‍රියාත්මකකිරීමේ ප්‍රවීනත්වය නිසා ඔහුට රට තුලින් සහ විදේශවලින්ද විශාල ගරුත්වයක් ලබාගත හැකිවිය. ඔහු ජාතීන්ගේ නායකයන් හා සම්බන්ධවීමෙන් ලෝකය මුළුල්ලේම සභාවේ නියෝජිතයන්ට දොර විවෘත කළේය.

සභාපති බෙන්සන්ගේ නායකත්වය යටතේ, සභාව ලෝකය මුළුල්ලේම වැදගත් දියුණුවක් ලබාගත්තේය. 1987 අගෝස්තු 28 වෙනිදා, ඔහු ජර්මන් මහජන සමූහාණ්ඩුවේ ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් දේවමාළිගාව කැපකළ අතර, එය ඔහුට අර්ථවත් වරප්‍රසාදයක් වුනේ, ඔහු 1964 සිට 1965 දක්වා යුරෝපා දූතමෙහෙයේ සභාපතිවරයා ලෙස සේවයකරන විටදී ඔහුගේ මූලස්ථානය තිබුනේ ෆ්‍රැන්ක්ෆර්ට් නගරයේ නිසාය.

ජර්මනියේ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ ජර්මන් ෆ්‍රීඩ්බර්ග් දේවමාළිගාව 1985 ජූනි 29 වෙනිදා කැපකරන ලදී. මෙම කැපකිරීමට එහි ඉදිකිරීම්වලට හැකියාවක් ඇතිකළ ආශ්චර්යයන් ගණනාවක් තිබුනි. දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි තෝමස් එස්. මොන්සන් ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ප්‍රථම වරට බැහැදුටු විට, ඔහු ශුද්ධවන්තයන්ට මෙසේ පොරොන්දුවිය: "ඔබ දෙවියන් වහන්සේගේ පණත්වලට අවංකව සහ ඇදහිලිමත්ව සිටියහොත්, වෙනත් ඕනෑම රටක ශුද්ධවන්තයන් භුක්තිවිඳින සෑම ආශිර්වාදයක්ම ඔබටද අයත්වනු ඇත." 1975දී, එම රටේම පැවරුමක යෙදී සිටියදී, වැඩිහිටි මොන්සන් දේශය කැපකිරීමට ස්වාමීන්වහන්සේ-ගෙන් ආත්මික පෙළඹවීමක් මෙසේ කීවේය, "පියාණන්වහන්ස, මෙම දේශයේ ඔබවහන්සේගේ සභාවේ සාමාජිකයන්ට මෙය අළුත් දවසක් වේවා" ශුද්ධවන්තයන්ගේ හදවතේ ඇති "දේවමාළිගා ආශිර්වාද ලබාගැ-නීමේ" ආශාව ඉෂ්ටකර දෙන මෙන් ඔහු ඉල්ලුවේය. ඔහුගේ ආනුභාසම්-පන්න සහ අනාවැකි පොරොන්දුව ඉෂ්ඨවිය.[4]

1989 මාර්තු මස අවසාන දිනයේ, පසු-දවස්වල ශුද්ධවන්තයන්ට ජර්මානු මහජන සමූහාණ්ඩුවට ඇතුළුවීමට අවසර ලැබින. 1989

නොවැම්බර් 9 වෙනිදා, බොහෝ ශුද්ධවතයන්ගේ ඇදහිල්ල සහ යාච්ඤාවලට පිළිතුරු ලැබී, බටහිර සහ නැගෙනහිර යුරෝපයේ තිබූ බාධක පහත වැටීම ආරම්භවී, හැරී ආ අයගේ බව්තීස්ම වැඩිවී සභා ගොඩනැගිලි ඉදිකිරීම්වලට මගපෑදුනි. එක් හැරී ආ අයෙක් ප්‍රථම වරට සභාව ගැන දැනගත්තේ, 1990 මැයි 1වෙනිදා, ජරමනියේ, ඩ්‍රෙස්ඩෙන් නුවර අළුත සම්පූර්ණකල දේවස්ථානය විවෘතකිරීමේ අවස්ථාවට පැමිණි විටය. පසුව සතියකටත් අඩු කාලයක් තුලදී, ඔහු ධර්මදූත පාඩම් ලබාගෙන, මුල සිට අග දක්වා මෝර්මන්ගේ පොත දෙවරක් කියවා, සුභාරංචියේ සත්‍යතාවය ගැන ශක්තිමත් සාක්ෂියක් ලබාගැනීමෙන් පසුව, ඔහු බව්තීස්ම විය.[5]

1991 ජූනි 24වෙනිදා, මොස්කව් නගරයේ මෝර්මන් දේවස්ථාන සංගීත කණ්ඩායමේ සංදර්ශනයකින් පසුව පැවැත්වූ සාදයකදී, සෝවියට් රුසියානු මහජන සමූහාණ්ඩුවේ උප ජනාධිපතිවරයා නිවේදනයක් කරමින් සභාව ඔහුගේ රට තුල නිළ වශයෙන් පිළිගන්නා බව කීවේය. මෙමගින් මෙම විශාල සමූහාණ්ඩුවේ සෑම තැනකම සභා පිහිටුවීමට සභාවට අවසර ලැබින. 1990 ගණන්වලදී, කලින් පැවති සෝවියට් සමූහාණ්ඩුවේ සහ මධ්‍යම සහ නැගෙනහිර යුරෝපා රටවල්, ගණනාවක්ම, ඇල්බේනියාව, ආර්මේනියාව, බෙලාරස්, බල්ගේරියාව, එස්ටෝනියාව, හන්ගේරියාව, ලැතුවියාව, ලිතුවේනියාව, රොමේනියාව, රුසියාව, සහ යුක්රේනයද ඇතුළුව, සුභාරංචිය දේශනාකිරීම සඳහා කැපකරන ලදී. මෙම එක් එක් රටවල සභා ගොඩනැගිලි බදුගැනීම සහ ගොඩනැගීම කරන ලද අතර, බොහෝ දෙනෙක් සුභාරංචියේ සත්‍යතාවය ගැන සාක්ෂි ලබාගත්හ. II වන ලෝක යුද්ධයෙන් පසුව පෝලන්තයේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ ප්‍රථම රැස්වීම්ශාලාව කැපකිරීමේදී, දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි රසල් එම්. නෙල්සන්, යාච්ඤාකරමින් මෙම රැස්වීම්ශාලාව කරදරයට පත් ආත්මවලට සමාදානයත්, ධර්මිෂ්ඨතාවයට සා පිපාසා ඇත්තන්ට ක්ෂේමස්ථානයක්ද වේවායි පැතුවේය."[6] මෙම ආශිර්වාදය බොහෝ රටවල ශුද්ධවන්තයන්ගේ ජීවිතවල ඉටුවෙමින් තිබෙන අතර, ඔවුන්ට සුභාරංචියේ සමාදානය සහ සතුට සොයාගැනීමට ලැබින.

සභා සාමාජිකත්වය අති විශාල ලෙසින් වැඩිවීමේ සහ සභාපති බෙන්සන්ගේ ධර්මදූත කටයුතු ගැන අවධාරණයකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ඔහුගේ පරිපාලනය අවසන්වීමේදී ධර්මදූතයෝ 48,000ක් පමණ සභාවේ දූතමෙහෙයන් 295ක සේවයකරමින් සිටියහ.



*වැඩිහිටි රසල් එම්. නෙල්සන් රුසියානු සමූහාණ්ඩුවේ උප ජනාධිපතිවරයා සමග 1991 ජුනි 24වෙනිදා පැවැත්වූ රාජ්‍ය රාත්‍රීකෑමකට සහභාගීව සිටියි. මාසයකටත් අඩු කාලයකට පෙරදී, සමූහාණ්ඩුව මුළුල්ලේම සභාවට පිළිගැනීමක් ලබාදුන් බව උප ජනාධිපතිවරයා නිවේදනය කළේය.*

එසේම ඔහුගේ පරිපාලන කාලය තුලදී, සභාවේ සුභසාධන වැඩසටහන ලෝකය මුළුල්ලේම සිටින වෙනත් ආගම්වල සාමාජිකයන්ට මානුෂික ආධාර පිරිනැමීමද වැඩිවිය. මෙම ආධාර පිරිනැමුනේ පීඩාවට පත්වූවන්ට සහනයක්දීමට සහ ස්වයං-ශක්තිය දීර්ඝ-කාලීනව ලබාගැනීමට පිහිටවීම සඳහාය. ආහාර, ඇඳුම්, වෛද්‍ය මෙවලම්, පොරෝනා, මුදල්, සහ වෙනත් ද්‍රව්‍ය විශාල වශයෙන් දුප්පතුන්ට බෙදාදෙනු ලැබූ අතර, දීර්ඝ-කාලීන ව්‍යාපෘතිවලින් සනීපාරක්ෂාව, අකුරු ඉගැන්වීම, සහ වෙනත් සේවාවන් ලබාදෙන ලදී. මෙම අනුකම්පා සහගත සේවය ලෝකයේ බොහෝ කොටස්වල දහස්ගණනකට අදද ලබාදෙනු ලැබේ.

මහළු වයසේ දුර්වලකම්වලින් සහ සිය ආදරණීය බිරිඳවූ ෆෙලෝරා, අහිමිවීමෙන්, ශෝකයට පත්ව, සභාපති බෙන්සන් 1994 මැයි 30වෙනිදින, වයස 94දී මියගියේ ස්වාමීන්වහන්සේගේ අනාගත වක්තෘවරයෙකු ලෙස තම දූතමෙහෙය වික්‍රමාන්විතව ඉටුකිරීමෙනි. ඔහුගෙන් පසුව හොවඩ්

ඩබ්ලිව්. හන්ටර් පත්වූ අතර, ඔහු ඒවන විට දොළොස්දෙනාගේ ගණපූර්-ණයේ සභාපතිවරයා ලෙස සේවයකරමින් සිටියේය.

## සභාපති හොවඩ් ඩබ්ලිව්. හන්ටර්

1984 ජූනි 6වෙනිදින තම ප්‍රථම ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයේදී, සභාපති හොවාඩ් ඩබ්ලිව්. හන්ටර් ඔහුගේ පරිපාලනයේ වැදගත් තේමාවන් කිහිප-යක් පිහිටුවමින් මෙසේ කීවේයඃ "ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශමත් ජීවිතයට, විශේෂයෙන්ම එතුමා ප්‍රදර්ශනය කළ ප්‍රේමය සහ බලාපොරොත්තුව සහ අනුකම්පාවට වෙනදාටත් වඩා අවධානයක් යොමු-කරමින් ජීවත්වීමට සභාවේ සියලුම සාමාජිකයන්ට මම ආරාධනාකරමි.

"එකිනෙකාට වඩාත් කරුණාවෙන්, වඩාත් අචාරශීලීව, වඩාත් නිහත-මානීව, සහ ඉවසීමෙන් සහ කමාවදීමෙන් සැලකීමට මම යාච්ඤාකරමි."

සභාවේ සමාජිකයන් ඇමතූ ඔහු, "ඔවුන්ගේ සාමාජිකත්වයේ ශ්‍රේෂ්ඨ සංකේතයක් ලෙස සහ ඔවුන්ගේ බොහෝ පූජනීය ගිවිසුම්වල දිව්‍යමයබව අනුව ස්වාමීන්වහන්සේගේ දේවමාළිගාව පිහිටුවීමට කීවේය. මගේ හද-වතේ ගැඹුරුම ආශාව වන්නේ සභාවේ සෑම සාමාජිකයෙක්ම දේවමාළිගා සුදුසුකම් ලැබීමය."[7] දහස් ගණන් සභා සාමාජිකයෝ මෙම පණිවුඩ ඔවුන්ගේ ජීවිතවලට අදාලකරගනිමින්, විශාල ආත්මික බවකින් ආශිර්වාද ලැබූහ.

සභාපති හන්ටර්ට පැහැදිළිව දියුණුකල හදවතක් තිබූ අතර, එය සභාවට විශාල වටිනාකමක් විය. 1970 පසුභාගයේදී ඔහුගේ හැකියාවන් සියල්ලම අවශ්‍යවූ පැවරුමක් ඔහුට ලැබින. සභාවේ විශාලතම ගොඩනැ-ගිල්ල ඉදිවන ශුද්ධවූ භූමියවූ බ්‍රිගම් යන්ග් විශ්වවිද්‍යාලයේ නැගෙනහිර අධ්‍යයන ශාලාව අසල යෙරුසලම් මධ්‍යස්ථානය—ඉදිකිරීම සහ එම භූමිය අයත්කරගැනීම සඳහා සාකච්ඡාකර වැදගත් කාර්‍යභාරයක් ඔහු ඉටු කළේය. මෙම මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ ස්කෝපස් කන්දේය, එය ඔලිව කන්දේ පිහිටා තිබේ. එහි නිවාස සහ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන ක්‍රියාකාරකම් පවත්වන අතර, ඔවුහු තෝරාගත් දේශය, සහ ජනතාව (යුදෙව්වරුන් සහ අරාබි ජනතාව එකසමානව) සහ යේසුස්වහන්සේ සහ එතුමාගේ පැරණි අනාගතවක්තෘවරුන් ගමන්කල ස්ථානද ගැඹුරින්ම අධ්‍යයනයකරති. එහි අධ්‍යයන කටයුතු කරන අයට එය ආශිර්වාදයක්වන අතර, එය බැහැදුටු බොහෝ දෙනෙක් එහි අලංකාරයෙන් ප්‍රබෝධමත්වී ඇත.



යෙරුසලමේ ඔරසන් හයිඩ් අනුස්මරණ උද්‍යානය 1979 ඔක්තෝබර් 24 වෙනිදා කැපකිරීම. ඔලීව කන්දේ උද්‍යානය සමරනු ලබන්නේ වැඩිහිටි ඔරසන් හයිඩ් 1841 ඔක්තෝබර් 24 වෙනිදා පලස්තීන දේශය කැපකිරීමය.

හවායි, හවායි ලෙයි—බ්‍රිගම් යන්ග් විශ්වවිද්‍යාලයට යාබදව පිහිටා තිබෙන පොලිනීසියානු සංස්කෘතික මධ්‍යස්ථානය දියුණුකිරීමේ වැදගත් වැඩකොටසක්ද සභාපති හන්ටර් ඉටුකළේය. සභාව සතුව ක්‍රියාත්මක වන අමුත්තන්ගේ සිත්ගත් අක්කර 42ක භූමිය පාලක මණ්ඩලයේ ආරම්භක සභාපතිවරයාද ඔහු විය. එහි අරමුණ වන්නේ පොලිනීසියානු සංස්කෘතිය ආරක්ෂාකිරීම සහ ශිෂ්‍යයන්ට රැකියා ලබාදීමය. 1963දී සාදන ලද, විශාල ආකර්ෂනයක් වන එය නැරඹීමට දැන් හැම වසරකම දශ ලක්ෂයක ජනතාවක් පැමිණ, පොලිනීසියානු දූපත්වල සංගීතය, රැඟුම්, කලා සහ කැටයම් බලා සතුටුවෙති.

ඔහු සභාවේ සභාපතිවරයාවීමට පෙර, වැඩිහිටි හන්ටර් යූටා, පෙළපත් සමාජයේ සභාපතිවරයා ලෙස වසර අටක් සේවයකළ අතර, ඔහු වර්තමාන පවුල් ඉතිහාස දෙපාර්තමෙන්තුවේ ආරම්භකයාද විය. මේ කාලයේදී, සමාජය අනුග්‍රහයෙන් පවත්වන ලද 1969දී වාර්තාගතව තිබෙන ප්‍රථම ලෝක සම්මන්ත්‍රනය, "සභාවට මහත් යහපතක් කර ඇති අතර, අපගේ වැඩකටයුතුවලට ලෝකයේ සෑම තැනකම දොර විවෘතකර ඇත"[8] යයි ඔහු කීවේය. ජීවත්වන සහ මියගිය සියල්ලන්ටම ඔහු විශාල ප්‍රේමයක් වර්ධනයකරගෙන, අප සියල්ලෝම එක් ශ්‍රේෂ්ඨ පවුලක කොටසක් බව නිතර ඉගැන්වීය. ඔහුව හඳුන්වනු ලැබුවේ ක්‍රිස්තු ප්‍රේමය සතුව තිබූ මිනිසෙක් ලෙසය.

තම ජීවිත කාලය තුලදී, සභාපති හන්ටර් බොහෝ විපත්වලට මුහුණ දුන්නේය. ඇදහිල්ලෙන් සහ ධෛර්‍යයෙන් යුතුව ඔහු බරපතල වේදනාකාරී සෞඛ්‍ය ප්‍රශ්නවලට, දීර්ඝ-කාලීන බෙලහීනතාවයන්ට සහ ඔහුගේ ප්‍රථම භාර්‍යාවගේ මරණය, සහ වෙනත් අසීරුතාවයන්ටද මුහුණ දුන්නේය. මෙම බාධක නොසලකා, ඔහු ක්‍රියාකාරීව ස්වාමීන්වහන්සේට සේවයකරමින්, බොහෝ සේ සංචාරයකර සහ වෙහෙසවී වැඩකරමින් සභාවේ පරිපාලන කටයුතු කළේය. ඔහුගේ ආදර්ශය ඔහුගේ මෙම පණිවුඩය හා ගැලපෙයිඃ "ඔබගේ නිවසේ නොමග යන ළමයින්ගේ ප්‍රශ්න ඔබට තිබේනම්, මූල්‍යමය ප්‍රශ්න සහ චෛතසික කැළැල් ඔබගේ නිවසට සහ සතුටට තර්ජනයක් නම්, ජීවිතයක් හෝ නිරෝගීකම හෝ අභිමිවීමකට ඔබ මුහුණදිය යුතුව තිබේනම්, ඔබගේ ආත්මයට සමාදානය ලැබේවා. අපගේ දරාගැනීමේ හැකියාව අභිබවා අපව පරීක්ෂාකරනු නොලැබේ. අපගේ ගමන්මග වෙනස්කම් සහ බලාපොරොත්තු කඩවීම් උන්වහන්සේට ඍජු සහ පටු මාවතේ යාමකි."[9]

සභාපති හන්ටර් 1994 දෙසැම්බර් 11 වෙනිදා, මෙක්ෂිකෝවේ, මෙක්ෂිකෝ නගරයේදී, සභා ඉතිහාසයේ වැදගත් සැතපුම් කණුවක් වන, සභාවේ 2,000වෙනි ස්ටේකය නිර්මානය කිරීමේදී මූලාසනය දැරුවේය, එහි සිටි අය ඇමතූ ඔහු, "ස්වාමීන්වහන්සේ, එතුමාගේ සේවකයන් තුලින්, එතුමාගේ හාස්කම් ඉෂ්ටකර ඇත. මෙම කටයුතු ශක්තිමත්ව සහ වැදගත්ලෙස නොකඩවාම ඉදිරියට යනු ඇත. ලිහායි පියාගේ සහ ඔහුගේ පරම්පරාව ගැන දුන් පොරොන්දු මෙක්ෂිකෝව තුල සිදුවී සහ සිදුවෙමින් පවතී."[10] සභාපති හන්ටර් ප්‍රධාන අධිකාරිවරයෙක් ලෙස සේවයකළ කාලය තුලදී, සභාව ලතින් අමෙරිකාව තුල විස්මිත ලෙස වර්ධනයවිය. ඔහු සභාවේ සභාපතිවරයා බවට පත්වූ කාලයේ, මිලියන 1.5 කට වැඩි ශුද්ධවන්තයන් පිරිසක්, මෙක්ෂිකෝව, බ්‍රසීලය, සහ චිලී රටවල සිටි අතර, එය ඒ කාලයේ යුටා නගරයේ ජීවත්වූ සභා සාමාජියන්ට වඩා වැඩි පිරිසකි.

සභාපති හන්ටර් සභාවේ සභාපතිවරයා ලෙස සේවය කලේ මාස නවයක් පමණක් වුවද, ශුද්ධවන්තයන් කරෙහි බලවත් ඇල්මක් ඔහුට තිබූ අතර, ඔහුගේ අනුකම්පාව, දීර්ඝ ඉවසීම සහ ක්‍රිස්තුස් වැනි ජීවිතයක උදාර ආදර්ශය ඔවුන්ට මතක ඇත.

## සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි

සභාපති හන්ටර්ගේ මරණයෙන් පසුව ගෝර්ඩන් බී. හින්ක්ලි සභාවේ සභාපතිවරයා බවට පත්වූ විට, සභාපතිත්වය ගැන ඔහුගේ දර්ශනය කුමක්දැයි ඔහුගෙන් අසන ලදී. ඔහු මෙසේ පිළිතුරු දුන්නේය: "ඉදිරියට ගෙනයාම, ඔව්. අපගේ තේමාව වන්නේ අපට කලින් සිටි අය, බොහෝ ප්‍රසංසනීයව, බොහෝ ඇදහිලිමත්ව, සහ බොහෝ හොඳින් ඉදිරියට ගෙන ආ ශ්‍රේෂ්ඨ කටයුතු ඉදිරියට ගෙන යාමය. පවුල් වටිනාකම් ගොඩනැගීමය, ඔව්, අධ්‍යාපනය පෝෂණයකිරීමය, ඔව්. සෑම තැනකම සිටින අපගේ ජනතාව අතර ඉවසීමේ ආකල්පයක් ගොඩනැගීමය, ඔව්. තවද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය දේශනාකිරීමය."[11]

සභා නායකත්වය ගැන සභාපති හින්ක්ලි සතුවූ පුළුල් අත්දැකීම් සභාපතිත්වය සඳහා ඔහුව හොඳින් සූදානම් කළේය. ඔහුව ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයට ස්ථිරකළේ 1961දීය. ඔහු 1981 ආරම්භව, ඔහු පළවෙනි සභාපතිත්වයේ සභාවේ සභාපතිවරුන් තුන්දෙනෙකුගේ උපදේශකවරයෙක් ලෙස—ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්, එස්රා ටැෆ්ට් බෙන්සන් සහ හොවඩ් ඩබ්ලිව්. හන්ටර් සමග සේවය කළේය. මෙම

කාලයේ සමහර වර්ෂවලදී, සභාවේ මෙම සභාපතිවරුන් මහළු වියේ දුබලතාවලින් පීඩාවිඳින විට, ඔහු අතිමහත් බරපතල වගකීම් දැරීය.

ගෝර්ඩන් බී. හින්ක්ලි තරුණ කාලයේ එංගලන්තයේ සේවය කරත්දී, ඔහුට ලැබුනු යම් උපදෙස්, ඔහුගේ කාලයේ ඇතිවූ අභියෝගාත්මක වගකීම්වලට ඔහුට මහා පිටුවහලක් විය. මඳ අධෛර්‍යයකින් යුතුව, ඔහු තම පියාට ලිපියක් ලීවේය, "මම මගේ කාලය සහ ඔබගේ මුදල් නාස්ති-කරමි. මෙහි නැවතී සිටීමේ තේරුමක් ඇතැයි මට නොපෙනේ." ටික කාලයකට පසුව, ඔහුගේ පියාගෙන් ඔහුට ලැබුන කෙටි ලිපියක මෙසේ සඳහන්වියඃ "ආදර ගෝර්ඩන්, ඔබගේ ලිපිය මා අත ඇත....මට ඇත්තේ එක් යෝජනාවක් පමණි. ඔබ ගැන අමතකකර වැඩට යන්න. මීට ආදර, ඔබගේ පියා."

එම මොහොත ගැන සභාපති හින්ක්ලි මෙසේ කීවේයඃ "ඒ ගැන මම සිතාබලා, පසුදා උදෑසන අපගේ ශුද්ධ ලියවිලි පංතියේදී ස්වාමීන්වහන්-සේගේ මෙම ශ්‍රේෂ්ඨ ප්‍රකාශය අපි කියවූවෙමුඃ 'මක්නිසාද තමාගේ ජීවිතය ගලවාගන්ට කැමති කවරෙකුට නුමුත් ඒක නැතිවෙන්නේය; මා නිසාද, ශුභාරංචිය නිසාද තමාගේ ජීවිතය නැතිකරගන්න කවරෙකු නුමුත් ඒක ගලවාගන්නේය.' (මාර්ක් 8:35). එය මගේ සිතට කාවැදින. එම ප්‍රකාශය, එම පොරොන්දුව, මගේ පියාගේ ලිපිය හා සම්බන්ධවී, ඉහළ මාලයට යාමට මා පොළඹවා,...මට දණගැසීමට සලස්වා, මාව අමතකකර, වැඩට යාමට මා උත්සාහකරන බවට ස්වාමීන්වහන්සේ සමග ගිවිසුමක් ඇතිකර-ගැනීමට සැලැස්වීය. එය මා සලකන්නේ මගේ ජීවිතයේ තීරණයක් ගත් දවස ලෙසය. එතැන් සිට මට සිදුවූ සෑම යහපතක්ම ඒ කාලයේ මා ගත් තීරණය නිසා ඇතිවූවක් ලෙස සිතීමට මට හැකිය."[12]

සභාපති හින්ක්ලි මැඩලිය නොහැකි සුභාවදීව සිතන, නිතරම දෙවි-යන්වහන්සේ තුල සහ අනාගතය ගැන පූර්ණ ඇදහිල්ලකින් යුත් පුද්ගල-යෙකු ලෙස ප්‍රසිද්ධය. "'සියල්ල හොඳින් සිදුවේවි' යන්න පවුලට, මිතු-රන්ට, සහ ඇසුරුකරන්නන්ට සභාපති හින්ක්ලි නිතර දුන් සහතිකයකි. 'උත්සාහකර බලන්න' යයි ඔහු කියනු ඇත. 'විශ්වාසකරන්න, සතුටින් සිටින්න, අධෛර්‍ය නොවන්න, සියල්ල හොඳින් සිදුවේවි.'"[13]

සභාව මුහුණදෙන විශාලතම අභියෝගය සඳහන්කිරීමට වාර්තාකරු-වෙකු කීවිට, ඔහු මෙසේ ප්‍රතිචාර දැක්වීය, "අප මුහුණදෙන වඩාත් බරප-තලම අභියෝගය සහ වඩාත් අසිරිමත්ම අභියෝගය නම්, වර්ධනයවී-මෙන් එන අභියෝගයයි." වැඩිවන වර්ධනය සඳහා වැඩිපුර ගොඩනැගිලි, දේවමාළිගාද ඇතුළුව අවශ්‍ය බව ඔහු පැහැදිළි කළේයඃ "දේවමාළිගා

ගොඩනැගීම සඳහා සහා ඉතිහාසය තුල ඇති හොඳම යුගය මෙයයි. දැන් මේ කාලයේ තරම් ඉදිරියට ගෙනයන පරිදි, දේවමාළිගා ඉදිකිරීම් කිසි කලෙක ඉදිරියට ගොස් නැත. ක්‍රියාත්මක දේවමාළිගා 47ක් අපට ඇත. ඉදිකිරීමේ යම් අවස්ථාවක පවතින තවත් දේවමාළිගා 13ක් අපට ඇත. අපි දිගටම දේවමාළිගා ගොඩ නගන්නෙමු."[14] සභාව වැඩියෙන් වර්ධනයවන විට, මෝර්මන්ගේ පොත තවත් භාෂාවලට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවයද පැනනගියි.

සභාවේ අසිරිමත් වර්ධනය හා සම්බන්ධව සභාපති හින්ක්ලිට පුද්ග-ලික අත්දැකීම් තිබී ඇත. 1967දී, ජපානයේ, ඔසාකා, නගරයේ, බොහෝ තරුණ පිරිසක් සිටි, සම්මන්ත්‍රනයකට සහභාගිවෙමින්, ඔහු මෙසේ කීවේයඃ "ජපානය තුල සභාවේ අනාගතය ඔබ තුලින් මට පෙනේ. එසේම ශ්‍රේෂ්ට අනාගතයක් මට පෙනේ. අපගේ වර්ධනය දැනට මෙහි ඇත්තේ මඳ වශයෙනි, නමුත් දීර්ඝ කාලයක සිට මට තද හැඟීමක් තිබුන බව කීමට මට පෙළඹවීමක් ඇත. එනම්, මෙම ශ්‍රේෂ්ඨ දේශයේ සයෝනයේ ස්ටෙකයක් ඇතිවන දිනය එතරම් දුර නැත."[15] පරම්පරාවක් තුලදී, ජපානය තුල, පසු-දවස්වල ශුද්ධවන්තයෝ 100,000ක්ද, ස්ටේක ගණනාවක්ද, දූතමෙහෙයන්, සහ දිස්ත්‍රික්ක සහ දේවමාළිගාවක්ද ඇත.

පිලිපීනයේ සභාව වර්ධනයවීම ගැනද සභාපති හින්ක්ලි තද සැල-කිල්ලක් දැක්වීය, එහි මැනිලා නගරයේ ප්‍රථම ස්ටේකය සංවිධානය කෙරුනේ 1973දීය. දසක දෙකකට පසුව, ඔහු සභාවේ සභාපතිවරයා බවට පත්වූ විට, 300,000ක අධික සාමාජිකයයෝ, ඔවුන්ගේ රට තුල දේවමාළිගාවක්ද ඇතුළුව, සුභාරංචියේ ආශිර්වාද ලබමින් සිටියහ. සභා-පති හින්ක්ලි, කොරියාව, චීනය, සහ නැගෙනහිර ආසියාවද ඇතුළුව, ආසියාවේ වෙනත් කොටස්වල සභාවේ වර්ධනය ගැනද විශාල සැලකිල්-ලක් පෙන්වා ඇත.

පිලිපීන ස්ටේකයට අළුත් ස්ටේක් සභාපතිවරයෙක් කැඳවීමට පත්-කරන ලද ප්‍රධාන අධිකාරීවරයෙකුගේ අත්දැකීම බොහෝ අසියාතික සමාජිකයන්ගේ ආත්මිකබවට සාක්ෂියකි. පූජකවරයේ සෙහොයුරන් ගණනාවක් සමග සම්මුඛපරීක්ෂණ පැවැත්වීමෙන් පසුව, විසි-හැවිරිදි වියේ මැද පසුවන මිනිසෙක් ස්ටේක් සබාපතිවරයා ලෙස කැඳවීමට ඔහු තුළ තද හැඟීමක් ඇතිවිය. එම තරුණ සොහොයුරාට යාබද කාමරයකට ගොස් මඳ කාලයක් වැයකර, ඔහුගේ උපදේශකයන් තෝරාගන්නා ලෙස ඔහු කීවේය. එම සොහොයුරා තත්පර 30කින් නැවත පැමිණියේය. ඔහු වරදවා තේරුම්ගෙන ඇති බව ප්‍රධාන අධිකාරිවරයා සිතු නමුත්, අළුත්

ස්ටේක් සභාපතිවරයා මෙසේ කීවේය, "නැත, මා ස්ටේක් සභාපතිවරයා-වීමට යන බව ස්වාමීන්වහන්සේගේ ආත්මය තුලින් මාසයකට පෙර මම දැන සිටියෙමි. මගේ උපදේශකවරුන් මම දැනටමත් තෝරාගෙන සිටිමි."

ලෝකය මුළුල්ලේම සභාව පිහිටුවීමට බොහෝ සේ සහාය දැක්වූ සභාපති හින්ක්ලි ඔහුගේ පරිපාලන කාලය තුලදී මෙම නිවේදනය කිරීමට හැකිවීම ඔහුට හොඳින්ම ගැලපේ: "අපගේ සංඛ්‍යා ලේඛකාධිව-රුන් මට පවසන පරිදි, වර්තමාන රැල්ල දිගටම පවතී නම්, 1996 යම් කාලයකදී, දැනට මාස කිහිපයකට පසුව, එක්සත් ජනපදයේ දැනට සිටි-නවාට වඩා වැඩි සාමාජික පිරිසක් එක්සත් ජනපදයෙන් පිටත සිටිනු ඇත. එම ඉර පැන්නීමට ලැබීම අසිරිමත් වැදගත් දෙයකි. අතිවිශාල ලෙස ලඟාවීමක් එයින් නියෝජනයවේ."[16]

සභාපති හින්ක්ලිගේ පරිපාලනයේ ප්‍රධාන අවධාරණයකිරීම නම්, විශේෂයෙන්ම පවුලේ වටිනාකම ගැන සහාය නොදක්වන ලෝකයක් තුල, යහපත් පවුල් ජීවිතයක වැදගත්කම ගැනය. ඔහුගේ මගපෙන්වීම යටතේ, පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය පවුල මාතෘකාව යටතේ, විශේෂ ප්‍රකාශනයක් නිකුත් කළේය, එහි කොටසක මෙසේ සඳහන්වේ:

"පවුල දෙවියන්වහන්සේගේ නියමයකි. මිනිසෙකු සහ ගැහැණියක අතර විවාහය උන්වහන්සේගේ සදාකාලික සැලසුමේ අත්‍යාවශ්‍ය අංගයකි. ළමුන් විවාහ බන්ධනයේ පොරොන්දු ප්‍රකාර ඉපදීමට සුදුසුකම් ලබන අතර, සම්පූර්ණ විශ්වාසයෙන් යුතුව විවාහ ගිවිසුම්වලට ගරුකරන පියා සහ මව විසින් ඇතිදැඩි කළ යුතුය. විවාහ ජීවිතයේ සතුට උදාකරගැ-නීමට වඩාත්ම හැකියාව ලැබෙන්නේ, ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්-සේගේ ඉගැන්වීම් මත ගොඩනගාගත් විටය....

"පතිවෘත්තාවේ ගිවිසුම් කඩකරන, ස්වාමිපුරුෂයාට හෝ භාර්යාවට හෝ දරුවන්ට හිරිහැරකරන, හෝ පවුලේ වගකීම් ඉටුකිරීම පැහැරහරින පුද්ගලයන් යම් දිනෙක දෙවියන්වහන්සේ ඉදිරියේ වගකිවයුතු වන බවට අපි අනතුරු අඟවන්නෙමු. තවදුරටත්, පවුලක් කැඩී බිඳීයාම මගින් පුද්ග-ලයන්ටද, සමාජයට හා ජාතීන් හටද, පුරාතන නූතන අනාගතවක්තෘව-රුන්ගේ අනාවැකි පරිදි මහත් විපත්ති ගෙන එන බවටද අපි අනතුරු අඟවන්නෙමු."[17]

1995 අප්‍රේල් සම්මන්ත්‍රනයේදී, සභාපති හින්ක්ලි නිවේදනයකරමින්, 1995 අගෝස්තු 15වෙනිදා, හොඳින් සේවයකළ, සභාවේ පළාත් නියෝජි-තයන්, මුදාහැර, අළුත් පදවියක්, එනම් ප්‍රාදේශීය අධිකාරියක් පිහිටුවන

බවත් කීවේය. ප්‍රාදේශීය අධිකාරීන් ස්ටේක් සම්මන්ත්‍රනවල මූලාසනය උසුලනු ඇත; ස්ටෙක් හඳුනාගැනීම හෝ නිර්මානයකරනු ඇත; ස්ටේක්-වලට, දූතමෙහෙයන්වලට සහ දිස්ත්‍රික් සභාපතිවරුන්ට පුහුණුවීම් ලබාෙ-දනු ඇත; තවද පළවෙනි සභාපතිත්වය සහ ඔවුන්ගේ ප්‍රාදේශීය සභාප-තිත්වයන් දෙනු ලබන පැවරුම් ක්‍රියාත්මකකරනු ඇත. මෙම අළුත් පදවිය මගින් සභා නායකයන් තමන් සේවයකරන ජනතාවට සමීපව ජීවත්වෙ-මින් වැඩකරන අතර, ලෝකය මුළුල්ලේම පහසුකම් වර්ධනයවීමද වැඩිවේ.

එක් එක් ශුද්ධවන්තයා සභාපති හින්ක්ලි ස්ථිරකරන අන්දම එක් ප්‍රධාන අධිකාරිවරයෙක් පැහැදිළි කළේය: "ඔහුව කැඳවා තිබෙන ශුද්ධවූ තනතුර වන—අනාගතවක්තෘ, දර්ශනදකින්නා සහ එළිදරව්කරු, මූලා-සනය උසුලන උත්තම පූජකවරයා, සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ සභාපතිවරයා ලෙස ක්‍රියා-කරන විට,…ඔහුගේ තනතුර ස්ථිරකිරීමට අපට හැකි හොඳම ක්‍රමය නම්, 'දිගටම කරගෙනයාමය, දිගටම කරගෙනයාමය, දිගටම කරගෙනයාමය!' "[18]



*මෙම ධර්මදූතයෝ ජෝසෆ් ස්මිත්ගේ අනාවැකිය සම්පූර්ණකිරීමට උපකාර කරති.: "දෙවියන්වහන්සේගේ සත්‍යය සෑම මහාද්වීපයක්ම විනිවිදයන තුරු,...සහ සෑම කණක්ම අසන තුරු, නිර්භීතව, උදාරව, සහ නිදහසේ ඉදිරියට යනු ඇත."*

# අවසානය

අප එකිනෙකාට සහා ඉතිහාසයේ ස්ථානයක් ඇත. සමහර සාමාජික-
යන් ඉපදී තිබෙන පවුල් පරම්පරා ගණනාවක සිට සුභාරංචිය වැළඳ-
ගෙන, තම දරුවන් ස්වාමීන්වහන්සේගේ මාර්ගවල ඇතිදැඩි කර ඇත.
තවත් අය ප්‍රථමවරට සුභාරංචිය අසා බව්තීස්ම ජලයට ඇතුළුවී, එමගින්
පූජනීය ගිවිසුම් තබා දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට
ඔවුන්ගේ කොටස කරති. බොහෝ සාමාජිකයෝ ඔවුන් ජීවත්වන ප්‍රදේ-
ශවල සහා ඉතිහාසයේ ඔවුන්ගේ යුගය ආරම්භකර, ඔවුන්ගේ දරුවන්ට
ඇදහිල්ලේ උරුමයක් නිර්මානයකර දෙති. අප කුමන තත්වයක සිටියද,
අපි හැම කෙනෙක්ම සයෝනය ගොඩනැගීමේ වැදගත් කොටසක්
කරමින් ගැලවුම්කරුවාණන්ගේ දෙවන ගමනට සූදානම්වන්නෙමු. අපි
"එනිසා තවත් විදේශිකයෝවත්, ආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන්
සමග එක නුවර වැසියෝව දෙවියන්වහන්සේගේ පවුලේ අයවල්ව සිටින්-
නෙමු" (එපීස 2:19).

අප අළුත් හෝ පැරණි සාමාජිකයන් වුවද, අපට පෙර ගිය අයගේ
ඇදහිල්ල සහ පරිත්‍යාගවල උරුමයක් අපට උරුමවී ඇත. තවද අපි
අපගේ දරුවන්ට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය තවමත්
අසා පිළි නොගත් අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ කෝටි
සංඛ්‍යාත දරුවන්ගේද නූතන-කාලයේ පුරෝගාමීන්වන්නෙමු. ස්වාමීන්ව-
හන්සේගේ කටයුතු ඇදහිලිමත්ව ක්‍රියාත්මක කිරීම මගින් අපි ලෝකය
මුළුල්ලේම විවිධ අන්දමින් අපගේ දායකත්වය ලබාදෙන්නෙමු.

පියවරු සහ මව්වරු තම දරුවන්ට ධර්මිෂ්ඨතාවයේ මූලධර්ම යාච්ඤා-
ාවෙන් යුතුව පුහුණුකරති. නිවාස සහ බැහැදැක ඉගැන්වීමේ ගුරුවරු
අවශ්‍යතාවයන් ඇති අයට සලකති. සුභාරංචි පණිවුඩය අන් අයට රැගෙ-
නයාමට තම ජීවිතයේ වසර ගණන් කැපකරන ධර්මදූතයන්ට පවුල් සුභ
පතති. ආත්මාර්ථ නොවන පූජකවරයේ සහ උපශාඛා නායකයෝ සේවය-
කිරීමේ කැඳවීමට පිළිතුරු දෙති. ගිණිය නොහැකි පැය ගණනාවක නිහඬ

සේවයක් මුතුන්මිත්තන්ගේ නම් සෙවීමට වැයකරමින් සහ දේවමාළිගාවේ පූජනීය නියෝග ඉටුකිරීම තුළින්, ජීවත්වන සහ මියගිය අයට ආශිර්වාද ලබාදෙනු ලැබේ.

අනාගතවක්තෘ ජෝසප් ස්මිත්ට එළිදරව්කල යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ ගමනාන්තය සම්පූර්ණකිරීමට අපි හැම කෙනෙක්ම උපකාර කරන්නෙමු. 1842දී ඔහු මෙම අනාවැකිය කීවේය:

"සත්‍යයේ ප්‍රමිතිය පිහිටුවා ඇත, වැඩකටයුතු වර්ධනයවීම නැවැත්වීමට කිසිදු අපවිත්‍ර හස්තයකට නොහැකිය; හිංසා පීඩා වැඩිවිය හැකිය, දාමරිකයෝ එක්විය හැකිය, හමුදාවෝ එකට එකතුවිය හැකිය, අපවාදවලින් කෙලෙසිය හැකිය, නමුත් දෙවියන්වහන්සේගේ සත්‍යය, සෑම මහාද්වීපයක්ම විනිවිද ගොස්, සෑම ප්‍රදේශයක්ම බැහැදැක, සෑම රටකම පැතිරී, සෑම කනක්ම අසන තුරු, සහ දෙවියන්වහන්සේගේ අරමුණු ඉටුවී, වැඩකටයුතු නිමවී තිබෙන බව ශ්‍රේෂ්ඨ යෙහෝවාවහන්සේ කියන තුරු, නිර්භීතව, උදාරව, සහ නිදහසේ ඉදිරියට යනු ඇත."[1]

අනාගතවක්තෘ ජෝසප් ස්මිත්ගේ ජීවිත කාලය තුළදී සභාව ඉතා කුඩාවට තිබුනද, එය පොළොව මත දෙවියන් වහන්සේගේ රාජ්‍යය බවත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචි සත්‍යයන්ගෙන් මුළු ලෝකයම පිරවීම එහි ගමනාන්තය බවත් ඔහු දැනසිටියේය. සභාවේ මෑතකාලීන විස්මිත වර්ධනය අප දැක ඇත. සදාකල් පවතින රාජ්‍යය වන, දෙවියන්වහන්සේගේ රාජ්‍යය පිහිටුවීමට උදව්කරමින් අපගේ ඇදහිල්ල සහ පරිත්‍යාගය පිරිනැමීමට අපට හැකි කාලයක ජීවත්වීමට ලැබීම අප ලත් වරප්‍රසාදයකි.

# අංකසටහන්

හැඳින්වීම

1. *සභා ඉතිහාසය,* 3:30.
2. "පළවෙනි සභාපතිත්වයෙන් පාස්කු සුභපැතුම්," *සභා පුවත්, 15 අප්‍රේ. 1995, 1.*

2 දෙවෙනි පරිච්ඡේදය

1. ලුසී මැක් ස්මිත්, *ජෝසෆ් ස්මිත් ඉතිහාසය* (1958), 128.
2. රූබන් මිලර් ජර්නල් 1848–49, 21 ඔක්තෝ. 1848; ඓතිහාසික දෙපාර්තමේන්තුව, ලේඛනාරක්ෂක කාර්‍යාංශය, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්ත-යන්ගෙන් යුත් සභාව, මතු සඳහන් වන්නේ පදගු සභාවේ ලේඛනාරක්ෂක වශයෙනි; අකුරු සහ විරාම ලකුණු නවීකරණයකර ඇත.
3. ඩීන් ජෙසී, සං, "මුල්කාලීන මෝර්මන් ඉතිහාසයේ ජෝසෆ් නයිට්ගේ එකතුවක්," *බ්‍රියම් අධ්‍යයන,* සරත් ඍතුව 1976, 36; අකුරු නවීකරනයකර ඇත.
4. *සභා ඉතිහාසය,* 5:124–25.
5. *ශුද්ධවන්තයන්ගේ හැරල්ඩ්,* 1 මාර්. 1882, 68.
6. *සභා ඉතිහාසය,* 1:55.
7. "බ්‍රිගම් යන්ග් ඉතිහාසය," *මිලෙනියල් ස්ටාර්,* 6 ජූනි 1863, 361.
8. බ්‍රිගම් යන්ග්, *ජර්නල් දේශනා තුලිනි,* 3:91.
9. "බ්‍රිගම් යන්ග් ඉතිහාසය," *මිලෙනියල් ස්ටාර්,* 11 ජූලි 1863, 438.
10. "ඔලිවර් කව්ඩරිගෙන් ඩබ්ලිව්. ඩබ්ලිව්. ෆෙල්ප්ස්ට ලිපියක්," *පසු-දවස්වල ශුද්ධවන්ත-යන්ගේ පණිවුඩකරු සහ මැදහත්කරු,* ඔක්තෝ. 1835, 199.
11. *සභා ඉතිහාසය,* 1:78.
12. *සභා ඉතිහාසය,* 1:78.
13. ලුසී මැක් ස්මිත්, *ජෝසෆ් ස්මිත් ඉතිහාසය,* 168.
14. ඩීන් ජෙසී, සංස්, "මුල්කාලීන මෝර්මන් ඉතිහාසයේ ජෝසෆ් නයිට්ගේ එකතුවක්," 37; අකුරු නවීකරනයකර ඇත.
15. *සභා ඉතිහාසය,* 5:126.
16. *සභා ඉතිහාසය,* 2:443.
17. "සම්මන්ත්‍රන සටහන්," *ටයිම්ස් සහ සීසන්ස්,* 1 මැයි 1844, 522–23.
18. ජෝසෆ් නයිට්ගේ ජීවිත කථා සටහන්, 1862; පදගු සභා ලේඛනාරක්ෂන තුලිනි.

19. නිවෙල් නයිට්, උපුටාගැනීම ලැරී පෝටර් තුලිනි, නිව් යෝර්ක් සහ පෙනිසෙල්වේ-නියා රාජ්‍ය තුල "යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ ආරම්භය ගැන අධ්‍යනයක් 1816–1831" (පීඑච්ඩී ඩිස්, බ්‍රිගම් යන් විශ්වවිද්‍යාලය, 1971), 296.
20. *බෲම් සමූහාණ්ඩුව,* 5 මැයි 1831; උපුටාගැනීම ලැරී පෝටර් තුලිනි, "යේසුස් ක්‍රිස්-තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ ආරම්භය ගැන අධ්‍යනයක්," 298–99; අවධාරණ ඇතුලත්ය.
21. ලූසී මැක් ස්මිත්, *ජෝසෆ් ස්මිත් සභා ඉතිහාසය,* 204.

3 තුන්වෙනි පරිච්ඡේදය

1. ඔරසන් එෆ්. විට්නි, "නිවෙල් කේ. විට්නි," *ආධාරකාරයා,* ජන. 1885, 125.
2. එළිසබෙත් ඇන් විට්නි, උපුටාගැනීම එඩ්වඩ් ඩබ්ලිව්. ටුලිජ් තුලිනි, *අනුස්මරණීය කාන්තාවන්* ♀1877♂, 42.
3. ඔරසන් එෆ්. විට්නි, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1912, 50.
4. බ්‍රිගම් යන්ග්, *ජර්නල් දේශනා* තුලිනි, 11:295.
5. ඔරසන් එෆ්. විට්නි, "නිවෙල් කේ. විට්නි," 126.
6. ජෝසෆ් හොල්බෲක්, උපුටාගැනීම ජේම්ස් එල්. බැඩ්ලි තුලිනි, *සයෝනයේ කඳවුර 1834: සිවිල් යුද්ධයට ප්‍රාරම්භයක්* (1990), 33.
7. ජෝර්ජ් ඇල්බට්. ස්මිත්, "ජෝර්ජ් ඇල්බට්. ස්මිත්ගේ ඉතිහාසය, 1834–1871," 17; පදශූ සභාවේ ලේඛනාරක්ෂන තුලිනි.
8. *සභා ඉතිහාසය,* 2:73.
9. *සභා ඉතිහාසය,* 2:68.
10. ජෝසෆ් යන්ග් ජ්‍යෙ., *හැත්තෑවරුන් සංවිධානය කිරීමේ ඉතිහාසය* (1878), 14.
11. විල්ෆෝඩ් වුඩ්රෆ්, *ඩෙසරට් පුවත්,* 22 දෙසැ. 1869, 543.
12. "සේරා පල්සිපර් වාර්තා පොත, 1858–1878," 5; පදශූ සභා ලේඛනාරක්ෂන තුලිනි.
13. "ජෝන් ඊ. පේජ්ගේ ඉතිහාසය," *ඩෙසරට් පුවත්,* 16 ජූනි 1858, 69.
14. ඔරසන් එෆ්. විට්නි, *හීබර් සී. කිම්බල්ගේ ඉතිහාසය,* 3වෙනි ප්‍රකා. (1945), 104.
15. ඔරසන් එෆ්. විට්නි, *හීබර් සී. කිම්බල්ගේ ජීවිතය,* 105.
16. *එලිසා ආර්. ස්නෝ: අමරණීයයි* (1957), 54.
17. "වැඩිහිටියෙකුගේ ජීවිත සටහන්," *ජීවිතකථාවේ කොටස්* (1883), 12.
18. *සභා ඉතිහාසය,* 2:430.
19. ඩැනියෙල් ටයිලර්, "අත්දැකීම්වල සිද්ධීන්," *ජීවිතකථාවේ කොටස්,* 32.
20. එලිසා ආර්. ස්නෝ, උපුටාගැනීම ටුලිජ් තුලිනි, *අනුස්මරණීය කාන්තාවන්, 95.*

4 හතරවෙනි පරිච්ඡේදය

1. එමිලි එම්. ඔස්ටින්, *මෝර්මන් දහම; හෝ මෝර්මන්වරුන් අතර ජීවිතය* (1882), 63.
2. එමිලි එම්. ඔස්ටින්, *මෝර්මන් දහම,* 64.
3. ජෝසෆ් ස්මිත්, *පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ පණිවුඩකරු සහ මැදහත්කරු,* සැප්තැ. 1835, 179.
4. ලැරී සී. පෝටර්, "කෝ නගරබද කෝල්ස්විලී ශාඛාව, ජැක්සන් ප්‍රාන්තය, මිසූරි, *1831 සිට 1833 දක්වා,"* පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ *සභා ඉතිහාසයේ පළාත්*

*අධ්‍යයන තුලිනි,: මිසුරි,* සං. ආර්නෝල්ඩ් කේ. ගාර් සහ ක්ලාක් වී. ජොන්සන් (1994), 286–87.

5. *සභා ඉතිහාසය,* 1:199.
6. එමිලි ඇම්. ඔස්ටින්, *මෝර්මන්දහම,* 67.
7. *පාර්ලි පී. ප්‍රැට්ගේ ජීවිතකථාව,* සංස්. පාර්ලි පී. ප්‍රැට් කණි. (1938), 72.
8. *සභා ඉතිහාසය,* 1:269.
9. *ෆාර් වෙස්ට් වාර්තා,* සං. ඩොනල්ඩ් කිව්. කැනන් සහ ලින්ඩන් ඩබ්ලිව්. කුක් (1983), 65.
10. "නිවෙල් නයිට්ගේ ජර්නලය," *ජීවිතකථාවේ කොටස්* (1883), 75.
11. මේරි එළිසබෙත් රොලින්ස් ලයිට්නර්, *යුටා පෙළපත් සහ ඓතිහාසික සඟරාව,* ජූලි 1926, 196
12. *සභා ඉතිහාසය,* 1:391.
13. "ෆිලෝ ඩිබෙල්ගේ කථාව," *සභා ඉතිහාසයේ මුල් සිද්ධීන්* (1882), 84–85.
14. *පාර්ලි පී. ප්‍රැට්ගේ ජීවිත කථාව,* 102.
15. "නිවෙල් නයිට්ගේ ජර්නලය," *ජීවිත කථාවේ කොටස්,* 85.
16. ඇන්ඩෘ ජෙන්සන්, *ඓතිහාසික වාර්තා* (1888), 7:586.
17. බලන්න ඩීසහසී 116:1; තවද බලන්න ඩීසහසී 107:53–57; *සභා ඉතිහාසය,* 3:34–35.
18. ඔරසන් එෆ්. විට්නි, *හීබර් සී. කිම්බල්ගේ ජීවිතය,* 3වන ප්‍රකා. (1945), 213–14.
19. ලේලන්ඩ් හෝමර් ජෙන්ට්රි, "මිසුරි උතුරුදිග සිටි පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ 1836 සිට 1839 දක්වා ඉතිහාසයක්," (පීඑච්.ඩී. ඩිස්., බ්‍රිගම් යන් විශ්වවිද්‍යාලය, 1965), 419.
20. අමන්දා බාන්ස් ස්මිත්, උපුටාගැනීම එඩ්වඩ් ඩබ්ලිව්. ටුලිගේ *අනුස්මරණීය කාන්තාවන් තුලිනි,* ෟ1877ඍ, 124, 128.
21. අමන්දා බාන්ස් ස්මිත්, උපුටාගැනීම ටුලිජ් තුලිනී, *අනුස්මරණීය කාන්තාවන්,* 126.
22. ඊ. ඩෙල් ලීබාරොන්, "බෙන්ජමින් ප්‍රැන්ක්ලීන් ජොන්සන්: ජනාවාසකයා, මහජන සේවක සහ සභා නායක" (මාස්ටර්ස් තෙසිස්, බ්‍රිගම් යන්ග් විශ්වවිද්‍යාලය, 1966), 42–43.
23. ලෙලන්ඩ් හෝමර් ජෙන්ට්රි, "මිසුරි උතුරුදිග පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ ඉතිහාසයක්," 518.
24. *පාර්ලි පී. ප්‍රැට්ගේ ජීවිත කථාව,* 211.
25. "ජේ. ස්මිත් කණි. විසින් ගැලන්ඩ් මහතාට යැව් ලිපියේ පිටපතක්," *ටයිම්ස් සහ සීසන්ස්, පෙබ.* 1840, 52.
26. ලයිමන් ඔමර් ලිට්ල්ෆීල්ඩ්, *පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ සිහිවටන* (1888), 72–73.
27. *සභා ඉතිහාසය,* 3:423.
28. මතායස් එෆ්. කව්ලි, *විල්ෆෝඩ් වුඩ්රෆ්* (1909), 102.

5 පස්වෙනි පරිච්ඡේදය

1. "ලුසියා බාර්න්ස් ප්‍රැට්ගේ ජර්නලය," *බටහිර සැලෙන හදවත,* සකස්. කේට් බී. කාටර්, 12වෙනි වෙළුම. (1939–51), 8:229.
2. "ලුසියා බාර්න්ස් ප්‍රැට්ගේ ජර්නලය," 8:233.

3. "මේරි ඈන් වෙස්ටන් මෝර්ගන්ගේ ජර්නලය," *අපගේ පුරෝගාමීන්ගේ උරුමය,* සකස්. කේට් බී. කාටර්, 9වෙනි වෙළුම, (1958–66), 2:353–54.
4. *සභා ඉතිහාසය,* 4:186.
5. ලුයිසා ඩෙකර්, "නාවූ සිහිවටන," *කාන්තා ප්‍රකාශක, මාර්තු.* 1909, 41.
6. "මෝර්මන්වරු සහ ඉන්දියන්වරු," *බටගිර සැළෙන හදවත,* 7:385.
7. බී. එච්. රොබර්ට්ස්, *සභාව් සවිස්තර ඉතිහාසයක්,* 2:472.
8. *සභා ඉතිහාසය,* 5:2.
9. නාවූ කාන්තා සහන සමිතියේ සටහන්, 28 අප්‍රේ. 1842, 40.
10. නාවූ කාන්තා සහන සමිතියේ සටහන්, 28 අප්‍රේ. 1842, 33.
11. "ලොයිසා බාර්න්ස් ප්‍රැට්ගේ ජර්නලය," 8:231.
12. *සභා ඉතිහාසය,* 4:587, 604; 6:558.
13. *සභා ඉතිහාසය,* 6:555.
14. කෙනත් ඩබ්ලිව්. ගොඩ්ෆ්‍රී, "සාතනය සුළඟේ තිබූ වෙලාවක්, කාලයක්, *මෝර්මන් උරුමය,*" ජූලි/අගෝ. 1994, 35–36.
15. *සභා ඉතිහාසය,* 6:601.
16. මතායස් කව්ලි, "සිහිවටන" (1856), 3; පදශු සභා ලේඛනාරක්ෂන තුලිනි.
17. තෝමස් ෆෝඩ්, *ඉලිනොයිස් ඉතිහාසයක්,* සංස්. මයිලෝ මිල්ටන් කුයිෆි, 2 වෙනි වෙළු. (1946), 2:217.
18. තෝමස් ෆෝඩ්, *ඉලිනොයිස් ඉතිහාසයක්,* 2:221–23.
19. *සභා ඉතිහාසය,* 7:230.
20. උපුටාගැනීම *සභා ඉතිහාසය* තුලිනි, 7:236.
21. උපුටාගැනීම *සභා ඉතිහාසය* තුලිනි, 7:236.
22. උපුටාගැනීම *සභා ඉතිහාසය* තුලිනි, 7:236.

6 වෙනි පරිච්ඡේදය

1. ජුනිටා බෲක්ස්, සං. *මෝර්මන් පෙරමුණ මතː හොසී ස්ටවුට්ගේ දිනපොත,* 2වෙනි වෙළු. (1964) 1:114; අකුරු සහ විරාම ලකුණු නවීකරණයකර ඇත.
2. ජුනිටා බෲක්ස්, *මෝර්මන් පෙරමුණ මත,* 1:117; අකුරු සහ විරාම ලකුණු නවීකරණයකර ඇත.
3. ජේම්ස් බී. ඇලන්, *ගෝලකමේ පරීක්ෂාවන්ː විලියම් ක්ලේටන්, නම් මෝර්මන්වරයෙකුගේ කථාව* (1987), 202.
4. රසල් ආර්. රිච්, *ජාතීන්ට කොඩියක්* (1972), 92.
5. *පදශු සභා ඉතිහාසය කියවීම තුලිනිː මුල් අත්පිටපත් වලිනි,* සංස්. විලියම් ඒ. බෙරට් සහ ඇල්මා පී. බර්ටන්, 3වෙනි වෙළු. (1965), 2:221.
6. ජේම්ස් එස්. බ්‍රවුන්, *ස්වාමීන්වහන්සේගේ යෝධයෙක්ː පුරෝගාමියෙකුගේ ජීවිතයක්* (1960), 120.
7. කැරොලින් ඔගස්ටා පර්කින්ස්, උපුටාගැනීම "බෲක්ලීන් ශුද්ධවන්තයන්ගේ නැව" තුලිනි, *අපගේ පුරෝගාමී උරුමය* (1960), 506.
8. යුටා අර්ධ-සංවත්සර කොමිසම, *පුරෝගාමීන්ගේ පොත* (1897), 2වෙනි වෙළු, 2:54; පදශු සභා ලේඛනාරක්ෂන තුලිනි.

9. "ජීන් රියෝ ග්‍රිෆිත් බේකර් දින පොත," 29 සැප්තැ. 1851; පදගු සභා ලේ-ඛනාරක්ෂන තුලිනි.
10. "අන්තැන්ක් නෙලී පුසෙල්ගේ කථාව," *බටහිර සැළෙන හදවත,* සංස්. කේට් බී. කාටර්, 12වෙනි වෙළු. (1939–51), 9:418–20.
11. විලියම් පැල්මර්, උපුටාගැනීම ඩේවිඩ් ඕ. මැකේ, "පුරෝගාමී කාන්තාවෝ," *සහන සමිතියේ සඟරාව,* ජන. 1948, 8.
12. "ඔවුහු, ජාතිය ගොඩනගන්නෝය," *ගීතිකා,* අංක 36.

7 වෙනි පරිච්ඡේදය

1. *බලන්න, ජර්නල් දේශනා,* 13:85–86.
2. ජෝන් ආර්. යන්ග්, *ජෝන් ආර්. යන්ගේ මතකයන්* (1920), 64.
3. කාටර් ඊ. ග්‍රාන්ට්, *දෙවියන්වහන්සේගේ රාජ්‍යය නැවත පිහිටුවන ලදී* (1955), 446.
4. උපුටාගැනීම බී. එච්. රොබට්ස් තුලිනි, *ජෝන් ටේලර්ගේ ජීවිතය* (1963), 202.
5. ප්‍රැන්සිස් එම්. ගිබන්ස්, *ලොරෙන්සෝ ස්නෝ: ආත්මික යෝධයා, දෙවියන්වහන්-සේගේ අනාගතවක්තෘවරයා* (1982), 64.
6. "ස්පාඃක්ඤදයේ සහ ගිබ්‍රොල්ටා සභාව," *මිතුරා,* මැයි 1975, 33.
7. ආර්. ලැනියර් බ්‍රිට්ස්ච්, *සාගරයේ දූපත් වෙත: පැසිෆික් දූපත්වල පසු-දවස්වල ශුද්ධ-වන්තයන්ගේ ඉතිහාසයක්* (1986), 21–22.
8. චාර්ල්ස් ඩබ්ලිව් නිබ්ලි, "සභාපති ජෝසෆ් එෆ්. ස්මිත්ගේ සිහිවටන," *ඉම්පෘවමන්ට් ඊරා,* ජන. 1919, 193–94.
9. උපුටාගැනීම රසල් එම්. රිච් තුලිනි, *ජාතීන්ට කොඩියක්* (1972), 349.
10. *චාල්ස් ලොවෙල් වෝකර්ගේ දිනපොත,* සංස්. ඒ කාර්ල් ලාසන් සහ කැතරින් මයිල්ස් ලාසන්, 2වෙනි වෙළු. (1980), 1:239; අකුරු සහ විරාම ලකුණු නවීකරනයකර ඇත.
11. ලෙනාඩ් ජේ. ඇරින්ටන්, *චාල්ස් සී. රිච්* (1974), 264.
12. එළිසබෙත් වුඩ් කේන්, *යුටා සිට ඇරිසෝනා දක්වා ගමනකදී මෝර්මන් ගෙවල් දොළොහක් සාර්ථකව බැහැදැකීම* (1974), 65–66.
13. උපුටාගැනීම ගෝර්ඩන් බී. හින්ක්ලි තුලිනි, *සත්‍යය නැවත පිහිටුවා ඇත* (1979), 127–28.
14. බ්‍රිගම් යන්ග්, *ජර්නල් දේශනා තුලිනි,* 18:233.

8 වෙනි පරිච්ඡේදය

1. කාලයිල් මෙහා, "දරාසිටින ඇදහිලිමතුන්: චෙකෝස්ලෝවෙකියා සහ පදගු සභාව, 1884–1990," *මෝර්මන් ඉතිහාසයේ ජර්නලය* (1992 අවසානය), 112–13.
2. ආර්. ලැනියර් බ්‍රිට්ච්, *සාගරයේ දූපත් වෙත: පැසිෆික් දූපත්වල පසු-දවස්වල ශුද්ධ-වන්තයන්ගේ ඉතිහාසයක්* (1986), 352–54.
3. ලී ජී. කැන්ට්වෙල්, "වෙන්කරන රෝගය," *මෙම ජනතාව* (ග්‍රීෂ්මය 1995), 58.
4. බී, එච්, රොබට්ස්, *සභාවේ පුළුල් ඉතිහාසයක්,* 5:592.
5. බී, එච්, රොබට්ස්, *සභාවේ පුළුල් ඉතිහාසයක්,* 5:593.
6. බී, එච්, රොබට්ස්, *සභාවේ පුළුල් ඉතිහාසයක්,* 5:590–91.
7. *මෙල්වින් ජේ. බලාඩ්: ධර්මිෂ්ඨකම මුදවාගන්නා* (1966), 16–17.

8. ජේම්ස් ආර්. ක්ලාක්, සකස්., *යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්ත-යන්ගෙන් යුත් සභාවේ පළවෙනි සභාපතිත්වයේ පණිවුඩ,* 6වෙනි වෙළුම, (1965–75), 3:256–57.
9. ජේම්ස් බී. ඇලන්, ජෙසී එල්. එම්බ්‍රි. කාලයිල් බී. මෙහා, *හදවත් පියවරුන්ට හැරී ඇතඃ යුටා පෙළපත් සමාජයේ ඉතිහාසයක්,* 1894–1994 (1995), 39–41.
10. බී. එච්. රොබට්ස්, *සභාවේ පුළුල් ඉතිහාසයක්,* 6:236.
11. "විල්ෆෝඩ් වුඩ්රෆ්ගේ ජර්නල්" (1833–98), 6 අප්‍රේ. 1893; පදශු සභා ලේඛනාරක්ෂන තුලිනි; අකුරු සහ විරාම ලකුණු නවීකරනයකර ඇත.
12. රිචඩ් නීට්සෙල් හොල්සෆෙල්, *සෑම ගලක්ම දේශනාවකි* (1992), 71, 75, 80.
13. බලන්න මතායස් එෆ්. කව්ලි, *විල්ෆෝඩ් වුඩ්රෆ්* (1909), 602.
14. "සයෝනයේ මිදීම," *මිලෙනියල් ස්ටාර්,* 29 නොවැ. 1900, 754.
15. "ජීවිතකථාවල කොටසඃ ජෙනී බ්‍රිම්හෝල් සහ අයිනස් නයිට්," *තරුණ කාන්තා-වන්ගේ ජර්නලය,* ජූනි 1898, 245.

9 වෙනි පරිච්ඡේදය

1. උපුටාගැනීම සර්ජ් එෆ්. බැලිෆ් තුලිනි, සම්මන්ත්‍රන වාර්තාව, ඔක්තෝ. 1920, 90.
2. ජ්මස් ආර්. ක්ලාක්, සකස්. *යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්-ගෙන් යුත් සභාවේ පළවෙනි සභාපතිත්වයේ පණිවුඩ,* 6වෙනි වෙළු.. (1965–75), 4:222.
3. "කතුවැකිය," *ඉම්පෘව්මන්ට් ඊරා,* නොවැ. 1936, 692.
4. පළවෙනි සභාපතිත්වය, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, ඔක්තෝ. 1936, 3.
5. ජ්. රූබන් ක්ලාක් කණි., ස්ටෙක් සභාපතිවරුන්ගේ විශේෂ රැස්වීමක්, 2 ඔක්තෝ. 1936.
6. අමතර තොරතුරු සඳහා, බලන්න ග්ලෙන් ආර්. රඩ්, *පිරිසිදු ආගමඃ 1930 (1995) සිට සභා සුභසාධන කථාව.*
7. වින්සෙන්සෝ ඩි ෆ්‍රැන්සෙස්කා, "මා පොත පුච්චන්නේ නැත!" *එන්සයින්,* ජන. 1988, 18.
8. ජෝර්ජ් ඇල්බර්ට් ස්මිත්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1948, 162.
9. ජෝර්ජ් ඇල්බර්ට් ස්මිත්, *අන් අය සමග සුහාරංචිය බෙදාගැනීම,* තෝරා. ප්‍රෙස්ටන් නිබ්ලි, (1948), 110–12.
10. ජෝර්ජ් ඇල්බර්ට් ස්මිත්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, ඔක්තෝ. 1947, 5–6.
11. බලන්න ග්ලෙන් ආර්. රඩ්, *පිරිසිදු ආගම,* 248.
12. එස්රා ටැෆ්ට් බෙන්සන්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1947, 154.
13. උපුටාගැනීම ගෙරී ඇවන්ට් තුලිනි, "යුද්ධය වෙන්කරයි, නමුත් සුහාරංචිය එක්සත්-කරයි," සභා පුවත්, 19 අගෝ. 1995, 5.
14. වැඩිදුර තොරතුරු සඳහා, බලන්න ග්ලෙන් ආර්. රඩ්, *පිරිසිදු ආගම,* 254–61.
15. ජෝර්ජ් ඇල්බර්ට් ස්මිත්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1949, 10.
16. උපුටාගැනීම ලෙව්ලින් ආර්. මැකේ තුලිනි, *සභාපති ඩේවිඩ් ඕ. මැකේගේ නිවාස මතකයන්* (1956), 5–6.
17. ජෝර්ජ් ඩරන්ට්, "අංක 1 ක්‍රිස්තියානුවෙක්," *ඉම්පෘව්මන්ට් ඊරා, නොවැ.* 1968, 82–84.

10 වෙනි පරිච්ඡේදය

1. ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1930, 91.
2. ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1972, 13; හෝ *එන්-සයින්,* ජූලි 1972, 27.
3. ෆ්‍රැන්සිස් එම්. ගිබ්සනස්, *හැරල්ඩ් බී. ලී* (1993), 459.
4. ජේ එම්. ටොඩ්, "මෙක්ෂිකෝ නගරයේ විශිෂ්ඨ ප්‍රාදේශීය සම්මන්ත්‍රනය," *එන්සයින්,* නොවැ. 1972, 89, 93, 95.
5. ඩබ්ලිව් ග්‍රාන්ට් බැන්ජර්ටර්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, ඔක්තෝ. 1977, 38–39; හෝ *එන්සයින්,* නොවැ. 1977, 26–27.
6. ඊ. ඩේල් ලී. බාරොන්, "කළු අප්‍රිකාව," *මෝර්මන් උරුමය, මාර්/අප්‍රේ.* 1994, 20.
7. *ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්ගේ ඉගැන්වීම්,* සංස්. එඩ්වඩ් එල්. කිම්බල් (1982), 451.
8. බෘස් ආර්. මැකොන්කි, "දෙවියන්වහන්සේට සියල්ලෝම එක සමානය," *ආගමික උගතුන්ට චෝදනාවක්,* 2වෙනි සංස්. (1981), 153.
9. ඊ. ඩේල් ලී බාරොන්, "කළු අප්‍රිකාව," 24.
10. ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්, "බ්‍රිගම් යන්ග් විශ්වවිද්‍යාලයේ දෙවන ශතවර්ෂය," *වසරේ කථා, 1975* (1976), 247.
11. *ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්,* සංස්. එඩ්වඩ් එල්. කිම්බල්, ඇන්ඩෘ ඊ. කිම්බල් කණි. (1977), 334.

11 වෙනි පරිච්ඡේදය

1. එස්රා ටැෆ්ට් බෙන්සන්, *සාක්ෂියක් සහ අනතුරු ඇඟවීමක්* (1988), 3, 21; තවද බලන්න *සභා ඉතිහාසය* 4:461.
2. එස්රා ටැෆ්ට් බෙන්සන්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1986, 100; හෝ *Ensign,* මැයි 1986, 78.
3. එස්රා ටැෆ්ට් බෙන්සන්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1989, 6–7; හෝ *Ensign,* මැයි 1989, 6–7.
4. තෝමස් එස්. මොන්සන්, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, අප්‍රේ. 1989, 66; හෝ *Ensign,* මැයි 1989, 51; තවද බලන්න සම්මන්ත්‍රන වාර්තාව, ඔක්තෝ. 1985, 44; හෝ *Ensign, නොවැ.* 1985, 34.
5. ගැරොල්ඩ් සහ නෝමා ඩේවිස්, "පවුර පහතට එයි," *එන්සයින්,* ජූනි 1991, 33.
6. *සභා පුවත්,* 29 ජූනි 1991, 12.
7. හොවාඩ් ඩබ්ලිව්. හන්ටර්, *සභා පුවත්* 11 ජූනි 1994, 14.
8. එලීනර් නෝවෙල්ස්, *හොවාඩ් ඩබ්ලිව්. හන්ටර්* (1994), 193.
9. *හොවාඩ් ඩබ්ලිව්. හන්ටර්,* සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, ඔක්තෝ. 1987, 71; හෝ *Ensign,* නොවැ. 1987, 60.
10. *සභා පුවත්,* 17දෙසැ. 1994, 3.
11. *සභා පුවත්,* 18 මාර්. 1995, 10.
12. *ගෝර්ඩන් බී. හින්ක්ලි; අවංකත්වයේ මිනිසා 15වෙනි සභාවේ සභාපතිවරයා* වීඩියෝ කැසට් (1994)
13. ජෙෆ්රි ආර්. හොලන්ඩ්, "සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි," *Ensign,* ජූනි 1995, 5.

14. *සභා පුවත්,* 18 මාර්. 1995, 10.
15. ගෝර්ඩන් බී. හින්ක්ලි, "ප්‍රකාශ," දණ්ඩ 1801; පදශු සභාවේ ලේඛනාරක්ෂන තුලිනි.
16. ගෝර්ඩන් බී. හින්ක්ලි, සම්මන්ත්‍රන වාර්තාව තුලිනි, ඔක්තෝ. 1995, 92–93; හෝ *Ensign,* නොවැ. 1995, 70.
17. පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ සභාව, "පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි," *Ensign,* නොවැ. 1995, 102.
18. Jeffrey R. Holland, "සභාපති Gordon B. Hinckley," 13.

අවසානය

1. *සභා ඉතිහාසය,* 4:540.

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ
පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

SINHALA
4 02354 48408 4
35448 408